
For E-Pusthakalaya

153



කුමාර කරුණාරත්න

# අපේ කතාව

For E-Pusthakalaya

# 1.

කුඹුරුවල අස්වැන්න එකතුකරගන්නා කාලය ළඟාවී තිබිණ. වැස්සකට පළමු ගොයම් ටික කපා කමතට ගැනීමට අම්මාත් තාත්තාත් යුහුසුළු වූහ.

තාත්තා විසින් අඳේට වැඩ කරනු ලැබූ දන්ගහ පැලැස්ස කුඹුර පිහිටියේ අපේ ගෙදර සිට සැතපුම් බාගයක් තරම් දුරිනි. ඒ කන්නේ කුඹුරු තරමක් සරුසාර වූ හෙයින් අම්මාත් තාත්තාත් තුළ වූයේ සතුටකි. පාසැල් නොයන දවසට අම්මාත් සමග වෙලට යාම මට ද සතුටක් විය.

ගොයම් කපා අවසන්ව ඒවා කමතට අදිනු ලැබූ දා සවස ද අම්මාට උදව් වීමට මම ගියෙමි. අම්මාත් මාත් ගොයම් මිටි බැඳීමෙහි නිරත වූ අතර තාත්තාත් මල්ලීත් ඒවා කමතට ඇදීමෙහි යෙදුණාහ. කමත පිහිටියේ ගංගොඩේ රාලහාමි මාමාට අයත් ඉඩමකය. දන්ගහ පැලැස්ස කුඹුර අයත් වූයේ ද ඔහුටය.

ඉර බසින්නට ආසන්න වූ විට අපට වැඩ අවසන් කිරීමට හැකි විය. අන්තිම ගොයම් මිටිය ද තාත්තාගේ හිසට එසවූ අම්මා මාගල අකුලමින් මා ඇමතුවාය.

"දැන් ඉතින් දුවේ මල්ලිත් එක්ක ගිහින් නාගන්න. මම මේ ගමන් ම ඇල අයිනෙන් ගොටුකොළ මිටකුත් කඩාගෙන එන්නං."

අම්මා බෙහෙවින් වෙහෙසට පත් ව සිටියාය. ඇගේ රෙද්දේ සහ හැට්ටයේත් ඇඟේත් දූවිලි මෙන් ගොයම් කාටු තැවරී තිබුණ අතර හිසකෙස් අවුල්ව පැවතිණ. එහෙත් ඇගේ මුහුණෙහි වෙහෙසට යටින් වුවද පැවැත්තේ කොළඳින් ඉවර කර ගන්නට ලැබීමෙන් ඇතිවූ සතුට ය. මහන්සි වී සිටියත් මට ද වෙහෙසක් නොදැනිණ.

For E-Pusthakalaya



මල්ලිත් මමත් ආපසු එන්නට වීමු. වෙල් යායේ ඈත කෙළවරේ කඳු මුදුනට හිරු පහන් වෙමින් සිටියේය. බටහිර අහස ලේ කැටියක් මෙන් රතු පාට වී තිබිණ. අහස එසේ රතුපාට වන්නේ වැස්සක් තිට්ටුව ඇති විට බව මම අසා ඇත්තෙමි. අනෙක් කුඹුරුවල ද ගැහැනු මිනිස්සු කුහුඹුවන් මෙන් කඩිසරව අස්වනු නෙළීමෙහි නිරතව සිටියහ.

මල්ලිත් මාත් නාන්නට අගාරේ ඇල්ල වෙත එන විට එහි මීදෙල්ලගස්වලට යස්සනිගේ අච්ච වැටී තිබිණ.

කඳු පාමුල අගාරේ පිහිටි දිය ඇල්ල ඉතා ඇකුම්කළු තැනකි. උස් ගල්කුළකින් ඇද හැලෙන නිල් දිය දහර පැතලි ගල්තලාවක් මත පතිතව විසිරී යයි. ඉන්පසු එතැන් සිට එය දිය පාරක්ව ගල් අතරින් ගලා බසියි. අවට වැඩුණු උස් තුරු වදුලේ සෙවණ නිසා ගිනි මද්දහනක වුව ද දියපාර සිසිල් ය.

අප ඇල්ල වෙත එන විට එහි මීදෙල්ල ගසක් යට ගලක් මත කිසිවකු අපට පිටුපා වාඩිවී ඇල්ල දෙස බලා සිටින අයුරු දුර තියාම අපට පෙනිණි. තිරුවත් උඩු කයින් යුතුව සිටි ඔහු නාන්නට පැමිණි කෙනකු බව මම සිතුවෙමි. ඔහුගේ හිසට උඩින් මීදෙල්ල අතුවල අතුරු සිදුරු නැතිව රතු මල්දම් එල්ලුවාක් මෙන් ගස පුරාම මල් පිපී එල්ලෙමින් තිබිණ. ගිලිහී වැටුණු මල් නිසා ගස යට ද රතු පලසක් අතුරා වූ කලක මෙන් විය.

අපි ඇල්ල වෙත ළඟා වීමු. අපට පිටුපා වාඩිවී සිටි ඔහු ඇඳ සිටියේ සුදු කොට කලිසමක් පමණකි. රන්වන් හිරු රැස් තැවරුණු ඔහුගේ නග්න පිට ඉතා ම පැහැපත් විය. තරමක් දිගට වැඩී තිබුණු කෙස් කැරලි සුළඟේ සසල විණ. සමාධියකට සම වැදුණකු මෙන් නිහඬව ඔහු ගල් කුළෙන් ඇද හැලෙන දිය දහර දෙස බලා සිටියේ ය. මම ඇඳුම් මාරුකරමින් මල්ලී ඇමතිමි.

"ඊ වෙන්න ආවා. මල්ලී ඉක්මණට නාන්න."

මගේ කට හඬින් තිගැස්සුණාක් මෙන් එවිට අර තැනැත්තා එකවර හිස හරවා අප දෙස බැලුවේය. ඒ සමග ම ඔහු හඳුනාගත් මම පුදුම වීමි. සේන අයියා මෙතන දී දකින්නට මම බලාපොරොත්තු



නොවීමි. ඔහුගේ මුව මඬල මත පියකරු සිනාවක් පැතිර ගියේ ය. මම ද මුහුණට සිනාවක් නගා ගන්නට උත්සාහ කෙළෙමි. දිය රෙද්ද අඳිමින් සිටි මට දැනුණේ මහත් ලජ්ජාවකි.

"සාමා ඇයි නාන්න මෙච්චර හවස් වෙනකන්?" ඔහු ඇසුවේය.

"වෙලට ගිය හින්දා පරක්කු උනා. අපි අද දන්ගහ පැලැස්සෙ කොළ ඇද්දා" මම ලජ්ජාශීලීව පැවසීමි.

දන්ගහ පැලැස්ස අයිති සේන අයියලාටය.

"සේන අයියා කවද්ද ගමේ ආවේ?"

"අද උදේ."

ඔහු ඉගෙණ ගත්තේ අගනුවර උසස් විද්‍යාලයක ය. සාමාන්‍යයෙන් ඔහු ගමේ පැමිණියේ පාසැල් නිවාඩු කාලයට පමණකි.

අප දෙස මොහොතක් බලා සිටි මල්ලී ඇල්ලට පැන එයට හිස අල්ලා සිනාසීගෙන අප දෙස බලා සිටියේය.

සේන අයියා සතුටින් මා දෙස බලා සිටින්නට විය. දිය රෙද්ද හැඳගත් මම කොණ්ඩය ලිහා පිට දිගේ දමා ගතිමි. සේන අයියා ගේ බැල්ම මට අපහසුවකි. එහෙත් ඔහු දැන් හොඳ ලස්සන තරුණයෙකැයි මට නිතැතින්ම සිතිණ. ලජ්ජාව සමග වුවද එය මා තුළ ඇති කෙළේ සතුටකි. මාත් දැන් ලස්සන තරුණියකැයි ඔහුටත් සිතෙන්නේද? ඔහු එසේ සිතනු ඇතැයි මට සිතිණ. ඒ සිතුවිල්ලත් සමගම මම ලජ්ජාවෙන් බිම බලා ගතිමි.

"සාමා පහුගිය වතාවෙ ජ්‍යෙෂ්ඨ විභාගෙට හිටියා නේද?"

"ඔව්. තාම ප්‍රතිඵල පිට උනේ නැහැ."

"මං හිතන්නෙ ඔයා පාස්වෙලා ඇති" යි පවසමින් ඔහු පියකරු ලෙස සිනාසුණේය.

"කොහොමද දන්නෙ?" මම ද ලජ්ජාශීලීව වුවත් සිනාසෙන්නට උත්සාහ කෙළෙමි.

"මට මතකනෙ අපි ගමේ ඉස්කෝලෙට ගිය කාලෙ ඔයා කොච්චර දක්ෂද කියල. ඒ කාලෙ ඔයා හැමදාම පන්තියේ පළමුවැනිය නේද?"

ඔහුට අපේ ළමාවිය තවමත් මතක තිබීම මට මහත් සතුටක් විය. ගමේ පාසැලේ ඉගෙණ ගනිද්දී මා සිටියේ ඔහුට පන්ති කීපයක්

For E-Pusthakalaya



පහළිනි. ඔහු ඉගෙණ ගන්නට කොළඹ ගියේ ගමේ පාසැලේ පස්වැන්න සමත්වීමෙන් පසුවය. මා ගමේ පාසැලෙන් අස්ව දඹතැන්න මහා විද්‍යාලයට ඇතුළත් වූයේ අටවැන්න සමත් වූවාට පසුවය. ගමේ පාසැලේ වූයේ අටවැන්න දක්වා පමණකි.

"ඔය ගොල්ලන්ගේ ඉස්කෝලෙට ඉංග්‍රීසි ගුරුවරයෙක් නැතිලු නේද?" යි ඔහු ඉක්බිතිව ඇසුවේය.

"ඔව් අනේ. හිටිය මිස් අස්වෙලා ගිහින් දැන් අවුරුද්දක් විතර වෙන්නත් ආවා. එයාට අපේ පළාත අල්ලන්නෙ නැතිලු. තාම වෙන කෙනෙක් ආවෙ නැහැ"

"එහෙනම් ඉංග්‍රීසි උගන්නන්න මම ආවොත් ඔගොල්ල කැමතිද?" යි අසමින් ඔහු සිනාසුණේය.

"අයියෝ එහෙනම් කොච්චර එකක්ද?" මම ද සතුටින් සිනාසෙන්නට උත්සාහ කෙළෙමි.

"එහෙනම් මම එන්නම්කො."

"අපට එච්චරත් වාසනාවක්"

"ඇත්තමයි. මට ඒ ඉස්කෝලෙට ඉංග්‍රීසි ගුරු පත්වීමක් හම්බවෙලා තියෙනවා"

ඔහුගේ කටහඬෙහි වූයේ විශ්වාස කළ යුතු ස්වරයකි. මම සතුටින් උද්දාම වීමි.

"කවදා ඉඳලද?"

"හෙට ඉඳල"

"අනේ දෙයියනේ කොච්චර දෙයක්ද" මම ඉහවහා ගිය සතුටින් පැවසීමි.

ඔහු ඒ ගැන තවත් විස්තර කතා කෙළේය. ඔහුට මේ ගුරු පත්වීම හදා දී ඇත්තේ මන්ත්‍රීතුමාය. විශ්ව විද්‍යාල ප්‍රවේශයට පෙනී සිටීමෙන් පසු ප්‍රතිඵල නිකුත් වන තෙක් නේවාසික ගාස්තු ගෙව ගෙවා කොළඹට වී නිකම්ම සිටීමට වඩා ගුරු පත්වීමක් ලබා ගැනීමට සේන අයියා කල්පනා කර තිබිණ. විභාග ප්‍රතිඵල පිළිබඳව ඔහු තුළ වූයේ මහත් විශ්වාසයකි. නිතිය හැදෑරීම ඔහුගේ බලාපොරොත්තුව බව ඔහු මා සමග පැවසුවේය.



"ඒ වෙන්න ආවනෙ. ඉතින් නාන්නකො" ඔහු පැවසුවේය.

මම ඇල්ල වෙත ගොස් එයට හිස අල්ලා සිනාසී ගෙන සේන අයියා දෙස බැලීමි. ඔහු ද සිනා මුහුණින් මා දෙස බලා සිටියේ ය. ඇල්ලේ වතුර ඉතාම සීතලය. තොප් කලඹත් ඇගත් දොවාගෙන සීතල වතුර ගලා බසිද්දී සියලු වෙහෙස ඉවත්වී මගේ සිරුරින් ඉවත්වී යන්නාක් මෙන් මට දැනිණ.

තුනී දිය රෙද්ද තෙමී මගේ ඇඟටම ඇලෙද්දී මට මහත් ලජ්ජාවක් දැනෙන්නට විය. සේන අයියා වරින් වර මා දෙස බලනු පෙනිණ. එවිට මම ලජ්ජාවෙන් ඇඹරුණෙමි.

මම මල්ලීගේ කුණු ඉලන්නට වීමි.

"ඇයි සබන් ගාන්නෙ නැද්ද?" සේන අයියා ඇසුවේය.

"අපි කෙළින්ම වෙලේ ඉඳලා ආව හින්දා සබන් ගෙනාවෙ නැහැ."

"මේ තියෙන්නෙ ගා ගන්න." සේන අයියා ඔහුගේ සබන් පෙට්ටිය අප වෙතට දිගු කරමින් පැවසුවේය.

අප සබන් ගාද්දී සේන අයියා නාන්නට විය. ඔහු ඇල්ලට හිස අල්ලා සිනාසීගෙන අප දෙස බලා සිටින්නට විය. ඔහුගේ ඇඟ දොවාගෙන වතුර ගලද්දී සුදු සිරුර වඩාත් පැහැපත්ව පෙනිණ. එය බලන්නට ආශා උපදවන සිරුරකි. පපුවේ සහ කකුල්වල මවිල් තෙමුණ විට ඒවා පහළට පීරා දූ කලක මෙන් විය.

මගේ සිත තුළින් කිසියම් අවිනිශ්චිත මිහිරි නැවුම් සුවඳක් වහනය වන්නාක් මෙන මට දැනිණ. සබන් සුවඳ ද අවට පැතිරිණ. එය ද මා තුළ ඇති කෙළේ මිහිරකි. මේවා අපි කවදා නම් ගාපු සුවඳ සබන්දැයි ඒ සමගම මට සිතිණ.

නාගෙන අපි තිදෙනාම දෙවැට දිගේ එක්ව ආවෙමු. එය බිම කළුවර වැටෙන ගොම්මන් වේලාව වුවත් සේන අයියා නිසා මගේ සිතට බියක් නොදැනිණ. ගොම්මන් වේලාවට ගෙයින් පිට යාමට අම්මා කිසි විටෙකත් මට ඉඩ නුදුන්නාය. සේන අයියා සමග දෙවැට දිගේ එද්දී මගේ සිතට දුක් දොම්නස් වේදනා සියල්ල අමතක වුණ ලොකු සහනයක් සහ සතුටක් දැනිණ. හෙට සිට ඔහු මගේ ගුරුවරයෙක් වෙයි. ඒ සිතුවිල්ල මගේ සිත තුළ ඇති කළේ විශාල සතුටකි. අපේ

For E-Pusthakalaya


ගෙට හැරෙන ඉදි කඩුල්ල ළඟදී සේන අයියා අපෙන් වෙන්විය. අම්මා මග බලා සිටියාය.

එදා රෑ අප කෑම කමින් සිටියදී මම සේන අයියාගේ ගුරු පත්වීම පිළිබඳ ආරංචිය අම්මාටත් තාත්තාටත් පැවසීමි.

"අනේ එහෙනම් කොච්චර එකක්ද?" අම්මා සතුටින් පැවසුවාය.

"පින් තියෙන තැන්වලට තමයි කොස් හම්බ වෙන්නෙත්. නැත්නම් මේ ගමේ ඉගෙණගෙන රස්සාවල් නැතුව ඉන්න ළමයි තවත් නැතුවායැ. ඒත් කෝ ඒ අයට ඔහොම පත්වීම්?" තාත්තා ඇසුවේය.

"ඒත් ඉංගිරිසි ඉගෙණ ගත්ත අය වෙන කවුද ඉන්නෙ?" යි අම්මා එවිට ඇසුවාය.

"කොහොම උනත් මහ මිනිස්සු වාගෙ නොවෙයි ඔය කුඩා එක්කෙනා හොඳ සීදේවි ළමයා. දැක්ක දුටු තැන කටපුරාම මාමෙ කියල කතාකරනවා" යයි තාත්තා ද ඉන්පසු පැවසුවේය.

"අනේ ඔව් හොඳ ගුණ යහපත්කම් ඇති ළමය. එහෙම අයට හරි යන්න ඕන." අම්මා ද යළිත් පැවසුවාය.

සේන අයියා පිළිබඳව ඔවුන් තුළ වූයේ එබඳු පැහැදීමකි. ඔහුගේ නිහතමානී බව වඩාත් කැපී පෙනුණේ ඔහුගේ පවුලේ අනිත් අයගේ අහංකාරකම් නිසා ද විය හැකිය. අපට කිට්ටුවන්ත නෑදෑකමක් නැතත් මම ඔහුගේ පියාට රාලහාමි මාමා කියමි. ඔහු කලින් ගම්මුලාදෑනි වසම් දැරූවෙකි. ඒ කාලේ ඔහු ළඟ තිබුණ තේජස තව දුරටත් පවත්වා ගැනීමට ඔහු වෙහෙසෙයි. ඔහුගේ ධනවත්කම හා පවුල් බලය ද ඊයට පිටුවහලක් වී ඇත.

ලොකු පුතා වැඩි දුර ඉගෙණ නොගත්තත් ගම්කාර්ය සභාවේ සභාපති ඔහුය. සමූපකාරයේ සභාපති කම දරන්නේත් ඔහුය. එකම දුව දඹිතැන්නේ මහා විද්‍යාලයේ විදුහල්පතිගේ බිරිඳය. ඇය ද එහි ගුරුවරියකි. රාලහාමි මාමාගේ නංගී විවාහවී සිටින්නේ ලේකම් රාලහාමි සමඟය. මේ පවුලට සමාන පවුලක් ගමේ තබා අවට ගම්වලවත් නැත.

"අද සවස ආකසෙත් නොසෑහෙන්න රතු කරලා තිබුණා. කොයිවේලාවෙ වැස්සක් කඩා වැටෙයිද දන්නෙ නැහැ" යි කෑමෙන්



පසු ඉස්තෝප්පුවට පැමිණි තාත්තා බුරු ඇඳේ වාඩිවී පැවසුවේය.

"අද රෑටම කොළ ටික මඩවා ගත්තෙ නැත්තං හෙටවත් ආකසේ විස්වාස නැහැ"යි පවසමින් ඔහු වහලයෙන් පොල් කොලයක් කඩාගෙන කුප්පි ලාම්පුවට අල්ලා එය දල්වාගෙන සුරුට්ටුවක් පත්තුකර ගත්තේය.

"ඒක නම් ඇත්ත. අනේ පුතේ මහන්සියි කියල බලන්නෙ නැතුව කොළේ මඩවන්න තාත්තත් එක්ක යන්න. මගෙ රත්තරන් පුතානෙ" අම්මා මල්ලීට පැවසුවාය.

ඉන් ටික වේලාවකට පසු තාත්තාත් මල්ලීත් කමතට යාම පිණිස ලන්තෑරුමත් රැගෙන මිදුලට බැස්සාහ. අහසේ හොඳින් සඳ පායා තිබිණ. අම්මාත් මමත් දොර වසා ගත්තෙමි.

මම කුප්පි ලාම්පුවත් දල්වාගෙන මේසය ළඟට වී පොතක් පෙරළා ගතිමි. පාඩම් කරන්නට මා එය ඉල්ලා ගත්තේ පාසැලේ ගැහැනු ළමයෙකුගෙනි. මට පොත් පත් වලින් කොතෙකුත් අඩුපාඩු තිබිණ. එහෙත් ඒවා ගැන අම්මාට හෝ තාත්තාට කරදර කරන්නට මට කොහෙත්ම පුළුවන්කමක් නොතිබිණ. ඔවුන් මා පාසැල් යැව්වේ ඉතාම අමාරුවෙනි. සැතැපුම් හයක් දුර පාසැලකට යාම සඳහා බස් වියදම වුවද සපයා දුන්නේ මහත් වැර වෑයමෙනි.

වෙහෙස නිසා පැදුරේ වැටුණ ගමන්ම අම්මාට නින්ද ගියේය. මහ රෑ නිහඬ බව තුළින් මට කොළ මඩවන කමතක ඕස හඬක් ඇසෙන්නට විය. මම එයට හොඳින් කන් දී අසා සිටින්නට වීමි. එය තාත්තාගේ කට හඬය. මගේ සිතට මහත් ශෝකයක් දැනෙන්නට විය. අපේ ජීවත්වීම සඳහා ඔහු මොනතරම් වෙහෙසෙන්නේද? ඒ සඳහා ඔහුට අව්ව වැස්ස ගණන් නැත. රෑ දාවල් ගණන් නැත. මල්ලීත් දැන්ම නියාම තාත්තා මෙන් වෙහෙසෙයි. ඔහුට හෙට ඉස්කෝලේ යාමටද නොලැබෙයි. මම ශෝකයෙන් සුසුමක් හෙළීමි.

මොහොතකින් මට සේන අයියාත් සවසත් මෙනෙහි විය. ඒ සමගම අන් සියල්ල අමතකව සිත මිහිරකින් වෙළී ගියේය. හෙට සිට ඔහු අපේ පාසැලේ උගන්වන්නට එයි. එය මොන තරම් සතුටක්ද? සේන අයියා දැන් ඉස්සරට වැඩියෙ හරිම ලස්සනයි. අපේ පුංචි

For E-Pusthakalaya

කාලෙ එයාට තාමත් මතකයි. ඒ කාලෙ අපි දෙන්නා ඉස්කෝලෙ ඇරිලා එද්දී මොනවද නොකෙළෙ? පිල්ලෑවෙ බඩවැටියට වැදිල වැලි පේර කැඩුවා. දන් ඇඹින්දා. කුරුල්ලන්ට ගල් ගැහුවා. තවත් ළමයි එක්ක එකතුවෙලා හැංගි මුත්තන් සෙල්ලම් කළා. අපි දෙන්නා හැංගෙන්නෙම එක තැනක. එකට ගුලිවෙලා හැංගිලා ඉන්නවා. මී පැටව් වාගෙ. අනිත් අයට අපිව සොයා ගන්න හරිම අමාරුයි. සමහර ළමයි අපි දෙන්නට විහිළුත් කළා ගෑනියි මිනිහයි කියලා. ඒවා මතක් වෙනකොට මට තාමත් හිනා.

මගේ සිතට මහත් සහනයක් දැනිණ. හය හතරක් නොතේරෙන කිසිම බරක් පතලක් වගකීමක් නැති ළමාවිය මොන තරම් සැහැල්ලුද? ඒක හරියට සුරංගනා ලෝකයක් වගෙ.

මම ඒ සිතුවිලි මැඩ පවත්වාගෙන පාඩම් කරන්නට උත්සාහ කෙළෙමි.



# 2.

"එළිය වැටිලා දුවේ" යි අම්මා කුස්සියේ සිට මට ඇසෙන සේ පැවසුවාය.

කුප්පි ලාම්පුව දල්වාගෙන මේසය ළඟ වාඩිවී පාඩම් කරමින් සිටි මම හිස ඔසවා බැලීමි. පොල් අතු වහලයටත් කටුමැටි බිත්ති මුඳුනටත් අතරින් ළහිරු රැස් කාමරය තුළට කාන්දු වෙමින් තිබිණ. එළිය වැටී ඇති බවක් එතෙක් මට නොදැනිණ. වේලාව බලා ගන්නට අපේ ගෙදර ඔර්ලෝසුවක් නැත.

අම්මා කුස්සියේ පොල් ගාන හඬ ඇසිණ.

මම පාසැල් ගෙන යා යුතු පොත් ටික සකස් කර ගන්නට වීමි. ඒ සමගම මට සේන අයියා මෙනෙහි විය. ඔහු අද අපේ පාසැලට එයි. මගේ සිතට විශාල සතුටක් සහ උනන්දුවක් දැනිණ. මම කුප්පි ලාම්පුව නිවා දමා ජනේලය හැර ඇමීමි. පුංචි ජනේලයේ ලී කූරු අතරින් එන ළහිරු රැසට කාමරය තුළ පවත්නා අඳුර මුළුමනින් පළවා හැරිය නොහැක.

ජනේලයේ ලී කූරු දෙකක් අල්ලා ගත් මම මොහොතක් වේලා පිටත බලා සිටින්නට වීමි. බොහෝ රෑ වන තුරුත් එළිවන යාමයේත් ඇහැරගෙන සිටිය නිසා මට හිස කැරකෙන ගතියක් දැනිණ. ජනේලයෙන් පිටපැත්තේ පොල් අතු මඩුවේ බැඳ සිටි රත්තිගෙන් පැටවා කිරි උරා බොමින් සිටියේය. ඌ ඇගේ බුරුල්ලට හිසෙන් ඇන්නේය. එහෙත් රත්ති ඉවසා සිටියාය. පැටියාට අයිති කිරි ටික පාන්දරම අම්මා රත්තිගෙන් දොවා ගන්නිය.

මා කුස්සියට එන විට අම්මා ළිප ළඟ වාඩිවී සිටියාය. ළිපේ ගිනි ඇවිළිණ. රොටියක් පිච්චෙමින් තිබිණ. මම ළිප ළඟින් අඟුරු කැල්ලක් අහුලාගෙන කළගෙඩිය උකුළට ගතිමි. ළිඳ වෙත ගොස් අඟුරු කැල්ල

වීසා දත් මැද්දීත් මට මෙනෙහි වූයේ සේන අයියාය. ඉක්මනින් සූදානම්වී පාසැල් යා යුතු යයි මට සිතිණ. මම ඉක්මනින් මුහුණ සෝදාගෙන වතුර කළගෙඩිය පුරවා උකුලට ගතිමි. කුස්සියට පැමිණ කළගෙඩිය බිම තැබූ මම අම්මා දෙස බැලීමි. ඈ කබලෙන් රොටියක් ඔා මා වෙත දිගු කළාය.

"ඊයෙ රෑ ඉතුරුවෙච්ච හොදි ටිකක් ඔන්න ඔය ඇතිලියේ ඇති. ඒකත් එක්ක මේක කාපන්"

"හොදි ටික මල්ලිට තිබුණාවෙ. මම ඔය සීනි ටිකක් එක්ක කන්නම්"

"එතකොට තේ බොන්නෙ ඔළුගෙඩියත් එක්කද?"

"ඒකත් ඇත්ත."

මම හීල් හොදිබොර ටිකක් ගාගෙන රොටිය කෑවෙමි. සීනි කැට ටිකක් අත්ලට හලාගෙන එය දිව ගාමින් කිරි වීදුරුව බීවෙමි. දැන් සම්පූර්ණය. මම කුස්සියෙන් ඉවත්වීමි.

තාත්තාගේ බුරු ඇඳ අකුලා ඊයේ බිත්තියට හේත්තු කළ අයුරින්ම තිබිණ. ඔහුත් මල්ලීත් තවමත් කමතේය.

මම මගේ පැදුරේ කොට්ටය උස්සා එය යට තිබුණ සුදු ගවුම ගතිමි. රෙදි මැද ගැනීමට අපේ ගෙදර ඉස්තිරික්කයක් නැත. ඒ අඩුව පිරිමසන්නේ මා හිස තබන කොට්ටයයි. පාසැල් ඇරී පැමිණ සෝදා වේලා ගන්නා ගවුම හොඳින් නවා රෑට මා නිදාගන්නා විට කොට්ටය යටින් තබා ගනිමි. එවිට උදේට ගවුම මැද්දාක් බඳුය. මම ගවුම ගෙන එහි වූ සැවැන්දරා මුල් ටික ගසා දමා ගවුම නාසයට කර බැලීමි. සැවැන්දරා මුල්වල සුවඳ නිසා ගවුමේ තිල්වල ගෙන්දගම් ගඳ නොදැනිණ.

මා ගවුම හැඳගෙන හැඩ වැඩ වූයේ වෙනදාට වඩා උනන්දුවෙනි. ඒ සෑම මොහොතකම සේන අයියාගේ රූපය මගේ මනසෙහි ඇඳී තිබිණ. මම කොණ්ඩය කරල් දෙකක් වන සේ ගොතා අගින් පිත්තපටි ඇටගසා ගතිමි. පුංචි කණ්නාඩිය ජනෙල් කණ්ඩිය මත තබා එදෙස බලාගෙන අල්ලට පියර කුඩු ටිකක් හලාගෙන මුහුණේ අතුල්ලා ගතිමි. කවදාවත් නැතිව එදා මා ලස්සනයයි මට සිතිණ. ඉන් සිතට ඇති වූයේ විශාල සතුටකි.



අම්මා පුරුදු පරිදි හැඳිලිය ඇඳ සත විසිපහක් මගේ අතේ තැබුවාය. එය දවල් ආහාරය සඳහාය. මම සිරිත් පරිදි අම්මාට වැඳ පිටත් වීමි.

දෙවැට දිගේ ආ මම බස් පාරට පැමිණ සේන අයියලාගේ ගෙය දෙස බැලීමි. එය ඇත්තේ පාරෙන් එහා පැත්තේය. රට උළු සෙවිලි කරනු ලැබූ ඒ නිවස ඉතා විශාලය. පාර අයිනේ ගල් තාප්පයක් සහ යකඩ ගේට්ටුවකි. මිදුලේ පිහිටි විශාල අශෝකා ගසේ ලොකු මල් පොකුරු පිපී තිබිණ.

මම පාර අයිනටවී බලා සිටින්නට වීමි. ටික වේලාවකට පසු සේන අයියා යකඩ ගේට්ටුව හැරගෙන පාරට ආවේය. මා දුටු සැණ ඔහුගේ මුව මඬල මත සතුටු කුසුමක් විකසිත විය. සුදු කලිසමක් සහ අත් දිග සුදු කමිසයක් හැඳ සිටි ඔහු අද වෙනදාටත් වඩා ලස්සන යයි මට සිතිණ. පාර හරහා පැමිණි ඔහු මා අසල සිට ගත්තේය. මම සතුටින් ඔහු දෙස බලා සිටින්නට වීමි.

"සාමා ඇවිත් හුගක් වෙලාද?"

"නෑ. මාත් ආවා විතරයි."

"හැමදාම යන්නේ මේ වෙලාවට ද?"

"ඔව්. මේ වෙලාවට තියෙන බස් එකේ සෙනඟ අඩුයි. පමාවෙලා එන එකේ හරියට සෙනඟ."

"සාමා සීසන් එකක් අරගෙන තියෙනවද?"

"ඔව්"

"මාත් එකක් ගන්න ඕන"

"සේන අයියට නම් ඉස්කෝලෙ නවතින්නත් පුළුවන්නෙ?"

"ඔව්. අක්කත් කීවා එහෙ නවතින්න කියලා. ඒත් මොනවටද ඒ අයට කරදර කරන්නේ තේද? මෙච්චර ළඟ එකේ මට ගෙදර ඉඳලම යන්න බැරියැ."

බස් එක පැමිණි පසු අපි එයට නැගුණෙමු. වැඩි සෙනඟක් නොසිටි හෙයින් මම ඉඩ ඇති අසුනක වාඩි වීමි. එවිට සේන අයියාද ඒ අසුනේම වාඩි විය. මට ලැජ්ජාවත් සමග සතුටක්ද දැනිණ. එහෙත් බස් රියට නැගුණ පසු ඔහු කතා කළේ අතරින් පතරය. එසේම ඔහු මගේ ඇඟෙහි නොගැටෙන අයුරින් විනීත ලෙස වාඩිවී

For E-Pusthakalaya

සිටියේය. සමහර තරුණයින් බස්රියේදී චූවමනා වෙන්ම ඇගේ ගැටෙන්නට ඒම මා අත්දැක ඇති දෙයකි. එවැන්නවුන් පිළිබඳව මා තුළ ඇති වන්නේ පිළිකුලක් සහ කෝපයකි. ඒ අතින් සේන අයියා මොන තරම් විනීත දැයි මට සිතිණ.

මම පොතක් පෙරළා ගතිමි. එහෙත් මට පොත කෙරෙහි අවධානය යොමු කරගැන්ම අපහසු විය. මගේ පපුව නුපුරුදු වේගයකින් ගැහෙමින් තිබිණ. මම පොත දෙස බලා සිටියදීම වරින් වර හොරැහින් ඔහු දෙස බැලීමි. ඔහු ඉදිරිපස බලාගෙන සිටියේය. ඔහුට නොදැනෙන්නට මම ඔහු දෙස හොරැහින් බලා සිටියෙමි.

ඔහුගේ නිකට ළඟ පමණක් රැවුල්ගස් කිපයක් යන්තමින් කළුගැසී තිබිණ. පැහැපත් මුහුණ තරුණියකගේ මෙන් සියුමැලි විය. එය රත්වන් පාටය. තරුණියකට නම් ඒ පාට ඉතාම ලස්සනැයි මට සිතිණ. මුදු ගැසුණු කෙස් කැරලි කළු පාටට වඩා රන්වන් පාටට හුරු විය.

පැහැපත් බෙල්ලත් ලේ පිරුණාක්මෙන් රත්පැ ගැසුණු දිගු කන්පෙත්තත් වෙත මොහොතක් මගේ දැස ගැටී පැවතිණ. ඒ සමගම එසේ බලා සිටීම නොහොබනේ යයි මට සිතිණ.

අනෙක් අය අප දෙස බලා සිටීදැයි මම වටපිට බැලීමි. සමහරු චූවමනාවෙන්ම අප දෙස බලා සිටියහ. එහෙත් අප දෙදෙනා අයියා සහ නංගී යයි ඔවුන් සිතනු ඇතැයි මම සිතිමි. රූපාකාරයෙන් අප දෙදෙනා අතර සහෝදර සහෝදරියන් බඳු සමාන පෙනුමක් ද ඇත. එය මගේ සිතට එක් අතකින් ආඩම්බරයක් බඳු හැඟීමක් දැනවීය.

පාසැලේ සිටින විනීතා බඳු ගැහැනු ළමයින් සේන අයියාට වහවැටෙනු ඇතැයි මට සිතිණ. තරුණ ගුරුවරයකුට ඔවුන්ගෙන් බේරීම අපහසුය. විශේෂයෙන්ම විනීතා පිළිබඳව මා තුළ වූයේ නොපැහැදීමකි.

පාසැල ඉදිරිපිට දී බස් රියෙන් බැස්ස අප දෙදෙනා ගේට්ටුවෙන් ඇතුළු වූයේ එකටමය. මිදුලේත් පාසැලේත් සිටි ළමයින් අප දෙස බලා සිටියේ මහත් උනන්දුවෙනි. එවිට මට දැනුණේ මහත් ආඩම්බරයකි. පන්ති කාමරයක කොට බිත්තියට උඩින් විනීතා ඇතුළු ගැහැනු ළමයින් කිප දෙනෙකු ද බලා සිටිනු මට පෙනිණ. ඔවුන්ගෙන්



දැන් ඉතින් මට බේරුමක් නොවන බව මම දැනගතිමි.

සේන අයියා ගුරු නිවාසයට ගිය අතර මම පන්ති කාමරයට ආවෙමි. කවුරුත් මා දෙස බලා සිටියේ උනන්දුවෙන් හා කුතුහලයෙන් වුවත් සිනාමුසුවය.

"ආයි - ආයි දැන් ජෝඩු ආලා ඉස්කෝලෙ එන්නෙත් ආ!" මා පන්තියට ඇතුළුවත්ම විනීතා සිනාසෙමින් වුවත් පහත් හඬින් පැවසුවාය.

එවිට කිප දෙනෙක් හඬ නගා එක රොත්තට සිනාසුණහ. ඔවුන්ට මැයි මෙච්චර දෙයක්.

"ආයිත් කතාවක් හැදුවද?" මම මවාගත් අමනාපයෙන් යුතුව ඇසීමි.

"ඇත්තට කවුද සාමා ඒ ආ?" සුමනා ඇසුවාය.

කෙල්ලෝ මා පිරිවරා ගත්හ.

"අපේ අලුත් ඉංග්‍රීසි සර්"

"ආ! ඇත්තද?"

ඔවුහු මගෙන් නොයෙකුත් ප්‍රශ්න අසන්නට වූහ.

"කොහෙ කෙනෙක්ද?"

"ප්‍රින්සිපල්ගෙ නෝනගෙ මල්ලි"

"ඇත්තද ආ? ඔයා කොහොමද අඳුනන්නෙ?"

"අපේ ගෙවල් ළඟ"

"ආව් - ආව් - මොන ෂෝක්ද?"

"පව් සිද්දවෙන කතා කියන්න එපා අනේ"

"ඔයාලගෙ නෑයොද?"

"ම් - ඔව්" මම ගොත ගැසීමි.

"ආව් ආව් - එහෙනම් සාමටත් හරි ගියා ආ! දැන් ඉතින් දෙන්නා යන්නෙත් එකට නෙ. මොන ෂෝක්ද?" විනීතා පැවසුවාය.

"පව් අනේ. එයා මගේ අයියා කෙනෙක් වෙනවා."

"අයියෝ ඒක සුළු දෙයක්. නෑකමට වැඩියිලුනෙ ඕනෑකම"යි පවසමින් ඇ හඬ නගා සිනාසුණාය.

"ඒ මට නොවෙයි - ඔයාට" මම අමනාපය අඟවන ස්වරයෙන් පැවසීමි.

For E-Pustakalaya



ඔවුන් මට කෙතෙක් විහිළු කළත් ඒ කවුරුන් තුළත් වූයේ විශාල සතුටකි. අපි කවුරුත් ඉංග්‍රීසි ඉගෙනීමට ආශා කළෙමු. ඊටත් ලස්සන තරුණ ගුරුවරයකු ලැබීම ගැහැනු ළමයි කාටත් සතුටක් විය.

අනාගතය අවිනිශ්චිත වුවත් මා තුළ පැවැත්තේ විශාල බලාපොරොත්තු සමූහයකි. ඉංග්‍රීසි ඉගෙනීමෙන් තොරව ඒ බලාපොරොත්තු ඉටුකර ගත නොහැකැයි මට නිතර හැඟිණ. උසස් අධ්‍යාපනයට දොරටුව ඉංග්‍රීසි භාෂාව නොවේද? සේන අයියා මගේ අනාගතය සාර්ථක කරදීමට මිහිබට සුර දූතයකු මෙන් මට පෙනිණ.

දවසේ අනෙක් පාඩම්වල යෙදී සිටියදී ද මා බෙහෙවින් කල්පනා කළේ සේන අයියා සහ අලුතින් ඇරඹෙන ඉංග්‍රීසි පාඩම ගැනය. අප කවුරුත් තුළත් වූයේ මහත් ප්‍රබෝධයකි. ඉංග්‍රීසි ඉගෙණ ගන්නට ලැබීම ඒ කාටත් විශාල සතුටකි. අසල පන්තියක ළමයින්ට සේන අයියා ඉංග්‍රීසි උගන්වන ආකාරය අපි සතුටින් බලා සිටියෙමු. ඒ අතර කෙල්ලෝ කසුකුසු ගෑහ.

"එයා නාම පොඩි කොල්ලෙක් අනේ!"

"ඉස්සෙල්ලම පන්විමලු නෙ?"

"මට නම් බලාගෙන ඉන්න ආශයි. ලස්සන සිනමා නළුවෙකුටත් වැඩියෙ හැඩයි" විනීතා සතුටින් පවසනු ඇසිණ.

ඇගේ කතාවට මගේ සිත තුළ අමනාපයක් ඇතිණ. අපේ ගුරුවරයකු ගැන අප එසේ කතා කළ යුතුද?

"පුළුවන් නම් ඉතින් ඇත්මම ඇලේ දාගනින්. අපට ඉංග්‍රීසි අකුරක් ඉගෙණ ගන්න තියෙන එකත් නැති කරන්න" සුමනා පැවසුවාය.

"ඇලේ දාගත්තොත් තමයි ඉගෙණ ගන්න පුළුවන් වෙන්නෙ." යි විනීතා අසංවර ලෙස පැවසුවාය.

"ඒ කොහොමද?"

"එතකොට ඒ මනුස්සයා මෙහෙන් මාරුවෙලා යන්නෙ නැහැනෙ, මෝඩියෙ" යි පවසමින් විනීතා ඇඟ ගස්සමින් සිනාසුණාය.

ඇගේ සිනාවේ අසංවර හඬ ඇසී සේන අයියා ද මොහොතකට හිස හරවා බැලුවේය. විනීතා මොන තරම් අවිනීත එකියකැයි මට සිතිණ. ඇත්ත වශයෙන්ම ඇ බලාපොරොත්තු වන්නේ ඔහු සමග





ආදර සම්බන්ධයක් පවත්වා ගන්නදැයි මම සිතීමි.

ඉන් මගේ සිතට ඇති වූයේ කෝපයක් හා විනීතා පිළිබඳව ඇඩි නොපහන් බවකි. ඇගේ කල්පනාව ඇත්මම මනමාලකම පටන්ගන්නද? ඉන් පාඩුවක් වන්නේ දුප්පත් අපටයි. ඇගේ පියාට මුදල් තිබේ. ඒ නිසා ඇ ඉගෙණ ගත්තත් නැතත් ඇගේ අනාගතයට හානියක් නැත. නමුත් අපට එසේ නොවන්නේය. දුප්පත් අප දහසක් කරදර විඳගෙන පාසැල් එන්නේ මනමාලකමට නොව ඉගෙණ ගන්නය.

ඇ ගුරුවරුන් අල්ලාගෙන නැටිල්ල පටන්ගත් විට පාඩු වන්නේ අපේ ඉගෙනීමටය. විජේරත්න මහතාට හදිසියේ මාරුවී යාමට සිදු වූයේත් විනීතාගේ මනමාලකම නිසාය. මගේ සිත තුළ කොතෙකුත් ඇති වන්නට වූයේ විනීතා පිළිබඳව නොපහන් සිතුවිලි සමුදායකි.

විජේරත්න මහතා උපාධිය ලබාගෙන මුලින්ම පැමිණියේ අපේ පාසැලටය. ඔහුත් විනීතාත් අතර නොමනා සම්බන්ධයක් ඇති විය. ඇගේ ගෙදරට ද ආව ගිය ඔහු පසුව සවසට ඇයට ගෙදරදී ඉගැන්වීමට ද පටන්ගත්තේය. ඇගේ දෙමව්පියෝ ද මුලදී ඒ සම්බන්ධයට ඉඩදී බලා සිටියහ. එහෙත් ඔහු තමුන්ගේ පවුලට වැද්දගැනීමට නොහැකි පහත් යයි සම්මත පවුලකට අයත් කෙනෙකු බව දැනගත් වහාම ඔවුහු ඒ සම්බන්ධයට විරුද්ධ වූහ. නමුත් පහසුවෙන් ඒ සම්බන්ධය කඩ නොවන බව පෙනී ගිය විට විනීතාගේ පියා කළේ මන්ත්‍රීතුමා ලවා විජේරත්න මහතා ඈත පළාතකට මාරුකර යැවීමය. ඉන් පාඩු වූයේ විනීතාට නොව අපටය. විජේරත්න මහතා ඉගැන්වූ විෂයයන් අපට ඉගැන්වීමට මාස ගණනක් යනතුරු ගුරුවරයෙක් නොපැමිණියේය.

විනීතා දෙස මා බලා සිටියේ නොපහන් දෑසිනි. ඇ සේන අයියා දෙස මනමාල දෑසින් බලාගෙන මිතුරියන් සමග රහසින් යමක් පවසා හිකි හිකි ගා සිනාසුණාය. ඇය උත්සාහ කළේ සේන අයියාගේ අවධානය තමා වෙත යොමු කරවා ගැනීමටය. මා ඇය දෙස බලා සිටියේ කෝපයෙනි.

එදා සේන අයියා අපේ පන්තියට නොපැමිණියේය. එහෙත් සවස පාසල් ඇරී අප දෙදෙනා ආපසු පැමිණියේ එකම බස් රියෙනි.

For E-Pusthakalaya

# 3.

"සේන අයියා අද උගන්නන්න ගියා අම්මෙ. දැන් එනකොටත් ආවේ මාත් එක්ක."

මම ගෙට ගොඩවුණ හැටියේම අම්මාට ආරංචිය කීවෙමි. මා මෙන්ම අම්මාත් සතුටුවනු ඇතැයි මම සිතිමි. එහෙත් උළුවස්ස මත වාඩිවී ඉරුණ හැට්ටයක් එලලමින් සිටි අම්මා කිසිවක් නොකී හෙයින් මම උනන්දුවෙන් ඇගේ මුහුණ බැලීමි. ඒ මුහුණ ශෝක වලාවකින් වැසී ඇති බව මට පෙනිණ. ඒ සමගම මෙතෙක් පුබුදුවී තිබූ මගේ හදවත වහා මැලවිණ.

"ඇයි අම්මා?"

"මොනවද?"

"අම්මා අඬලා වගෙ"

"නෑ"

"එහෙනම් ඔය ඇස් දෙකේ.........?"

"මට ටිකක් ඉසේ රදේ"

"ඩිස්ප්‍රින් පෙත්තක්වත් ගෙන්නා ගත්තෙ නැද්ද?"

"එපා. තව ටිකකින් ඇරිලා යයි."

මා රවටන්නට අම්මා බොරුවක් කියන්නීදැයි මට සැක සිතිණ. මා නැති අතර ගෙදර කුමක් හෝ කනගාටුදායක දෙයක් සිදුවීද? මම කුතුහලයෙන් අම්මාගේ මුහුණ දෙස බලා සිටින්නට වීමි. එවිට අම්මා හෙමිහිට කතා කළාය.

"ගවුම මාරු කරගෙන ඔය තියන දෙයක් කාපන්"

මා ඇඳුම් මාරු කරන්නට වූයේද කල්පනා කරමිනි. ඇයි අම්මා කනගාටුවෙන් ඉන්නේ? ළිඳ වෙත ගොස් මූණ සෝදද්දීද මා කල්පනා කෙළේ ඒ ගැනය.



කුස්සියට පැමිණි මම පිඟානේ වසුන් හැර බැලීමි. එහි පොල් සම්බෝල සමග බතල කැලි කීපයක් බෙදා තිබිණ. මම මොහොතක් එදෙස බලා සිටියෙමි. මගේ මුවින් ඉබේම සුසුමක් නික්මිණ. අද දවාලට උයන්න ගෙදර හාල් තියෙන්න නැතුව ඇති. මම එසේ සිතීමි.

ඉන්පසු මම පිඟාන අතට ගෙන හිරමණය මත වාඩිවී බතල කෑල්ලක් කඩා මුව තුළ දමා ගතිමි. ඒ අතර ද මා කල්පනා කෙළේ අම්මා ගැනය. බතල කෑල්ල මගේ උගුරේ හිරවිය. අම්මා පසුවන්නේ බඩගින්නේදැයි ඒ සමගම මට කල්පනා විය. තමුන්ගේ කෙනකු බඩ ගින්නේ සිටින විට කෑම උගුරේ හිරවන බව අම්මා කියනු මම අසා ඇත්තෙමි. මම වතුර ටිකක් බීවෙමි.

"අම්ම කෑවද?" මම ශබ්ද නගා ඇසීමි.

"ඔව්. ඔය ටික සේරම උඹ කාපන්"

හිස රදේ තිබියදීත් අම්මා කන්නට ඇත්තේ බතලය. මේක අපේ කරුමෙ. නැත්නම් තාත්තා කොච්චර මහන්සි වෙනවද? ඒත් හැමදාම අපට කෙළවරක් නැති හිඟනකම. මේක කවදා ඉවරවන හිඟනකමක්ද මන්දා. මට හිතැතින්ම එසේ සිතිණ.

මම බතල කෑලි කීපය කා කුස පුරා වතුර බීවෙමි. ඉන්පසු පිඟාන සෝදා රාක්කයෙන් තබා සාලයට ආවෙමි. මල්ලී බිම පැදුරක් එලාගෙන නිදා සිටියේය. ඔහුට නින්ද ගොස් තිබිණ. මම ඔහු දෙස මොහොතක් බලා සිටියෙමි. ඊයේ රෑ නිදිමරා මහන්සිවී දැන් හොඳටම නිදි. අද ඉස්කෝලෙ යන්න ලැබුණෙත් නැහැ. මට මල්ලී ගැන දුකක් දැනිණ. මම හෙමිහිට අම්මා වෙත ආවෙමි.

"කෝ අම්මෙ තාත්තා තාමත් කමතෙද?"

"නෑ. බැත යාල්ලලා ඉවරයි"

එවිට මම ගෙය සිසාරා දෙනෙත විහිදුවීමි. තාත්තා ගෙනා වී කොහෙද? එහෙත් පෙනෙන්නට නොවීය.

"කෝ අම්මේ අපේ වී පංගුව?"

එහෙත් අම්මා කතා නොකළාය. මම කුතුහලයෙන් කාමරයට ද එබී බැලීමි. එහි ද එක වී මල්ලක්වත් නොවීය.

For E-Pusthakalaya



"කෝ අම්මේ අපේ අඳේ?"

එවිට අම්මා මා දෙස නොබලාම සුසුමක් හෙළුවාය.

"අපි පැල් රැක්කා - ගිනි තැප්පා. එච්චරයි දුවේ" ඈ හැට්ටයේ ඉරුණු තැනක් දෙස බලාගෙන ශෝකයෙන් කොඳුළාය.

එය අදහා ගත නොහැකි විමතියෙන් මම අම්මාගේ මුහුණ දෙස බලා සිටින්නට වීමි.

"රාලහාමි අයියගෙන් අපි අරගෙන තිබුණ ණයවලට අඳේ සේරම හිලව්කර ගත්තා දුවේ. අපට එක වී ඇටයක්වත් ඉතුරු උනේ නෑ" අම්මා දුකින් පැවසුවාය.

මගේ පපුව හොස් ගා එකවර දැවී ගියේය. හඬ නගා වැලපෙන්නට තරම් විශාල ශෝකයක් මට දැනිණ.

දෙයියනේ මගේ තාත්තා මහන්සි වෙච්ච තරමක්. ගිනි කාස්ටක අව්වේ මොන තරමක් ඩාදිය වගුරන්න ඇද්ද? රෑ තිස්සේ කොච්චර නිදි මර මරා පැල් රකින්න ඇද්ද? ඒත් වී ටික සේරම අනුන්ට. එක ඩාදිය බින්දුවක් හෙළුවෙ නැති රාලහාමි මාමට. එයා කුඹුරු අයිතිකාරයා වින්තිය ඇත්ත. ඒත් දෙයියනේ මහන්සි වුණේ මගේ තාත්තා නේද? හද දැවෙන ශෝකයෙන් හා වේදනාවෙන් මම එසේ සිතිමි.

පළමුවෙන් තාත්තා පිළිබඳව මගේ සිත තුළ උපන් ශෝකය කෙමෙන් රාලහාමි මාමා පිළිබඳව හටගත් අධික කෝපයක් බවට පත්වන්නට විය.

දෙයියනේ ඒ මිනිහට හොඳක් නම් වෙන්න එපා. ගමේම ඉන්න දුප්පත් මිනිස්සුන්ගෙ කුඹුරු ටික එයා රාලහාමි කාලේ වල්ලෙන් කොල්ලෙන් කොල්ල කාගෙන ඒ කුඹුරු ඒ මිනිස්සුන්ටම අඳේට වැඩ කරන්න දීලා වී ටිකත් සේරම කොල්ල කාගන්න ඒ මිනිහට හොඳක් නම් වෙන්න එපා. මම සිතින් ඔහුට ශාප කෙළෙමි.

අම්මා යළිත් හෙමිහිට කටහඬ අවදි කළාය.

"ඒ මදිවට රාලහාමි අයියා තාත්තට කිව්වලු ලබන කන්නේ ඉඳලා වෙන කාගෙ හරි කුඹුරක් අඳේට ඉල්ලා ගන්න කියල"

"ඒ මොකද?" මම ක්ෂණිකව ඇසීමි.



"එයා මීට පස්සෙ කුඹුරු අඳේට නොදී සේරම කුළියට වැඩ කරන්න යනවලු ට්‍රැක්ටර් ආලා"

මගේ සිතට දැනුණේ අප්‍රමාණ කෝපයකි.

"හිතේ ඇති ලේසියෙන්ම අඳේ කඩන්න"

"ඇයි බැරි? එයාගෙනෙ කුඹුරු" අම්ම එවිට පැවසුවාය.

"ඒ උනාට මම අහලා තියෙනව කුඹුරු පණතේ හැටියට අඳ ගොවියන්ගෙන් හිතු මනාපෙට කුඹුරු කඩන්න බැහැ කියල"

"තාත්තත් එහෙම මොකක්ද නම් කිව්වා තමයි"

"ඒක තමයි. රාලහාමි මාමා ඔය හිතන තරම් ලේසියෙන් එහෙම කරන්න ලැබෙන්නෙ නැහැ. මේ සැරේ අපේ අඳේ හිලව් කරගත්තෙත් කුඹුරු ගොවිතැන අපට එපා කරවන්න හිතාගෙන වෙන්න ඇති. අපි වැඩ කරන්න බෑ කිව්වොත් එයාට ලේසිනෙ. අපිත් ලේසියකින් මේක අතාරින්න හොඳ නෑ. මොකද අපි උන්ගෙ වහල්ලුද?" මම හිතේ පැවැති කෝපයෙහි වේගයෙන් පැවසීමි.

අම්මා නිහඬ වූවාය. එතැන් සිට දවස ගෙවෙන්නට වූයේ මහත් ශෝකාන්ධකාරයෙනි. පාසැලේදී මා තුළ පැවති සතුට උනන්දුව ප්‍රබෝධය ඇන් මගේ අසලක ද නැත. ගෙදර පැමිණි වේලෙහි සිට සිත කලකිරවන පාරන දෙයක්ම මිස සතුටු වන්නට කිසිවක්ම නොවීය. පාසැලෙන් දුන් ගෙදර වැඩ කිසිවක් ද මට මෙනෙහි නොවිය. ඒ කිසිවක් ගැන උනන්දුවක් දක්වන්නට තරම් චිත්ත ඒකාග්‍රතාවයක් හෝ සැනසුමක් මා තුළ නොවීය.

තාත්තා ගෙදර පැමිණියේ අඳුරත් සමගය. ඔහුගේ මුහුණ ශෝකාන්ධකාරයෙන් වැසී තිබෙන අයුරු මම දුටුවෙමි. මගේ හදවත මා තුළ හඬා වැලපිණ.

තාත්තාගේ සිත සැනසීම සඳහා කුමක් කියන්නද? මා ඉගෙණීමේ කටයුතු ගැන හෝ පාසැලේ කිසියම් සිද්ධියක් ගැන පවසන විට සතුටින් හා උනන්දුවෙන් අසා සිටීම තාත්තාගේ සිරිතය. සේන අයියා අද ඉංග්‍රීසි ගුරු පත්වීම භාරගත් බව කියන්නට මම සිතූ විටක්ම සිතුවෙමි. එහෙත් එවැනි ආරංචියක් ගැන අසා සතුටු වන්නට තරම් තත්වයක තාත්තා නොසිටියේය. සේන අයියා ගැන කීමෙන්

For E-Pusthakalaya



තාත්තාගේ කෝපය උග්‍ර වනු ඇතැයි ද මට සිතිණ. සේන අයියා රාලහාමි මාමාගේ පුතාය. එයාත් කොහොමද කවුද දන්නේ? ගමේ කටු උල් කරන්න ඕනයෑ. මට සේන අයියා ගැන වුවද එසේ සිතිණ.

අම්මා ද කෑම කෙසේ හෝ පිළියෙළ කර තිබුණි. කෑමෙන් පසු තාත්තා සුරුට්ටුවක් ද පත්තු කර ගෙන ඉස්තෝප්පුවේ බූරු ඇඳට වුණේය. අම්මා බුලත් හෙප්පුව ද ගෙන දොරකඩ එළිපත්ත මත වාඩිවූවාය. මම උළුවස්සට හේත්තුවී ඔවුන් දෙස බලා සිටින්නට වීමි. කිසිම කෙනෙක් කතා නොකළහ. ගෙය පුරාම මහත් පාළු මූසල බවක් පැතිර තිබිණ.

"හෙට කොහොම කරන්නද මන්දා. කුපන් හාල් ටික ගන්න තියෙන්නෙත් අනිද්දට" යයි අම්මා නිහඬ බව බිඳිමින් පැවසුවාය.

මමෙතක් වේලා අම්මා කල්පනා කරමින් පසුවී ඇත්තේ හෙට ජීවත්වන්නේ කෙසේද යන්නය.

"අනිද්දාට උනත් නිකං දෙන හාල් ටික විතරයි ගේන්න වෙන්නෙ. අනිත් බඩු ගන්න මගේ අතේ සතයක්වත් නැහැ" යි තාත්තා පැවසුවේය.

මගේ හදවත කම්පා විණ. ජීවත්වීම සඳහා අම්මාත් තාත්තාත් කරන්නේ මොන තරම් විශාල සටනක්ද? තාත්තා කම්මැලියෙක් නොවේ. නිකම්ම ඉන්න මිනිහෙකුත් නොවේ. එච්චර මහන්සිවෙලත් තාත්තට කුස පුරා කන්නවත් නැත.

අම්මාත් තාත්තාත් දිගටම සිතුවිලි ලෝකයේ නිමග්නව පසුවූහ. ඔවුන් සිතන එකම දෙය ජීවත් වන්නේ කෙසේද යන්න නොවේද? නිලතල යාන වාහන වස්තුව සැප සම්පත් ආදිය ළඟාකර ගන්නේ කෙසේදැයි ඔවුහු නොසිතති. ඔවුන්ගේ ජීවිතත් සිතුවිලිත් අන් සියල්ලත් සීමාවී ඇත්තේ ජීවත්වන්නේ කෙසේද යන ප්‍රශ්නය වෙත පමණකි. ජීවත්වීම සඳහා කරන සටනට පමණක් ජීවිතය සීමාවී තිබීම මොන තරම් අවාසනාවක්ද?

"මගෙත් කල්පනාව අර උක්කුරාල වාගෙ මේ ගමෙන් පිටවෙලා යන්න" සෑහෙන වෙලාවකට පසු තාත්තා නිහඬ බව බිඳිමින් පැවසුවේය.



අම්මාත් මමත් ක්ෂණිකව ඔහු දෙස බැලීමු.

"එහෙම ගිහින්?" අම්මා වහා ඇසුවාය.

"අහුවෙච්ච දෙයක් මොකක් හරි කරනවා. මේකෙ එකාලගෙ ආඩම්බර බල බලා ඉන්නවට වැඩියෙ කොහේ හරි ඈතක ගිහින් මොනවා කළත් හොඳයි. මේ ගමේ ඉඳලා අපට තියා අපේ දරුවෙකුටවත් යන කලක් නැහැ."

තාත්තා ගමෙන් පිටවී ගියොත්? මගේ සිතට විශාල බියක් දැනිණ. දෙයියනේ එහෙම වෙන්න එපා. හිඟාගෙන කාලා හරි අපි එකටම ඉන්න ඕන. කොහොම හරි තාත්තගෙ ගමන වළක්වන්න ඕන. මට එසේ සිතිණ.

"තාත්තෙ කුඹුරු පණතේ හැටියට එකපාරටම ඔහොම නිතුමනේට කුඹුරු කඩන්න බැරිලු නේද?"

"පාලක ලේකම් උන්නැහෙත් එහෙම කතාවක් නම් කිවා තමයි. ඒත් රාලහාමි හිතු දේ කරන මිනිහා. මං ගැන නම් මට බයක් නෑ. උන් මත්තේ මැරුණත් මට කමක් නෑ. ඒත් මම කළුගලක ඔළුව ගහ ගත්තාම උඹලට යන කල මොකක්ද? ඒකයි මම ගමෙන් මගාරින්න කල්පනා කෙරුවෙ"

"ඒ උනත් අපි ගොවිකාරක සභාවට පෙත්සමක් දීලා බලමුකො තාත්තෙ"

"මොනවටද දූවේ - රාලහාමිනෙ ඒකෙත් සභාපති."

"එහෙනම් අපි ආණ්ඩුවට පෙත්සමක් දෙමුකො."

"එහෙම කරලා අපි මේ ගමේ ඉන්ටද? උන්ට විරුද්ධවෙලා මේ ගමෙ ඉඳගෙන කරන්න දෙයක් නැහැ. මේ ගෙට උනත් එන්න තියෙන්නෙ උන්ගෙ ඉඩම් උඩින්නෙ. හෙට පාරවල්වලට කටු ගැහුවොත් අපි ගෙට කොටුවෙනවා. අපිට පුළුවන්ද උන් එක්ක හඬු කියන්න. එතකොට මේ ගෙටත් ගින්දර තියාවි. මට නම් ඕන දෙයක් ඔට්ටුයි. මට පුළුවනි මරාගෙන මැරෙන්න. ඒත් උඹලා........?"

ශෝකය යටපත් කර ගෙන නැගුණු කෝපයෙන් යුතුව මම බලා සිටින්නට වීමි. කළ හැකි කිසිවක්ම මට නොපෙනිණ. මේ අසාධාරණයන් ඉදිරිපිට මගේ නූගත් දෙමාපියන් මෙන්ම මා ද

For E-Pusthakalaya

... හිස ඔසවා නැගී සිටීමට අපට පුළුවන් අසරණය. මේවාට එරෙහිව හිස ඔසවා නැගී සිටීමට අපට පුළුවන් කමක් ලැබෙන්නේ කවදාද? එය එක එක්කෙනා තනි තනිව කළ යුත්තක් නොව අපේ තත්ත්වයේ සිටින සියලු දෙනාම එකාවන්ව නැගී සිට සංවිධානයවී සාමූහිකව කළ යුත්තකි.

අපි බොහෝ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටියෙමු.

"දූවේ විභාග ප්‍රතිඵල පිටවෙන්න තව හුඟක් කල් යයිද?" තාත්තා ඇසුවේය.

ඔහුට මේ අවස්ථාවේ එය මෙනෙහි වූයේ ඇයි? මෙච්චර වෙලා මගේ අනාගතය ගැන සිතන්නට ඇති. බලාපොරොත්තුවකට ඇත්තේ මගේ විභාගය පමණකි.

"පත්තරේ නම් කීප දවසක්ම තිබුණා අද පිටවෙයි - හෙට පිටවෙයි කිය කියා. ඒත් කාටද විශ්වාස."

"ඇයි?"

"මේ රටේ කවද්ද නියම කාලෙට විභාගෙක ප්‍රතිඵල පිටවෙන්නෙ?"

"එතකොට අර පහුගිය දවස්වල පිටවෙලා තියෙනවා කියල උඹ කිවේ මොනවද?" අම්මා ඇසුවාය.

"ආ - ඒ පිටවෙලා තිබුණේ විභාගෙට ඉස්සෙල්ලා ප්‍රශ්න පත්තර. තවත් විභාගෙක ප්‍රතිඵල පිටවෙන්න ඉස්සෙල්ලා උත්තර පත්තර සයිබර් කඩේක තිබුණාලු අතපිහිත්න තියලා කියල මෙදා පත්තරේක තිබුණා........"

"අනේ මන්දන්නෑ - මෙහෙව් රටේ අපි මොනවා ගැන බලාපොරොත්තු වෙන්නද කියල" යයි පවසමින් තාත්තා සුසුමක් හෙළුවේය.

අපි යළිත් නිහඬව මිදුලේ අඳුර දෙස බලා සිටියෙමු.

"හුඟක් ර් උනා. උඹ අද පාඩම් කරන්නෙ නැද්ද?" යි අම්මා ඇසුවාය.

"බෑ අම්මෙ. මම නිදා ගන්නව."

පාඩම් කරන්නට කිසිදු උනන්දුවක් මා තුළ නොවීය. පාසැලේදී මා පසුවූයේ මොන තරම් උනන්දුවකින් හා සතුටකින්ද? ඒත් දැන්?



මම කාමරයට ආවෙමි. මල්ලී බිත්තිය අයිනට වෙන්නට පැදුරක් එලාගෙන ගුලිවී නිදා සිටියේය. දවල් ඇඳගෙන සිටිය කිළුටු කලිසම් කොටය පිටින්ම ඔහුට නින්ද ගොස් තිබිණ. මම අම්මාගේ පරණ චීත්තයක් ගෙන මල්ලීගේ ඇඟ වැසෙන්නට පෙරවා එතැනින්ම මගේ පැදුර එලා ගතිමි.

දෑස පියාගත් නමුත් මට නිදිමතක් නොදැනිණ. අන් සියලුම ප්‍රශ්න මැඩගෙන මගේ සිත තුළ ඉස්මතු වූයේ තාත්තා ගමෙන් පිටවී යාද යන ප්‍රශ්නයයි. ඉන් මගේ සිත විශාල බියකට පත්විය.

සිදු වන්නට ඇති ඉතාම අසුබ දෙයක් ගැන කියන මූසල අසුබ පෙර නිමිත්තක් මෙන් කොහේදෝ ඈතක සිට බල්ලෙකු උඩුබුරන හඬ රාත්‍රි නිසලතාවය ඔස්සේ ඇසෙන්නට විය. මගේ සිත බියෙන් ඇළලී යන්නට විය.

For E-Pusthakalaya

# 4.

"**සේ**න අයියා ඇයි අපේ පන්තියට ඉංග්‍රීසි උගන්නන්න එන්නෙ නැත්තෙ?" බස් රියේදී මම ඔහුගෙන් ඇසීමි.

"කෝ කාල සටහනට අනුව ඒ පන්තියට ඉංග්‍රීසි පීරියඩ් එකක් නැහැනෙ. මම ප්‍රින්සිපල්ගෙනුත් ඇහුවා. එයා කියනවා ඔයගොල්ලෝ විභාගෙට ඉංග්‍රීසි නොකරන හින්දා ඕන නැහැ කියල"

මගේ සිතට මහත් දුකක් දැනිණ. ඉංග්‍රීසි ඉගෙනීමට අප තුළ වූයේ බලවත් ආශාවකි.

"අපි ප්‍රින්සිපල්ට කියලා පීරියඩ් එකක් ඉල්ලා ගත්තොත් සේන අයියා උගන්නන්න කැමතිද?"

"ඇයි නැත්තෙ? කාල සටහනට අනුව නම් මට වෙලාවක් නැති එක ඇත්ත. ඒත් ළමයි කැමති නම් ඉස්කෝලෙ වෙලාවෙන් පස්සේ නැවතිලා හරි මට උගන්නන්න පුළුවනි."

ඔහු පිළිබඳව මට මහත් ආදරයක් දැනිණ. ඔහු ගහේ කටුව නොවේ. තාත්තාගේ පුතා නොවේ. එවලෙහි මට එසේ සිතිණ. පාසැලට පැමිණි පසු මම ඉංග්‍රීසි පාඩම ගැන සිරිසේන සමග කතා කෙළෙමි. සාමාන්‍යයෙන් පන්තියේ සෑම කරුණකදීම මූලිකව කටයුතු කරන්නේ ඔහුය. එසේම ඔහුද ඉංග්‍රීසි පාඩම ගැන ලොකු උනන්දුවක් දක්වන්නෙකි. බස් රියේදී සේන අයියා සමග සිදුවූ කතා බහද මම සිරිසේන සමග පැවසීමි.

"අපිත් ප්‍රින්සිපත්ට කියල ඉංග්‍රීසි පීරියඩ් එකක් ඉල්ලාගනිමු සිරි" මම පැවසීමි.

එහෙත් සිරිසේන කතා කිරීමට පෙර කට ඇම්මේ විනීතාය.

"වහෙන් ඔරෝ නොකියා කෙළින්ම ඔහෙන්වරෝ කියන්නකො"

"මොකක්ද ඒ කතාවෙ තේරුම?"



"ඔයාට ඉංග්‍රීසි පාඩමට වැඩියෙ ඕන කරන්නෙ ඉංග්‍රීසි සර්නෙ."

ඒ කතාවට මා මෙන්ම සිරිසේන ද කෝප විය.

"තමුන්ගෙ මිම්මෙන් හැමෝම මනින්න එපා විනීතා"

"මොකක්ද මගේ මිම්ම?"

"ඒක අපට වැඩියෙ හොඳට දන්නෙ ඔයානෙ" සිරිසේන අමනාපයෙන් පැවසුවේය. "අපි මේ රැවුල ගිනි අරගෙන දඟලනවා. ඔයා එනවා සුරුට්ටු පත්තුකර ගන්න. ඔයාගෙ ඔළුවේ හැම තිස්සෙම තියෙන්නෙ මනමාලකම....."

එයට විනීතා තවත් කට ගහගෙන ආවාය. ඇයට ඉගෙණ ගන්නට අවශ්‍ය නැත. ඉගෙණ ගන්න කෙනකුට ඉඩදීමට ද කැමති නැත. පන්තියේ කවුරුත් අපේ පැත්ත ගත් නිසා ඈ නිහඬ වූවාය.

පසුව අපි විදුහල්පති තුමා හමුවීමට ගියෙමු. අපි එක වරම එතුමාගේ කාමරයට ඇතුළු නොවී පිටපැත්තේ නතරවී එකිනෙකාගේ මුහුණු බලන්නට වීමු. දැන් ඉතින් බළලාගේ කරේ මිණිගෙඩිය බඳින මීයා කොයි එකාද?

"මහ ලොකුවට වීරයෝ වාගෙ ආවෙ. දැන් ඉතින් ගිහින් කියන්නකො" විනීතා පහත් හඬින් වුවත් ඇණුම් පදයක් මෙන් පවසමින් මගේ මුහුණ බැලුවාය.

මම එවිට සිරිසේනගේ මුහුණ බැලීමි. එය ආයාචනයක් බඳු බැල්මකි. සිරිසේන පෙරමුණ ගත්තේය. ඔහුගේ පිටුපසින් අපිද කාමරයට ඇතුළු වීමු. මගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. අනෙක් අයගේ හදවත් ද එසේම වන්නට ඇති. විදුහල්පතිතුමා පිළිබඳව අප තුළ පැවැත්තේ ගෞරව සම්ප්‍රයුක්ත බියකි.

"ඇයි මේ ළමයි?" විදුහල්පති තුමා මුහුණට ප්‍රශ්නාර්ථය නගාගෙන ඇසුවේය.

අපි කවුරුත් සිරිසේනගේ මුහුණ බැලීමු. එවිට ඔහු බියෙන් බියෙන් මෙන් කටහඬ අවදි කළේය.

"සර් අපේ පන්තියට ඉංග්‍රීසි පීරියඩ් එකක් නැහැ"

"ඔව් මම දන්නවා. ඉතින්?"

"දැන් ඉංග්‍රීසි සර් කෙනෙක් ඇවිත් ඉන්න හින්දා අපටත් ඉගෙණ

For E-Pusthakalaya



ගන්න ලැබුණොත්..........."

"මම හිතන්නෙ ඒකෙන් ඔය ළමයින්ට ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ."

මගේ හදවත කඩා වැටුණාක් මෙන් දැනිණ. අනෙක් අයටත් එසේම දැනෙන්නට ඇත. මැවූ සිහින සියල්ලක්ම අවසානය. මම සිරිසේන දෙස බැලීමි. එහෙත් ඔහු ද නිහඬය. විදුහල්පති තුමා උපැස් යුවළට යටින් අප දෙස බලා සිටියේය. කුමක් වෙතත් තවත් ප්‍රයත්නයක් දැරිය යුතුය. දැන් කතා නොකර පන්තියට ගොස් මොනවා කළත් පලක් නැත. මම බියෙන් බියෙන් කටහඬ අවදි කර ගතිමි.

"සර් අපට ආයෙත් විභාගේ ගන්න උනොත් එතකොට ඉංග්‍රීසිත් විෂයක් වශයෙන් ගන්න පුළුවන් වෙනව. ඒකට දැන්ම තියාම ඉගෙණ ගන්න ලැබුණොත්........"

විදුහල්පති තුමාගේ මුහුණෙහි සිහින් සිනා රැල්ලක් පැතිරිණ.

"මම හිතන්නෙ ඔය ළමයි කවුරුත් වාගෙ මේ වතාවෙ විභාගේ පාස්වෙලා ඇති. ඊට පස්සෙ විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඔය ළමයින්ට ඉංග්‍රීසි විෂය ගන්න බැහැනෙ. ඒකට ඉංග්‍රීසි පොත් කියවලා ලොකු දැනුමක් ඕන. ටික කාලෙකින් ඒ දැනුම කොහෙත්ම ලබා ගන්න බැහැ. මුල ඉඳලම ඉංග්‍රීසි ඉගෙණ ගන්න ළමයින්ට විතරයි ඒක කරන්න පුළුවන් වෙන්නෙ"

"ඒ උනත් සර් අපේ විභාගේ ප්‍රතිඵල පිටවෙනකන් වත් අපට ඉංග්‍රීසි ටිකක් ඉගෙණ ගන්න ලැබුණොත් ඒක අපට ලොකු ප්‍රයෝජනයක් වෙනව" සිරිසේන නැවත ඉදිරිපත් විය.

"ඒක මම පිළිගන්නව. ඒත්. මේ එක ගුරුවරයෙක් කොහොමද මුළු ඉස්කෝලෙම ළමයින්ට උගන්වන්නෙ?"

"ඉස්කෝල වෙලාවෙන් පස්සෙ හරි උගන්වන්න ඒ සර් කැමතියි"

"එයා එහෙම කිව්ද?"

"එහෙමයි"

"හොඳයි, එහෙම නම් මගෙන් කිසිම විරුද්ධත්වයක් නැහැ. මට තේරෙනවා ඔය ළමයින්ට තියෙන උවමනාව. ඒක ඔය ළමයින්ගේ විතරක් නෙවෙයි. අද මුළු රටේම ඉන්න ළමයින්ගේ පොදු අවශ්‍යතාවක්



හොඳයි - මම එයත් එක්ක කතා කරලා එයාට පහසු විදියකට කාල සටහන වෙනස් කරල දෙන්නම්"

මගේ සිත සාතිශය ප්‍රීතියට පත් විය. අපි එතුමාට ස්තුති කොට පන්තියට ආවෙමු.

ඊළඟ දවසේ අපේ කාල සටහන වෙනස් කෙරිණ. ඒ අනුව අපට සතියකට ඉංග්‍රීසි පීරියඩ් තුනක් ලැබී තිබීම ගැන අපි සතුටු වීමු. කෙබඳු තත්ත්වයක් යටතේ වුවත් ඉංග්‍රීසි පාඩම හොඳින් කළ යුතු බව මම අදිටන් කර ගතිමි.

ඉංග්‍රීසි පාඩම සඳහා සේන අයියා මුලින්ම අපේ පන්තියට පැමිණි දවසේ අපි ඉහවහා ගිය සතුටින් පසු වීමු. අප ඔහුගේ පියකරු මුහුණ දෙස බලා සිටියේ ආදරයෙන් හා ගෞරවයෙනි. ඔහු රාජකාරියක් කරන්නකු නොව සේවයක් කරන්නකු වශයෙන් අපි සැළකීමු. ඔහු පළමුවෙන්ම අපේ ඉංග්‍රීසි දැනුම පරීක්ෂා කර බැලුවේය.

"ඔය ළමයි සැහෙන්න ඉංග්‍රීසි දන්න පාට පෙනෙනව. මම හොඳ පොත් දෙකක් නියම කරන්නම්. ඉක්මනට ඉංග්‍රීසි ඉගෙණ ගන්න ඒ පොත් දෙක හොඳයි"

මගේ සිත සතුටින් ඉපිළිණ. පොත් දෙකකින් ඉක්මනට ඉංග්‍රීසි ඉගෙණ ගන්නට පුළුවන්නම් කොච්චර වාසනාවක් ද?

"ඔය ළමයින්ට හොඳ සිංහල දැනුමකුත් තියන හින්දා ඉංග්‍රීසි ව්‍යාකරණ - වචන භාවිතය - උච්චාරණය වාගේ දේවල් පහසුවෙන් ඉගෙණ ගන්න පුළුවනි සමරනායකගේ ප්‍රැක්ටිකල් ඉංග්ලිෂ් කියන පොතෙන්. සාමාන්‍ය කියවීමට හොඳයි තිව් ටේල්ස් ෆ්‍රොම් ෂේක්ස්පියර් කියන පොත. දැනට අපි ඒ පොත් දෙක භාවිතා කරමු" යයි ඔහු යෝජනා කෙළේය.

අපි ඒ පොත් දෙක සටහන්කර ගතිමු. ඉක්මනට ඒ පොත් දෙක ගත යුතු යයි මට සිතිණ. එහෙත් ඒ සමගම අනෙක් ක්ෂණික සිතුවිල්ලකින් මගේ උනන්දුව මැඩුනු ලැබිණ.

ඒ පොත් දෙක කීයක් වෙයිද? කීය උනත් මට නම් ගන්න පුළුවන් කමක් නැහැ. මේ දිනවල තාත්තාගේ අතේ සතේ නැහැ. කුලී වැඩක් සොයා ගන්න තාත්තා මොන තරමක් මහන්සි වෙනවද? තාම තැනක්

For E-Pusthakalaya

නම්බ වුණේ නැහැ. හෙට්ටි වත්තට ගන්නෙත් නැතිවුණු වැඩ කාරයො වැඩියි කියල. අනේ මන්දා. මගෙම අවාසනාව තමයි. කමක් නෑ. ඔහෙ කොහොම හරි කරනවා. කාගෙ කාගෙනුත් ඉල්ලාගෙන පාඩම් කරනවා. තාත්තා ගෙන් නම් මම කියක්වත් ඉල්ලන්නෙ නැහැ. තවත් කරදර කරනකොට තාත්තා කොහේ හරි යාවි යන්න. හැම තිස්සෙම ඉන්නේ කල්පනා කර කර. දැන් දැන් නිතරම කියන්නේ ගමෙන් පිටවෙලා යන කතාව. මොනවා වුණත් තාත්තට නම් කරදර කරන්නෙත් නැහැ. මම අන්තිමට එසේ සිතිමි.

මුලින්ම පොත් දෙක මිලට ගෙන තිබුණේ විනීතාය. මම මහත් ආශාවෙන් ඒවා ඉල්ලාගෙන පෙරළා බැලිමි. සිංහල පොත් මෙන් නොව ඒවායේ මුද්‍රණය ඉතාම ශෝභනය. කවරය ඝනකමය. මැදපු කඩදාසිත් රෙදි බැම්මත් නිසා පොත් ලස්සනය. පෙරළන විට සුවඳක් ද වහනය විය. ඒවා හුඟක් ගණන් ඇතැයි මට සිතිණ. විනීතා ඒවා ගෙන්වා ගෙන තිබුණේ නුවර පොත් සාප්පුවකිනි. ඇගේ පියා නිතර නුවර යන මුදලාලි කෙනෙකි. පොත් දෙක රුපියල් පහළොවකැයි විනීතා පැවසුවාය. මගේ දෙබැම නළලට ගියේය. මා එච්චර මුදලක් කොහේ සොයන්නද? රුපියල් පහළොවක් තියා සත පහළොවක් වත් දැන් අපේ ගේ හරියේ නැතුව ඇතැයි මට සිතිණ.

කෙසේ වෙතත් ඉංග්‍රීසි පාඩම අතපසු නොකරන්නට මම වගබලා ගතිමි. එක දවසක එක ළමයකුගෙන් පොතක් ඉල්ලා ගත්තා මම තවත් දවසක වෙනත් ළමයකුගෙන් පොතක් ඉල්ලා ගතිමි. එසේ ඉල්ලාගෙන ගෙදර ගෙන ආ දවසට මම ඒ පොතෙන් සම්පූර්ණ ප්‍රයෝජනය ගතිමි. විවේක අවස්ථාවල ද මම කාගෙන් හෝ පොතක් ඉල්ලාගෙන පාඩම් කරමි.

එහෙත් සමහර දාට සේන අයියා පන්තියට පැමිණෙන තෙක් ද එදාට නියමිත පාඩම බලා ගන්නට මට නොලැබෙයි. එබඳු දවසට මම සැකයෙන් හා බියෙන් පසුවෙමි. මට පාඩම කියන්නට කීවොත් මම කොහොමද ගොත ගහන්නෙ? මා අදක්ෂයයි ඔහුට සිතා ගන්නට ඉඩදීමට බැරිය.

"අද තියෙන්නෙ ඉංග්‍රීසි භාෂාවද සාහිත්‍යද?" එක් උදයක පන්තියට



පැමිණි ඔහු ඇසුවේය.

"සාහිත්‍ය"

"එහෙනම් සාමා කියවන්න බලන්න පාඩම"

කලබල වූ මම වහාම නැගිට්ටෙමි. මට පොතක් නැත. මා ළඟම සිටි විනීතාගෙන් පොතක් ඉල්ලා ගැනීමට මම උත්සාහ කළෙමි. එහෙත් ප්‍රමාද වූවා වැඩිය. ඔහු මා දෙස බලා සිටියේය.

"ඇයි සාමා අද පොත ගෙනාවෙ නැද්ද?" ඔහු ඇසුවේය.

මම බිම බලා ගතිමි. මා අතේ පොතක් නැත. විනීතාගෙන් පොත ලබාගත නොහැකි විය. මගේ ප්‍රශ්නය වහාම තේරුම් ගත්තේ සිරිසේනය. ඔහු සිටියේ මට ඉස්සරහ පේළියේය. ඔහු පිටුපස හැරී වහාම මට පොත දිගු කෙළේය. එය ඉතා පරණ පොතකි. ඔහු ද එය වෙනත් පාසැලක අඳුනන කාගෙන්දෝ ඉල්ලාගත් පොතකි.

"සාමා" සේන අයියා නැවතත් කතා කළේය.

මම ඉස්සරහ බැලිමි.

"ඇයි පොත ගෙනාවෙ නැත්තෙ?"

එය ගෙනෙන්නට අමතක වුණා යයි මට බොරුවක් කීමට සිතිණ. එහෙත් එවිට මා නොසැලකිලිමත් ළමයෙකැයි ඔහු සිතනු ඇතැයි මට ඒ සමගම නැවත සිතිණ. ඔහු එසේ සිතා ගැනීම මට පාඩුවකි.

"ම් - මට - පොතක් නැහැ" මම හෙමිහිට ගොත ගැසීමි.

ඔහු බණිනු ඇතැයි මට සිතිණ. එහෙත් ඒ වෙනුවට ඔහු නිහඬව මොහොතක් මා දෙස බලා සිටියේය. ඉන් පසු හෙමිහිට මා වෙත පැමිණියේය.

"දෙන්න ඔය පොත සිරිසේනට"

මම එය සිරිසේනට ආපසු දුනිමි.

"ම් - මේ පොත අරගෙන කියවන්න"

ඔහු තමා අතේ තිබූ පොත මා වෙත දිගු කළේය. මම වෙවුලන අතින් එය ගතිමි. ඉන්පසු පාඩම කියවන්නට වීමි. 'ඒ මිඩ්සමර් නයිට්ස් ඩ්‍රීම්' නම් කතාවෙන් පිටු භාගයක් පමණ මම පහසුවෙන් කියවීමි. සේන අයියා මා දෙස බලා සිටියේ මහත් උනන්දුවෙනි.

"ඇති. සාමා පොතක් නැහැයි කීවෙ බොරුවටද? ඔය කදිමට

For E-Pusthakalaya


පාඩම් තියෙන්නෙ" ඔහු සිනා මුසුව පැවසුවේය.

පොතක් නැතත් මගේ උනන්දුව ඔහුට පෙන්විය යුතු යයි මම කල්පනා කෙළෙමි. එවිට ඔහු අප ගැන තවත් උනන්දු වනු ඇත.

"මම පොතක් ඉල්ලාගෙන පාඩම් කළා"

පාඩම අවසානවීමෙන් පසු ඔහුට පොත ආපසු දීමට මම ගියෙමි.

"පොතක් ගන්නකන් පාඩම් කරන්න ඒක තියා ගන්න" ඔහු පැවසුවේය.

මම ඉතාම කෘතඥතා පූර්වකව ඔහුගේ මුහුණ බැලීමි. ඔහු පන්තියෙන් පිටවී ගියේය. ඒ සමගම විනීතා කට හඬ අවදි කළාය.

"දෙන දෙයියෝ ගෙටම ඇවිත් ඇඟට ඇන ඇන දෙනවලු නේද?" යි පවසමින් ඈ සිනාසුණාය.

"මොනවද දෙන්නෙ?" සිරිසේන ඇසුවේය.

"කොයි දේත් මං කියන්නෙ"

ඈ ඇඟටපතට නොදැනී එසේ කියමින් මා දෙස බැලුවාය. එය මට ඇනුම් පදයක් බව ඒ සමගම මට වැටහිණ. එහෙත් මම නිහඬ වීමි. නමුත් විනීතා නිහඬ නුවූවාය.

"අපරාදෙ කියන්න බෑ ඉංග්‍රීසි සර් සාමට හරිම ආදරෙයි"

මම කෝපවීමි.

"මට විතරක් සර්ගෙ විශේෂ ආදරයක් නැහැ. සර් අපි කාටත් එකවාගෙ ආදරෙයි."

"ඒ උනාට ඔයාට වාගෙ අපට සපෝට් නැහැනෙ"

"සාමාට සර් පොත දුන්නෙ එයාට පොතක් නැති හින්දා. විනීතට පොතක් තියෙද්දි සර්ගෙනුත් මොනවටද?" සිරිසේන ඇසුවේය.

"ඒක නෙවෙයි අපි දන්නව"

"මොකක්ද?"

"මොකක් හරි. ඒක සිරිට ඕන නැහැනෙ"

"ඔයා දන්නව කෙහෙම්මල" සිරිසේන වේගයෙන් පැවසුවේය.

"මෙයාටනෙ හිතට අමාරු"

"කාට කිව්වත් ඔයාගෙ කතාවෙ යුක්තියක් නැහැ විනීතා. අනික් කෙනෙකුගෙ අමාරුවක් ඔයාට කවදාවත් තේරෙන්නෙ නැහැ. ඔයාට



එහෙම අත්දැකීමක් නැහැ" සිරිසේන පැවසුවේය.

"විනීතා ඔහොම කතා කරන්න එපා. මම දුප්පත් එක ඇත්ත. ඒත් මටත් නම්බුවක් කියලා එකක් තියෙනවා. සර් මං ගැන අනුකම්පා කරපු එකට පදයක් හදන්න ඔයාට යුතුකමක් නැහැ........" මගේ කටහඬ අතරමග බිඳී මට ඉබේම හැඬිණ.

"විනීතා කතා කරන හැටි හරි නරකයි. සර් ගැන ඔහොම කතා කරන්න පව් නැද්ද? සාමා ඔය කතාව සර්ට කිවොත් සර් ආයින් මේ පන්තියට අඩිය තියන එකක් නැහැ. එතකොට පාඩුව අපටයි" නිර්මලා ද අමනාපයෙන් පැවසුවාය.

සේන අයියා මා සමග කතාබස් කරන විට - මට අනුකම්පා කරන විට - විනීතාට ඉරිසියා සිතෙන්නේ ඔහු පිළිබඳව ඇගේ යටි හිතෙහි නොමනා අදහසක් ඇති නිසා නොවේදැයි මට සිතිණ. ඈ එවැන්නියකි. ඇයට සිතන්නට වෙන දෙයක් නැත. ඇත්තේ පිරිමියකු ගැන සිතීම පමණකි. වෙන මොනවායින් අඩුවක්ද?

හොඳයි මාත් බලා ගන්නම්කො. පුළුවන් තරම් මාත් සේන අයියට හිතවත්ව ඉන්නවා. එතකොට තමයි විනීතගෙ හිතට තවත් අමාරු. එහෙම අයට එහෙම නොකර බැහැ. මම එසේ සිතිමි.

For E-Pusthakalaya

# 5.

**සේ**න අයියාගෙන් ලැබුණ ඉංග්‍රීසි පොත මට මහාර්ඝ වස්තුවක් බඳු විය. එසේම ඔහු සිහිපත් කරන විට මගේ සිතට දැනුණේ ගෞරවාන්විත සිතුවිලි සමුදායකි. ඒ සිතුවිලි වලින් මගේ සිත කිසියම් නුහුරු නුපුරුදු සුවදායක වින්දනයක් ද ලැබුවේය.

රාත්‍රියේ කුප්පි ලාම්පුව දල්වාගත් මම මහත් ආශාවෙන් ඉංග්‍රීසි පොත පෙරළා ගතිමි. අම්මාත් තාත්තාත් ඉස්තෝප්පුවේ කතා කරමින පසුවූහ.

"රාලහාමිලා අද ට්‍රැක්ටර් එකකුත් ගෙනල්ලා. රුපියල් පහළොස් දාහක්ලු" තාත්තා පැවසුවේය.

"මගෙ අම්මේ එච්චර සල්ලි කන්දරාවක් දීලා?" අම්මා මවිතය හඟවන ස්වරයෙන් ඇසුවාය.

"ඔව්. උන්ට සල්ලි වැහි වැහැලා. හේරත් බණ්ඩෙටත් රාලහාමි කීවලු ලබන කන්නෙ ඉඳලා වෙන කාගෙහරි කුඹුරක් අල්ලා ගන්න කියල"

"ඉතින් ඔච්චර සල්ලි කන්දරාවක් යටකරලා ට්‍රැක්ටර් ගෙනල්ලා ගොයිරාලලාගෙන් කුඹුරු කඩන එකෙන් පලක් තියෙනවද?"

"ඇයි නැත්තෙ? රාලහාමිලාට බය තියෙන්නෙ කුඹුරු ටික ගොයිරාලලාට අයිතිවෙයි කියල. ඒවා බේරගන්න කීයක් වියදම් ගියත් උන් ලෝබ නැහැ."

"ඉතින් ගොයිරාලලාට එහෙම අයිති වෙනවලුද?"

"එහෙමලු කියල කියන්නෙ. හේරත් බණ්ඩෙ කවුද එක්ක කියලා තියෙනවා පෙත්සමක් ආන්ඩ ඕන කියල. ඒක සබාපති මහත්තයට ආරංචිවෙලා හේරත් බණ්ඩෙට කීවලු හොඳයි කරලා බලමුකො කියල"

"අනේ මන්දා අපි මොනවා කරන්නද කියල"



ඉන්පසු සෑහෙන වේලාවකට අම්මාගේත් තාත්තාගේත් කටහඬවල් නො ඇසිණ. මම පොත පෙරළාගෙන කන්දී සිටින්නට වීමි. පොත කෙරෙහි අවධානය යොමු කර ගැනීම මට අසීරු විය. ජීවත් වන්නේ කොහොමද යන ප්‍රශ්නයෙන් අපේ ජීවිත හෙම්බත්ව තිබියදී මා පාඩම් කරන්නේ කොහොමද?

"රාලහාමියි සබාපති මහත්තයයි ඔය තරම් නපුරු උනාට මොකද අර බාල ළමයගෙ නම් එහෙම ගතියක් නැහැ. සාමට ඉංග්‍රීසි පොතක් නැති හින්දා ඒ ළමයා පොතකුත් දීලා තියෙනවා" අම්මා පැවසුවාය.

"ඇත්තද? මහ එවුන් දන්නවා නම් නහියි" තාත්තා පැවසුවේය.

"සාමට කියල තියෙනවා හොඳට මහන්සිවෙලා ඉගෙණ ගන්න කියල. ඒ ළමයත් පුළුවන් උදව්වක් කරන්නම් කීවලු"

"එහෙනම් ඒ ළමයට මහ එවුන්ගෙ ගතිගුණ පිහිටන්න නැතුව ඇත්තෙ පුංචිකාලෙ ඉඳලම ගෙදරින් පිටවෙලා හිටිය හින්දා වෙන්න ඇති." තාත්තා පැවසුවේය.

ඉන්පසු යළිත් ඔවුහු නිහඬ වූහ. සේන අයියා පිළිබඳව ඔවුන් තුළ එබඳු පැහැදීමක් තිබීම මට සතුටක් විය.

"රත්තිවත් විකුණලා ආමුද කියල මම මේ කල්පනා කෙරුවෙ" සෑහෙන වේලාවකට පසු තාත්තාගේ කටහඬ ඇසිණ.

"අනේ ඒක කරලා කොහොමද? උදේට මේ ළමයින්ට කිරිටිකත් නැතුව ගියාම.........."

"අනේ කීයක්වත් නැතුව පාරට බහින්න විදියක් නැහෙ. ගමේ ඉඳල හරියන්නෙ නැහැ. කොහේ හරි ගිහින් රස්සාවක් හොයාගන්න ඕන......."

"ඒකට නම් මම කොහෙත්ම කැමති නැහැ. මේ ළමිස්සියකුත් ගෙදර තියාගෙන මම කොහොමද තනියම............"

"ගියයි කියල මම එහෙ පදිංචි වෙන්න යනවා නෙවෙයිනෙ. දෙයියනේ කියල ඔය වත්තක මුරකාරකමක්වත් හරිගියොත් ළමයිනුත් එක්ක අපට එහෙ යන්න බැරියැ. මට දැන් මේ ගම තිත්තවෙලා තියෙන්නෙ.........."

"අනේ මන්දා........."

For E-Pusthakalaya


මගේ සිතට විශාල බියක් දැනෙන්නට විය. තාත්තා නැතිව මේ ගෙදර අප සිටින්නේ කෙසේදැයි මට සිතාගත නොහැකි විය. තාත්තා ගමේ රඳවා ගැනීමට කළ යුත්තේ කුමක්ද? මෙතෙක් වැඩ කළ කුඹුර ආපසු ලබා ගන්නට හැකි වුණොත් නම් බාගෙ වෙලාවට තාත්තා ගමේ නවතිනු ඇතැයි මට සිතිණ. එය ලබා ගන්නේ කොහොමද? මම සේන අයියාටවත් බැගෑපත්වෙලා මේ ගැන කියන්නද? ඔහු කියන දෙයක් රාලහාමි මාමා අහන්න පුළුවනි. මට එසේ සිතිණ.

"කෝ දුව?" තාත්තා අසනු ඇසිණ.

"පාඩම් කරනවා" අම්මා පැවසුවාය.

"එහෙනම් සද්ද කරන්නෙ නැතුව දැන් ඉතින් නිදාගන්න."

තාත්තා පිළිබඳව මට විශාල ශෝකයක් දැනිණ. ඔහු මේ තරම් විශාල ප්‍රශ්න ගොඩකට මැදිව සිටියදිත් මගේ පාඩම ගැන කල්පනාකරයි. ඔහු මා ගැන තබාගෙන සිටින්නේ විශාල බලාපොරොත්තු නොවේද? මා දොස්තර වරියක හෝ අධිනීතිඥ වරියක කිරීමට ඔහු බලාපොරොත්තු නොවෙයි. ගුරුවරියක හෝ හෙදියක කරවීමට ලැබුණොත් එය ඔහුට හොඳටම ප්‍රමාණවත්ය. ඒවා වුවත් ඔහුගේ තත්වයේ හැටියට කෙතරම් විශාල බලාපොරොත්තුද?

තාත්තා නිදාගන්නට බුරු ඇඳ ගසාදමන හඬ ඇසිණ. අම්මාගේ ශබ්දයක් නොවීය. ඇයද බුරු ඇඳ පාමුලින් පැදුර එළා ගන්නට ඇති.

මම අත් සියල්ල අමතක කොට පාඩම් කරන්නට උත්සාහ කෙළෙමි. එහෙත් තාත්තාගේ මුහුණ මගේ මනසින් බැහැර නොවෙයි. ඔහු කෙසේ හෝ ගෙදර නවත්වා ගත යුතුයි. ඒ සමගම මට ඉංග්‍රීසි පොතේ අකුරු අතරින් සේන අයියාගේ දයාබර මුහුණ පෙනෙන්නට විය. අනේ සේන අයියේ මට පිහිට වෙන්න. මගේ සිත එසේ කන්නලව් කරන්නට විය. නිතරම සිනාවෙන් පිරුණු ඔහුගේ පිත්බර මුහුණ මා දෙස බලා සිටින්නට විය. මොන තරම් සිරියාවන්ත මුහුණක්ද? ඒ මුහුණ මගේ සිතට සහනයක් දනවන්නට විය.

ඔහු පිළිබඳ ගෞරවය හා භක්තිය මුසු ආදරයකින් මගේ සිත මහත් සුන්දරයක වින්දනයක ගිලෙන්න විය. ඒ වින්දනයෙන් යුතුව මම



පාඩම් කරන්නට වීමි. පොතෙන් වහනය වන කිසියම් මිහිරි සුවඳක් මගේ නාසයට දැනිණ. මම මහත් ආදරයෙන් පොත සිඹ බැලීමි. එය අලුත් පොත් වලින් වහනය වන නැවුම් සුවඳයි.

මම බොහෝ වෙලාවක් පාඩම් කළෙමි. එහෙත් පොත අතින් තැබීමට මට නොසිතිණ. මම නියමිත පාඩමෙන් ඔබ්බටද පිටු කීපයක් පෙරළා බැලීමි. රෝමියෝ සහ ජූලියට් නම් කතාවද එහි ඇති බව මට පෙනිණ. එය රසවත් ප්‍රේම කතාවක් බව මම අසා ඇත්තෙමි. එහෙත් ඒ කතාව කුමක්දැයි මම නොදැන සිටියෙමි. එය කියවා බැලීමට මා තුළ උපන්නේ විශාල ආශාවකි. මම ඒ ආශාවෙන් යුතුව එහි මුල් කොටස කියවීමට උත්සාහ කෙළෙමි. එහෙත් මට එය කියවා තේරුම් ගැනීම අපහසු විය. මා නොදන්නා වචන ගණන දන්නා වචන ගණනට වැඩි තරම් විය.

සේන අයියාගෙන් ඒ කතාව අසා දැන ගැනීමට මම කල්පනා කෙළෙමි. එයා පාඩම ලස්සනට තේරුම් කරලා දෙනවා. අහගෙන ඉන්න ආසයි. ඉංග්‍රීසි දන්නව නම් කොච්චර පොත් කියවන්න පුළුවන්ද? ඒක විශ්ව සාහිත්‍යයට පිවිසෙන දොරටුව. මටත් හොඳට ඉංග්‍රීසි ඉගෙනගෙන හොඳ ලේඛකයින්ගේ උසස් සාහිත්‍ය කෘති කියවන්න පුළුවන් උනොත්. හොඳට ඉංග්‍රීසි ඉගෙනගන්න ඕන. නිතැතින්ම මට එසේ සිතිණ.

මම පොත වසා මගේ පොත් ගොඩ මත තබා නැගිට්ටෙමි. නිදා ගන්නට පෙර දොරවල් හොඳින් වසා ඇද්දැයි බැලීම මගේ පුරුද්දකි. එය කවදා කෙසේ පුරුදු වූවාදැයි මම නොදනිමි. සාලයේ ඉස්තෝප්පුවට පිවිසෙන දොරත් කුස්සියේ දොරත් හොඳින් වසා ඇද්දැයි මම සෑම රැයකම බලමි. ගෙදර කවදත් අන්තිමට නින්දට යන්නේ මාය.

කුප්පි ලාම්පුවත් රැගෙන මම සාලයට ආවෙමි. සියල්ල නිහඬව තිබිණ. තාත්තා බිත්තිය අයිනට වෙන්නට බුරු ඇඳ තබාගෙන නිදා සිටියේය. ඔහුට නින්දගොස් තිබිණ. නින්දේදී පවා ඔහුගේ මුහුණ අධික වෙහෙසට පත්ව පෙනිණ. එය ජීවිතයේ දුකෙන් දුක් සහිතයෙන වේදනා විඳින්නෙකුගේ මුහුණකි. තාත්තාට ඇති එකම සුවය නින්ද

For E-Pusthakalaya

පමණකි. තාත්තා හොඳින් නිදාගන්නාවේ. ඔහු අවදිවන සුළු ශබ්දයක් පවා කිරීම පාපයකි. මම එසේ සිතිමි.

අම්මා බුරු ඇඳ පාමුල පැදුරක් එලාගෙන වැතිර සිටියාය. ඇයට ද නින්ද ගොස් තිබිණි. මම ඇගේ මුහුණ දෙස බලා සිටින්නට වීමි. අම්මා දැන් වයසට වඩා වැහැරී ගොස් සිටින්නී යයි මට සිතිණි. අම්මට මොකක්ද තියෙන සැපේ? මල්ලීත් අම්මාට තුරුලුවී නිදා සිටියේය. ඔහුගේ දණහිස් සහ වැලමිටිවල කොස්කටු බඳු ගොරෝසු බිබිලි වගයක් මතුවී තිබිණ. එය ඔහු මන්දපෝෂණයෙන් පෙළෙන බවට ලකුණකි.

නින්ද ගොස් සිටි ඔවුන් තිදෙනා දෙස මම නිශ්ශබ්දව බලා සිටින්නට වීමි. මගේ සිත තුළ ඇති වන්නට වූයේ අප්‍රමාණ ශෝකයකි.

මම ඕනෑම දස දුකක් විඳලා හරි ඉගෙණ ගන්නම. ඊට පස්සෙ මේ හැම කෙනෙක්ම සැපවත් කරන්නම. මම ඉගෙණ ගන්න මහන්සි වෙන්නෙ මට විතරක් සැප විඳින්න නෙවෙයි. මේ හැම දෙනාම ජීවත් කරන්න.

මම කාමරයට පැමිණ පැදුරේ ඇලවීමි. හෙට පාන්දරම නැගිටලා ඉස්කෝලෙ යන්න ඕන. වෙනදා යන බස් එකේ ගිහින් මදි. කල්තියා ඒකේ ගියාම කලින් එන ළමයෙකුගෙන් අනිත් ඉංග්‍රීසි පොතත් ඉල්ලාගෙන ටිකක් පාඩම් කරන්න පුළුවනි. ඒ පොත තමයි වැඩිය හොඳට ඉගෙණ ගන්න ඕන. සේන අයියා පස්සෙ බස් එකේ ආවාවෙ. හැමදාම එයත් එක්ක යනවා එනවා දකිනකොට අනිත් අයගෙ හිත් හොඳ නැහැ. මොනවටද බොරුවට පදයක් හදාගන්නෙ. මම සේන අයියගෙ නමට තරකක් නොවෙන විදියට හැසිරෙන්න වගබලා ගන්න ඕන.

එබඳු නොයෙකුත් දේවල් ගැන් සිතමින් සිටි මට නින්ද ගියේ බොහෝ වේලාවකට පසුවය.

පසුවදා පාසැලේදී සේන අයියා මුණගැසුණු නමුත් දන්ගහ පැලැස්ස ගැන ඔහුත් සමග කතාකිරීමට අවශ්‍ය ධෛර්ය උපදවා ගැනීමට මම අසමත්විමි. සවස අප පාසැල් ඇරී ආපසු ආවේත් එකම බස්රියේය. අප දෙදෙනා වාඩිවී සිටියේද එකම අසුනෙහි



වුවත් මට කුඹුර ගැන කතා කළ නොහැකි විය. අපේ පවුලේ කරදර ගැන මං ඔහුට කරදර කළ යුතුද? අපේ ඉගෙණීමේ කටයුතු ගැන වෙහෙසෙන ඔහුට පවුලේ ප්‍රශ්න ගැනත් කරදර නොකළ යුතුය. මම එසේ සිතිමි.

එහෙත් ගෙදර පැමිණි මට ඒ අදහස යළිත් වෙනස් කර ගැනීමට සිදුවිය. මා එන විට ද අම්මා පසුවූයේ හඬමිනි. රත්තිගේ මඩුව හිස්ව තිබිණ. මට කාරණය වහා අවබෝධ විය. ඒ සමගම මගේ පපුව දැවීගෙන ගියේය. රත්තී අප සමග සිටියේ අපේම ගෙදර කෙනෙකු මෙන් නොවේද?

තාත්තා අනිද්දාට ගමෙන් පිටවී යාමට අදහස්කර සිටින බව අම්මා කිවාය. මෙය යන්නෙ කොහේදැයි නිශ්චිතව අරමුණක් ඇතිව යන ගමනක් නොවේ. ඉබාගාතේ යාමකි. හිස හැරුණ අතේ යන මේ ගමනින් තාත්තා වළක්වා ගන්නේ කෙසේද? මේ ගැන සේන අයියා සමග කතා නොකිරීමෙන් මා කෙළේ මෝඩකමකැයි මට සිතිණ.

සවස මා මිදුලට වී කල්පනාකරමින් සිටියදී සේන අයියා දෙවැට දිගේ යනු පෙනිණ. ඒ වෙලාවට ඔහු යන්නේ නෑම සඳහා ඇල්ලටය. ඔහු නොපෙනී ගිය පසු මමද මල්ලීත් සමග නාන්නට යාමට පිටත වුණෙමි.

ඇල්ල ළඟදී වුවද සේන අයියාත් සමග මේ ගැන කතා කිරීම මට මහත් අපහසුවක් විය. මම මහත් දෙගිඩියාවෙන් පසුවීමි. එය සේන අයියා අවබෝධ කරගන්නට ඇත. මම දිය රෙද්ද හැඳගෙන කොණ්ඩය කඩා දමා ගෙන වතුරට දෙපා දමා ගලමත වාඩිවී සිටියදී සේන අයියා මා දෙස බලා සිටියේය.

"මොකද සාමා අද අඬලා වාගෙ?" ඔහු ඇසුවේය.

මම කතා නොකර මුහුණ පහත්කරගෙන, ගල් අතරින් ඇදී යන වතුර පාර දෙස බලා සිටින්නට වීමි. මගේ පිළිතුර බලාපොරොත්තුවෙන් සිටි ඔහු ඉන්පසු මල්ලී ඇමතුවේය.

"ඇයි නිමල් අද අක්කා අඬලා?"

එහෙත් නිමල්ද කතා නොකෙළේය.

"සාමා"

මම මුහුණ ඔසවා ඔහු දෙස බැලීමි. එවිට මගේ දෑස කඳුලින් තෙත්ව තිබිණ.

"සේන අයියාගෙන් මට උපකාරයක් ඉල්ලාගන්න වෙලා තියෙනවා" යි ළිත් මම බිම බලා ගනිමින් පැවසීමි.

"මොකක්ද?"

"මම මේක ගැන සේන අයියට කරදර කරන්න වටින්නෙ නැහැ. නමුත් වෙන කරන්න දෙයක් නැතිම තැනයි කියන්න හිතාගත්තෙ. බාගවෙලාවට අයියට පුළුවන් වෙයි අපට මේ උදව්ව කරන්න."

"මොකක්ද?"

"රාලහාමි මාමට කියල දන්ගහ පැලැස්ස වැඩකරන්න අපට ඉල්ලල දෙන්න"

බොහෝ වේලාවක් යනතුරු සේන අයියා කිසිවක් කතා නොකළේය. ඒ නිසා මම මුහුණ ඔසවා ඔහු දෙස බැලීමි. ඔහු ඉතා ශෝකයෙන් මා දෙස බලා සිටියේය.

"මට දැන් ගෙදර ඉදිල්ල එපාවෙලා තියෙන්නෙ සාමා"

"ඇයි?"

"තාත්තගෙයි අයියගෙයි වැඩ කටයුතු කිසිම දෙයක් මට අල්ලන්නෙ නැහැ. ට්‍රැක්ටරයක් ගෙනාවට පස්සෙ මටත් ඔය කතාව ආරංචි උනා. පරම්පරාගාණක් ඒ අයගෙ කුඹුරු අඳේට වැඩ කරපු අයට අත්වෙන ඉරණම ගැන තාත්තටවත් අයියටවත් කිසිම කැක්කුමක් නැහැ. ඒ අයගෙ එකම වීරිය තව තවත් ඉඩකඩම් කොටුකර ගන්න එක....... හොඳයි සාමා මේ ගැන දුක් වෙන්න එපා. මම කොහොමහරි තාත්තට කියල මේක කරලා දෙන්න බලන්නම්......"

"පින් සිද්ධ වෙයි අයියෙ. නැත්නම් අපට සිද්ධ වෙන්නේ තාත්ත නැතුව යන එක. තාත්තා හිතාගෙන ඉන්නෙ ගම ඇරලා යන්න......" මට ඉබේම හැඬිණ.

සේන අයියා බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියේය. ඇත්ත වශයෙන්ම ඔහු පසු වූයේ මහත් ශෝකයෙනි. ලොකු අයත් ඔහු වැනි නම් කොපමණ හොඳදැයි මට කල්පනා විය.

"අනේ අයියේ අදම මේක ගැන රාලහාමි මාමාත් එක්ක කතා



කරලා මෙට උඳේට මට කියන්න. තාත්තා යන්න හිතාගෙන ඉන්නෙ අනිද්දට........"

"කොහෙද රන්බණ්ඩෙ මාමා යන්න හිතාගෙන ඉන්නෙ?"

"තැනක් නෑ. ඔළුව හැරුණ අතේ යාවි. ඒකයි මට දුක"

ඔහු ශෝකයෙන් මා දෙස බලා සිටියේය.

පසුවදා උදේ මං පාසැල් යන්නට පාරට එන විට සේන අයියා පාරට පැමිණ සිටියේය. ඔහු සුපුරුදු පරිදි මා සමග සිනාසෙන්නට උත්සාහ කළේය. එහෙත් ඒ සිනාවෙන් මතුවූයේ සතුට නොව ශෝකයයි. ඔහුගේ ප්‍රයත්නයෙන් ද පලක්වී නැතැයි ඒ සමගම මට සිතිණ. මගේ හදවත දැවී ගියේය.

"අර කාරණේ ගැන රාලහාමි මාමාට කතා කළාද අයියෙ?"

එහෙත් ඔහු එයට පිළිතුරු නොදී සෑහෙන වේලාවක් බලා සිටියේය.

"මම කතා කළා සාමා. ඒත් එකෙන් වැඩක් වෙන්නෙ නැහැ. එහෙම නෙමෙයි මම වෙන වැඩක් කියන්නම්."

"මොකක්ද?"

"මම හොඳ පෙත්සමක් ලියල දෙන්නම්. මාමට කියන්න කුඹුරු අහිමි වෙච්ච අනිත් අයටත් කියල ඒක අත්සන් කරවා ගෙන මට ආපහු ගෙනැවිත් දෙන්න කියලා. ඉතුරු හරිය මම බලා ගන්නම්. තාත්තයි අයියයි විතරක් නොවෙයි ගමේ අනිත් මිනිස්සුත් ජීවත් වෙන්න ඕන. ඒ අය ගම රට ඇරලා කොහෙ යන්නද?"

"අනේ අයියෙ......." මට ඉබේම පැවසිණ.

"ඇයි?"

"අයියා කොහොමද ගෙදර ඉඳගෙන ගෙදර අයටම විරුද්ධව වැඩ කරන්නෙ?"

"ඒකට කමක් නෑ. මම කරන්න යන්නේ මගේ හිතට එකඟව සාධාරණ දෙයක්"

"ඒත් අයියා හිතනවද ඊට පස්සේ ඒ මිනිස්සුන්ට මේ ගමේ යහතින් ඉන්න ලැබෙයි කියල?"

"ඇයි?"

"රාලහාමි මාමායි සභාපති අයියයි හිතු දේ කරන අය. ඒක හින්දා

මිනිස්සු පෙන්සම් දෙන්න බයයි"

"ඒ බය නැතුව යනතුරු කවදාවත් ඒ මිනිස්සුන්ට හරි යයි කියල සාමා හිතනවද?"

එය ඇත්තකි. එහෙත් අසාධාරණයට විරුද්ධව හිස ඔසවා සිටීමට ඔවුන් සංවිධානයවී නැත.

"එහෙම අසාධාරණයට විරුද්ධව සටන් කරන්න ඒ අය සංවිධානය වෙලා නැහැ අයියෙ"

"එහෙනම් අපට තියෙන්නෙ ඒ අය සංවිධානය කරන එකයි"

එය කරන්නට ලැබුණොත් කෙතරම් උදාර දෙයක්දැයි මට සිතිණ. ඒ සමගම මට සේන අයියා පිළිබඳව ඇති වූයේ අනුපමේය භක්තියකි. ඔහුට කිසිවකින් අඩුවක් නැත. තම පන්තියේ අය සමග එක්ව ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඒ පන්තියේ මුර බල්ලකු වීම ඔහුට වාසියකි. එහෙත් එයට සිත් නොදෙන සානුකම්පික හදවතක් ඔහුට ඇත. තමා අයත්වන පන්තිය ගැන නොතකා ඔහු අපේ පන්තියේ අයිති වාසිකම් ගැන සිතන්නේ ඒ නිසා නොවේද?

එහෙත් තාත්තා එබඳු එඩිතර සටනකට පොළඹවා ගත නොහැකි බව මම දැන සිටියෙමි. ඔහු එයට අකැමති වන්නේ තමුන්ගේ පණට ඇති භය නිසා නොව අපේ ආරක්ෂාවට හානියක් නොවනු පිණිසය. තම ආරක්ෂාව වත් සලසානොගෙන මිනිසුන්ට තනි තනිව මේ සටන කළ නොහැක. ඔවුන් එකාවන්ව සංවිධානය වුවහොත් එය කෙතරම් ප්‍රබල ශක්තියක් වනු ඇද්ද? ඒ ශක්තිය පරාජය කිරීමට අතලොස්සක් දෙනකුට නුපුළුවන් වන්නේය.

"අයියා හිතනවද අපේ තාත්තලා වාගේ නූගත් ගොවියන් සංවිධානය කරන්න පුළුවන් වෙයි කියල?"

"අමාරුයි. නමුත් බැරි දෙයක් නොවෙයි. ඒ අය පරම්පරා ගණන් ලොකු මිනිස්සුන්ට ගැතිවෙලා හිටිය නිසයි ඒක අමාරු. නමුත් අපි උත්සාහ කළොත් ඒ අයට නියම අවබෝධයක් දෙන්න අපට බැරිවෙන්නෙ නැහැ"

"හොඳයි - සේන අයියා සූදානම්ද මේ ගම් පළාතේ එහෙම දෙයක් කරන්න?"



"ඇයි නැත්තේ? ඒ අවබෝධය මට ඇති වුණේ මම ආනන්දේ ඉගෙණ ගනිද්දි. මාත් එක්ක මගෙම පන්තියේ ඉගෙණගත්ත සමහර ළමයි ඉගෙණ ගත්ත විත්දේ මොන දුකක්ද? සමහර අයගෙ ගෙවල්වලටත් මම ගිහින් තියෙනවා. ඒ අයට කන්න නෑ. අඳින්න නෑ. ඉන්න හිටින්න ගෙයක් දොරක් නෑ. දහජරා මුඩුක්කුවල ජීවත්වෙන්නෙ. දවස් ගණන් කන්න නැතුව පන්තියෙදී කලන්තෙ හැදිල වැටිච්ච ළමයි මාත් එක්ක ඉගෙණගෙන තියෙනවා. එහෙම වෙලාවල්වල තමයි මට අපේ තාත්තලා වාගෙ මිනිස්සු ගැන මුලින්ම කේන්තියක් ඇනුණෙ........."

මම අප්‍රමාණ භක්තියෙන් ඔහුගේ මුහුණ දෙස බලා සිටින්නට වීමි. ඔහුගේ සානුකම්පික හදවත හමුවෙහි මගේ දෑස කඳුලින් තෙත් විය. මා විඳින්නේ දුකක් නොවේ. මටත් වඩා අනන්ත අපා දුක් විඳින මගේම සහෝදර සහෝදරියන් තව කී ලක්ෂයක් මේ රටේ ඇද්ද? ඔවුන් වෙනුවෙන් කළ හැකි මෙහෙයක් මට නැද්ද?

For E-Pusthakalaya

# 6.

එළිය වැටිගෙන එද්දී අම්මා මාව අවදි කළාය.

"දුවේ නැගිටින්න. අන්න තාත්තා යන්න ලෑස්ති වෙලා දුවට කතා කරනවා"යි අම්මා හෙමිහිට පැවසුවාය.

මම කලබලයෙන් නැගිට්ටෙමි. අම්මා රෙදි පොටින් කඳුළු පිස දමමින් සිටියාය. මම ඇයත් සමග ඉස්තෝප්පුවට ආවෙමි. තාත්තා ඉස්තෝප්පුවේ වාඩිවී සිටියේය. සරමත් බැනියමත් ඇඳ තුවායක් කරේ දමාගෙන සිටි ඔහු බලා සිටියේ තවමත් මිදුලේ ඇති අඳුර දෙසය. ඔහුගේ පසෙකින් කඩදාසියක එතූ පාර්සලයක් ද විය. එහි ඇඳුම් වියයුතු බව මම සිතිමි.

තාත්තා හෙමිහිට හිස හරවා මා දෙස බැලුවේය. ඒ සමගම මගේ හදවත එකවර විලාප දී හඬා වැලපිණ. ඔහුගේ දෙපා බදාගෙන කෑගසා හඬන්නට මට සිතිණ. එහෙත් මම සිත දැඩිකර ගන්නට උත්සාහ කෙළෙමි.

"දුවේ මම. ගිහින් එන්නම්. කොහෙත් හරි රස්සාවක් සොයා ගත්තු හැටියෙ මම ලියුමක් එවන්නම්කො. මල්ලිත් බලාගෙන පරිස්සම් වෙලා ඉන්න." තාත්තා බිඳුණු ස්වරයෙන් හෙමිහිට පැවසුවේය.

කොතෙක් සිත දැඩිකර ගන්නට උත්සාහ කළත් මට එකවර හැඬිණ. මම දුවැවිත් තාත්තා ඉදිරිපිට දණගසා ඔහුගේ දෙපා අල්ලා වැත්දෙමි. ඔහු මෙසේ ගමෙන් පිටවී ගොස් අතට අසුවන ඕනෑම දෙයක් කරන්නට යාමට පෙළඹුණේ අපව ජීවත් කරවීම සඳහා නොවේද? තාත්තා මගේ හිස අතගා ආශිර්වාද කෙළේය. මම දෝතින් මුහුණ වසාගෙන නැගිට්ටෙමි.

"අඬන්න එපා මගෙ රත්තරන් දුව. මගෙ දුව තවත් හොඳට මහන්සිවෙලා ඉගෙණ ගන්නකො. අපටත් යන කලක් ඒවි."



තාත්තා නැගිට පාර්සලය අතට ගත්තේය. මොහොතක් අම්මාගේ මුහුණ දෙස බලා සිට හෙමිහිට මිදුලට බැස්සේය. අම්මාගේ දෙකොපුල් දිගේ කඳුළු වැගිරිණ. තාත්තා කඩුල්ලෙන් පැන අඳුරේ නොපෙනී යන තෙක්ම අපි කඳුළු අතරින් බලා සිටියෙමු.

"තාත්තා පාන්දරම ගියා පුතේ" මල්ලී පාසැල් යාමට සූදානම් වෙද්දී අම්මා හෙමිහිට පැවසුවාය.

එවිට ඒ අහිංසකයා බිය වූවාක් බඳු ඇසින් මොහොතක් වෙලා අම්මාගේ මුහුණ බලා සිට නිහඬව මගේ මුහුණ බැලුවේය. මම බිම බලා ගතිමි. මල්ලී බොහෝ වේලාවක් මිදුල දෙස බලා සිටියේය. එහෙත් මා හෝ අම්මා මෙන් ඔහු නොහැඬුවේය.

මට පාසැල් යාම සඳහා වෙනදා තිබු උනන්දුව එදා නොවීය. එහෙත් මම සූදානම් වී හෙමිහිට පාරට ආවෙමි.

මා එන විට සේන අයියා පාරේ බලා සිටියේය. මට කෙළින්ම ඔහුගේ මුහුණ දෙස බැලීම අපහසු විය. මම ඔහුගෙන් මුහුණ සඟවා ගන්නට උත්සාහ කෙළෙමි. එහෙත් ඔහු මගේ අපහසුව තේරුම් ගන්නට ඇත. ඔහු නිහඬව මා දෙස බලා සිට හෙමිහිට කතා කෙළේය.

"සාමා පාන්දරම අඬලා නේද?"

මම කතා නොකර බිම බලාගෙන පසුවන්නට වීමි.

"සාමා ඇයි මේ?"

"තාත්තා පාන්දරම ගමෙන් පිටවෙලා ගියා සේන අයියෙ" මම බිම බලාගෙන හෙමිහිට පැවසීමි.

ඒ සමගම මට හැඬිණ. මම ලේන්සුව දෙනෙතට තදකර ගතිමි. සේන අයියා ද බොහෝ වේලාවක් ගත වන තුරු නිහඬව පසුවිය.

"අඬන්න එපා සාමා. මාමා ගෙදර නැහැයි කියලා ඔයා බය වෙන්න ඕන නැහැ. ඕනම දෙයක් ගැන මට කියන්න ලැජ්ජාවෙන්න එපා. අපි කොහොම හරි අපේ කටයුතු කර ගන්න බලමු" ඔහු ශෝකී ස්වරයෙන් හෙමිහිට පැවසුවේය.

එය මගේ අසරණ දුක්බර සිතට මොන තරම් අස්වැසිල්ලක් වීද? මට ඔහුගේ වචනය විශ්වාස කළ හැක. මම අප්‍රමාණ භක්තියෙන් හෙමිහිට මුහුණ ඔසවා ඔහු දෙස බැලීමි. ඔහු මහත් අනුකම්පාවෙන්

For E-Pustakalaya

හා ආදරයෙන් මා දෙස බලා සිටියේය.

රත්ති විකුණා ලබාගත් මුදලින් තාත්තා ගෙන ගොස් තිබුණේ මග වියදම සඳහා රුපියල් දහයක් පමණකි. ඉතිරි මුදල් සියල්ලම අම්මාට දී ගොස් තිබුණි.

අම්මාගේ දවස් ගත වන්නට වූයේ හැඬූ කඳුලිනි. ගෙදර මහත් මුසල පාටවක් දරන්නට විය. පාසැල් ඇරී එන මම මුලින්ම සොයා බලන්නේ තාත්තාගෙන් ලිපියක් ලැබී තිබේද යන්නය. එහෙත් අපට ලිපියක් ලැබුණේ සතියකට පසුවය. තාත්තාට රත්නපුරේ මැණික් පතලක කුලී වැඩක් ලැබුණ බව එහි සඳහන් විය. පඩිය ලැබුණ විහාම මුදල් ටිකක් එවන බවද එහි සඳහන්කර තිබිණ.

"අනේ එයාට කවදාවත් පතල් වැඩ පුරුදු නැහැ"යි. පවසමින් අම්මා හැඬුවාය.

"අනේ දෙයියනේ අපි හින්දා අපේ තාත්තා විඳින දුකක්" යයි මට ඉබේම පැවසිණ.

පරිස්සමින් ජීවත්විය යුතු බවත් අපට සියලුම දෙවියන්ගේ පිහිට පතන බවත් තාත්තාගේ ලිපියේ අන්තිමට සඳහන් විය. මම පහුවදාම තාත්තාට ලිපියක් තැපැල් කළෙමි. අපේ දුක් වේදනා ගැන කිසිවක් සඳහන් නොකිරීමට මම වගබලා ගතිමි. අනුන්ට මැණික් ඉල්ලම් ගොඩ ඇඹීම සඳහා වෙහෙසෙන ඔහුට තවත් සිත් වේදනා අත්කර දිය යුතුද? සේන අයියා දැන් අපට හොඳින් ඉංග්‍රීසි උගන්වන බවත් එය මතුවට විශාල ප්‍රයෝජනයක් වන බවත් මම සඳහන් කෙළෙමි. එබඳු ආරංචියකින් තාත්තා කොපමණ සතුටු වන්නේදැයි මම දනිමි. පතලක් තුළ පස් හාරද්දී තාත්තා මා ගැන සිතමින් සතුටුවනු ඇත.

තාත්තාගේ ලිපිය ගැන මම සේන අයියා සමග ද පැවසීමි.

"සාමාට බැරිද හවසට හවසට අපේ ගෙදර එන්න. මම ඔයාට ඉංග්‍රීසි ටිකක් කියලා දෙන්නම්" දිනක් ඔහු පැවසුවේය.

මගේ සිතට විශාල ප්‍රීතියක් දැනිණ. වැඩිපුර ඉංග්‍රීසි ටිකක් ඉගෙණ ගන්න ඇත්නම් කොච්චර එකක්ද? එහෙත් ඒ සමගම එය පිළිබඳව මගේ සිත තුළ අනෙක් සිතුවිල්ලක්ද පහළ විය. සේන අයියාගේ ගෙදර අය කැමති වේවිද?



"ඒක සේන අයියට කරදරයක් නෙවෙයිද?"

"මොකක්ද මට තියෙන කරදරේ? හවසට මම ඉන්නෙ නිකම්මයි"

"ඒත් සේන අයියලෑ ගෙදර අය කැමති වෙයිද දන්නෙ නැහැ"

"ඒ අය නෙවෙයි - උගන්නන්නෙ මම" ඔහු හිතුවක්කාරයකු මෙන් පැවසුවේය.

මම අදිමදියෙන් බලා සිටින්නට වීමි.

"ඔයා බය නැතුව එන්න. අපේ ගෙදර ප්‍රශ්නයක් නැගුණොත් ඒක මම බලාගන්නම්කො"

මම අම්මා සමගද ඒ ගැන පැවසීමි.

"අනේ මන්දා දුවේ ඒ ළමයා බුදුන් ඇති කාලේ දරුවා. ඒත් මහ එවුන් මොකුත් කිවොත්?"

"මාත් සේන අයියට කිවේ ඒක තමයි. ඒත් එයා කියනවා එහෙම දෙයක් වෙන්නෙ නැහැයි කියල"

"කොයි එකටත් අනේ දුවේ පරිස්සමට. මහ එවුන් මහ පුදුම මිනිස්සු"

සේන අයියලාගේ ගෙදර මට එතරම්ම අමුතු තැනක් නොවීය. තාත්තා කලේ අඳේට ඔවුන්ගේ කුඹුරු වැඩ කිරීම පමණක් නොවේ. ඒ ගෙදර දානයක් පින්කමක් මඟුලක් වැනි දෙයක් වුණොත් තාත්තා දිවා රෑ වෙහෙස නොබලා ඒ සියල්ල සඳහා මහන්සි වුණේය. ඒ සියල්ල නොමිලේය. එදිනෙදා යම් යම් වැඩපල සඳහාද තාත්තාට පණිවුඩ එවා ගෙන්වා ගත්හ. අම්මාද වී කෙටීම ඉවීම වැනි වැඩපලවලට නිතර උදව් වූවාය. කුඩා කාලයේ සිට අම්මාත් සමග එහි යාම මගේද පුරුද්ද විය. එහෙත් අඳේට කුඹුරු ගොවිතැන නැතිවී ගියදා සිට අප පසුවන්නේ අමනාප වූවන් මෙනි. අම්මා ද එහි යාමක් නැත. ඇයට එන්නැයි පණිවුඩ එවීමක් ද නැත.

අපේ ගෙදර කවුරුත් සේන අයියලාගේ ගෙදරට ගොඩවන්නේ කුස්සිය පැත්තෙනි. අපේ තත්ත්වයේ සිටින ගමේ අනිත් අයද එසේය.

සවස මම සටහන් පොතක් ද රැගෙන බයෙන් බයෙන් සේන අයියලාගේ ගෙදර කුස්සියට ගොඩවීමි. මා දුටු නැන්දා පුදුමයෙන් මෙන් මා දෙස බැලුවාය.

"ආ - සාමාවතී. මොකද කෙල්ලෙ කාලෙකින් මේ පැත්තෙ ආවෙ නැත්තෙ" ඈ ඇසුවාය.

"සේන අයියගෙන් පාඩමක් අහගන්න ආවා නැන්දෙ"

ඈ එවිට මොහොතක් මා දෙස බලා සිටියාය.

"මොනවද? ඉංගිරිසිද?"

"ඔව් නැන්දෙ"

ඈ නැවතත් කතා කෙළේ මා දෙස නිහඬව බලා සිටීමෙන පසුවය.

"අපි දාස් ගණන් වියදම් කරලා අපේ ළමයි ලොකු කොලීජ්වල බෝඩිං කරලා ඉංගිරිසි ඉගැන්නුවෙ. දැන් උඹලට නිකම්ම ඉංගිරිසි" කියමින් ඈ සාවඥ ලෙස සිනාසුණාය.

මම නිහඬව බලා සිටින්නට වීමි. සභාපති අයියාගේ නෝනා ද අප වෙත පැමිණියාය. මා ඉංගිරිසි පාඩම අසාගන්නට ආ බව ඇසූ ඇයද කතා කෙළේ සාවඥ ලෙසිනි.

"මොන ඉංගිරිසිද සාමාවතීයේ කෙල්ලන්ට? අපි නම් ඉගෙණ ගත්තේ හොඳට ගෙදර දොරේ වැඩ."

"අක්කලාට නම් මොකද ඉතින්. ඒත් අපි මොකක් හරි රක්ෂාවක් හොයා ගන්න එපායැ අක්කෙ"

ඔවුහු තව දුරටත් මා අධෛර්ය කරන අයුරින් කතා කරන්නට වූහ. මට අවශ්‍ය වූයේ කෙසේ හෝ ඔවුන් වෙතින් ඉවත්වීමය.

"සාමාවතී ආව එකත් හොඳට ගියා. ලැයිසා පලා ලියන්නට ගිහින් අත කපාගෙන. අනේ සාමාවතියෙ ඔය මිරිස් ටික අඹරලා දීපන්කෝ" නැන්දා පැවසුවාය.

මම ඉතාම සතුටින් ඔවුන් වෙතින් ඉවත්වීමි. මට මිරිස් ඇඹරීම එතරම් දෙයක් නොවේ. ගෙදරදොරේ වැඩ කොයි එකත් මට හොඳින් පුරුදුය. මා මිරිස් අඹරා අවසන්වූ පසු නැන්දා මට කහට තේ කෝප්පයක් දුන්නාය. මම එය බීවෙමි.

"සේන අයියා ගෙදර නැද්ද නැන්දෙ?"

"ඔන්න ඔය කාමරේට වෙලා හිටියා පොතකට ඔරවාගෙන" ඈ අමනාපයෙන් පැවසුවාය.

මම සෙමින් සාලය වෙත පැමිණ එබී බැලීමි. රාලහාමි මාමා



එහි ඇද්දැයි මට බය සිතිණ. වාසනාවට මෙන් සේන අයියා සාලයේ සිටියේය.

"ආ - සාමා ආවද? මොකද මෙච්චර පරක්කු උනේ? මම නාන්න යන්නයි ලෑස්ති උනේ"

"මම ඇවිත් ටිකක් වෙලා. නැන්දලත් එක්ක ටිකක් කුස්සියේ කතා කර කර හිටියා"

ඔහු මට පාඩම කියාදීම සඳහා තෝරා ගත්තේ ඔහුගේ කාමරයයි. එයට ඇතුළු වන්නට මට බයක්ද සිතිණ. එය සුවපහසු කාමරයකි. ඔහුගේ මේසය තබා තිබුණේ ජනේලය අසලිනි. මේසය ළඟ පුටු දෙකක් විය. බිත්තිය අයිනේ ඇඳකි. එහි ඇතිරිල්ල සහ කොට්ටය ඉතාම පිරිසිදුය. ඇඳුම් අල්මාරිය සහ පොත් රාක්කය තවත් බිත්තියක් අයිනේ විය. ඔහු මේසය ළඟ එක් පුටුවක වාඩිවී මට අනෙක් පුටුවේ වාඩිවෙන්නට කීවේය. එහෙත් මම අදි මදියෙන් සිටගෙන සිටියෙමි.

"වාඩිවෙන්න ළමයො"

"නෑ අයියෙ මම හිටගෙන ඉන්නම්"

"මම කියන එක අහන්න" ඔහු අණ කරන ස්වරයෙන් පැවසුවේය.

මම පුටුවේ කෙළවරට වන්නට වාඩිවීමි. ඔහු මට පාඩම කියාදීම ආරම්භ කෙළේය. එහෙත් මගේ හදවත පුදුම වේගයකින් ගැහෙමින් තිබිණ. නැන්දා හරි මානෙල් අක්කා කාමරයට එයිද? නැත්නම් රාලහාමි මාමා එයිද? මම සේන අයියත් එක්ක මෙහෙම ඉඳගෙන ඉන්නවා දකිනකොට ඒ අයට මොනවා හිතෙයිද? මම ජනේලයෙන් පිටත මහපාර දෙස බලා සිටින්නට වීමි.

"සාමා කොහෙද බලාගෙන ඉන්නෙ?"

මම අවදිවී ඔහු දෙස බැලීමි.

"ම් - නෑ මොකුත් නෑ අයියෙ"

"එහෙනම් බලාගෙන ඉන්නෙ?"

"අපි පාඩම් කරන්න වෙන තැනක් ලෑස්තිකර ගම්මුද අයියෙ?"

"ඇයි මෙතන මොකද?"

"මගෙ හිතට මහ බයක් වාගෙ දැනෙනවා"

"ඇයි?"

"ගෙදර අය මං ගැන මොනවා හිතයිද අයියෙ?"

"මොනව හිතන්නද?"

"අයියටත් එක්ක බණියි"

"බණ කිව්වොත් සාදු කියමු" යයි පවසා ඔහු සිනාසෙන්නට උත්සාහ කෙළේය.

එහෙත් මගේ මුවට සිනාවක් නොනැගිණ.

එදා සවස මා ගෙදර පැමිණියේ මහත් ප්‍රීතියෙනි. සේන අයියා මොනතරම් හොඳදැයි මට නිතැතින්ම සිතිණ. ඒ ගෙදර අනිත් අයත් ඔහු මෙන් හොඳ නම් මොනතරම් වාසනාවක්ද? ඒ අය ගැන සිතන විට මගේ ඉගෙණිමට එතරම් ආයුෂක් නැති වෙතැයි මට බියක්ද දැනිණ.

ඉන්පසු සෑම සවසකම මම එහි යන්නට වීමි. ඒ සෑම දවසකම නැන්දා හෝ මානෙල් අක්කා මගෙන් කුස්සියේ කිසියම් වැඩක් කරවා ගැනීමට අමතක නොකළහ. ඔවුන් හොඳින් තබා ගත යුතු හෙයින් මම ද ඒ සෑම දෙයක්ම සැලකිල්ලෙන් කෙළෙමි. සමහරදාක ඔවුන් කියන තුරු නොසිට මගේ කැමැත්තෙන්ම මම මිරිස් ඇඹරීමි. වතුර ගෙනාවෙමි.

එහෙත් එක් සවසක මා එහි යන විට සේන අයියාගේ මුහුණ වෙනස්වී තිබිණ. අනිත් අය ද මුහුණු එල්ලාගෙන සිටියහ. රාලහාමි මාමාද ගෙදර සිටියේය. කිසියම් අමුත්තක් සිදුවී ඇතැයි මට ඉවකින් මෙන් දැනිණ. මගේ සිත බියපත් විය.

සේන අයියා එදා මට ඉගැන්වීම සඳහා පිළියෙළ කර ගත්තේ කෑම මේසයයි. එය විවෘත තැනකි. මම වාඩි වුණෙමි. ඔහු ද මට වාඩිවීමට නොකීවේය. නැන්දා සාලයේ අප පෙනෙන තෙක් මානයේ වාඩිවී බලා සිටියාය.

"සේන අයියට අපරාදේ මම හින්දා ගෙදරින් බැණුම් අහන්න සිද්දවුණා නේද?" මම පසුදා උදේ පාරේදී ඇසීමි.

"කවුද කීවෙ?"

"කියාපු කෙනෙක් නෑ. ඒත් මට තේරුණා ගෙදර අයගෙ මූණු දකිනකොට"



"එහෙනම් දැන් සාත්තර කියන්නත් දන්නව නේද?" ඔහු සිනාසෙන්නට උත්සාහ කෙළේය.

"ඔවා ගණන් ගන්න ගියොත් අපට ජීවත් වෙන්න බෑ සාමා"

"ඒ උනත් අපරාදේ අයියා මං හින්ද ගෙදරින් බැණුම් අහනවා නේද? මම මීට පස්සෙ නැවිත් නිකා ඉන්නම්. නැත්දා වෙලාවක මට හොඳටම බනිව් කියලා මට බයත් හිතෙනවා......"

"නෑ එච්චර දෙයක් නම් වෙන්නෙ නෑ. මම අම්මට කියල තියෙන්නෙ මට මොනවා කිව්වත් කමක් නෑ සාමාට එහෙම මොකුත් කියන්න එපා කියල"

"ඊයේ ගෙදර මොකුත් කතාවක් ඇතිඋනාද අයියෙ?"

"ඔව්. අපි දෙන්නා කාමරේ ඉන්න එක ගැන මානෙල් අක්කගෙ හිත හොඳ නැහැ. එයාගෙ හිතේ මොකක්ද ඉරිසියාවක් තියෙනව. එයා තමයි අම්මයි තාත්තයි දෙන්නත් වයින් කරලා තියෙන්නෙ"

"ඇයි අනේ මානෙල් අක්කා එච්චර නපුරු?"

"ඒක එයාගේ හැටි"

සේන අයියා නොකීවත් ගෙදර අය ඔහුට හොඳටම බණින්නට ඇතැයි මට සිතිණ. ඔය හිගන කෙල්ලක් කාමරේ ඇතුළෙ දමාගෙන ඉන්න උඹට ලැජ්ජා නැද්ද මිනිහො? මාමා මෙහෙම අහන්න ඇති. මම හින්දා අපරාදේ සේන අයියා බැණුම් අහන්නෙ. මට ඔහු පිළිබඳව මහත් ආදරයක් හා භක්තියක් දැනිණ. ඔහු සියල්ල මා වෙනුවෙන් කරන්නේ මගෙන් ඇති කිසිම ප්‍රයෝජනයක් නිසා නොවේ. මගෙන් කිසිම දෙයක් අපේක්ෂාවෙන් ද නොවේ.

අනිත් අතින් ඔහු මොන තරම් විනීතද? කවදාවත් නරක වචනයක් කතා කරන්නෙ නැහැ. ඉතා අඩු වශයෙන් මගේ දිහා නරක විදියට බලන්නෙවත් නැහැ. මම එයාගෙ කාමරේ ඉඳලත් එයා මගේ අතින්වත් ඇල්ලුවෙ නැහැ.

එහෙත් පසුව දවසක සිදුවූයේ ඉතාම අවාසනාවන්ත සිදුවීමකි. මානෙල් අක්කා මට මිරිස් අඹරන්නට කීවාය. මම ඉතාම සතුටින් එය කරමින් සිටියෙමි. හදිසියේ සේන අයියා කුස්සියට ආවේය. ඔහු ඇස් දෙක ලොකු කරගෙන මා දෙස බලා සිටියේය. ඉන්පසු මානෙල්

අක්කා දෙස බැලුවේය. ඔහුගේ දෑසින් ගිනි පිටවන්නට විය. ඔහු එතරම් කෝපයෙන් සිටිනු කිසිදාක මා දැක නැත. මම මහත් බියට පත්වීමි.

"කවුද සාමාට මිරිස් අඹරන්න කිවෙ? එනව අත්දෙක සෝදාගෙන මෙහාට" ඔහු අණ කෙළේය.

"කවුරුවත් කියාපු එකක් නැහැ මමමයි මේ මිරිස් ටික අඹරන්න ගත්තේ. මේක ඇඹරුවයි කියල මගේ අත් දෙක ගෙවෙනවද අයියේ?"

"සාමාට මම මෙහෙ එන්න කියල තියෙන්නෙ කුස්සියේ වැඩ කරන්න නෙවෙයි ඉගෙණ ගන්න" ඔහු කෝපයෙන් ගුගුළේය.

ඉන්පසු ඔහු මානෙල් අක්කා දෙස බැලුවේය.

"මම ඒ ළමයට උගන්නන එකට ගාස්තුවට හරියන්න කවුරුවත් එයාගෙන් වැඩ ගන්න ඕන නැහැ" ඔහු කෝපයෙන් පැවසුවේය.

මානෙල් අක්කා කෝපයෙන් බලා සිට ගස්සාගෙන කුස්සියෙන් ඉවත්වූවාය. සේන අයියා ද සාලය පැත්තට ගියේය. මට මහත් බියක් දැනිණ. මගේ දුප්පත්කම හින්දා මේ ගෙදර සාමයත් නැතිවෙන්නද එන්නේ? මම මිරිස් ටික අඹරා සාලය වෙත ආවෙමි. සේන අයියා කෑම මේසය ළඟ වාඩිවී සිටියේය.

අපි පාඩම් ආරම්භ කෙළෙමු. එහෙත් ඒ සමගම නැන්දා කෝපයෙන් එතනට කඩා වැදුණාය.

"මොකද උඹ අර ළමයට කීවෙ?" ඈ සැරවුණාය.

"මම කීවේ සාමාගෙන් කවුරුවත් මේ ගෙදර වැඩ ගන්න ඕන නැහැ කියල. ඒ ළමයට මෙහෙ එන්න කියල තියෙන්නෙ මම. ඒ ළමයා එන්නෙ ඉගෙණ ගන්න මිස වැඩ කරන්න නෙවෙයි" ඔහු ගුගුළේය.

"අනේ සේන අයියෙ කෑ නොගහ ඉන්නකො. මේ ගෙදරට වැඩක් පලක් කරල දෙන එක මට මදිකමක්ද? මේ ගෙදර කවුරුවත් මට වැඩ කියන්නෙ නැහැ. කුස්සියේ මොකුත් වැඩක් තිබුණොත් මම කරලා දෙන්නේ මගේම උවමනාවට" මම බැගෑපත්වීමි.

එහෙත් නැන්දා සේන අයියා දෙස ඔරවා බලා සිටින්නට වූවාය.

"මම උඹට ඉඩ දුන්නා වැඩියි. හිතන්න එපා මෙතන කෝලං



නටන්න. මේක නාඩගම් මඩුවක් නොවෙයි"

ඈ එසේ පවසාගෙන එතැනින් ඉවත්ව ගියාය. මට ඉබේම හැඬුම් ආවේය. ඈ ඉන් අදහස් කෙළේ කුමක්ද? මෙතන නාඩගම් නටාපු කෙනෙක් නැහැ. මාත් සේන අයියාත් අතරේ නොහිසි සම්බන්ධයක් ඇතැයි ඈ සිතන්නී ද? එහෙම හිතන එක පව්.

එදා මා ගෙදර ගියේ බරවූ හදවතින් යුතුවය. මින්පසු පාඩම සඳහා එහි නොයා යුතු යයි මට සිතිණ. මා නිසා සේන අයියා බැණුම් ඇසිය යුතු නැත. මා නොගියොත් ඔහු අමනාප වන්නට පුළුවනි. හෙට උදේට සේන අයියට හිත නොරිදෙන විදියට කරුණු පහදලා දෙන්න ඕනෑ. මම එසේ සිතීමි.

පසුවදා උදේද සේන අයියා මට පාරේදී මුණ ගැසුණ නමුත් මා කතා කරන්නට පෙර ඔහු කතා කෙළේය.

"අම්මා ඊයේ කියාපු කතාවට සාමා තරහ වෙන්න එපා. ඔය සේරම මානෙල් අක්කගෙ වැඩ. එයා අපි දෙන්න ගැන අම්මගෙ හිතට නරක අදහසක් දමලා තියෙනවා. ඒත් අම්මා දැන ගන්න ඕන අපි පුංචි කාලෙ ඉඳල හිටීමයෙ කොහොමද කියල."

"අනේ අයියෙ......."

"ඇයි?"

"අපරාදෙ මේ පව්කාර මම හින්ද අයියගෙ නමත් නරක් වෙනව. මම මීට පස්සෙ නැවිත් ඉන්නම් අයියෙ."

"ඔය ඔය ඉතින්? ඔයත් හදන්නෙ ඒ අයට දිනුම දෙන්න ද?"

"නැතුව වෙන මොනවා කරන්නද අයියෙ?"

"ඒ සේරම මම බලා ගන්නම්, ඔයා නැවිත් ඉන්න එපා."

නමුත් එදා සවස මා පාසැල් ඇරී එන විට අම්මා මග බලාගෙන සිටියාය.

"අනේ දුවේ අද ඉඳල ඉංග්‍රීසි පාඩමට යන්න එපා."

"ඇයි අම්මෙ?"

"ඊයේ රාත්තිරියේ එහෙ හරියට කලබල උනාලු. රාලහාමි අයිය අර ළමයට හරියට බැන්නලු, ඒ ළමයා කීවලු ගෙදරින්නුත් යනවා කියල."

"කවුද අම්මට කීවේ?"

For E-Pothakalaya

"අර ලැයිසා කෙල්ල. මානෙල් මැණිකෙයි සභාපති මහත්තයයි දෙන්නත් හරියට බැන්නලු."

සේන අයියා ගැන මට මහත් ශෝකයක් ඇතිණ. මේ කිසිවක් ඔහු මට නොකීවේය. ඔහුට ගෙදරින් තවත් මොන මොන කරදර ඇද්ද? නෑ. මීට පස්සේ මම යන්නෙ නැහැ.

සේන අයියා මග හැර සිටින්නට වුවමනා නිසා පසුදා මම පාසැලට නොගියෙමි.

සවසට සේන අයියාගෙන් ඉංග්‍රීසි ඉගෙණ ගැනීම මට නැතිව ගියේ ඒ අයුරිනි.



# 7.

**මා** නොයන නිසා සේන අයියලාගේ ගෙදර අර්බුදය එතෙකින් අවසන් වනු ඇතැයි මම සිතීමි. එහෙත් සිදුවූයේ අනෙකකි. ඔහු ගෙදර සියල්ලන්ටම බැණ වැදී අන්තිමට පාසැලට ගොස් එහි නතර වූණේය.

"මේ ගෙදර හැමෝම හිතාගෙන ඉන්නෙ තනියම රජවෙන්න. ගමේ දුප්පත් මිනිස්සුන්ට සළකන්නේ පරවේනි දාසයින්ට වාගේ. අපේ කුඹුරු අඳේට වැඩ කෙරුව දුප්පත් මිනිස්සු කීදෙනෙකුගෙ බඩට පයින් ගැහුව ද? අන්තිමට සමහරු දැන් ගමෙත් නැහැ. අර දුප්පත් කෙල්ල මෙතෙන්ට ඇවිත් හවසට ඉංග්‍රීසි ටිකක් ඉගෙන ගත්තා. අන්තිමට ඒකත් නැති කෙරුවා. හොඳයි බලමු හැමදාම ඔය විදියටම රජ කරගෙන ඉන්න පුළුවන් වෙයිද කියල. ඔය දුප්පත් මිනිස්සු හැමදාම ඔහොම ඔළුව පාත් කරගෙන ඉවසන එකක් නෑ. ඒ මිනිස්සු ඔළුව උස්සපුදාට බලමු මොකක්ද වෙන්නෙ කියල" ඔහු එසේ පවසා ඇත. ඒ බව මට කීවේ ලැයිසාය.

සේන අයියා පාසැලේම නැවතීම වඩාත් හොඳ යයි මට සිතිණ. ඔහුගේ අක්කා විදුහල්පති තුමාගේ බිරිඳය. විදුහල්පති තුමා මෙන්ම ඇයද කරුණාවන්තය. පාසැල දියුණු කිරීමට ඔවුන්ට අවශ්‍ය වී තිබේ. ඒ නිසා ඔවුහු ගුරු මණ්ඩලය සහ ශිෂ්‍යයින් සමඟ සහයෝගයෙන් හා උනන්දුවෙන් වැඩ කරති.

ගුරු නිවාසය පිහිටියේ පාසැල් වත්තේමය. එහෙත් සේන අයියා නවතින්නට තෝරාගෙන තිබුණේ ප්‍රධාන පාසැල් ගොඩනැගිල්ලේම එක කෙළවරක පිහිටි පුංචි කාමරයයි.

මම කල්තියා බස් එකේ යාමට කෙමෙන් පුරුදු වීමි. සමහරදාක මා පාසැල් යන විට මට කලින් එහි පැමිණ සිටිනුයේ ළමයින්

For E-Pusthakalaya


දෙතුන් දෙනකු පමණි. පාසැලේ මිදුලත් පන්ති කාමරත් අප විසින්ම ශුද්ධ පවිත්‍ර කරගත යුතුව තිබිණ. අපි ඒ වැඩ කොටස් බෙදාගෙන සිටියෙමු. මම කල්තියා ගිය දවසට පංගු පේරුවක් නැතිව පන්තියත් මිදුලත් ඇමදිමි. එදාට ඒ වැඩ කොටස භාරව සිටින ශිෂ්‍යාවද කල් තියා එයි. එහෙත් ඒ වන විට ද ඇගේ වැඩ මගෙන් කෙරී අවසානය. මම ඉන්පසු අර ශිෂ්‍යාවගෙන් පොතක් ඉල්ලාගෙන පාඩම් කරමි.

සමහරදාක උදේට සේන අයියා නාන්නට යන්නේ මා පාසැල් ගිය පසුය. ඔහු දැන් නාන්නේ පාසැල් වත්තේම ළිඳෙනි. පිජාමා සරමක් හැඳගෙන තුවායක් ද කරේ දමාගෙන ලී සෙරෙප්පු දෙකක් දෙපයේ ලාගෙන නාන්නට යන ඔහු දෙස මම මහත් පහන් සිතින් බලා සිටිමි. මා සිටිනු දුටුවොත් ඔහු මා සමග වචන කීපයක් කතා කිරීමට අමතක නොකරයි. සමහරදාක මා යන විට ඔහු නාගෙන පැමිණ කලිසම ද ඇඳගෙන සිටියි.

එක් උදයක මම පන්ති කාමරය අතුගාමින් සිටියෙමි. එවිට ඔහු එහි පැමිණියේය. පන්තියේ සිටියේ මා පමණකි. මගේ සිතට සතුටක් දැනුණත් මම කිසියම් ලජ්ජාශීලී හැඟුමකින් හැකුළුණෙමි. එහෙත් උදේ පිපුණ මලක් මෙන් ඔහුගේ මුහුණ පියකරුව තිබිණ.

"කොහොම ද සාමා ගම් පැත්තේ එහෙම තොරතුරු?"

"කියන්න අමුත්තක් නැහැ අයියෙ."

"අපේ ගෙදර අය එහෙම මුණ ගැහෙන්නෙ නැද්ද?"

"අද උදෙත් මම බස් එකට නගින්න පාරේ ඉන්න කොට මාතෙල් අක්කා ජනේලෙකින් බලාගෙන උන්නා"

ඔහු මුහුණට අහිංසක සිනාවක් නගා ගත්තේය.

"ඔයාට හවසට ටිකක් පමාවෙලා ගෙදර යන එක කරදරයක්ද සාමා?"

"නැහැ. ඇයි අයියෙ?"

"මම හිතාගෙන ඉන්නව හවසට මෙහෙ ඉංග්‍රීසි පන්තියක් දමන්න. අයියයි අක්කයි දෙන්නත් ඒකට හුඟක් කැමති වුණා."

මගේ සිතට විශාල සතුටක් දැනිණ.

"කොච්චර එකක්ද අයියෙ. එහෙනම් මාත් හවසට නවතින්නම්."




"ඔව්. මම ඔයාගෙ පන්තියේ අනික් ළමයින්ටත් කියන්නම්කො ලබන සතියෙ ඉඳල සූදානම් වෙලා එන්න කියල. මං හිතන්නෙ ඒ පන්තියට නම් මෙහෙනුරා ලබන එකක් නැහැ" යි පවසමින් ඔහු සිනා සුණේය.

"පහුගිය වතාවෙ අයියට මං හින්දා අපරාදේ කොච්චර කරදර උනාද"

"ඒව අපේ මිනිස්සුන්ගෙ මෝඩකම් සාමා"

මම කිසිවක් නොපැවසීමි.

"ඒක නෙවෙයි. සාමගෙ කවුරුවත් නැදැයෙක් එහෙම නැද්ද රටවුමක් කිට්ටුවක?"

"නැහැ. ඇයි අයියෙ?"

"එහෙමවත් කවුරුවත් උන්නා නම් ඔයාට සෑහෙන ඉස්කෝලෙකට ඇතුළත් වෙන්න තිබුණා. මේක නමට මහා විද්‍යාලයක් උනත් ඔයා වගේ ළමයින්ගෙ දක්ෂකම්වල හැටියට ප්‍රයෝජනයක් ගන්න බැහැ. විද්‍යාගාරයක් නැහැ. සෑහෙන පුස්තකාලයක් නැහැ. අවශ්‍ය තරමට ගුරුවරු නැහැ. වෙලාවකට මට ඔයා වගේ ළමයි ගැන ලොකු දුකක් දැනෙනවා"

ඔහු මොනතරම් කරුණාවන්ත ද? අප ගැන ඔහු මොන තරම් ආදරයකින් කරුණාවකින් සිටින්නේ ද? ඔහු පිළිබඳව විශාල පැහැදීමක් මෙන්ම අප පිළිබඳව විශාල ශෝකයක් ද මට දැනෙන්නට විය. අපි හරියට කැලේ පිපිලා කැලේම පරවෙලා යන මල් වගේ නොවේද? අපෙන් අපට වැඩකුත් නැහැ. රටට වැඩකුත් නැහැ. අපටත් හොඳ පාසැලක් ඇත්නම් අපේ ජීවිත මොන තරම් ආලෝකවත් කර ගන්න පුළුවන් ද? ඒක අපට වගේම අපි උපන් බිමටත් යහපතක්.

"රත්බණ්ඩා මාමා ළඟකදී ගෙදර ආවෙ නැද්ද?"

"නැහැ අයියෙ. ගියාටම පස්සෙ තාත්ත තාම ආවෙ නැහැ. එන්න නිවාඩුවක් නැතිලු"

"ගෙදර වියදමට මුදල් එහෙම එවනව ද?"

"ඔව් අයියෙ"

"මොනවා හරි අඩු පාඩුවක් තියෙනවානම් මට කියන්න ලැජ්ජ

පොත් එපා. ගිය සතියෙ මම කොළඹ ගිය වෙලාවෙ හොඳ ඉංග්‍රීසි පොතක් ගෙනාව. අලුතෙන් ඉංග්‍රීසි ඉගෙන ගන්න කෙනෙකුට ඒක හුඟක් ප්‍රයෝජනයි. වෙලාවක මම ඒක දෙන්නම්කො."

මම හෙමිහිට මුහුණ ඔසවා ඔහුගේ මුහුණ දෙස බැලීමි. මගේ සිත තුළ ශෝකය භක්තිය ආදරය එකට මුසුවෙයි. ඔහුගේ දෙපා වැළඳගෙන හඬන්නට ඇත්නම් යයි මට සිතිණ.

"අයියගෙ පොත් දෙකකුත් තාම මගෙ ළඟ"

"ඒවා ඔයා තියා ගන්න"

"එපා අයියෙ"

"ඇයි?"

මම කතා නොකර බිම බලා ගතිමි.

"සාමා පොත් ගත්ත ද?"

"න් - නැහැ"

"එහෙනං?"

මම පිළිතුරු නොදී බිම බලාගත්වන පසු වීමි. ඔහු සමග එය කියන්නේ කෙසේද? මට මෙනෙහි වන්නේ විනීතාය. ඇගේ ඇණුම්පද මගේ කණෙහි යවුල් අතියි. ඒවා මට නම් විඳ දරා ගත හැකිය. එහෙත් මගේ නැති බැරිකම නිසා නිරපරාදේ ඔහුගේ නම කැත කරන්නට ඉඩක් නොතැබිය යුතුය. විනීතා ගැන කියන්න දැයි මට වරෙක සිතෙයි. එහෙත් එසේ කීවොත් ඔහු කුමක් සිතයි ද? පන්තියේ සිටින්නේ මත නොහැදිච්ච ළමයින් යයි ඔහුට සිතෙනු ඇත. ඉන්පසු පන්තිය පිළිබඳව ඔහු තුළ ඇති ආදරය දෙදරා යන්නේය. එය විනීතාට කෙසේ වෙතත් අපට දැරිය නොහැකි පාඩුවක් වන්නේය. ඔහුගේ [illegible] මං මෙනෙහි වෙයි. මට ඔහු පොත් අරගෙන දෙන බව ඔවුන් දැනගත්තොත් කුමකින් කුමක් වෙයිද?

"ඇයි සාමා කතා නැත්තෙ?"

මම හිස ඔසවා බැලීමි. අනෙකක් කිව යුතු යයි මට සිතිණ.

"මං පොත් අරගෙන දෙන එක අයියට කරදරයක්......."

"පිස්සු" යයි පවසමින් ඔහු සිනාසුණේය.

මම ද දෙතොලට යන්තමින් සිනාවක් නගා ගෙන ලජ්ජාවෙන්



යුතුව කොට බිත්තිය උඩින් බැලීමි. මිදුල මැද මල් පාත්තියේ සූර්යකාන්තා පඳුරේ විශාල මලක් පිපී තිබිණ. එය හිරු දෙසට හැරී බලා සිටියේ තම පෙම්වතා පිළි ගන්නට ඉතා සතුටින් බලා සිටින පෙම්වතියක ලෙසිනි.

විනීතාත් සුමනාත් ගේට්ටුවෙන් පාසැල් වත්තට ඇතුළු වනු මට පෙනිණ. ඒ සමගම මගේ සිත චිහා තැති ගැනිණ. දැන් ඉතින් කුමකින් කුමක් වේ ද? මම සේන අයියා දෙස බැලීමි. ඔහුට යන්නැයි කියන්නට මට පුළුවන් කමක් නැත. ඔහු පමණක් පන්තියේ සිටියදී එතැනින් පිටවී යාමට ද මට බැරිය. එසේ කළොත් එය ඔහුට කරන ලොකු මදිකමකි. ඔවුන් දුර තියාම පන්ති කාමරය දෙස බලනු මට පෙනිණ. අප දෙදෙනා පමණක් පන්තියේ සිටින හැටි ඔවුන් දුටු බව මට දැන් සහතිකය. අන් කළ යුත්තක් සිතා ගත නොහැකි මම බිම බලාගෙන පන්තිය අමදින්නට වීමි.

මා නැවත හිස ඔසවා බලන විට මිදුල දිගේ එන සුමනාත් විනීතාත් දෙස සේන අයියා සිනා මුසුව බලා සිටියේය.

"ගුඩ් මෝනිං සර්"

"ගුඩ් මෝනිං"

එය ඇසුණ නමුත් හිස ඔසවා බැලීමට මම අපොහොසත් වීමි.

"සර්ට අන්න තේ බොන්න කතා කරනවා."

එවිට මම හිස ඔසවා බැලීමි. ගුරු නිවාසයේ සිටින මෙහෙකාර ළමයා පැමිණ සිටියේය. සේන අයියා පන්තියෙන් පිටවී යන්නට ගියේය.

සුමනාත් විනීතාත් දෙස කෙළින් බැලීමට මම අපොහොසත් වීමි. මගේ හදවත හිරි වැටුණාක් බඳුය. දැන් දැන් විනීතා කිසියම් ඇනුම් පදයක් කියනු ඇත.

"අද පාන්දරම ඇවිල්ලා අපි කරගන්නෙ හරි පවක් නේද සුමනා?" විනීතා ඇසුවාය.

"මොකද් ද?"

"කදිමට එකට තුරුල්වෙලා හිටිය කුරුළු ජෝඩුවක් අපරාදෙ වෙන් කෙරුවා"යි පවසමින් ඇ සිනාසුණාය.

ක්ෂණික කෝපයෙන් මම හිස ඔසවා බැලීමි. සුමනා බියමුසුව

For E-P

මෙන් පසුබා සිටියාය. එහෙත් විනීතා අවලම්ලෙස සිනාසුණාය.

"මොකක්ද විනීතා ඔයාගෙ ඒ කතාවෙ තේරුම?" මම කෝපයෙන් ඇසීමි.

"තේරුමත් ඒකම තමයි"

"මොකද්ද?"

"මොකක් උනත් ඒක අපේ කතාවක්"

"ඔයාට වටින්නෙ නැහැ එහෙම කතාවක් කියන්න"

"ඉඳා - මේ මොකද මෙයා පාන්දරම මගෙ ඇඟට ගොඩ වෙන්න හදන්නෙ?"

"ඔයානෙ පාන්දරම එක එක කතා හදාගෙන එන්නෙ"

"අපෝ ඔව්. මෙයා පාන්දරම එන්නෙ මොකටද කියල අපි නොදන්නවයැ. මහ ලොකු පත්තිනි අම්ම"

මම කෝපයෙන් දැවුණෙමි. මට කුමක් වූවාදැයි මටම නොවැටහිණ. මම අතුගාමින් සිටිය කොස්ස උරුක් කරගෙන ඇය වෙත පැන්නෙමි.

"මොකද්ද උඹ කීවෙ? කඩනව උඹේ වලත්ත කට"

සුමනා වහාම මත් විනීතාත් අතරට පැන මා තල්ලු කළාය.

"එපා සුමනා. අත ඇරපන් එයාව. හරි චණ්ඩියෙක්නෙ" විනීතා සාවඥ ලෙස පවසයි.

මම වෙවුලමින් බලා සිටින්නට වීමි. මුල් වතාවේ කොස්සත් රැගෙන කෝපයෙන් ඇය වෙත මා පැන්නත් ඇයට පහර දෙන්නට දැන් මට අවශ්‍යතාවයක් නැත.

"විනීතාවරනෙ. ඕව ඔච්චර ගණන් ගන්න එපා සාමා" සුමනා මා සනසාලීමට තැත් කරයි.

"සර් කෙනෙකුගෙ නමක් ගාවලා මොකක්ද කරන විහිළුව? එයා සල් එකක කුට්ටු වෙලා තාඩගම් කැටුවට අහිත් හැමෝමත් එයා වගේ නොවෙයි. මම කියන්නෙ ඉංග්‍රීසි සර් එක්ක"

"කියල මගේ ළඟ කියයි."

"ආ, එක ගන්නකො විනීතා" යි සුමනා තර්ජනය කළාය.

"මං ඉස්කෝලෙට ඉන්නවරම එයා එක එක පද හදනවා. එයා කුමාර මා ඉංග්‍රීසි සර්ගෙ නම ගාවලා මොකක් හරි කතාවක්



කියනවා. එයාට වගේ ගායක් මට නැහැ."

"ඇති සාමා. ඔයත් ඉකින් කටවහ ගන්න. මේවා කොච්චර පුංචි දේවල් ද?"

මම නිහඬ වීමි. විනීතා ද නිහඬ වූවාය. ඉතාම අනවශ්‍ය දෙයක් අප අතර සිදු වී යයි ටික වෙලාවකින් මට සිතිණ. මට මගේ අසරණකම සිහිවිය. මේ හැම එකක්ම අහන්න සිද්ධ වෙලා තියෙන්නෙ මගේ දුප්පත් කම නිසා නේද?

ඒ සමගම මට හැඬිණ. මම දෝතින් මුහුණ වසා ගෙන මේස එක මත නළල ගසාගෙන හඬන්නට වීමි.

ටිකවෙලාවකට පසු මගේ උරහිස මත අතක් රැඳිණ.

"මට සමාවෙන්න සාමා. මම කීවේ විහිළුවට. මම හිතුවෙ නැහැ ඔයාට කේන්ති යයි කියල. ඔයා දන්නවනෙ මම හැමෝටම විහිළු කරනව. මීට පස්සෙ මම ඔයාට විහිළු කරන්නෙ නැහැ" ඒ විනීතාගේ කටහඬය.

මම කඳුළු පිස දමමින් හිස ඔසවා බැලීමි. විනීතාත් සුමනාත් මා අසල සිටගෙන සිටියහ.

"ඔව් සාමා. ඕවා දිග දුර යන්න දෙන්න එපා. අපි කරන විහිළු ඉංග්‍රීසි සර්ට දැනෙන්න අරින්න එපා. සර් හිතයි අපි හරි වල් කෙල්ලො කියල" සුමනා පැවසුවාය.

සමාව ඉල්ලීමට විනීතාව පොළඹ වන්නට ඇත්තේත් සුමනා බව මට සිතිණ.

මා කතා කරන්නට උත්සාහ කළ නමුත් මට මගේ හැඬීම නවත්වා ගැනීම අපහසු විය. මා කතා කෙළේ හැඬීම අතරිනි.

"නෑ සුමනා. ඔයා වගේම විනීතාත් හොඳටම දන්නව මම උදෙන්ම එන්නෙ ඇයි කියල. කල්තියා එන්නෙ කාගෙන්හරි පොතක් ඉල්ලාගෙන බලාගන්න විත්තිය ඔය දෙන්නම දන්නව. සර් මෙතනින් ඔන් බොන්න යද්දි මම ඉන්නව දැකල කතා කෙළේ. විහිළුවටවත් සර්ලගෙ නම් ගාවලා කතා කරන එක කොච්චර පව් ද? අනිත් එක ඉංග්‍රීසි සර් අපට කොච්චර ආදරේ ද?" මම කඩින් කඩ පවසා ගතිමි.

"විනීතා ඒක හිතල කියාපු දෙයක් නොවෙයි සාමා" සුමනා

For E-Pusthakalaya

හැඬුවාය.

"හරහ වෙන්න එපා සාමා. මම එච්චර දුරට ඒක ගැන හිතුවෙ නැහැ" විනීතා ශෝකානුකූලව පැවසුවා ය.

මගේ සිතට කනගාටුවක් දැනිණ.

"මගේ ඇති තරහක් නැහැ. මම හිතේ වෛරය තියාගෙන ඉන්න කෙල්ලෙක් නොවෙයි. ඔයාට මම කොස්සෙන් ගහන්න පැන්නට මට සමා වෙන්න."

සන්දරම් හැමුවේ මොන තරම් කුණාටුවක් ද? දැන් එය නිහඬය. එහෙත් ඉන් සිදුවූ හානියෙහි තටඹුත් ඉතිරිව ඇත. ඒවා දැක්ම ශෝකානුකූලය. සිදුවී ඇත්තේ ඉතාම අනවශ්‍ය දෙයකි. එය මුළුමනින්ම අමතක කර දැමිය යුතුය.

එදා ඉංග්‍රීසි පාඩම සඳහා සේන අයියා පන්තියට පැමිණි විට මගේ හදවත වේගයෙන් ස්පන්දනය වන්නට විය. වෙනදා මෙන් කෙළින්ම ඔහුගේ මුහුණ බැලීමට මට මහත් අපහසුවක් දැනිණ. මම වරක් හිස හරවා විනීතා දෙස බැලීමි. ඈ ඔහු දෙසත් නැවත මා දෙසත් බලනු පෙනිණ. එවිට මගේ හදවතෙහි ස්පන්දනය අධික විය. වෙනදා තරම් පාඩම කෙරෙහි අවධානය යොමු කර ගන්නට මම අසමත් වීමි.

මා ඔහු දෙස බලා සිටියදී ඔහු මා දෙස බැලීය. එවිට අපේ ඇස් හමුවිය. ඔහුගේ දෑසෙහි වෙනදා නැති ප්‍රශ්නාර්ථයක් ඇතැයි මට සිතිණ. මම වහාම යළිත් පොත වෙත දෙනෙත යොමු කර ගතිමි. එහෙත් මට පාඩම කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කර ගත නොහැකි විය.

පාඩම අවසන් වූ පසු මම හිස එසවීමි. ඔහු මා දෙස බලා සිටියේය. මට දැනෙන්නට වූයේ මහත් අපහසුවකි.

"සාමා"

"සර්" පන්තියේ ළමයින් ඉදිරිපිටදී මම ඔහුට අයියේ නොකියමි.

"මෙන්න අර පොත"

මගේ හදවත එකවර සලිත විය. ඒ සමගම සිරුරද ගැහෙන්නට විය. එහෙත් මම සෙමින් ඔහු වෙත පිය නගන්නට වීමි. විනීතා



කුමක් සිතනු ඇද් ද? මම ඔහු ඉදිරිපිට සිට ගතිමි. බිම බලා ගතිමි.

"මොක ද? සාමාට අද සනීප නැද් ද?"

"න් - නැහැ සර්"

"එහෙනම් මොකද නිකම් හෝන්දූ මාන්දූ වෙලා?"

මම කතා නො කළෙමි. ඔහු මා වෙත පොත දිගු කෙළේය. මම එය රැගෙන ආපසු මගේ පුටුව වෙත ආවෙමි. මා යන්තමට ස්තුතියි කීවා මිස මගේ හිතේ හැටියට ඔහුට කෘතඥතාව පිරිනැමීමට මම අසමත් වීමි.

ඔහු පන්තියෙන් ඉවත්ව ගිය පසු මම වඩාත් බියපත් වීමි. විනීතා නැවතත් මුළු පන්තියටම ඇහෙන්න ඇනුම් පදයක් කියාවි ද? ඇය නම් යළිත් කිසිවක් නොකියනු ඇතැයි මට සිතිණ. එහෙත් කවුදෝ හිකි හිකි ගා සිනාසෙනු ඇසිණ. මම වහාම කුතුහලයෙන් හිස ඔසවා බැලිමි. එහෙත් පන්තිය නිහඬය. සිනාසුණේ කවුදැයි සිතා ගත නොහැක. මම ඉවසා සිටියෙමි.

සේන අයියා කෙතරම් ගුණ යහපත් කෙනෙකු දැයි නොසිතා සිටීමට මට නොහැකි විය. ඔහු මට දක්වන්නේ කෙතරම් විශාල කරුණාවක් ද? ආදරයක් කරුණාවක් දක්වන කෙනෙකු ගැන නො සිතා සිටීම අපහසුය. නිතරම ඔහුගේ මුහුණ මගේ සිත තුළ මැවී පැවතිණ. ඉන් මගේ සිත කිසියම් සතුටක් ලැබුවේය.

ගෙදරදී පාඩම් කරන්නට ඉංග්‍රීසි පොතක් ගත් සැණින් මට ඔහු මෙනෙහි වෙයි. එවිට මගේ සිත තුළ ඇති වන්නේ කිසිදාක නොදැනුණ සුවදායක බවකි. මගේ සිත ආදරයෙන් හා භක්තියෙන් පිරෙයි. අම්මා සහ තාත්තා පිළිබඳව ද මගේ සිත තුළ ආදරයක් හා භක්තියක් ඇත. එහෙත් අම්මාත් තාත්තාත් පිළිබඳව සිතන විට ආදරය හා භක්තිය සමග දුක් වේදනාවක් ද මගේ සිතට දැනෙයි. මා නිසා ඔවුන් විඳින්නේ මොන තරම් දුකක් ද? ඔවුන් පිළිබඳව සිතද්දී මගේ සිතට දුක් වේදනාවක් දැනෙන්නේ ඒ නිසාය. එහෙත් සේන අයියා ගැන සිතන විට සිත තුළ ඇතිවන ආදරය සහ භක්තිය සමග එක් වූ දුක් වේදනාවක් නැත. ඒ ආදරය හා භක්තිය සිතට සහනයකි. සුවයකි. එහි එල්බගෙන සිටින්නට මම කැමැත්තෙමි.

පොත පෙරළා ගත් විට එහි අකුරු අතරින් මට ඔහුගේ සිනාසෙන මුහුණ පෙනෙයි. එවිට මම අසීමිත ආශාවකින් ඒ මනෝ රූපය දෙස බලා සිටිමි. ඒ මුහුණ භවයෙහි කාලාන්තරයක් තිස්සේ මා සමග එක්ව ආ කෙනෙකුගේ මෙන් මට දැනෙයි.

මේක සංසාර පුරුද්දක් වෙන්න ඕන. ඉහතාත්මභාවයන් ගණනාවකදී ඔහු මට හමුවෙලා ඇති. අපි දෙන්නා හිතවත්ව ඉන්න ඇති. මම ඔහුගේ නංගී වෙලා හිටිය ද? නැත්නම්....... නෑ. නෑ. එහෙම හිතන එක පව්.

මා එය නොසිතා සිටින්නට උත්සාහ කළත් මා පෙර භවයන් ගණනාවකදී ඔහුගේ බිරිඳ වී සිටින්නට ඇද්ද යන සිතුවිල්ල මට මැඩ පවත්වා ගත නො හැකි විය.

ඒ සිතුවිල්ලෙන් මම බියවීමි. සතුටුවීමි. කෙසේ වෙතත් අධ්‍යාත්මයෙන් අවදි වීමි.

සෑම තරුණියකගේ මෙන්ම මගේ මනසෙහිද පිරිමියෙක් ජීවත් විය. මා මනසින් දුටු ඒ පිරිමියාගේත් සේන අයියාගේත් රූපයෙහි සහ ගතිගුණවල සමානත්වයක් විය. එහෙත් ඒ බව මට එවකට පැහැදිලිව අවබෝධ නො විය. මා සංසාර පුරුද්දක් ගැන සිතුවේ එහෙයින් විය හැකිය.

පොත අතේ තබාගෙන මම කොතෙකුත් වෙලා ඒ මනෝරූපය දෙස බලා සිටිමි. ඔහු සිනාසෙයි. එවිට මගේ ද දෙතොල අතර ඉබේම සිනාවක් ඇඳෙයි. ඔහු වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක යෙදෙන්නට මට පුළුවනැයි එවිට මට සිතෙයි.

පන්තියේ සෑම ළමයකුම පාසෙහ් අනෙක් පාඩම්වලට වඩා ඉංග්‍රීසි පාඩම ගැන උනන්දුවක් දක්වන බව මට දකින්නට ලැබිණ. එය අරුමයක් නො වේ. අප ඉගෙණ ගන්නා විෂයයන් අතුරින් අනාගත සුරක්ෂිත භාවය තහවුරු කරනු ලබන්නේ ඉංග්‍රීසි විෂය විසින් පමණක් නොවේදැයි මා මෙන්ම ඔවුහු ද කල්පනා කළහ. ඒ බව සේන අයියා ද අවබෝධ කරගෙන ඇති බව ඔහු ඉගැන්වීම ගැන දැක් වූ උනන්දුවෙන් මම අවබෝධ කෙළෙමි.

විභාගේ ප්‍රතිඵල නිකුත්වන තෙක් අපේ පන්තියට එතරම් වැදගත්



වැඩක් නොතිබිණ. ඒ නිසා එම කාලය මුළුමනින්ම පාසෙහ් ඉංග්‍රීසි පාඩම සඳහා යොදවා ගැනීමට අපි කවුරුත් කල්පනා කෙළෙමු. ඒ උනන්දුව දුටු සේන අයියා ඉතාම සතුටු විය. එහෙත් සතියකට පීරියඩ් තුනකට වඩා අප වෙනුවෙන් මිඩංගු කිරීමට පාසැල් වේලාවේදී ඔහුට කාලයක් නො තිබිණ.

"ඉංග්‍රීසි ඉගෙණ ගන්න ඔය ළමයින්ගෙ තියෙන උනන්දුවෙ හැටියට මුල ඉඳලම හොඳ ගුරුවරයෙක් යටතේ ක්‍රමානුකූලව ඉගෙණ ගන්න පුළුවන් උනා නම් ලොකු දියුණුවක් ලබා ගන්න තිබුණා. මට හරි ආශයි මේ වගේ උනන්දුවක් තියෙන පන්තියකට උගන්වන්න"

"අපිත් හරි ආශයි සර් වගේ උනන්දුවක් තියෙන ගුරුවරයෙකුගෙන් ඉගෙණ ගන්න. ඉංග්‍රීසි වලින් විතර තමයි අපට වැඩක් වෙනොත් වෙන්නෙත්" සිරිසේන පැවසුවේය.

සේන අයියාගේ මුහුණෙහි පියකරු මද සිනාවක් ඇඳිණ.

"මං හිතන්නෙ ඔය ළමයින්ට ඉංග්‍රීසි ඉගෙණ ගන්න වෙන්නෙ විභාගෙ ප්‍රතිඵල පිටවෙනකන් විතරයි. ඒක නිසා ඔය ළමයි කැමති නම් මට පුළුවනි ඉස්කෝලෙ වේලාවෙන් පස්සෙ පැයක් හමාරක් උගන්වන්න"

අනෙක් ළමයින් මෙන්ම මම ද ප්‍රීතියෙන් උද්දාම වීමි. ඒක කොච්චර එකක්ද. ගෙදර යන්න පමා උනත් කමක් නෑ. මෙහෙම කෙනෙක් මුල ඉඳලම මෙහෙ උන්න නම් අපිත් මෙලහකට සෑහෙන්න ඉංග්‍රීසි ඉගෙණ ගෙන. විභාගෙටත් අරගෙන. එතකොට අනාගතයක් ගැන මෙච්චර බයක් නැහැ.

සේන අයියට වඩා ඉටු දෙවියකු අපට තවත් නැතැයි මට සිතිණ. මම භක්තිය උතුරන ඇසින් ඔහු දෙස බලා සිටින්නට වීමි. ඉතා අඩු වශයෙන් මීට අවුරුදු දෙක තුනකටවත් කලින් අපට මෙබඳු ගුරුවරයකු ලැබුණි නම් කෙතරම් වාසනාවක් ද? විභාගයේ ප්‍රතිඵල නිකුත් වන තෙක් හෝ ඔහුගෙන් හොඳින් ඉංග්‍රීසි ඉගෙණ ගත යුතුය. මම එසේ සිතිමි.

ඊළඟ සතියේ සඳුදා අපේ සවස ඉංග්‍රීසි පන්තිය පටන් ගැනිණ. සේන අයියාත් අපිත් ඒ ගැන මහත් උනන්දුවක් දක්වා කටයුතු කෙළෙමු.

සමහර දිනවල මා පාසැල් ඇරී ගෙදර ආවේ ඊ වෙන්නට කිට්ටුවය. එහෙත් මා තුළ කිසිදු වෙහෙසක් නොවීය. ඒ වෙනුවට මම ඉතාම ප්‍රබෝධයකින් පසු වීමි. මා ගෙදර පැමිණීමට ප්‍රමාද වීම ගැන අම්මා ද දොස් නො කීවාය. ඈ සේන අයියාට නිතර පින්දුන්නාය.

සෑම අවස්ථාවකම මගේ සිත තුළ පැවැත්තේ ඉංග්‍රීසි පිළිබඳ උනන්දුවමය. මා තනිව සිටි නොයෙක් අවස්ථාවල මම තනියම ඉංග්‍රීසි කතා කෙළෙමි. එබඳු අවස්ථාවල මටම සිනා පහළ විය. අනෝමාට වගේ මටත් ඉංග්‍රීසි කතා කරන්නට පුළුවන් නම් යයි මට නිතැතින්ම සිතිණ. අපේ මුළු ගමටම ඉංග්‍රීසි දන්නා එකම යුවතිය අනෝමා පමණකි. ඈ ලේකම් රාලහාමිගේ දුවය. සේන අයියාගේ හැන්දෑ අනෝමාගේ මවය. සේන අයියාත් අනෝමාත් දිනක් පන්සලේ දී ඉංග්‍රීසියෙන් කතා කරනු මම දැක ඇත්තෙමි. එදා මා එදෙස බලා සිටියේ මොන තරම් ආශාවෙන් ද? අනෝමා නුවර කන්‍යාරාමයක නේවාසික ශිෂ්‍යාවක වශයෙන් ඉගෙණ ගනියි. මටත් උසස් බාලිකා විද්‍යාලයක නේවාසික ශිෂ්‍යාවක වී උසස් අධ්‍යාපනයක් ලබන්නට ඇත්නම් මොන තරම් වාසනාවක්දැයි මට නිතැතින්ම සිතිණ. ඒ සෑම අවස්ථාවකම මම දිග සුසුමක් හෙළමි.

පාසැලේ අනෙක් කිසිම විෂයක් කෙරෙහි නොදැක්වූ උනන්දුවක් ඉංග්‍රීසි ගැන පමණක් දක්වන්නට අප පෙළඹී සිටියේ අප තුළ ඇති පරගැති බව නිසා හෝ පුහු ආටෝපයට ඇති ගිජුකම නිසා නොව අප ඉගෙණ ගත් අනෙක් කිසිම විෂයයකට නොතිබුණු තත්ත්වයක් ඉංග්‍රීසි වලට තිබුණ නිසාය. සමාජයේ ඕනෑම උසස් තැනකට පිවිසීමේ දොරටුවලට යතුර එය වූ නිසාය. ඒ යතුර අතේ නැති විට ඒ එකද දොරක්වත් විවෘත කරගත නොහැකි නිසාය.

ඉංග්‍රීසි පන්තිය ගැන තාත්තාටද මම නිතර ලියා යැවීමි. එය ඔහුට කෙතරම් විශාල සතුටක් වනු ඇද්දැයි මම දැන සිටියෙමි. තාත්තා අපට ලිපි ද මුදල් ද එව්වේය. එහෙත් තාත්තා තුළ සතුටට වඩා ඇවිළ කෝපයක් නිතර බලපවත්නා බව ඔහුගේ ලිපිවලින් මම තේරුම් ගතිමි. ඒ කෝපය චූකලී තම ජීවිතයට සිදුවී ඇති අසාධාරණය ගැනය.

මොනවා කරන්නද දුවේ? ගමේ ඉන්දැද්දිත් මගේ මහන්සියෙන්



ප්‍රයෝජන ගත්තේ අනුන්. රාලහාමිගෙ කුඹුරු වැඩ කරද්දිත් මම පැල් රැක්කා ගිනි තැප්පා විතරයි. අදේ රාලහාමිට. මෙහෙත් එච්චර තමයි. අපි කම්කරුවන් ඊ දාවල් දෙකේ පතල් ඇතුළෙ පොළව හාර හාර ලක්ෂ කෝටි ගණන් වටින මැණික් ඉල්ලම් ගොඩදානවා. ඒත් කාටද? නිකම්ම ගොඩ ඉන්න මුදලාලියකුට. හැමතැනකම ලක්ෂ ගණන්වලින් සල්ලි හම්බ කරන්නෙ එක ඩාදිය බිංදුවක් හෙළන්නෙ නැති මිනිස්සු. මේ එක පුංචි මැණික් ගලක් මට අයිති නම් මට පුළුවනි මගේ දරුවො දෙන්නටත් හොඳට උගන්වාගෙන ගෙයක් දොරක් හදාගෙන තමුන්ට කියල කුඹුරක් අරගෙන දෙයියනේ කියල ඒක වැඩකරගෙන ජීවත් වෙන්න. ඒත් ඒවා අපට හීන විතරයි. එහෙම ජීවත් වෙන්න අපට වාසනාව නැහැ. අපට වාසනාව තියෙන්නෙ අනුන්ට හම්බකරලා දීල අපි දුක් විඳින්න. මේවා හිතට අරගෙන මගෙ දුවවත් මේ දුකෙන් අත් මිදෙන්න හොඳට ඉගෙණ ගන්න මහන්සි වෙන්න. තාත්තා එසේ ලියා එව්වේය.

අපේ ජීවිතවලට සිදුවී ඇත්තේ කෙතරම් විශාල අසාධාරණයක් දැයි සිතන්නට නිතැතින්ම මම පෙළඹී සිටියෙමි. තාත්තා කියන්නාක් මෙන් අපට සිදුවී ඇත්තේ අනුන්ගේ සැප සම්පත් සාදා දීම සඳහා ජීවත් වීමටය. මේ අසාධාරණයට භාජනවී සිටින පිරිස කෝටි ගණනකි. ඔවුන් සූරාකන පිරිස අතළොස්සක් දෙනෙකි. මේ අතළොස්සක් දෙනා යටපත් කරගෙන නැගී සිටින්නට කෝටි ගණනකට නොහැකිවී ඇත්තේ ඇයි? ඔවුන් පන්ති හැඟීමෙන් යුතුව ඒකාවන්ව සංවිධානයවී නැත. සංවිධානයවී සිටින කම්කරු කොටස්ද බෙදී සිටිති. ඒ බෙදී සිටින කොටස් බොහොමයක නායකත්වය දරන්නේද අර සූරාකන පන්තියේ අතළොස්සක් දෙනාගේම නියෝජිතයෝය. වැඩකරන ජනතාව මෙය අවබෝධකර ගන්නේ කවදාද? ඔවුන්ට ඒ අවබෝධය දෙන්නේ කවුද? සේන අයියා කියන්නාක් මෙන් ඔවුන්ට ඒ අවබෝධය ලබා දීම උගත් තරුණ පරපුර වන අපේ ලොකුම කාර්ය විය යුතුය. කවදා හෝ ඒ යුතුකම අපෙන් ඉටුවිය යුතුය.

සති දෙකකට වරක්වත් අපට ලිපියක් එවීමට තාත්තා අතපසු

For E-Pustakalaya



නොකෙළේය. ලිපියක් ප්‍රමාද වන විට අපි කෙතරම් නොඉවසිලිමත් වීමුද? ලියුම්කාරයා එන තුරු අපි මග බලා සිටියෙමු.

එහෙත් අන්තිමවරට ලිපියක් වෙනුවට ආවේ කුමක් ද?

එදා සෙනසුරාදාවක් වූ නිසා මම ද ගෙදර සිටියෙමි. දෙවැට දිගේ ආ තැපැල් පියුන්කාරයෙක් ඉදිකඩුල්ල ළඟ බයිසිකලය නවතා බැල් එක ගැසුවේය. මම මහත් සතුටින් දුව ගියෙමි. අපට ලියුම එවන්නට තාත්තා හැර වෙන කවුරුත් නැත.

මම සුපුරුදු සිනාමුසු මුහුණින් යුතුව තැපැල් පියුන්කරු වෙත ආවෙමි. එහෙත් ඔහු මා දෙස බැලුවේ වෙනදා මෙන් සිනාමුසු මුහුණින් නොව බැරෑරුම් මුහුණකිනි. ලිපියක් වෙනුවට ඔහු මා වෙත දිගු කෙළේ විදුලි පුවතකි. නැතිගත් මම භ්‍රාන්ත වීමි. කාගෙන්ද මොකක්ද ආරංචිය? මම ගැහෙන හදවතින් යුතුව වෙවුලන ඇඟිලිවලින් යුතුව ඔහුගේ පොත අත්සන්කර විදුලි පණිවුඩය ගතිමි. එහි ලිපිනය ලියා තිබුණේ අම්මා නමටය. මම වෙවුලන ඇඟිලිවලින් මහත් ආයාසයෙකින් විදුලි පුවත විවෘතකර දිගහැර බැලීමි.

රත්බණ්ඩා මළා. වහාම එන්න - මුදියන්සේ.

"අනේ දෙයියනේ මගේ රත්තරන් තාත්තා.........!" යි මට ඉබේම යටිගිරියෙන් කෑගැසිණ.

ඒ සමගම ක්ෂණයකින් මුළු ලෝකයම කම්පා වී අඳුරු විය. ඝනාන්ධකාරයේ කණාමැදිරියෝ ගිනි දල්වාගෙන ඉගිලුණහ.

මගේ මුළු ලෝකයම සදාකාලයටම අන්ධකාරවූයේ එදා නොවේද?



# 8.

විදුලි පුවත එවා තිබුණේ මුදියන්සේ මාමා විසිනි. ඔහු ද තාත්තාත් සමග ගමෙන් පිටවී ගොස් වැඩ කෙළේ එකම පතලේමය.

ආරංචිය ලැබුණ මොහොතේ විලාපදී හඬා වැලපීම හැර අන් කළයුතු කිසිවක් ගැන අම්මාටත් මටත් සිතා ගත නොහැකි විය. අප දෙදෙනාම රටතොට ගැන නොදන්නා කිසිවක් කරකියා ගත නොහැකි අසරණ ගැහැනු දෙදෙනෙකි.

පිහිට වීමට සිටින කෙනෙකු වශයෙන් ළඟට යාමට අපට සිටියේ හීන්බණ්ඩා මාමා පමණකි. ඔහු අම්මාගේ එක්කුස උපන් සහෝදරයාය. අපි ඔහු සොයා සැතපුම් දොළහක් ඈත අම්මාගේ ගමට ගියෙමු. ග්‍රාමීය රෝහලක සුළු සේවකයකු වන ඔහු ගෙදර නොසිටියේය. රෝහලට ගොස් ඔහු හමුවූ නමුත් අවමඟුල් කටයුතු සඳහා මුදල් සොයාගැනීම ඔහුට ද ප්‍රශ්නයක් විය. මග වියදම්වලට පමණක් සෑහෙන මුදලක් ණයට ලබාගැනීමට ඔහුට හැකි විය.

අම්මාත් මල්ලීත් මාමාත් මාත් රත්නපුරයට පැමිණියේ පසුදාය. ලිපිනය අනුව තාත්තා වැඩ කළ ස්ථානය අප විසින් සොයාගනු ලැබුයේ ආයාසයෙනි.

අප එහි එනවිට පොල්අතු වාඩියක් තුළ ලී මැස්සක් උඩ තාත්තාගේ මිනිය බාවා තිබිණ. අපි විලාපදෙමින් ඒ මිනිය බදා ගතිමු. විලාපදීගෙන මිනිය මත හැපුණ අම්මා වීසඥවී වැටුණාය.

තාත්තාගේ සිරුර තැලී පොඩිවී ඇටකටු බිඳී විරූපවී තිබිණ. කුණුවෙන්නට ආසන්නව දුර්ගන්ධයක්ද හැමීය. අප එනතුරු එය වළනොදා තබාගෙන ඇත්තේ මුදියන්සේ මාමා විසිනි. තාත්තා ගැඹුරු පතලක ඉල්ලමක් කපද්දී පරණ දෝනාවක් මතුවීමෙන් පස්කණ්ඩියක් කඩාවැටී එයට යටවී ඇත. මහත් අමාරුවෙන් ගොඩගනු ලබා ඇත්තේ

For E-Pusthakalaya



මළ සිරුරය. අනේ මගේ තාත්තා පස් කණ්ඩියට යටවී මොන වේදනාවක් විඳින්නට ඇද්ද? ඔහුට මොනවා මතක් වන්නට ඇද්ද? අප හැමෝම මතක් වන්නට ඇත.

තාත්තා මළ ආකාරය අසන්නට ලැබීමෙන් දරාගත නොහැකි වේදනාවෙන් මම විසඳුවීමි. අනේ මගේ දුප්පත් අසරණ තාත්තා අප ජීවත් කරවීම සඳහා මේ තරම් දුරකතරක් පැමිණියේ බෙත් උගුරක් පවා නැතිව මෙහෙම මැරෙන්නද?

මිනිය ගමට ගෙන එන්නට අපට කොහෙත්ම පුළුවන් කමක් නොවීය. ඒ සඳහා වැය වන විශාල වියදම දරන්නේ කවුද? වාඩියේ කම්කරුවෝ එක්ව ඔවුන්ගේ වියදමින් ඉතාම ලාභ මිනී පෙට්ටියක් ගෙනැවිත් තාත්තා ගේ සිරුර එහි තැන්පත් කළහ. අප එහි යන විට මරණ පරීක්ෂණයද පවත්වා අවසන්ව තිබුණ හෙයින් මිනිය වළ දැමීමට කටයුතු සලස්වනු ලැබීය.

මළ හිරු බැසගෙන යද්දී පාළු කනත්තක තාත්තා ගේ මිනිය වළලනු ලැබූ සොහොනේ ගුරුපාට පස් කණ්ඩිය මත අපි වැලපෙමින් ඉටිපන්දම් පත්තු කෙළෙමු. ඔහු මෙහි තනිකර දමා අප පය ඔසවන්නේ කෙසේද?

පය ඔසවා ගන්නට තරම්වත් පණ නැතිව සිටි අම්මා මුදියන්සේ මාමා විසින් වත්තන් කරගනු ලැබුවාය. අවසන් වරටත් කඳුළු වැගිරෙන ඇසින් තාත්තාගේ සොහොන දෙස බලා සිටි මල්ලීත් මමත් දෙදණ ඔබා එයට වැඳ නැගී සිටියෙමු. මතු ජාතිත් උපදිනා උපදිනා හැම ආත්මයකම අපේ තාත්තා අපටම තාත්තා වේවා!

තත්තාඳුනන රටක ඒ පාළු කනත්තේ තාත්තා සදහටම තනිකර දමා අපි ආපසු පැමිණියෙමු. තාත්තා සමග වැඩකළ කම්කරුවන්ගේ සහයෝගය නොලැබෙන්නට එතරම් වාම් අයුරින්වත් එහිදී තාත්තාගේ අවමඟුල් කටයුතු කරගැනීමට අපට නුපුළුවන් වන්නේය.

ගෙදර පැමිණි අපි තොකා තොබී ඇඹු කඳුලින් දවස් ගතකරන්නට වීමු. අම්මා හිටි හැටියේ නිතරම පාහේ වැලපෙමින් සිහිසන් නැතිව වැටුණාය.

"අනේ ඔහොම දෙයක් උනේ ඔය නුපුරුදු රස්සාවකට ගිය හින්දා



නේද දෙයියනේ? ඔය ගමන යන්ඩ එපා කියල මම කොච්චර කිව්වද? අපි හින්දා නේද ඔය ගමන ගිහින් ඔහොම දෙයක් උනේ?" අම්මා නිතරම එසේ කියමින් වැලපුණාය.

අම්මා මෙන්ම මම ද බලාගත් අතේ බලාගෙන නිතරම කල්පනාවේ ගිලී පසුවීමි. දැන් ඉතින් අපට ඇති අනාගතය කුමක්ද? අනාගතයක් කියා යමක් ඇත්තේම නැත. අපි එදිනෙදාට ජීවත් වන්නේවත් කොහොමද?

ගමේ කවුරුත් පාහේ අප සමග දුක් වූහ. අපට අනුකම්පා කළහ. සමහරු අපට කෑම බීම පවා ගෙනැවිත් දුන්හ. නමුත් ඔවුන්ගේ උපකාර කිදිනක් බලාපොරොත්තු වන්නද? එය ඉතාම සීමිත කලකට පමණි. ඉන්පසු අප ජීවිතයට මුහුණ දිය යුතුය. අපේම දෙපයින් සිටගත යුතුය. අපේම දෝතින් ජීවිතය ගොඩ නඟා ගත යුතුය.

සේන අයියාටද මෙය ආරංචිවී ඔහු අපේ ගෙදර පැමිණියේය. මම ඉවසා දරා ගත නොහැකි ශෝකයෙන් දෝතින් මුහුණ වසාගෙන හඬන්නට වීමි.

"අපි අනාත උනා සේන අයියේ. දැන් ඉතින් මගේ ජීවිතේ සේරම ඉවරයි" මම වැලපුණෙමි.

ඔහු දැඩි ශෝකයෙන් පසුවිය. බොහෝ වේලාවක් අපේ නිවසේ රැඳී සිටි ඔහු ආපසු යාටම සූදානම්ව ඉතාම ශෝකයෙන් අම්මාත් මාත් ඇමතුවේය.

"සාමා ඉස්කෝලෙන් අස්කර ගන්න එහෙම කල්පනා කරන්න එපා නැන්දෙ. අපි කොහොම හරි එයාගෙ ඉගෙනීමේ කටයුතු කරගන්න බලමු"

මට ඔහුගේ දෙපා ළඟ වැඳ වැටෙන්නට තරම් සිත් විය. අම්මා බලා සිටියා මිස කිසිවක් නොපැවසුවාය.

ඊළඟ සතියේ සිට පාසැල් නිවාඩුව ලැබීමට නියමිතව තිබුණ හෙයින් ඒ ටික දිනද මම පාසැල් නොගොස් ගෙදර නතර වුණෙමි.

තාත්තාගේ මරණය නිසා ශෝකයෙන් පසුවූ අම්මා ඊළඟට කල්පනාකරන්නට වූයේ අප ජීවත්වන්නේ කෙසේද යන්නයි. කුමක් කොට හෝ අපද ජීවත්විය යුතුය.

For E-Pusthakalaya

තාත්තා ජීවත්ව සිටියදී අම්මා ඔහුගේ ගොවිතැන් වැඩවලට උදව් වුවද කිසිදාක කුලී වැඩකට නොගියාය. ගෙවල්වල බැලමෙහෙවර කිරීමට නොගියාය. එහෙත් දැන් පවත්නා තත්ත්වයේ හැටියට එවැනි යමක් කොට හෝ දිවි රැකගත යුතු යයි ඇ කල්පනා කළාය.

පළමුවෙන්ම අම්මා උත්සාහ කළේ කිසියම් තැනක කුලී වැඩක් සොයා ගැනීමටය. එහෙත් ඒ සෑම තැනකින්ම ඇයට ඇනගන්නට ලැබුණේ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අය දැනටත් සේවයේ යෙදී සිටින හෙයින් ඇබෑර්තු කිසිවක් නැති බවය.

අන් කළ යුතු කිසිවක් නැති තැන ගමේ ගෙවල්වල එදිනෙදා බැල මෙහෙවර කිරීමට අම්මා ටිකින් ටික පුරුදු වූවාය. රාලහාමි මාමාගේ ගෙදරත් ලේකම් රාලහාමිගේ ගෙදරත් ඇතුළු යමක් කමක් ඇති ගෙවල් කිපයක්ම ගමේ තිබිණ. අම්මා ටිකින් ටික ඒ ගෙවල්වලට ඇබ්බැහි වූවාය. ඒ ගෙවල්වල කුස්සියේ වැඩපලට උදව් වූවාය. ඒවායින ලැබුණ යමක්ද රැගෙන අඳුර වැටීගෙන එන විට ගෙදර පැමිණියාය.

ඇයට ඒ එකම ගෙයකින්වත් ශ්‍රමයට සරිලන කුලියක් නොලැබිණ. ඒ වෙනුවට ලැබුණේ සහල් ටිකක් හෝ මාළුපිනි යමක් නැතහොත් ඉතුරුවුණ බත් ටිකකි. එහෙත් ඒ වෙනුවෙන් ඇ ඒ තැන්වල මොනතරම් මහන්සි වුණාද? ඇ වී කෙටුවාය. දර පැලුවාය. පිටි කෙටුවාය. කෑම ඉව්වාය.

ගෙදරකින් ලැබෙන කිසියම් දෙයකුත් රැගෙන අඳුර වැටීගෙන එද්දී අම්මා ගෙදර එන්නේ අන්තයටම වෙහෙසටත් පත්වය. ඇ ඉස්තෝප්පුවේ බිම වාඩිවී බොහෝ වේලාවක් වෙහෙස නිවා ගනියි. තම දෙපය පිරිමැද ගනියි. හන්දිපත් අතගා ගනියි.

අම්මාට ඇඟපත සෝදා ගැනීම සඳහා සෑම සවසකම මම වතුර උණුකර තබමි. ඇගේ වෙහෙස නිවුණ බවක් පෙනෙන්නේ උණුවතුරෙන් ඇඟපත සෝදාගෙන උණුවට කහට තේ එකක් බීමෙන් පසුවය.

ඉන්පසු මම අම්මා ගෙන ආ දෙයකින් රෑ කෑම පිළියෙළ කරමි. ඒ සඳහා අම්මාට වෙහෙසෙන්නට මම ඉඩ නොදෙමි.

සෑම දවසකම පීඟානට කෑම ටිකක් බෙදාගෙන බත් පිඩක්



කටෙට තබා ගනිද්දී මගේ ඇස කඳුළින් තෙත්වෙයි. උගුර හිරවෙයි. මට මේ කෑම ටික කන්නට දෙන්නට අම්මා ගෙවල්වල කොච්චර බැල මෙහෙවර කරනවද? කොච්චර බාල්දු වෙනවද? අම්මා එබඳු තත්වයකට පත්කර මගේ කුසගිනි නිවාගන්නට සිදුවී තිබීම මොන කරුමයක්ද දෙයියනේ? නිතැතින්ම මට එසේ සිතිණ. නමුත් මා මොනවා කරන්නද? අප නිසාම තාත්තා නැහුණේය. ඉන්පසු දැන් අම්මා නැහෙයි.

අම්මාට නොපෙනෙන්නට මම කඳුළු පිසදමා ගනිමි.

දවාලට මා තනිව ගෙදර සිටීම ගැනද අම්මා තුළ වූයේ බියකි.

"අනේ දුවේ තනියම ගෙදර ඉන්නකොට පරිස්සම් වෙන්න ඕන. මම කොහේ ගිහින් මොනවා කෙරුවත් දවල් තිස්සේ මගෙ පපුව ගිනි බැඳිලා ඉන්නේ"

"අම්මා ඒක ගැන බය වෙන්න එපා අම්මෙ"

"දැන් කාලෙ බොහොම නරකයි. ඇහැට කනට පෙනෙන්න ඉන්න ගෑනු දරුවෙකුට පාරෙ බැහැලා යන්නතියා ගෙදරකවත් ඉන්න පුළුවන් කාලයක්යැ. කවුරුවත් දුවට නැගිබෝග එහෙම දෙන්න හැදුවට රැවටෙන්න එහෙම එපා............"

අම්මා කියන දේ මට වැටහෙයි. මට කොතෙකුත් අඩුපාඩු ඇති බව අම්මා දනියි. ඒ නිසා කාටවත් මා රැවටේදැයි ඇයට බියක් සිතීම පුදුමයක් නොවෙයි. ඒ ගැන මා අම්මා සමග උරණ විය යුතු නැත.

"මට තේරෙනවා අම්මෙ. පරිස්සම් වෙන්න මම දන්නවා. අම්මා බය වෙන්න එපා"

"ඒක තමයි. මගෙ දුව මට විශ්වාස හින්දා තමයි තනියම ආලා යන්නෙත්"

ජ්‍යෙෂ්ඨ විභාගයේ ප්‍රතිඵල නිකුත් වූයේ ඒ පාසැල් නිවාඩු කාලයේය. එදා අපේ ගෙදර පැමිණි සේන අයියා මා සම්මාන හතක් සමග සමත්වී ඇති බව පැවසුවේය.

මගේ සිතට විශාල සතුටක් දැනිණ. එහෙත් එය මොහොතකට පමණි. ඒ සමගම මට විඳ දරාගත නොහැකි විශාල ශෝකයක් දැනිණ. මම දෝතින් මුහුණ වසාගෙන හැඬීමි.

"ඇයි මෙච්චර සතුටුදායක ආරංචියක් ලැබිලත් සාමා අඬන්නේ?"

For E-Pusthakalaya

සේන අයියා ඇසුවේය.

"මට මගේ තාත්තා මතක් වුණා සේනා අයියෙ. අද මගේ තාත්තා ජීවතුන් අතර හිටියා නම් කොච්චර සතුටු වෙයිද දෙයියනේ?"

ඒ සමගම අම්මා ද හඬන්නට වූවාය. සේන අයියාගේ ද ඇස කඳුළින් තෙත්ව තිබිණ.

"අඬන්න එපා නංගි. අපේ කටයුතු අපි කොහොම හරි කරගන්න බලමු" සේන අයියා මහත ශෝකයෙන හා අනුකම්පාවෙන පැවසුවේය.

ඒ ඔහු මතක ඇති කාලයක මට නංගී කියා කතා කළ මුල් වතාවය. එයින් ද මගේ හදවත වඩාත් වැලපිණ. අනේ මටත් වැඩිමල් සහෝදරයකු ඇත්නම්! එසේ නම් එය මෙබඳු අවස්ථාවක සිතට මොනතරම් ධෛර්යයක්ද?

නිවාඩු කාලය අවසන්වූ නමුත් නැවත පාසැල් යාම මට විශාල ප්‍රශ්නයක් විය. අම්මා මාව පාසැල් යවන්නේ කෙසේද? ඈ කොතෙකුත් වෙහෙසෙයි. එහෙත් ඇගේ මහන්සියෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් වන්නේ අපට වේලක් හැර වේලක් කා යන්තමින් නොමැරී ජීවත් වීමට පමණකි. එබඳු අමාරු තත්වයකින් අපව ජීවත් කරන අම්මා මාව පාසැල් යවන්නේ කෙසේද? ඒ ගැන ඇයට මා කරදර කරන්නෙ කෙසේද?

මා පාසැල් නොගිය නිසා සේන අයියා අපේ ගෙදර පැමිණ මට පාසැල් යාමට කීවේය. ඔහු එසේ කීවත් මා ඉගෙනීම අවසන් කරන තෙක්ම ඔහුට මගේ වියහියදම් සියල්ල දැරීමට පුළුවන්ද?

"ඒ ළමයා බුදුන් ඇතිකාලෙ දරුවෙක් දූවේ. ඒත් එයාට පුළුවන්ද අපට උදව් කරන්න? මහ එවුන් දැන ගත්තොත් උඹටයි මටයි මේ ගමේ ජීවත් වෙන්නවත් ඉඩ දෙන එකක් නැහැ." අම්මා පැවසුවාය.

එයද ඇත්තකි. මට මොනවා වුණත් අම්මාටවත් ඔවුන්ගෙන් හිරිහැරයක් නැතිව මේ ගමේ ජීවත්වීමට මා ඉඩහැරිය යුතුය. ඒනිසා මම පාසැල් නොයාමට දෙනෙත පිරුණ කඳුලින් යුතුව තීරණය කෙළෙමි. දැන් ඉතින් කෙසේ හෝ රක්ෂාවක් සොයාගත යුතුය. අම්මා විඳින මේ දුකෙන් ඇය ගොඩ ඇඹීමටත් අපට ජීවත් වීමටත් කිරීමට ඇති එකම දෙය එපමණකි. නමුත් කුමක්ද මට ලබා ගන්නට පුළුවන් රක්ෂාව?



මා නැවත සේන අයියා හමුවූයේ පෝයදා රැයක ගමේ පන්සලේදීය. අම්මා සිල් සමාදන්වී සිටියාය. මම බෝධියට මල්පූජාකර සුදුවැල්ල දිගේ විහාරය දෙසට එමින් සිටියෙමි. අහසේ හොඳින් සඳ පායා තිබිණ. විහාර බිමේ මිදුලේ සුදු වැල්ලෙන් සඳරැස් පරාවර්තනය විය.

"සාමා"

ඒ හඬින් මම හිස හරවා බැලීමි. සේන අයියා මා අසල සිටගෙන සිටියේය. ඔහු ඇඳ සිටියේ සුදු සරමක් හා අත්දිග සුදු බැනියමකි. ඒ ඇඳුම ඔහුට ඉතාම ලස්සනයැයි මට සිතිණ. ඔහු දැකීමෙන් මගේ සිත තුළ ඇතිවූයේ සතුටකි.

ඔහු මා දෙස බලා සිටින්නට විය. එක එල්ලේ එදෙස බලා සිටීමට අපහසු බවක් දැනුණ හෙයින් මම බිම බලා ගතිමි.

"මම ඔච්චර කියලත් සාමා ඉස්කෝලෙ එන්නෙ නැහැ නේද?" ඔහු හෙමිහිට ඇසුවේය.

"තරහ වෙන්න එපා අයියෙ. මම කොහොමද ඉස්කෝලෙ එන්නෙ?" මම හෙමිහිට කොඳුලෙමි.

"ඇයි මම කීවනෙ ඒ ප්‍රශ්නය මම බලා ගන්නම් කියල"

"ඒත් මට බයයි අයියෙ"

"ඇයි?"

"ඒකෙන් අයියට ලොකු කරදරයක් වෙයිද කියල"

"මොකක්ද මට තියෙන කරදරය? මට හම්බවෙන පඩියෙන් මට පුළුවනි සාමට උදව් කරන්න"

"ඒත් ඒකට අයියලාගෙ ගෙදර අය කැමති වෙයිද?"

"ඒක හරි කතාවක්නෙ. ඒවා ඒ අයගෙ සල්ලි නෙවෙයි මගෙ. මම මගෙ සල්ලි කොහොම වියදම් කළත් ඒ අයට ඇති රුදාව මොකක්ද?"

මට ඔහු පිළිබඳව අසීමිත භක්තියක් දැනිණ. මා වැනි අසරණ කෙල්ලකගේ ජීවිතය සාර්ථක කරගැනීම සඳහා අත දීමට සූදානම්ව සිටින ඔහු මිනිසකුට වඩා දෙවියකු නොවේද?

"ඒත් අයියෙ මම වගේම අම්මත් බයයි. මම නම් ඕන හිරිහැරයක් විඳින්නම්. ඒත් අයියා මට උදව්කරන විත්තිය අයියලාගෙ ගෙදර අය

දැන් ගත්තොත් මට නියා අම්මටවත් ගමේ විසිල්ලක් වෙන එකක් නැහැ. දැනට අම්මා ජීවත්වන විදියටවත් ඉන්න මම ඉඩ දෙන්න ඕන" ඒ සමගම මට හැඩිණ.

සේන අයියා කල්පනා කරමින් සිටියා මිස කිසිවක් නොපැවසුවේය.

නැවත මට ඔහු මුණ ගැසුණේ ඉරිදා දවසක ඇල්ල ළඟදීය. මම දියරෙද්ද හැදගෙන නාන්නට සූදානම් වෙමින් සිටියෙමි. ඒ අවස්ථාවේ ඔහුද පැමිණියේය.

"සේන අයියා ආයෙත් ඉස්කෝලෙ උගන්නන්න යන්නෙ ගෙදර ඉදලද?" මම ඇසීමි.

ඔහු ටික වේලාවක් මා දෙස බලා සිටියේය. ඒ මුහුණේ සිනාවක් හෝ සතුටක් නොවීය.

"මම ඉස්කෝලෙන් අස්වුණා සාමා"

මම කම්පා වීමි.

"අනේ.......... ඇයි අයියේ?"

"ඒ ඉස්කෝලේ මගේ ඉගැන්නිල්ලෙන් කිසිම වැඩක් වෙන්නෙ නැහැ. ළමයින්ට වැඩකුත් නැහැ. මට වැඩකුත් නැහැ."

"ඇයි එහෙම කියන්නෙ?"

"ඒ ළමයින්ට අධ්‍යාපනයෙන් ප්‍රයෝජනයක් ගන්න ඉඩක් නැහැ. සාමා එක්ක විභාගේ පාස්වුණ ළමයි හුඟක් දෙනෙක් දැන් ගෙදර. ඒ පන්තියේ හිටිය පිරිමි ළමයි කවුරුවත් දැන් ඉස්කෝලෙ එන්නෙ නැහැ. මම දන්නවා ඒ හැමෝගෙම ගෙදරවල්වල එක එක කරදර. ඒ ළමයි දැන් රස්සාවල් හොයනව. ගෑනු ළමයිනුත් හුඟක් දෙනෙක් එහෙමයි. දෙතුන් දෙනෙක් විතරක් ඉතුරු උනා. ඒත් ඒ අය වෙනුවෙන් පන්තියක් තියන්න ගණන මදි. ඒක නිසා ඒ අයත් උත්සාහ කරන්නෙ වෙන ඉස්කෝලවලට ඇතුළත් වෙන්න. මේ තත්වය ගැන ඒ ළමයි කාටවත් මම දොස් කියන්නෙ නැහැ. අවුරුදු ගණනක් සිද්ධවෙලා තියෙන්නෙත් මේකමයි. ලබන අවුරුද්දේ සිද්ධ වෙන්නෙත් ඒක. ඊළඟ අවුරුද්දෙත් එච්චරයි. එහෙම තැනක මම මහන්සිවන එකෙන් තියෙන පලේ මොකක්ද? ඉතා අඩු වශයෙන් මගේ වැඩක්වත්



බලාගන්න ඕන..........."

මගේ සිතට විශාල ශෝකයක් ඇතිණ. අපෙ පන්තියේ ළමයින් ඉගෙණ ගත්තේ මොනතරම් උනන්දුවෙන්ද? ඒත් අද ඒ පන්තිය කඩා ඉහිරුණ කුරුලු කූඩුවක් වගේය.

"අයියා ඉස්කෝලෙන් අස්වෙලා මොකද කරන්න හිතාගෙන ඉන්නෙ?"

"මම ආයෙත් කොළඹ යනවා ඉගෙණගන්න. ඒත් මම මේ ගම අත් ඇරලා යනවා නෙවෙයි. ආයෙත් කවදා හරි මම ගමට එන්නෙ මට පුළුවන් තරමකින් මේ ගම වෙනස් කරන්න බලාගෙන. ඒකට තවමත් මට කාලෙ නොවෙයි. මගේ බලාපොරොත්තුව තව ඉගෙණ ගෙන නියම අවස්ථාවට ගමට එන්න"

මම ඔහු දෙස ආදරයෙන් හා භක්තියෙන් බලා සිටින්නට වීමි. ඔහුගේ අභිප්‍රාය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි මම ඉන සිතින පැතීමි.

"අයියට පින් සිද්ධ වෙයි අයියා කොළඹ ගියාම මට කොහොම හරි රක්ෂාවක් හොයල දෙන්න මහන්සි ගන්න අයියෙ. මගේ තාත්තා වින්දා වගේම අම්මත් දැන් විඳින්නේ පුදුම දුකක්. මට ඒක බලාගෙන ඉන්න බැහැ........." මම කඳුළු අතරින් පැවසීමි.

"මට පුළුවන් හැම උත්සාහයක්ම ගන්නම් නංගි"

ඒ වචන ටික වුණත් මොන තරම් සහනයක්ද? එදා රාත්‍රියේ නිදා ගන්නට ගිය විට ද මම සේන අයියා ගැන බොහෝ වේලාවක් සිතීමි.

මේ දිනවල නැවතත් ලැබුණු ආරංචියක් නිසා යළිත් අපි ශෝකයෙන් ඇළලී ගියෙමු. ඒ ආරංචියද තාත්තාගේ මරණය ගැනය. තාත්තාගේ මරණය මිනීමැරුමක් බවට ගමේ දූසමාන ආරංචියක් පැතිර ගියේය. ගමට මේ ආරංචිය ලැබී ඇත්තේ මුදියන්සේ මාමා ගමේ පැමිණි අවස්ථාවකය. තාත්තා විසින් මැණිකක් සොරකම් කරනු ලැබූ බවත්, මුදලාලිට එය ආරංචි වී මැණික ආපසු ලබා ගැනීමට තාත්තාට වධහිංසා කළ බවත්, එසේ පහර දෙද්දී තාත්තා මළ බවත්, මරණයෙන් පසුව වුවත් මැණික සොයා ගත නොහැකි වූ බවත් ඒ දූසමාන ආරංචිය විය. ඉන්පසු මිනීමැරුම් චෝදනාවෙන් නිදහස් වීම

සඳහා පරණ පතලක පස්කණ්ඩියකට තාත්තාගේ සිරුර යටකරනු ලැබූ බවද එම ආරංචියෙන් කියැවිණ.

මේ ආරංචියෙන් කම්පාවූ අම්මා නිතර හඬා වැලපෙන්නට වූවාය. එයින්ම අසනීප වූවාය. ඒ ශෝකය ඇයට කෙසේවත් ඔරොත්තු නොදෙන්නක් විය.

මගේ තාත්තා සොරෙක් නොවේ. ඒ බව මම හොඳින්ම දනිමි. එහෙත් තාත්තා මැණික් ගලක් සොරකම් කළා නම් මම ඒ ගැන පුදුම නොවෙමි. ඒ එක මැණික් ගලකට තම පවුලේ සියලු දෙනාගේම ජීවිත සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කළ හැකි නොවේදැයි ඔහුට කල්පනාවන්නට ඇත. සම්පූර්ණ ජීවිත කාලයම අනුන් යටතේ ශ්‍රමය වැය කිරීමට කැපකොට වුවද ලබාගත නොහැකි සාර්ථකත්වයක් එක් සුළු ක්‍රියාවකින් ලබාගත හැකි නොවේදැයි ඔහුට සිතෙන්නට බැරිද? තාත්තා හොරෙකු නොවූවත් මේ ආරංචිය ගැන මා පුදුම නොවන්නේ ඒ නිසාය.

සෑම දෙයක්ම රුපියල් සතවලට සීමාවී ඇති සමාජයක - ඕනෑම දෙයක් මුදලට ලබාගත හැකි සමාජයක - මිල මුදල් ඇත්තවුන් ඉහළින්ම වැජඹෙන සමාජයක - මිනිසුන් අතරින් සොරකම තුරන් කළ හැකිද? සොරකම් කරන්නට එපා යයි කීමට පළමුව කළ යුත්තේ මිනිසුන්ට සොරකම් කිරීමට සිදුවී ඇත්තේ ඇයිදැයි සොයා බලා ඊට ප්‍රතිකර්ම යෙදීම නොවේද?

අම්මා ටිකින් ටිකම ශරීර සෞඛ්‍යයෙන් පිරිහෙමින් පරඬලා පතක් බවට පත්වන්නට වූවාය. එසේ කෘශවීත් ගෙවල්වල බැල මෙහෙවර කරන්නට වෙහෙසුණාය.

කෙසේ හෝ රැකියාවක් සොයාගෙන අම්මා මේ අපා දුකෙන් අතමිදවිය යුතුයයි මම දිවාරෑ දෙකේ කල්පනා කෙළෙමි. මොකක්ද මට ලබාගත හැකි රැකියාව?

ඉගෙණ ගෙන ගෙදර නැවතී සිටිය නමුත් අධ්‍යාපන හෝ චරිත සහතික කිසිවක් මා ළඟ නොතිබිණ. රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමට ඒවා අවශ්‍යය. ඒ නිසා පාසැලෙන් අස්වීමේ සහතිකය ලබාගැනීමට මම අදහස් කෙළෙමි.



# 9.

**මා** අස්වීමේ සහතිකය ගැනීමට පාසැලට ගියේ අම්මාත් සමගය. මම බුලත් හුරුල්ල ද දෝතින් ගෙන ගැහෙන හදවතින් යුතුව විදුහල්පති තුමාගේ කාමරයට ගියෙමි.

"ආ - මොකද සාමා මේ බුලත් හුරුල්ලකුත් අරගෙන?" මේසය ළඟ වාඩිවී යමක් ලියමින් සිටි එතුමා හිස ඔසවා අප දෙස බලා ඇසුවේය.

එයට පිළිතුරු දීම මට අපහසු විය. මගේ පපුව හිර වන්නට එන්නාක් මෙන් මට ඇනිණ. මම බිම බලාගෙන පයේ මාපටඇඟිල්ලෙන් සිමෙන්තිය කොනහන්නට වීමි. මා වෙනුවට අම්මා පිළිතුරු දුන්නාය.

"ළමයා ඉස්කෝලෙන් අස්කර ගන්න කියලා මහත්මයා......."

"අස්කර ගන්න?"

"එහෙමයි"

අප අතර නිශ්ශබ්දතාවයක් පැතිරිණ. මම සෑහෙන වේලාවකට පසු හිස ඔසවා විදුහල්පති තුමාගේ මුහුණ දෙස බැලීමි. එතුමා දෙනෙතෙහි රැඳවුණු උපැස් යුවළින් යුතුව මා දෙස බලා සිටියේය. මගේ දෙනෙතට කඳුළු එකතු වුණ පසු මම යළිත් බිම බලාගෙන ලේන්සුවෙන් ඇස පිසදමා ගතිමි. මගේ නාසය ද බරවනු මට ඇනිණ.

"ඉස්කෝලෙන් අස්වෙලා සාමා මොකද කරන්න යන්නෙ?"

"මොකුත් නැහැ සර්" මම බිම බලාගෙනම හෙමිහිට කොඳුරුළෙමි.

"එහෙනම් අස්වෙන්නෙ?"

මම කතා නො කෙළෙමි. මට කතා කරගත නොහැකි අයුරින් හැඬුම් එයි. පාසැලින් අස් වීමට මට කිසිදු උවමනාවක් නැත. පාසැලින් වෙන්වීම මගේ හදවත ඇඩි ලෙස පාරයි. එහෙත් අස් නොවී දුප්පත් මා වෙන කුමක් කරන්නද?

"ළමයා අස්කරගන්නෙ නැතුව මම මොනව කරන්නද මහත්මයා? ළමයගෙ තාත්තත්......." අම්මාට කියාගත හැකිවූයේ එපමණකි. ඇයට හැඩුම් ආවේය.

"ඔව් මටත් ආරංචි වුණා." විදුහල්පතිතුමා හෙමිහිට පැවසුවේය.

අම්මා ඔසරි පටින් කඳුළු පිස දමා ගනියි. මගේ හදවත දැවී යයි. සැහෙන වෙලාවකට පසු විදුහල්පතිතුමා යළිත් කටහඬ අවදි කෙළේය. ඒ කටහඬට විශාල ශෝකයක් මුසුවී තිබිණ.

"මේ වාගෙ දක්ෂ ළමයින්ට අතරමගදි අධ්‍යාපනය කඩාකප්පල් කර ගන්න සිද්ධ වෙලා තියෙන්නෙ මේ ළමයින්ගෙ කරුමෙටද - නැත්නම් මේ රටේ කරුමෙටද මන්දා." ඔහු සුසුමක් හෙළුවේය. "රටට වැඩක් ගන්න පුළුවන් මේ ළමයි හරියට කැලේ පිපිලා කැලේම පරවෙලා යන මල් වාගෙ. ඒකයි මගෙ හිතට දුක......."

"මං මොනව කරන්න ද මහත්මයා? ඒ මනුස්සයා පතළට යටවෙලා නොමළා නම් මේ ළමයටත් යන කලක් බලා ගන්න තිබුණා. අසරණ මම මොනවා කරන්න ද? අනුන්ගෙ ගෙවල්වල බැල මෙහෙවර කර කර මේ ළමයට ඉහළට උගන්නන්න මට පුළුවන් ද?"

"මට තේරෙනව. බැල මෙහෙවර කරලා හරි මේ ළමයට උගන්නන්න කියල කියන්න මට පුළුවනි. ඒත් මම එහෙම කියන්නෙ නැහැ. දැන් ඉගෙණ ගන්න ළමයින්ගෙ අනාගතය ගැන සහතික වෙන්න මට පුළුවන් කමක් නෑ. සාමා දක්ෂ එක ඇත්ත. ඒ ළමයා පෙනී හිටින හැම විභාගයක්ම පාස් කරයි. ඒත් ඊළඟට කරන්නෙ මොකක්ද? උපාධිධාරීනුත් දහස් ගණනක් අතරමං වෙලා ඉන්න රටක ඉගෙනීමෙන් ළමයකුගෙ අනාගතය සහතික කරන්න මට බැහැ....."

අම්මාත් මමත් නිහඬව බලා සිටින්නට වීමු. විදුහල්පති තුමාගේ මුහුණෙන් පළ වූයේ මහත් ශෝකයකි. එය කලකිරීමකට ආසන්නය. මේ රටේ පවත්නා නිදහස් යයි කියන අධ්‍යාපන ක්‍රමය ගැන ඔහු කලකිරී සිටිනු ඇත. අම්මා වැනි අයට අවුරුදු පහකට වරක් නොයෙකුත් බලපෑම් මැද ඡන්ද කොළයක කතිරයක් ඇඳීමට පමණක් අවස්ථාව දී ඇති ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඔහු කලකිරී සිටිනු ඇත. එහෙත් ඒ කිසිවක් ගැන කෙළින්ම කතා කිරීමේ නිදහස අහිමි වූ



අප සේම දුක්මුසුව අසරණ අප දෙස බලා සිටියි.

"කොහොම උනත් සාමා වගේ දක්ෂ ළමයි ඉස්කෝලෙන් අස්වෙන එක ඉස්කෝලෙට විශාල පාඩුවක්. දක්ෂ ළමයි අස් වුණාම ප්‍රතිඵල හොඳ නැහැ. අන්තිමට ඒකෙ දෝසෙත් එන්නෙ අපට...."

මට එතුමා පිළිබඳව ඇතිවූයේ විශාල භක්තියකි. අප වෙනුවෙන් එතුමා කොපමණ මහන්සිවී ද? විභාගය සඳහා අපට සමහර විෂයයන් උගන්වනු ලැබුවේ ඔහු විසිනි. සවසටද ඔහු අප්ව පාසැලේ නවත්වාගෙන ඉගැන්වූයේය. විභාග ප්‍රතිඵල ඉතා ම හොඳ වූයේ එහෙයිනි. එහෙත් එතුමා බලාපොරොත්තු ඵලය ඉන් අත්වී ද?

එතුමා මගේ අස්වීමේ සහතිකය ලියන්නට විය. හැඬෙන්නට තරම් ආසන්න කලකිරීමක් එතුමාගේ මුහුණ පුරා පැතිර තිබිණ. එතුමා සහතිකය ලියා මා දෙස බැලුවේය.

"වැඩක් කරවා ගන්න පුළුවන් දන්නා අඳුනන කවුරු හරි කෙනෙක් නැත්නම් මේ සහතිකේට කොච්චර සම්මාන තිබුණත් වැඩක් නැහැ. ඇමති කෙනෙක් හරි මන්ත්‍රී කෙනෙක් හරි අල්ලා ගන්න පුළුවන් නම් මේ මොන සහතිකයක්වත් නැතත් ඔය සංස්ථාවක කාරිය රක්ෂාවක් ලබා ගන්න අමාරුවක එකක් නැහැ. කෝකටත් සාමා මේක තියාගෙන උත්සාහ කරලා බලන්න. සාමා හොඳට ඉගෙණ ගත්තා - හොඳට හැසිරුණා - නොයෙක් අවස්ථාවලදි ඉස්කෝලේ ගෞරවය ආරක්ෂා කරලා දීලත් තියෙනවා. මගෙන් මොනවා හරි උදව්වක් ඕන වුණ වෙලාවක බය නැතුව ඇවිත් මාව මුණ ගැහෙන්න." යයි පවසා ඔහු සහතිකය මා වෙත දිගු කෙළේය.

මම එය ගෙන අම්මා අතට දී බුලත් හුරුල්ල දෝතින් ම ගෙන ඔහු වෙත ආසන්න වීමි. මගේ දෙනෙත් කඳුළින් පෙගෙයි. හදවත වැලපෙයි. එය හිරවන්නට එන්නාක් බඳුය. මම බුලත් හුරුල්ල දී දණබිම ගසා වැන්දෙමි. මට ඔහුගේ දෙපා සිඹින්නට තරම් සිත්විය. ඔහු මට ගුරුවරයෙකු මෙන්ම ඇතැම් අවස්ථාවල පියකුද බඳු වූවා නො වේ ද?

මම දෙනෙතින් ගලන කඳුළු පිස දමා ගනිමින් නැගිට බිම බලා ගතිමි.

"සාමා කොහොම හරි සුළු රක්ෂාවක් වත් සොයා ගන්න උත්සාහ කරන්න. ඊට පස්සේ ස්වෝත්සාහයෙන් ඉගෙණ ගන්න. ඔය ළමයට කවදාහරි හොඳ අනාගතයක් තියෙනවා. මම ඔය ළමයගෙ අනාගතය සාර්ථක වේවා කියල පතනව" එතුමා. පැවසුවේය.

එහෙත් ඒ කටහඬ ශෝකයෙන් බිඳී තිබිණ.

මම පාසැලේ අනෙක් සෑම ගුරුවර ගුරුවරියක වෙත ද ගොස් වැන්දෙමි. ඒ සෑම කෙනෙක්ම මා ගැන දුක් වූහ. මට සුබ පැතූහ. ඒ සෑම කෙනෙකු ළඟදීම මට හැඬිණ.

මිස් මොරගගෙන් මගේ හිස අතගාද්දී මට මෙන්ම ඇයටද හැඬිණ. ඈ මට කෙතරම් ආදරය කළ ගුරුවරියක් ද. අපට ඉතිහාසය ඉගැන්වූයේ ඇයයි. ඇය මට ශිෂ්‍යාවකට වඩා ඇතැම් අවස්ථාවල මිතුරියකට මෙන් ද සැළකුවාය. තරුණ පුහුණු ගුරුවරියක වන ඈ ළමයින් සහ තමා අතර විශාල පරතරයක් තබා නොගත්තායු.

"මම නම් සාමාගෙන් බලාපොරොත්තු වුණේ ඔහොම අතරමග නවතින අනාගතයක් නොවෙයි. ඒත් ඔය ළමයට කවදාහරි හරියන්න ඕන" ඈ කඳුළ අතරින් පැවසුවාය.

අපට සිංහල භාෂාව සහ සාහිත්‍ය ඉගැන්වූ සිරිවර්ධන සර් ඇඩි කලකිරීමකින් පසු වුණේය. ඔහු උපාධිධාරි ගුරුවරයෙකි.

"විභාගෙ පාස්වුණ ළමයි හැමෝම අස්වෙවී යනවා. අපි මහන්සිවුණේ මොනවටද කියල මට හිතාගන්න බැහැ. ඒ මහන්සිවලින් කිසිම වැඩක් වෙන්නෙ නැහැ"යි ඔහු පැවසුවේය.

"සාමා වාගෙ ළමයි ඉගෙණීම අවසාන කරන්න ඕන මේ වාගේ ඉස්කෝලෙකින් නොවෙයි - විශ්ව විද්‍යාලෙකින්. ඒත් මම දන්නව ඔය ළමයට තියෙන අමාරුකම්. අනිත් ළමයිනුත් හුගක් දෙනෙකුට එහෙම තමයි. විභාගේ පාස් වුණ අයගෙන් කීප දෙනයි නිවාඩුවෙන් පස්සේ ඉස්කෝලෙ එන්නෙ. සමහරු ඇවිත් අස්වීම් අරගෙන ගියා රස්සාවල් හොයාගෙන. යමක් කමක් කරගන්න පුළුවන් සමහරු අස්වෙලා ගියා වෙන ඉස්කෝලවලට. ප්‍රින්සිපලුත් හුගක් කලකිරිලා ඉන්නේ මේ අවුරුද්දෙත් මෙහෙ ප්‍රවේශ පන්තිය තියන්න නොලැබෙනවට......... ඔය ළමය දැන් අස්වෙලා ගිහින් මොකද කරන්න



හිතාගෙන ඉන්නෙ?"

"මොකුත් නැහැ සර්" මම කොඳුලෙමි.

ඔහු මහත් ශෝකයෙක් මා දෙස බලා සිටින්නට විය. ඔහු උගන්වමින් සිටි පන්තියේ ළමෝ ද ශෝකයෙන් මෙන් නිහඬව අප දෙස බලා සිටින්නට වූහ. ඒ ළමෝ කවුරුත් මට ආදරය කරති. මා පාසැලේදී මෙතෙක් දැක්වූ දක්ෂකම් ගැන ඔවුහු දනිති. දයාබර සොහොයුරියක වියෝවී යන කලක මෙන් මා දෙස ශෝකයෙන් බලා සිටිති. ඔවුන්ගේ දයාබර සාමක්කා අදින් පසු මෙහි නැත.

මම සමුගෙන ලේන්සුවෙන් දෙනෙත පිස දමා ගනිමින් පන්තියෙන් ඉවත්වීමි.

මා සමග විභාගය සමත්වුණ අයගෙන් එදා පාසැල් පැමිණ සිටියේ කීප දෙනෙකි. පිරිමි ළමයි කිසිවෙක් පැමිණ නොසිටියහ. මගේ මිතුරියෝ මා වටකර ගත්හ. අප එක්වූ විට සමනලයින් රැනක් බඳු නොවේද? එහෙත් ඒ සමනලියන්ගෙන් ඉතිරිවී ඇත්තේ කීප දෙනෙක පමණි.

"අනේ සාමා ඔයත් අස්වෙලා යන්න නේද?"

"වෙන මොනවා කරන්නද නිම්මි"

"බිසෝයි මුතුයි දෙන්නත් අස්වෙනවලු"

"ඔව්. සිරිවර්ධන සර් මා එක්ක කිව්වා"

"ඔයා අස්වෙලා මොකද කරන්නෙ?"

"මොනවා කරන්නද අනේ"

"නිම්මි වෙන ඉස්කෝලෙකට යනවලු" නිම්මි දෙස බලමින් රම්‍යා පැවසුවාය.

"ඇත්තද නිම්මි?"

"ඔව් අනේ. ඔයගොල්ලෝ සේරම අස්වෙවී යන්න උනාම මේ අවුරුද්දෙත් මෙහෙ පන්තියක් පටන් ගන්න වෙන්නෙ නැහැ. තාත්තා කියනව නුවර ඉස්කෝලෙකටවත් යවන්න ඕන කියල"

"ඔයා වාසනාවන්තයි නිම්මි" මම මහත් සෙනෙහසින් ඇගේ අත අල්ලා ගනිමින් පැවසීමි.

යමක් කමක් තියෙන පවුලක දැරියක වන නිර්මලාට වියදම්

ප්‍රශ්නය එතරම් බලපාන්නක් නොවේ. ඈ අපට වඩා මොනාටම වාසනාවන්තද?

"ප්‍රේමිගෙ කල්පනාවක් නැද්ද වෙන ඉස්කෝලෙකට යන්න?"

"මෙහෙ පන්තිය නැතුව ගියොත් මාත් කොහේ හරි වෙන ඉස්කෝලෙකට නොගිහින් මොනවා කරන්නද?"

මම ඇගේද අත අල්ලා ගතිමි.

"එතකොට රම්මි?"මම රම්‍යාගෙන් ඇසීමි.

"මටත් ඉතින් ඔයාගෙ ආනිසංසේ තමයි. මෙහෙ පන්තිය නැතුව ගියොත් මටත් ගෙදර තමයි" ඈ දුක්මුසුව පැවසුවාය.

විභාගය සමත්වූ අයගෙන් වැඩිදුර අධ්‍යාපනය ලබන්නට වාසනාව ලබා ඇත්තේ කීයෙන් කීදෙනාටද? මෙතන සිටින අප හතර දෙනාගෙන් දෙදෙනෙකුට පමණි.

"ඔය දෙන්නා හරි වාසනාවන්තයි. දෙන්නා හොඳට ඉගෙණගෙන විශ්ව විද්‍යාලෙට ගිහින් උපාධි ලබාගෙන එන්න. ඒක අපේ ඉස්කෝලෙට ලොකු ගෞරවයක්. අපට ආඩම්බරයක්" මම අවංකව පැවසීමි.

"සාමා ගැන මට හරිම දුකයි." නිම්මි අවංකව පැවසුවාය.

"ඔයා කොච්චර දක්ෂද? සම්මාන හතක්" යයි ප්‍රේමා දුක්මුසුව පැවසුවාය.

"මොනවා කරන්නද ප්‍රේමා - ඒක මම ලබා උපන් හැටි" මම ශෝකයෙන් පැවසීමි

මට විනීතා මෙනෙහි විය.

"විනීතා විභාගේ පේල්ලු නේද?

"ඔව් අනේ"

"එයා නිවාඩුවෙන් පස්සෙ ඉස්කෝලෙ ආවෙ නැද්ද?"

"නැහැ. එයාව දැන් කොළඹ ගෙවන ඉස්කෝලෙකට දාලා"

"එහෙම තමයි සල්ලි තියෙන අයට ඉගෙණ ගන්න බෑ. ඉගෙණ ගන්න පුළුවන් අයට සල්ලි නැහැ"යි රම්‍යා පැවසුවාය.

"ඒ උනාට සල්ලි බලෙන් හරි විනීතා ඉගෙණගෙන ඒවි. මෙහෙ බැරි උනොත් පිටරට ගිහින් හරි" ප්‍රේමා පැවසුවාය.



අපි තවත් බොහෝ වේලාවක් කතා කරමින් සිටියෙමු. එහෙත් අප පසුවූයේ වෙනදා මෙන් ප්‍රීතියෙන් නොව මහත් ශෝකයෙනි. අප කීපදෙනා කුරුලු කූඩුවක ඉතිරිව සිටින පැටවුන් කීපදෙනෙකු බඳුය. මෙතෙක් එක්ව සිටි අපි ඒ කූඩුව අතැර පියා දසත ඉගිලී යන්නෙමු. නැවත කවදා කොතැනකදී අප හමුවෙතැයි කාට කිව හැකිද? ජීවිතයේ එක්තරා සොඳුරු යුගයක් සදහටම අවසන්ව තිබේ.

පිටපැත්තේ සිටි අම්මා කොට බිත්තිය උඩින් අප දෙස බැලුවාය.

"පමා වෙනවනෙ අපි යමු නේද දුවේ?"

මා මෙන්ම මගේ මිතුරියෝද අම්මා දෙස බැලූහ. අප අතර වූයේ ඇඩි නිහඬ බවකි. අපි ශෝකයෙන් උනුනුන්ගේ මුහුණු බලමු. අපේ සිත් තව තවත් ශෝකයෙන් ඇළලී යයි. සමුගෙන වෙන්ව යායුතු මොහොත පැමිණ තිබේ.

"එහෙනම් නිම්මි - ප්‍රේමා - රම්මි - මම ගිහින් එන්නම්" මම ගොත ගසා ගතිමි.

මගේ මෙන්ම ඔවුන්ගේ ද ඇස් කඳුලින් තෙමී තිබිණ.

"යමු. අපිත් එන්නම් ගේට්ටුව ළඟට එනකන්"

ඔවුහු ද මාත් සමග පිටත් වූහ. පන්ති කාමරයෙන් මිදුලට බසින්නට පෙර මම අවසන් වරටත් පන්ති කාමරය පුරා දෙනෙත් විහිදුවීමි. මවිසින් අඳිනු ලැබූ චිත්‍ර කීපයක් තවමත් බිත්තිවල එල්ලා තිබේ. ඒවා තවත් ටික කාලයක් එසේ රැඳී පවතිනු ඇත.

මම සුසුමක් හෙළා පන්ති කාමරයෙන් මිදුලට බැසීමි. අපි ගේට්ටුව දෙසට ගමන් කරන්නට වීමු. අම්මාද අප පසුපසින් ශෙමිහිට ඇදුණාය. මිදුලේ මල් පාත්ති වෙත මගේ දෙනෙත ගැටිණ. ඒවා මගේ දෝතින් කොතෙක් පොහොර හා දිය ලබා ඇද්ද? ඒවායෙහි මල් පිපී තිබේ. මා එම මල් පඳුරු දෙස බැලුවේ ඒවායින් සමු ගන්නාක් මෙනි.

මල් පාත්ති ඉක්මවූ අපි එළවළු පාත්ති අතරින් වැටුණු සුදු වැලි පාර දිගේ ගමන් කරන්නට වීමු. අප එක එකාගෙ පාත්ති පිහිටා ඇත්තේ යාබදවය. මගේ පාත්තිය දෙස මම බැලීමි. නිවාඩු කාලයේ එය තරමක් වල් බිහිවී ඇත. එහෙත් එහි එළවළු පැල මල් දරා තිබේ. මා එහි කෙතරම් වෙහෙසෙන්නට ඇද්ද? මින් පසු මා මෙන්ම තවත්

For E-Pusthakalaya

ශිෂ්‍යාවක් එහි වෙහෙසෙනු ඇත.

මගේ හදවත තව තවත් ශෝකයෙක් බර වෙයි. ගේට්ටුව දක්වා විහිදුන සුදුවැලි පාර දිගේ අපි හෙමිහිට පියවර තබමු. නිමිමි මගේ එක් අතක් අල්ලාගෙන සිටී. අනික් අත ප්‍රේමාගේ අතක රැඳී තිබේ. මට බිසෝ මෙනෙහි වෙයි. මං වගේම දූප්පත් කෙල්ල. එයත් අද හිටියා නම් කොච්චර හොඳද? මුතු මැණිකෙත් නැහැ. සිරිසේනත් නැහැ. සිරිසේනට සම්මාන අටක්ලු. වැඩ අටටම සම්මාන. එයා රක්ෂාවක් සොයනවලු. ගුණපාල, පියදාස ඒ ළමයිනුත් කවුරුවත් නැහැ. එක කූඩුවෙ ලැගගෙන හිටිය කුරුලුපැටව් ටික අද සීසීකඩ ගිහින්. කූඩුව තවමත් තිබුණ තැනමයි. මාත් ඉන් සඳහටම ඈත් පිටවෙලා යනව..........

මම අපමණ ශෝකයෙන් පාසැල් වත්ත සිසාරා බැලීමි. අවුරුදු ගණනක් සතුටින් සිටිය තැන. මට සෙවණ දුන් පාසැල් ගොඩනැගිල්ල - මා කුසපුරා දිය බිව් ළිඳ - මිතුරියන් සමග මා සිසිල් සෙවණ ලබා සැනසුණ මිදෙල්ල ගස - ඒ සියල්ලම නිසලව ශෝකයෙන් මෙන් මා දෙස බලාගෙන. සදහටම වෙන්වී යන දරුවකු දිහා බලාගෙන ඉන්නා වාගෙ.

මගේ පපුව හිරවෙයි. උගුරෙහි උණු අලගෙඩියක් හිරවූවාක් වැන්න.

අපි හෙමින් හෙමින් වත්තේ ගේට්ටුව වෙත ආවෙමු. හැම දෙනාම නිහඬය. අප කිසිවකුට කතාකර ගත නොහැක. වියෝ දුක අප හදවත් අරක්ගෙන ඇත. අපි ගේට්ටුව ළඟ නැවතිමු. මම මගේ දයාබර මිතුරියන්ගේ මුහුණ දෙස බැලීමි. කඳුළු පිරුණු ඇස්වලින් ඔවුහු මා දෙස බලා සිටිති. මට ඉබේම හැඬිණ. මගේ මිතුරියෝද අත් ලේන්සුවලින් කඳුළු පිසදාගන්නට වූහ. අපට කිසිවක් කතාකරගත නොහැක. එකට බැඳී තිබුණ අපේ අත් හෙමිහිට ගිළිහිණ.

"නිමමි - රම්මි - ප්‍රේමා............." මම කඳුළු අතරින් හෙමිහිට ගොතගැසීමි.

ඔවුහු මා දෙස බලා සිටිති.

"අපි ආයෙත් මුණ ගැහෙමු"

"අපි එන්නම් ඔයා බලන්න"



මට ඔවුන් වැළඳගෙන සිප ගැනීමට සිතෙයි.

"වෙරියෝ........!" මම තොල් මතුළෙමි.

"වෙරියෝ..........!" ඔවුහු ද කොඳුළහ.

මම කඳුළු පිසදමමින් ගේට්ටුවෙන් පිටවීමි. මහ පාරට පැමිණි මම පියාපත් සිඳ දමනු ලැබූ කුරුලු පැටවකු මහ පොළොවේ බඩගාන්නාක් මෙන් ආයාසයෙන් හෙමිහිට පාරදිගේ පියවර තබන්නට වීමි.

මහපාර කෙළවරක් නොපෙනෙන තරම් ඈතට දිග ඇදී ඇත. එහි අන්තය පැහැදිලිව නොපෙනෙයි. එයට අවසානයක් ඇද්ද?

මම යළිත් හිස හරවා බැලීමි. මගේ මිතුරියෝ තවමත් ගේට්ටුව අසල රැඳී මහත් ශෝකයෙන් බලා සිටිති. ඔවුන්ට පසුබිමින් මගේ දයාබර පාසැල් මැණියෝ ශෝකයෙන් මෙන් නිහඬව බලා සිටිති. මම අතක් එසවීමි. මිතුරියෝද අත් ඔසවා වැනූහ.

මට සිප්සතර කිරි පෙවූ දයාබර පාසල් මවුනි! මම අද සදහටම ඔබේ ඇකයෙන් වෙන්වෙමි. ඔබට ආයුබෝවන!

For E-Pusthakalaya

# 10.

**ගෙ**දරදී මගේ කාලය ගතවන්නට වූයේ ඉමහත් කාන්සියෙනි. උදේ පාන්දරම ගෙදරින් පිටවන අම්මා නැවත ගෙදර එන්නේ බිමට අඳුර වැටීගෙන එද්දීය. මල්ලී ද දැන් පාසැල් නොයතත් ඔහු ගෙදර රඳවා ගැනීම බෙහෙවින් අපහසුය. වැඩි වශයෙන් මා ගෙදර සිටින්නේ තනිවය.

මල්ලීට පාසැල් යාම නවත්වන්නට සිදුවූයේ ගමේ පාසැලේ අටවැන්න සමත්වූවාට පසුවය. එහි පන්ති ඇත්තේ අටවැන්න දක්වා පමණකි. මල්ලිව දුරබැහැරක පාසැලකට යැවීමට දැන් අපට පුළුවන් කමක් නැත.

"අනේ පුතේ රස්තියාදුවේ යන්නෙ නැතුව අක්කත් එක්ක ගෙදර ඉන්න. අක්කා තනියමනෙ" අම්මා උදේට ඔහුට කියයි.

එහෙත් අම්මා පිටත්ව ගොස් නොබෝ වේලාවකින් මල්ලීද හොරෙන්ම ලිස්සා යයි. ඔහු දැන් ගමේ කොලු රැළකට වැටී රස්තියාදු වෙයි. මුලින් මුලින් ඔහු සවසට අම්මාට පළමුව ගෙදර ආවේය.

"අම්මා ඔච්චර එපා කියලත් කොහෙද මල්ලී ගියේ?" මම ඇසමි.

"ඈතක කොහෙවත් ගියේ නෑ."

"එහෙනම් මෙච්චර වෙලා?"

"අපි ගුඩු ගැහුවා"

ඔහු අතපය හකුලාගෙන ගෙදරටවී මට තනි රකින්නේ කෙසේද? මෙය ඔහු ක්‍රීඩා කළ යුතු වයසයි. එහෙත් ගමේ රස්තියාදු කොලුකැලට එකතුවී ඔහු වල්වේ දැයි මට බියක් සිතෙයි.

"අද නම් මම අම්මට කියනවා කියනවාමයි" මම ඔහුව බිය ගත්වමි.



"අනේ එපා. හොඳ අක්කනෙ. මම ආයෙ යන්නෙ නෑ" ඔහු පින්සෙණ්ඩු වෙයි.

"හැමදාම මල්ලී කියන්නෙ ඔය කතාවයි. ඊත් ආයෙත් පහුවදාටත් යනවනෙ. අම්මා දැනගත්තොත් මටත් එක්කයි බණින්නෙ"

"කොහෙවත් යනවයැ අක්කෙ මම යන්නෙ සෙල්ලම් කරන්න වෙලාටනෙ. මට පුළුවන්ද ගෙටමවෙලා ඉන්න"

"ඒ උනාට ඔයා සෙල්ලම් කරන්නෙ මහ වල්කොල්ලොත් එක්ක"

"අනේ නෑ අක්කෙ උන් හරි හොඳයි"

ඔහු සෙල්ලම් කරන්නට යන බව පසුව අම්මාද දැන ගත්තාය. එහෙත් ඈ ඔහුට තරවටු නොකර කාරුණිකව කතා කළාය.

"අක්කා තනියම ගෙදරදාලා යන්න එපා අනේ රත්තරන් පුතේ. මම කොහේ ගිහින් මොනවා කළත් ඉන්නේ පපුවේ කොච්චර ගිනි බැඳීලද? අනේ යන්න එපා පුතේ ඔය වල්කොල්ලොත් එක්ක සෙල්ලමට. සණ්ඩුවක් වෙලා එවුන් මගෙ පුතාට මොකුත් කළොත් එහෙම මොන දෙයියන්ට කියන්නද? අනේ යන්න එපා පුතේ........" අම්මා පින්සෙණ්ඩු වූවාය.

"උන් මට මොනවා කරන්නද?"

"අල්ලාගෙන ගැහුවොත්?"

"උන් මට ගහන්න? එහෙනම් මම දෙන්නෙ දෙකයි"

"ආ - මෙයා දැන් එච්චර චණ්ඩිද?" මම ඇසීමි.

"එහෙනම් මට ගහනකන් මම බලාගෙන ඉන්නද?"

"ඒ චණ්ඩිකම්වලින් කමක් නෑ - උඹ මීට පස්සෙ කොල්ලන්ට එකතුවෙන්න යන්න එපා" යි අම්මා පැවසුවාය.

අම්මා කිසියම් තර්ජන ස්වරයකින් කතා කළත් ඔහුගේ කතාවට ඇය තුළ සතුටක්ද ඇති බව ඇගේ දැසින් පළ විය. ඒ ඔහුගේ නිර්භීතකම පිළිබඳව විය යුතුය. මගේ සිත තුළ ද එබඳු සතුටක් විය. මල්ලී වැඩුණු පසු නිර්භීත තරුණයකු වනු ඇත. එය එක්තරා සැනසිල්ලකි. නැත්නම් ගැහැනු දෙදෙනකු සිටින ගෙදර මල්ලීද ගැහැනියක වුවොත් අවට මිනිසුන් අපේ හිසට අත සෝදනු ඇත.

එක් දිනක් මා මල්ලිගේ කලිසම් කොටය සෝදද්දී එහි සාක්කුවක

For E-Pusthakalaya



තිබී මට බීඩි කොටයක් හසුවිය. එය දැක මම තැතිගතිමි. මල්ලී දැන් බීඩිත් බොනවද? එයාට කොහෙන්ද සල්ලි?

මල්ලී මා අසලම සබන්ගාමින් සිටියේය. මම ඔහුගේ කනින් අල්ලා ගතිමි.

"මොකක්ද මේක?" මම බීඩි කොට පෙන්වමින් ඇසීමි.

ඔහු බිය රැඳි ඇසින් එදෙස බැලුවේය.

"දැන් බීඩි බොන්නත් පුරුදු වෙලා නේද?"

"මම බොන්නෙ නෑ"

"එහෙනම් කාගෙද මේක?"

"මන්දන්නෙනෑ"

"වැරද්ද කරලා මදිවට ඒක වහන්න බොරුත් කියනවා" කියමින් මම ඔහුගේ හිසට වේගවත් ටොක්කක් ඇන ඔහුගේ කන අතහැරියෙමි.

ඔහු කෝපයෙන් මා දෙස රවා බලා සිටියේය. මෙය කොතරම් අමුතුද? වෙනදා ඔහු මේ තරම් මුරණ්ඩු නොවූයේය. මගේ සිතට කෝපය මෙන්ම බියක්ද දැනිණ.

"මොකද උඹ මට රවාගෙන?" මම කෝපයෙන් ඇසීමි.

ඔහු මා වෙතින් ඉවත්ව බිමබලා ගත්තේය. එහෙත් තොල් මතුළේය.

"කියන්නම්කො මම අම්මත් එක්ක පුතණ්ඩිගෙ හැටි"

"කියල මාව උල තියයි"

මම තිගැස්සී සිටියෙමි.

"මොනව? මොකක්ද උඹ කිවෙ?"

ඔහු කෝපයෙන් බිමබලාගෙන සුටුපුටු ගෑවා මිස කිසිවක් ඇසෙන්නට නොපැවසුවේය. මා ඔහුට පැරදුණා යයි මට සිතිණ. මා පිළිබඳව ඔහු තුළ කලින් පැවති බිය දැන් නැහැ නොවේද?

අම්මා ඔහුව පිල්කණුවේ බැඳගෙන හොඳ කෙවිටක් අතට ගත්තාය.

"මීට පස්සෙ උඹ බීඩි බොනවද? බොනවද?" අසමින් දිගට හරහට තැළුවාය.

එහෙත් වෙනදා මෙන් ඔහු කෑ බෙරිහන් නුදුන්නේය. ඒ වෙනුවට පහර පිට පහර වදිද්දී කට ඇද වෙමින් වුවද ඔහු ක්‍රෝධයෙන් අම්මා දෙස රවා බැලුවේය. මම අම්මාගේ අතින් කෝටුව උදුරා ගතිමි. බැ



ලිහා දැමූ විට ඔහු කඳුළු පිරුණු ඇස්වලින් ක්‍රෝධයෙන් අප දෙස බලා සිටියේය. ඔහු මොනතරම් මුරණ්ඩු වී සිටිද? එය සිදු වූයේ කෙසේද? මේ අර පාසැල් යද්දී සිටි අහිංසක කීකරු විනීත මල්ලීදැයි මට සිතාගත නොහැකි විය.

එදා රෑ අපි කවුරුත් ඇඬූ කඳුළින් ගත කෙළෙමු. බත් කන්නැයි අපි ඔහුට කොතෙකුත් කීවෙමු. එහෙත් කලින් තාත්තා නිදා සිටි බූරු ඇඳට වී ගුලිගැසී නිදා සිටි ඔහු වචනයක්වත් කතා නොකළේය. එක බත් ඇටයක්වත් නොකෑවේය.

"අපට සිද්ධ වෙන්න තිබුණ හැමදේම උනා. අන්තිමට උඹේ අතපය හයිවුණ කාලෙකවත් මේ කෙල්ලටයි මටයි ටිකක් හිතේ සැනසිල්ලෙන් ඉන්න ලැබෙයි කියල හිතාගෙනයි උඹලගෙ අතපය හයිකරන්න මම මේ තඹින්නෙ. ඒත් දැන්මම උඹත් ඔච්චරම හිතුවක්කාර නම්....... අනේ දෙයියනේ මේක මොන කරුමයක්ද කියල මට තේරෙන්නෙ නෑ........" අම්මා කඳුළු සැළුවාය.

බත් කන්නැයි මමද ඔහුට කොතෙකුත් කන්නලව් කෙළෙමි. එහෙත් ඔහු ඇසක්වත් හැර නොබැලුවේය. කෝටු පහරවලට ඔහුගේ අත පය සහ පිටද පළුගැසී තිබිණ. මම ඒවායෙහි තෙල් ගා පිරිමැද්දෙමි. අම්මාගේ මෙන්ම මගේද ඇසින් කඳුළු කඩා හැළිණ. මල්ලී නොකෑ නිසා අපිද නිරාහාරව නිදා ගතිමු.

පසුවදා උදේ ද අම්මා පිටත්ව යන තෙක්ම ඔහු බූරු ඇඳටවී ගුලිගැසී සිටියේය. ඉන්පසු ළිඳ වෙත ගොස් මූණ සෝදාගත් ඔහු කලිසම් කොටයද හැඳගෙන මිදුලට බැස්සේය.

"කොහෙද මල්ලී යන්නෙ?"

ඔහු කතා නොකෙළේය. ආපසු නොබැලුවේය.

"ඊයේ රෑටත් කෑවෙ නැහැනෙ. යනදිහාක තේ ටිකවත් බීලා යන්න."

ඒත් ඔහු නොනැවතුණේය. මම දුවගොස් ඔහුගේ අතින් අල්ලා ගතිමි.

"යන්න එපා මල්ලී. අනේ........" මම බැගෑපත්වීමි. ඔහු කෝපයෙන් මගේ අත ගසා දැම්මේය.

"දැන් එනව මෙතන අනේ හුනේගාලා මාව තලවන්න. පලයන් යන්න" ඔහු කෝපයෙන් මාව තල්ලු කෙළේය.

මට මහත් බියක් ඇතිණ. ඔහු කෝපයෙන් මේ යන්නට යන්නේ කොහේද?

"අනේ යන්න එපා මල්ලී. ඕනතරමක් මට බණින්න. යන්න නම් එපා" මම ඔහුගේ අතින් යළිත් අල්ලා ගතිමි.

එහෙත් ඔහු පෙරටත් වඩා කෝපයෙන් මගේ අත ගසා දමා පැන්නේය. මම ඔහු අල්ලා ගැනීමට තැත් කෙළෙමි. එහෙත් මගේ ග්‍රහණයෙන් මිදුණ ඔහු මිටින් හැරිය කුරුල්ලකු මෙන් ඉඳිකඩුල්ලට උඩින් පැන දුව ගියේය. මම ඔහු නොපෙනී යන තෙක්ම කඩුල්ල ළඟට වී බලා සිටියෙමි. ඔහු එක් වරක්වත් ආපසු හැරී නොබලා නොපෙනී ගියේය. මම කඳුළු පිරුණු දෑසින් බලා සිට සුසුමක් හෙළා ආපසු හැරුණෙමි.

මල්ලී සදහටම අපේ ග්‍රහණයෙන් මිදුණේද? මගේ සිතට විශාල බියක් ඇතිණ.

ජීවිතයේ මුල්වරට ඔහු එදා රාත්‍රියේ ගෙදර නොපැමිණියේය. අම්මාත් මමත් රෑ තිස්සේ ඔහු සොයා වෙහෙසුණෙමු. එහෙත් සොයාගත නොහැකි විය. බිමට කළුවර වැටෙන තෙක්ම ඔහු වෙලේ සෙල්ලම් කරමින් සිටි බව ඔහුගේ වයසේ ළමයින් කීප දෙනෙකුගෙන්ම දැනගත හැකිවිය. අම්මාත් මමත් මුළු රැයම කඳුළු සලමින් ගත කෙළෙමු.

"අපරාදෙ මේ වල් කොල්ලන්ට එකතුවෙලා මල්ලී නරක්වුණේ. ඉස්කෝලෙ යද්දි කොච්චරනං හොඳට හිටිය ළමයෙක්ද?"

"ඒක තමයි මාත් කල්පනා කෙළේ. ඌ නරක ළමයෙක් නොවෙයි. ඒත් අපරාදෙ වල් උනා. ඉස්කෝලෙ යන වයසෙදි ළමයි ඉස්කෝලෙ යවන්න ඕන. නැත්නම් වල් වෙනවා. අනේ මන්දා මේ ළමයා හදා ගන්නේ කොහොමද කියල. එකයි ඉන්නෙ ඒකත් එකා යකා උනොත් මොන දෙයියන්ට කියන්නද..........." අම්මා කඳුළු සැළුවාය.

පසුදා උදේ මල්ලී වෙලේ සෙල්ලම් කරමින් සිටියදී අම්මාට අහුවිය. ඈ ඔහු ගෙදර එක්කරගෙන ආවාය. ඉකුත් රැය ඔහු ගතකට



ඇත්තේ ගැටවර තරුණයකුත් සමග හේනක පැලකය. ඔවුන් මසද්සොක්කා පඳුරක් ගලවා තම්බාගෙන කා කුසගිනි නිවාගෙන ඇත. නැවතත් එබඳු ගමන් නොයන්නැයි අම්මා හැඬූ කඳුළින් යුතුව පැවසුවාය. මල්ලී කිසිවක් කතා නොකර අසා සිටියේය.

කෙසේ වෙතත් අපට ඔහු ගෙදර රඳවා ගැනීම අපහසු විය. ඉන්පසුවද ඔහු රෑට ගෙදරින් පිට නැවතී සිටියේය. ඔහු හදාගන්නේ කෙසේදැයි කඳුළු සලමින් අම්මා කල්පනා කළාය.

ඔහු වැඩි වශයෙන් ආශ්‍රය කළේ තමාට වැඩිමල් ගැටවර වියේ තරුණයින්ය. නොයෙක් අවස්ථාවල ඔහු ළඟ මාරු කාසි තිබිණ.

"කොහෙන්ද නිමල් උඹට සල්ලි?" අම්මා අසයි.

"රංජිත් අයියා දුන්නා" ඔහු එබඳු කිසියම් ගැටවරයකුගේ නමක් සඳහන් කරයි.

"ඇයි රංජිත් උඹට සල්ලි දෙන්නෙ?"

"නිකං"

"අනේ පුතේ උන් එක්ක යන්න එපා. උන් හරි හොරු. වත්තක පොල් ගැටයක් තියන්නෙ නැති එවුන්. අන්තිමේට උඹටත් නික නිකම්ම ඒක පුරුදු වෙයි. එදාට නම් මම පණ තියාගන්නෙ නෑ පුතේ. අන්න ඒක හොඳට හිතේ තියා ගනින්"

මල්ලී රස්තියාදුකාර කොල්ලන් සමග හොරකමට ඇබ්බැහි වෙනැයි අම්මාත් මමත් බියවීමු.

"අනේ මේ කොලුවා යවන්නවත් තැනක් නැහැනෙ. මල්ලිලාගෙ ගෙදරවත් යවන්න එහෙත් ළමයි කී දෙනෙක්ද?" අම්මා ඔහු ගැන කොතෙකුත් කල්පනා කළාය.

සමහර අවස්ථාවල මල්ලී කොල්ලන් සමග ගුටි ඇන ගත්තේය. ඔළු පලාගත්තේය. ඒ ගානේ අම්මාට පැමිණිලි ආවේය. එහෙත් අම්මා ඔහුට තරවටු කළ විට ඔහු එක දිගට දින ගණන් ගෙදර නොපැමිණ සිටියේය.

දිනක් බිම් කළුවර වැටීගෙන එද්දී ගුණපාල අයියා තකහනියක් අපේ ගෙදර දුවගෙන ආවේය. අම්මාද ගෙදර ආවා විතරය.

"අන්න හෙට්ටිවත්තේ පොල් හොරකමකට ගිහින් නිමල්ව

For E-Pusthakalaya

අල්ලාගෙන පොලීසියට ගෙනිච්චා"

"අපොයි දෙයියනෙ!"යි අම්මා පපුවට ගසා ගත්තාය.

තවත් කොලුවන් කීප දෙනෙකු සමග මල්ලී පොල් හොරකම් කරමින් සිටියදී මුරකාරයා පැමිණ අල්ලාගෙන ඇත. අනිත් අය මල්ලීට වඩා ලොකුය. ඔවුන් පැන දිවූ නමුත් මල්ලී අතටම අසුවී ඇත. ඉන්පසු මල්ලීව ගස්බැඳ ග්‍රාමසේවකයාද කැඳවා පොල් ද සමග මල්ලී පොලීසියට ගෙන ගොස් භාරදෙනු ලබා තිබේ. අපි එය අසා කම්පාවීමු.

"අපොයි දෙයියනේ පොලීසියෙන් මෙලහකටත් අඬු කඩලා ඇද්ද දන්නෙ නෑ. අනුන්ගෙ ගෙවල්වල වළං හෝද හෝද මම නහින්නෙ මේකටද දෙයියනේ..........!" අම්මා හැඬුණාය.

අම්මා කිසිදවසක පොලීසියකට අඩියක් තබා නැත. මේ වෙලාවේ පොලීසියට යන්නේ කොහොමද? එච්චර ඈත යාමට කිසිම වාහනයක් නැත.

අම්මා වත්තට යාමට කල්පනා කළාය. එහෙත් ඉන්පෙර අපි හුළු අත්තකුත් දල්වාගෙන ග්‍රාමසේවක මහතා හමුවීමට ගියෙමු. ඒවන විටත් ඔහු ආපසු පැමිණ නොසිටියේය. ඔහු එනතෙක්ම අපි එහි රැඳී සිටියෙමු.

"අනේ රාලහාමි මගේ කොලු පැටියට පොලීසියෙන් ගහනවද?" ඔහු ආ සැණින් අම්මා හැඬුණාය.

"ඇත්ත නොකිවොත් ගහයි" ඔහු පැවසුවේය.

"ඌත් එක්ක ඉඳලා පැනලා ගිය කොල්ලො කවුද කියල ඌ තාමත් කියල නැහැ. ඒත් අද රෑට ඒක පොලීසියෙන් ඇනගනීවි"

"අනේ දෙයියනෙ!" අම්මා හැඬුණාය.

ග්‍රාමසේවකයා තව තවත් අම්මා බියගැන්වූවා මිස ඇගේ සිත සැනසෙන වචනයකුදු කතා නොකෙළේය. ඔහු මල්ලී ගැන සැලකුවේ මහා භයානක අපරාධයක් කළ මිනීමරුවකු අයුරිනි.

අපි වත්තටද ගියෙමු.

"අනේ හාමුදුරුවනේ මගේ කොලු පැටියා බේරලා දෙන්න. ඔය නොදරුවා ඕකට පැටලිලා තියෙන්නෙ කොලු රැළට වැටිලා



නොදන්නාකමට" අම්මා වතු පරිපාලකයා ඉදිරිපිට වැඳ වැටී කන්නලව් කළාය.

"ඔව්. අහුවෙච්ච හින්දා නොදන්නාකම. ඕකුත් හැමදාම වත්තේ පොල් හොරකම් කරනවා. ඒවා අරගෙන ගිහින් කන්න දුන්නාම නම් අම්මලාට හිතෙන්නෙ නෑ නේද මෙහෙම දෙයක් වෙයි කියලා......"

"අනේ හාමුදුරුවනේ මම මගෙ දරුවන්ට කන්න දෙන්නේ අනුන්ගෙ ගෙවල්වල වළං හෝද හෝදා. මේක මේ කොලුවගෙ නොදන්නාකමට........"

"මට ඕවට කන්දෙන්න වෙලාවක් නෑ. උසාවි ගිහින් නිදහසට කරුණු කියල බේරෙන එකයි. මම අනිත් එවුන් ටිකත් අල්ලාගෙන හිරේ ඇරලයි පස්ස බලන්නේ.........."

ඔහුට කොතෙක් බැගෑපත්ව කන්නලව් කළත් ඔහුගෙන් කිසිම බුරුලක් නොවීය.

පසුවදා පොලීසියෙන් පැමිණ තවත් කීපදෙනෙක් අල්ලාගෙන යනු ලැබූහ. මල්ලීට පහර දෙන විට ඔහු අනෙක් අයගේද නම් හෙළිකර ඇත.

පොලීසියටත් ග්‍රාමසේවකයාටත් පගාවක් දුන්නොත් නඩු නොගොස් මල්ලී බේරාගතහැකි බව කීපදෙනෙක්ම කීහ. එහෙත් අපි පගාවට මොනවා දෙන්නද? අන්තිමට ග්‍රාමසේවකයා ගෙනා යෝජනාවට කැමති වන්නට අපට සිදුවිය. පොලිස්පරීක්ෂකවරයාගේ ගෙදර මෙහෙකාර කමට මල්ලී යැවීමට කැමති නම් හිරේ නොගොස් බේරාගතහැකි බව ඔහු කීවේය.

වෙන කළ හැකි කිසිවක්ම නුවූ හෙයින් ඇස් පිරුණ කඳුළින් යුතුව අපි ඒ අපරාධයට එකඟවීමු. මල්ලී අපට නැතිව ගියේ එපරිද්දෙනි.

For E-Pusthakalaya

# 11.

**ගෙ**දරටම කොටුවී මගේ කාලය ගෙවී යන්නේ මට අවශ්‍ය අයුරින් නොව කාලයට අවශ්‍ය අයුරිනි. උදේ පාන්දරම ගෙදරින් පිටවී යන අම්මා නැවත ගෙදර එන්නේ අඳුරත් සමගය. එතෙක් මා කාන්සියෙන් තනිව ගෙදර සිටිය යුතුය.

කළ යුතු දෙයක් නැතිව හුදෙකලාව ගෙදර සිටින විට මගේ සිතුවිලි මංමුලාවීම මට නොවැළැක්විය හැකි දෙයකි. මම නිතැතින්ම අතීතය ගැන සිතන්නට පෙළඹෙමි. ගෙවී ගිය පාසැල් ජීවිතය සිහිනෙන් දුටු සුරංගනා ලෝකයක් බඳුය. සඳහටම ජීවිතයෙන් ගිලිහී ගිය එය යළිත් කිසිදාක ග්‍රහණයට හසුකර ගත නොහැක. ඒ ගැන සිතා මම සුසුම් හෙළමි. තව දුරටත් ඉගෙණ ගන්නට ලැබුණා නම් කොච්චර හොඳද? ඒ වාසනාව හිමි වූයේ යමක් කමක් ඇති අයට පමණකි. ඔවුන් කවදා හෝ විශ්වවිද්‍යාලයටත් ඇතුළත්ව උපාධි ලබාගෙන උසස් රැකියාවලට ගොස් වාසනාවන්ත ජීවිත ගත කරනු ඇත. මගේ පන්තියේ සිටි මගේම තත්වයේ අනිත් ළමයින් දැන් කොහෙ කොහෙ ඇද්ද? මොන මොනවා කරනවා ඇද්ද?

අතීතය ගැන මිස අනාගතය ගැන සිතන්නට මම බියවෙමි. අනාගතය ගැන කුමක් සිතන්නද? මට අනාගතයක් නැත. ඇත්තේ නොපැහැදිලි ගණ දූමාරයක් පමණි. එහි දූමාරය හැර අනෙක් කිසිවක ඡායා මාත්‍රයක් පවා දැක ගත නොහැක. මේ දූමාරය තුළ මා සඳහා කුමක් ඇද්ද?

මට කුමක් හෝ රක්ෂාවක් සොයා ගත හැකි නම් අපට යන්තමින් හෝ හිස ඔසවා ජීවත් විය හැකි වන්නේය. එහෙත් රක්ෂාවක් සොයා ගන්නේ කෙසේද? මට කළ හැකි රක්ෂාව කුමක්ද? ඒ කිසිවක් ගැන මට සිතාගත නොහැක. මුළු අනාගතයම අනාථය.



රක්ෂාවක් ගැන සිතන විට නිතැතින්ම මගේ සිතට පිවිසෙන්නේ ගුරුවරියක වීමයි. ඉතා කුඩා අවධියේ සිටම මම ගුරුවරියක වීමට ආශා කෙළෙමි. මට උගන්වන ගුරුවරියන් දෙස මා කුඩා කාලයේ බලා සිටියේ මහත් ආශාවෙනි. ලොකුවූ පසු මම ද ගුරුවරියක වී ළමයින්ට උගන්වන්නෙමැයි මගේ පුංචි සිත තීරණය කෙළේය. මා පිළිබඳව තාත්තාගේ බලාපොරොත්තුව වූයේත් එයම නොවේද?

ඒ බලාපොරොත්තු සියල්ල අද මිරිඟුවකි.

මගේත් මල්ලිගේත් අනාගතය ගැන තාත්තා තුළ වූයේ කෙතරම් දැඩි විශ්වාසයක්ද? අප දෙදෙනා දක්ෂ ලෙස ඉගෙණ ගන්නා දෙස තාත්තා බලා සිටියේ මහත් ආදරයෙන් හා ආශාවෙනි. මා ගුරුවරියක කිරීමටත් මල්ලී ගුරුවරයකු කිරීමටත් තාත්තා සිතාගෙන සිටියේ ය. කලා විෂයන්ට පමණක් සීමා වූ පිරිසර පාසැලක ඉගෙණ ගනිමින් සිටි අප ගැන අනෙක් බලාපොරොත්තුවක් ඇති කර ගැනීමට තාත්තාට නුපුළුවන්වීම පුදුමයක් නොවේ. තාත්තාගේ මුළු අනාගතයම ඔහු සැලසුම් කරගෙන සිටියේ මාත් මල්ලීත් අරමුණු කරගෙන බව මට රහසක් නොවේ.

අම්මාත් තාත්තාත් අපේ අනාගතය ගැන නොයෙක් විට කතා කළ අයුරු නිතැතින්ම මගේ මතකයට නැගේ.

"අපි විඳින දුක අපේ දරුවන්ටත් විඳින්න ඉඩ තියන්න බැහැ නෙ. අපි දුක් වින්දට කමක් නෑ - ඒකෙන් අපේ දරුවෝ අනාගතේදි සැප විඳීවි. දෙයියන්ගෙ පිහිටෙන් ඒ දෙන්නට හොඳට ඉගෙණ ගන්න පුළුවනි. අපි දුක් විඳලා හරි ඒ දෙන්නට හොඳට ඉගැන්නුවට පස්සෙ අපටත් සැප විඳින්න බැරියැ"

ඒ බලාපොරොත්තුවලට සිදුවූයේ කුමක්ද? තාත්තා ජීවතුන් අතරත් නැත. මල්ලී ගෙදර නැත. ඔහු අනුන්ගේ ගෙදරක වැඩකාරයෙක්. අම්මා අනුන්ගේ ගෙවල්වල වළං හෝදනව. මම ගෙට කොටුවෙලා කඳුළු බොනවා. අනේ අපේ ජීවිතවල හැටි! තාත්තා මළේ කොහොමද කියන්නවත් අපි දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම තාත්තා මැරුම් කෑවද?

"මේ වැඩෙත් ඒ තරම් ප්‍රයෝජනයක් ඇති වැඩක් නොවෙයි

දුවේ. ලක්ෂ ගණන් වටින මැණික් හම්බ වෙනවා. ඒත් මුදලාලිට මිස අපට ඇති පලක් නැහැ. මුදලාලි අපි දිහා ඇහැ ගහගෙන ඉන්නෙ උකුස්සෙක් වාගෙ. වැඩකරන කුලීකාරයෙක් මෙදා මැණික් ගලක් හංගගෙන අපරාදෙ මැරුම් කෑවා. අපි විඳින දුකේ හැටියට සැහෙන ගලක් ලැබුණාම හංගා ගන්න හිතෙන එකත් පුදුමයක් නොවෙයි" තාත්තා මට එවූ එක් ලිපියක එසේ සඳහන්ව තිබිණ.

මේ කොටස දැන් නිතරම මගේ මනස වේදනාවට පත්කරයි. තාත්තාට අත්වූයේත් ඒ කුලීකාරයාට අත්වූ ඉරණමමද? මගේ තාත්තා කවදාවත් හොරෙක් නොවේ. ඔහු ශරීර මහන්සියෙන් දිවිපෙවෙත උපයා ගත්තෙකි. එහෙත් සැමදාම දුකම උරුමකරගෙන සිටි තාත්තාට සැප විඳීමේ ආශාවක් නොතිබිණිද? වටිනා මැණිකක් තමා අතට පත්වුණ වෙලාවක දුකෙන් අත මිදෙන්නට තාත්තාට සිතුණා නම් ඒ ගැන පුදුම විය යුතුද? ඔහු එතරම්ම දුක් වින්දෙකි.

තාත්තා කොතෙක් මහන්සි වුණත් අවසන් හුස්ම හෙළනවිට ඔහුට ඉතිරිව තිබුණේ කුමක්ද? දුක් විඳින්නට උපන් අසරණ දරුපවුලක් පමණකි. ඔහුගේ මුළු ජීවිතයම ඩාදියෙන් තෙතබත් වූවක් වුවත් අසරණ දරුපවුලකගේ හිසට වහලක් සාදා දී අවසන් හුස්ම හෙළන්නටවත් ඔහුට හැකි වීද? වරිච්චි බැඳ කටුමැටි ගසා වහලටය පොල් අතු සෙවිලිකර ඇති පැල්පතෙහි වැඩ අවසන්කර ගන්නට පවා තාත්තාට ජීවිත කාලය තුළම නොහැකි විය.

අප ජීවත්වන පැල්පත අපේ ජීවිතවල අසරණ බව කියාපාන සංකේතයක් බඳුය.

දිරාපත් වහල කොයි මොහොතක හෝ අපේ හිස මත කඩා වැටෙනු ඇත. වරිච්චි ලී වැසෙන්නට වැලි කපරාරු කර නැති හෙයින් ඒවා ඉල්ලන් විසින් විදිනු ලැබ දිරාගොස් තිබේ. මුදුන් බිත්තිය දැනටමත් ඇලවී තිබේ. කොයි මොහොතක හෝ එය ඇද වැටෙන්නට සූදානම්ව ඇත. බිත්තිවල වරිච්චි කෝටු මතුවී ඇදගසා ඇති මේ පැල්පත, මැරෙන්නට පණ අදින අබල දුබල මහල්ලකුගේ දිරාපත් ඇට කූඩුව බඳුය.

එසේ වෙතත් ගෙයත් අවටත් පිරිසිදුව තබා ගන්නට මම



වෙහෙසෙමි. පාසැල් යද්දී මා ළමයින්ගෙන් ඉල්ලා ගෙනැවිත් සිටවූ මල්පැලවලින් වැසුණ පාත්ති කීපය මිදූලට අලංකාරයක් ගෙන දෙයි. මම ඒවාට හොඳින් සාත්තු කරමි. ගෙදර බිත්ති කපරාරු කර ගැනීමට මට නොහැකි වුවත් මම ගෙබිම හොඳින් මැටි ගා ගොම ගා පිරිසිදුව තබා ගනිමි.

මල් වැවීමට අමතරව මම ගෙය පිටුපස පාත්ති කීපයක එළවළු වගා කරගෙන සිටිමි. එය අපේ එදිනෙදා වියදමට මහත් රුකුලකි. අපි කිසිදාක කඩෙන් එළවළු නොගෙනෙමු. ඒ වෙනුවට අපේ ආහාරයට වැඩිපුර ඇති බටු බණ්ඩක්කා මිරිස් මෑ වැටකොළු ආදිය අම්මා කඩේට විකුණයි. අනාගතය පිළිබඳව බියකරු වූත් ව්‍යාකූල වූත් සිතුවිලිවලින් වැලකී සිටීමට කිසියම් වැඩක යෙදෙන්නට මම කැමැත්තෙමි. මගේ එළවළු පාත්ති සරුවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

එහෙත් එළවළු වගාවෙන් පමණක් මට කාලය ගත කළ හැකිද? මගේ මනසටද කිසියම් ආහාරයක් අවශ්‍යය. එයට ආහාර නොලැබෙන විට මා සිහි විකල වීමට ආසන්න වන්නාක් මෙන් මට දැනෙයි. පාසැල් යද්දී මම බෙහෙවින් පොත්පත් කියවීමට පුරුදුව සිටියෙමි. මට ඇනුදු එයින් වැලකී සිටිය නොහැක.

රෙදි වියන පාසැලක ඉගෙණ ගන්නා තරුණ ශිෂ්‍යාවෝ කීපදෙනෙක් සැමදාම අපේ ගෙය පසුකරගෙන යති. ඔවුන් අත නිතර පොත් තිබෙනු මා දැක ඇත. මම ඔවුන් එන වෙලාවට වැට අද්දරට ගොස් ඔවුන් හා කතා බස් කරන්නට පුරුදු වීමි. ඉන්පසු මට ඔවුන්ගෙන් නවකතා පොත් ඉල්ලාගෙන කියවීමට හැකි විය.

එහෙත් කලකින් මට ඒ පොත් එපාවිය. ඒ සෑම පොතකම පාහේ වූයේ එක්බඳු කතාවකි. ඒ සියල්ලම එක්තරා ගණයක බොළඳ ප්‍රේම කතාවන්ය. ගැටවර තරුණ තරුණියන් මානසික සිහිනලොවක තාවකාලිකව නලවන ඒ බොළඳ හැලි ගැන මම කලකිරුණෙමි. මාත් ඒ වියෙහිම පසුවූවත් මට අවශ්‍යවී ඇත්තේ මානසික සිහින ලොවකට පිවිස ජීවිතය තාවකාලිකව හෝ අමතක කර සිටීමට නොව ව්‍යවහාර ලෝකයේ සත්‍ය ජීවිතයට මුහුණ දීමටය.

මා මෙන් අනාථවූ උගත් තරුණ තරුණියන් නව කිලක්ෂයක් මේ

For E-Books...

රටේ ඇද්ද? ඔවුන්ගේ ජීවිත ප්‍රශ්න අමතක කරවා ඔවුන්ගේ මනස සිහින ලොවක සතප්පන්නට ඇතැම් නූතන නවකතා කරුවන් කල්පනා කරන්නේ ඇයිදැයි මට සිතාගත නොහැක.

රෙදි වියන පාසැලේ ශිෂ්‍යාවන්ගෙන් මාරක හා කාම කතාද බොළඳ ප්‍රේම කතාත් ඉල්ලාගෙන කියවීම මම අත්හලෙමි. එහෙත් මට යමක් නොකියවා සිටිය නොහැක. එසේ සිටීම මට මහත් මානසික පීඩාවකි. උසස් රසවින්දනයක් හා ජීවිතය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදෙන නවකතා කිපයක්වත් සොයාගෙන කියවිය යුතු යයි මම සිතා ගතිමි. එහෙත් එබඳු නවකතා මා මෙහි කෙසේ ලබා ගන්නද?

පුවත්පතක පළවූ දැන්වීමක් අනුව මම තැපැල් මාර්ගික මිතුරු හවුලකට බැඳුණෙමි. එයට සුළු මුදලක් ගෙවූ විට නවකතා කිපයක් කියවා ආපසු යැවීමේ අවස්ථාවක් ලැබෙයි. මම එයට බැඳී උසස් සිංහල නවකතා කරුවන් යයි මා අසා තිබූ අයගේ පොත් ගෙන්වාගෙන කියවන්නට වීමි.

සිංහලයේ උසස්ම නවකතා කරුවන් වශයෙන් මේ අයව අපට හඳුන්වා දෙනු ලැබ සිටියේ පේරාදෙණි සරසවියේ කලා උපාධියක් ලබාගෙන අපට උගන්වන්නට පැමිණ සිටි තිලකරත්න සර් විසිනි. මේ ලේඛකයින් බොහෝ දෙනකු තමාගේ මිත්‍රයින්ද වන බව ඔහු පැවසුවේ කිසියම් ගර්වයකින් යුතුවය. උසස් ලේඛක මිතුරන් සිටින ඔහු අපට වීරයෙක් විය.

කොතෙක් උනන්දුවෙන් කියවූවත් නොබෝ කලකින්ම මම ඒ පොත් ගැනද නිතැතින්ම කලකිරුණෙමි. ඒ සියල්ලම නොකියවා මාර්ටින් වික්‍රමසිංහගේ විරාගය පමණක් කියවී නම් ප්‍රමාණවත් යයි මට සිතිණ. විරාගයෙන් පසුව පළවූ උසස් යයි සම්මත සෑම නවකතාවකම පාහේ මා විසින් දක්නා ලද්දේ විරාගයෙන් හඳුන්වා දෙනු ලැබූ අරවින්දටම වෙනත් වෙනත් වෙස් මුහුණු පළඳවා ඉදිරිපත් කිරීමකි.

එවාත්ම මා කලකිරුණේ- ඒ සෑම නවකතාවකම පාහේ පුන පුනා වනනු ලැබූ ජීවිත අක්‍රිය ස්වභාවය ගැනය. උසස් නවකතාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ අක්‍රිය චරිතයන් නිරූපණය කිරීම යයි



බැසගත් නිගමනයක පිහිටා ලියූ අයුරින් ඔවුන් විසින් පුන පුනා නිරූපණය කරනු ලැබුවේ නොයෙක් නොයෙක් අතට හරවමින් එලොවටත් මෙලොවටත් වැඩක් නැති ආත්ම වංචනිකයකු වන අරවින්දගේ චරිතයමය.

ජීවිතය තව දුරටත් මලානික කරන පරාජිත කුහකයින්ගේ චරිත කියවීමට මට අවශ්‍ය නැත. එසේම උසස්ම නවකතා වශයෙන් ඇතැම් පාෂාණ්ඩයින් ලියා ඇති තිත්ත කුණුහරුප කියවීමට ද මට අවශ්‍ය නැත. මේ සාමාජයේ අනාගත භාරකරුවන් වන යොවුන් පරපුරේ අපට ඇති ප්‍රශ්න හෝ ඒවාට ඇති විසඳුම් කිසිවක් මේ පණ්ඩිතමානී නවකතා කරුවන් කාටවත් නොපෙනෙන්නේ ඇයි? ඔවුන්ට අවශ්‍යව ඇත්තේ සදාකාලයටම අපව මානසික සිහින ලෝකවල අතරමං කර තැබීමට ද?

මම නවකතා කියවීම අත්හැරියෙමි. අප වැනි අතරමංවූ පිරිසක් සම්පූර්ණයෙන්ම අමතක කර සිටින ලේඛකයින් පිරිසක් වෙනුවෙන්, මා ඩාඩිය මහන්සියෙන් උපයා ගන්නා තුට්ටු දෙක වියදම් කිරීම අපරාධයකි. ඒ තුට්ටු දෙක වුවත් අම්මා උපයන දෙයට එක්විය යුතුය. ඉන් ඇගේ ජීවිතබර කළඳකින් හෝ සැහැල්ලු විය යුතුය.

අම්මා නිතර ගත කරන්නේ කල්පනාවෙන් බර මුහුණින් යුතුවය. අගේ සිරුර අකාලයේ වැහැරී ගොස් ඇත. ඈ දවස තිස්සේ ගෙවල්වල බැල මෙහෙවර කොට මහන්සිවී රෑට හන්දිපත් වේදනාවෙන් කෙඳිරිගාන විට මගේ හදවත පත්තුවෙයි. දෙවියනේ මට රක්ෂාවක් ලබා දෙන්නැයි මම සිතින් දෙවියන් යදිමි. කෙසේ හෝ රක්ෂාවක් ලැබුණොත් මට අම්මාගේ ජීවිතය සැපවත් කළ හැකි වන්නේය. තාත්තා මෙන්ම මහන්සිවී අම්මා ද අකාලයේ මිය ගියොත් එය මොන තරම් අපරාධයක්දැයි මට සිතෙයි.

ඇතැම් අවස්ථාවක මල්ලී ගැන සිහි කරමින් අම්මා කඳුළු සලයි.

"කොලු පැටියා එක්කරගෙන ගියත් ගියාමයි කිසිම ආරංචියක් නෑ දෙයියනේ"

"අම්මා ආයිත් අහලා බලන්නකො ග්‍රාමසේවක මහත්තයාගෙන්"

"ඒ මනුස්සයගෙන් ඇහුවට පලක් නෑ. අහනකොට කියන්නෙම

'ඌ කරදරයක් නැතුව ඇති බං. ඉන්ස්පැක්ටර් මහත්තය ඌව කන්ඩ ගෙනිච්චෙ නැහැ' කියල.

"අනේ දෙයියනේ අපි ඒ මනුස්සයගෙ ගෙදරවත් දන්නවනං අපට ගිහින් මල්ලිව බලලා එන්න පුළුවන්නෙ."

"ඒක තේන්නං. ඉන්ස්පැක්ටර් උන්නැහේ මෙහෙන් මාරුවෙලා යන විත්තියක් ග්‍රාමසේවකයා කිව්වෙම නැහැනෙ. කොලු පැටිය දැන් දුක් විඳිනවා ඇති. හැම්දාම රෑට මට හීනෙන් පෙනෙනවා" අම්මා කඳුළු සලයි.

"ඔය මිනිහා මාරුවෙලා ගියේ කොහාටද කියල දැන ගන්නම බැරිද අම්මේ?"

"කොහෙද? ග්‍රාම සේවකයා ඒක හැමදාම වසංගනවනෙ. වෙලාවක පොලිසියටවත් ගිහින් මම ඒක දැන ගන්න ඕන"

"අනේ අම්මේ පරක්කු නොවී වෙලාවක ගිහින් එන්න යන්නකෝ. මල්ලී ඇහැට නො දැක දැන් මාස කීයක් උනා ද?"

"අනේ මන්දා දුවේ. අපි උපන්නෙම සඳහටම අනුන්ට බැල මෙහෙවර කරන්න ද?" අම්මා සුසුම් හෙළයි.

මල්ලී සොයන්නට අම්මා පසුව පොලීසියට ගියාය. ඇයට දැන ගන්නට ලැබුණේ ඉන්ස්පැක්ටර් මාරුවී ගොස් ඇත්තේ කොළඹට බවය. අපට කොළඹ පිටසක්වල බඳුය. අම්මා හෝ මා කවදාවත් කොළඹ ගොස් නැත.

දිනක් ග්‍රාමසේවක මහතා බයිසිකලයේ නැගී අපේ ගේ ඉදිරිපිටින් යමින් සිටියේය. අම්මා ද ගෙදර සිටියාය. ඈ වහාම පාරට දුව ගියාය.

"අනේ රාලහාමි මට කොලු පැටියා දකින්න ආසයි. වෙලාවක රාලහාමි මාත් එක්ක එන්න ඕන කොළඹ යන්න" ඈ කන්නලව් කළාය.

"හියාට ඒ ඉන්ස්පැක්ටර් උන්නැහේ කොළඹ මොන පොලීසියේ ඉන්නවද කවුද දන්නෙ? බංගලාව කොහෙ තියෙනවද මම දන්නෙත් නැහැ බං" ඔහු බයිසිකලයෙන් නො බැස ම කකුලක් බිම තබා නැවති පැවසුවේය.

අම්මා කෝප වූවාය.



"කොලුවා කොළඹ එක්කගෙන යනකන් රාලහාමි ඒක මට නොකියා වසංගාගෙන උන්න. දැන් ඉන්න තැන දන්නෙ නැහැ කියනව. මේක මහ අපරාධයක් රාලහාමි. මම ළමයා දුන්නෙ රාලහාමි විශ්වාස කරගෙන......."

එවිට ඔහු කෝප වූයේය.

"හූහ! ඌ හිරේ නොදා මම කෙරුවෙ උදව්වක්. දැන් කළ හොඳ පස්සෙන් එළවන්න එනව. අපූරුයිනේ උඹේ කතාව. මම එහෙනම් කරලා තියෙන්නෙ අපරාධයක් අ?"

"රාලහාමි තරහ වෙන්න එපා. දැන් ඔය කතාවෙන් පලක් නෑ. මට කොහොම හරි ළමයා හොයල දෙන්න ඕන."

"ඇයි? නැත්නම් උඹ මාව උල තියන්න ද?" යි ඔහු කෝපයෙන් අසා බයිසිකලය පැදගෙන යන්නට ගියේය.

අම්මා කෝපයෙන් ඔහු දෙස බලා සිටින්නට වූවාය.

"මේක මහ හෙණ ගහන අපරාධයක්" ඈ කෝපයෙන් කෑගැසුවාය.

මල්ලී සොයා ගන්නේ කෙසේ දැයි පසුව ද අපි නොයෙක් වෙලාවල කල්පනා කළෙමු.

"අපි මහ ආණ්ඩුවට පෙත්සමක් දෙමු අම්මේ"

"මොනව කියලද දුවේ"

"ග්‍රාමසේවකයයි ඉන්ස්පැක්ටරුයි අපේ මල්ලිව බලහත්කාර-කමෙන් හංගාගෙන ඉන්නව කියල"

අම්මා ටික වේලාවක් කල්පනා කළාය.

"ඊට පස්සේ අපි මෙහෙ ඉන්න ද දුවේ? ආණ්ඩුවේ මුලාදැනින්ට විරුද්ධව අපි මොනවා කරන්න ද? පොලීසියෙන් ඇවිත් මේ ගෙටත් ගින්දර තියලා යාවි. අනිත් එක උඹට මොකුත් අපරාධයක් කෙරුවොත්? මට නම් මොනවා උනත් කමක් නැහැ." අම්මා කඳුළු සැළුවාය.

මේ අපරාධයන් හමුවේ අපට කළ හැකි වූයේ මා කෝප වීමත් අම්මා කඳුළු සැලීමත් පමණකි.

"මට දැන් කොලුපැටියටත් වැඩියෙ දුක උඹ ගැන"

"අම්මා මං ගැන දුක් වෙන්න ඕන නැහැ"

"දුක් නොවී ඉන්නෙ කොහොම ද දූවේ? උඹට යන කිසිම කලක් නැහැනෙ. කරපු වැඩ සේරම ගඟට ඉනි කැපුවා වාගෙ. අනිත් එක දැන් උඹේ වැඩ කටයුතු කරන්න තියෙන කාලෙ........." අම්මා සුසුම හෙළුවාය. "දැන් ගෙයිනුත් දොට්ට බහින්නයි වෙලා තියෙන්නෙ......."

මම විහාම අම්මා දෙස බැලීමි.

"ඇයි අම්මේ රාලහාමි මාමා ඒක ගැන මොකුත් කිව ද?"

"ගෙයින් යන්නෙයි කියල නම් නාම කිවෙ නැහැ. ඒත් පොරොන්දු ඔප්පුවේ හැටියට දැන් මේ ඉඩම් කෑල්ල අයිති එයාටයි කියල කිවා"

මට ඉබේම දිග සුසුමක් හෙළිණ. තාත්තා දසදුක් විඳිමින් මහන්සි වෙවී ජීවත් වුවත් අන්තිමේදී අපට ඉතිරි කර ගියේ අල්ලක් විතර මේ ඉඩම් කෑල්ලත් දිරාපත් පැල්පතක් දිළිඳුකමත් පමණකි. රාළහාමි මාමාට ඉඩම් කෑල්ල උගස් තබා තිබුණේ තාත්තා ජීවතුන් අතර සිටිය දීමය.

වැටේ තිබූ කොස් ගස බෙදා ගන්නට බැරිව අල්ලපු ඉඩමේ අයත් සමග නඩු මගට බසින්නට තාත්තාට සිදු විය. ඒ සඳහා පෙරකදෝරු ගාස්තු ගෙවීමට තාත්තා ඉඩම උගස් කෙළේය. නඩුව තවමත් අවසන් නැත. එහෙත් තාත්තා දැන් ජීවතුන් අතරත් නැත. ඉඩමත් අපට නැත.

"අනේ දෙයියනේ මට මොකක් හරි රක්ෂාවක් කියල එකක් ලැබෙනවා නම්....." මම සුසුමක් හෙළීමි.

"කෝ ඉතින් දැන් කොච්චර කල් එහෙම බලාගෙන උන්න ද? කොච්චර ඉල්ලුම් පත්තර දැම්ම ද? කිසිම පලක් නැහෙ" අම්මා ද සුසුමක් හෙළුවාය.

පාසැලෙන් අස්වූ දා සිට ම මම සතියකට වරක් නොවරදවා ම තැපැල් කන්තෝරුවට යමි. එසේ ගොස් ගැසට් පත අතට ගන්නේ මොන තරම් ප්‍රාර්ථනාවන් ඇතිව ද? එහෙත් එය පෙරළා බලා ආපසු තබන්නේ සියලු පැතුම් සුන් වීමෙනි. මා වැන්නවුන්ට ඉදිරිපත්විය හැකි රක්ෂාවක් ගැන නිවේදනයක් ගැසට් පතේ පළ වන්නේ එහෙමෙන් කලාතුරකිනි. ඒ සෑම එකකට ම මම ඉල්ලුම්පත් යවමි. ඉන්පසු සෑම උදේක ම තැපැල් කාර්යා එනතුරු මග බලා සිටිමි. එහෙත් ඔහු අපේ මිදෙදර නො හැරී පාර දිගේ කෙළින් ම යන විට මම සුසුම් හෙළමි.



සම්මාන හතක් සමග විභාගය සමත් වී සිටියත් ඉතා අඩු වශයෙන් සම්මුඛ පරීක්ෂණයකටවත් මම කැඳවනු නොලබමි.

මම සැමදා ම පියදාස අයියාගේ කඩෙන් පත්තරය ඉල්ලාගෙනැවිත් බලමි. පොල්ගෙඩි තරම් ලොකු අකුරින් මුල් පිටුවේ අලුත් ම ආරංචියක් තිබුණත් මා පත්තරය ගත් වහාම පෙරළන්නේ රැකිරක්ෂා ඇබෑර්තු පිටුව ය. එහෙත් එය ද මගේ බලාපොරොත්තු කඩ කරයි. සමහර තනතුරුවලට ඉංග්‍රීසි දැනුමක් අවශ්‍යය. තවත් ඒවාට ඇපයක් තැබිය යුතුය. ඒ දෙකම මට නැත.

රැකී රක්ෂා ඇබෑර්තු තීරයෙන් බලාපොරොත්තු කඩවී සිටින්නාක් මෙන් ම පත්තර වල පොල්ගෙඩි තරම් ලොකු අකුරින් පළවන ආරංචිවලින් ද මම හෙම්බත් වී සිටිමි. මේ පත්තරවල පළවන ආරංචි තබා ඒවායේ පළවන මරණ දැන්වීමක් පවා විශ්වාස නොකළ යුතු යයි මට සිතෙයි. 'ජ්‍යෙෂ්ඨ සමතුන් සියලු දෙනාටම රක්ෂා' 'නව කර්මාන්ත වලින් 25,000 කට රක්ෂා' 'රක්ෂා ප්‍රශ්නය විසඳීමට ඇමති අනුකාරක සභාවක්' 'තරුණ-තරුණියන් දෙලක්ෂයකට රක්ෂා' ආදී දහසකුත් එකක් ආරංචි පල වෙයි.

ආණ්ඩුවත් පත්තරත් එක් වී බලාපොරොත්තු වන්නේ සදහට ම අපව බලාපොරොත්තු මිරිඟුව මත ජීවත් කරවීමට ද?

ආණ්ඩුවේ ඇතැම් මැති ඇමතිවරු කිසිම හිරිකිතයක් නැතුව වේදිකා මත ගිරිය පුප්පමින් කයිවාරු ගසති. ඔවුන්ගේ හොරණෑ බවට පත්ව සිටින ඇතැම් පත්තර කාරයෝත් ගුවන් විදුලියත් ඒ කයිවාරුවලට ප්‍රසිද්ධිය දෙමින් බඩ වඩා ගනිති. රටේ අනාගතය භාර ගැනීමට සිටින උගත් තරුණ පෙළ වූ අපි කරන්නට රක්ෂාවක් නැතුව - ඉන්න හිටින්නට තැනක් නැතුව - හරියකට කන්න නැතුව බඩ ගින්නේ වේළි වේළී - දොට්ට බහින්න හරියකට ඇඳුමක් නැතුව මුළුගැන්වී - කෝපය හා කඳුළ සමග ජීවත් වෙමු. එහෙත් පාලකයන්ගේත් පත්තර වලත් ගුවන් විදුලියේත් කතාව - ප්‍රජාතන්ත්‍රවාදය - සමාජවාදය - දශරාජ ධර්මය - කිරියෙන් පැණියෙන් උතුරන ලංකාවක් - ලෝකෙන් උතුම් රට ලංකාවයි........! ඒක ඇමති කෙනෙක් කියාපු සිංදුවක්. 'මේ තරම් හොඳට කාපු බීපු කාලයක්

For E-Pusthakalaya



ඉතිහාසෙවත් නැ' ඒකත් ඇමති කෙනෙක් කියාපු කතාවක්.

එක අතකින් ඒ සේරම ඇත්ත. අපට මොනවා නැතත් ඔවුන්ට ඒ සියල්ලම තිබේ. ඒවා ගැන ඔවුන් කයිවාරු නො ගසා කැම දිරවන්නට වෙන මොනවා කරන්න ද?

මොවුන්ගේ පන්තියේ ආධිපත්‍යය යටතේ අපේ පන්තියේ විමුක්තිය කවදාවත් බලාපොරොත්තු විය හැකි ද?



# 12.

අපේ මිදුල දෙසින් බයිසිකලයක සීනුව නාදවනු ඇසිණ. තැපැල් කාරයා ඇවිත් ඇතැයි සිතුණ මම ගෙය පිටුපසින් වහාම මිදුලට දුවගෙන ආවෙමි. මට මගේ ඇස් දෙක අදහා ගත නො හැකි විය. තැපැල් කාරයා වෙනුවට එහි සිටියේ සිරිසේන ය. මාත් සමග එකට ඉගෙණගත් සිරිසේන. මගේ සිතට මහත් සතුටක් ඇතිණ.

"ආ - නේ. සිරි." මට එක වර ම ඉබේ ම පැවසිණ.

පාසැල් වියේ මිහිරි සුවඳ මොහොතකට යළිත් ක්ෂණික ව මගේ හදවත තුළට වහනය වෙයි. සිරිගේ ද මුහුණට පියකරු සිනාවක් නැග ඇත.

"එන්න සිරි වාඩිවෙන්න"

ඔහු බයිසිකලයෙන් බැස්සේ ය.

"මොකද සාමා ආඩිය පෙරාගෙන?"

"මම පොඩි වැඩක් කර කර හිටියෙ. මගෙ එළවළු කොටුවෙ"

"එහෙනම් සාමත් දැන් වගා ව්‍යාපාරෙට බැහැල වගේ" යයි පවසමින් සිරි අහිංසක ලෙස සිනාසෙන්නට උත්සාහ කළේ ය.

"ගෙදරට වෙලා නිකම්ම ඉන්න එක මටත් හිතුණා මොකුත් වවන්න ඕන කියල."

"ඒව හොඳ වැඩ"

"ඉතින් එන්නකො සිරි වාඩි වෙන්න"

ඔහු බයිසිකලය බිත්තියට හේත්තු කර ඉස්තෝප්පුවට ගොඩ හැගුණේ ය. මම ගෙතුළට ගොස් අපට ඇති එකම පුටුව ගෙනැවිත් ඉස්තෝප්පුවේ තැබීමි.

"වාඩිවෙන්න සිරි"

"ඉතින් කොහොම ද සාමා වාස දේස?" අසමින් ඔහු වාඩි වුණේ ය.

For E-Pusthakalaya

"ඔහෙ ඉන්නවා සිරි" යි පවසමින් මම උළුවස්සට ඇලවී සිටිගෙන ඔහු දෙස බලා සිටින්නට වීමි.

සිරිසේන දැන් පෙරට වඩා කළුගැසී ඇතැයි මට සිතිණ. පාසැල් යද්දී පිපුණාක් මෙන් පැවති ඔහුගේ මුහුණ දැන් ඇදී ගොස් ඇත. ඔහු කෙට්ටු ය.

"කෝ අම්මා ගෙදර නැද්ද?"

"නැහැ"

"ගමනක් ගිහින් ද?"

"න් - නැහැ. අම්ම දැන් වැඩට යනව"

"කොහෙ ද?"

"තැනක් නියමයක් නැහැ. කාගෙ හරි ගෙදරක එවලෙට අහුවුණ දෙයක් කරනවා. අපිත් කොහොම හරි ජීවත් වෙන්න එපායැ."

සිරිසේන නිහඬව මහත් ශෝකයෙන් මිදුල දෙස බලා සිටින්නට විය. ඔහු සමග ඇත්ත කතා කිරීමට මට ලැජ්ජාවක් නැත. ඔහු ද මගේ ම තත්වයේ පසුවන දිළින්දෙකි.

"සාමා ඉස්කෝලෙ පැත්තේ එහෙම ගියේ නැද්ද?"

"ඔහෙ නෑ අනේ. අස්වීමේ සහතිකේ අරගෙන ආවට පස්සෙ යන්න ලැබුණෙ නැහැ. සිරි ගියෙත් නැද්ද?"

"මම නම් මේ ළඟදි ගියා. ඒත් ඉස්කෝලේ දැන් හරිම පාළුයි." ඔහු දුක් මුසු ව පැවසුවේය.

"ඒ මොක ද?"

"අපිත් එක්ක විභාගේ පාස් වෙච්ච ළමයි කවුරුවත් දැන් නැහැ. ප්‍රවේශ පන්තිය තියන්න බැරි උනාට ප්‍රින්සිපල් හරි හිතේ අමාරුවෙන් ඉන්නෙ"

"එහෙනම් මේ ගමනත් පන්තියක් නැහැ?"

"ඔහෙ නෑ අනේ"

"සිරිවර්ධන සර්ට හරි දුක ඇති"

"සර් මාරුවෙලා ගිහින්"

"ඇත්තට?"

"ඔව් - ඉස්කෝලෙ ගැන කලකිරිල. සර් මෙහෙ උගන්නන එකෙන් ඉස්කෝලෙටවත් සර්ටවත් වැඩක් නැහැයි කියල"



"ඒකත් එක අතකින් ඇත්ත"

"ඉංග්‍රීසි සර් ඉගෙණ ගන්න කොළඹ ගියාලු නේද?"

"ඔව්. එයත් හොඳට ම කලකිරිලා ගියේ. මහන්සි වුණාට පලක් නැහැ කියල."

"අපට ඉගෙණ ගන්න වාසනාව නෑ සාමා"

සිරිසේන කලකිරුණ මුහුණින් යුතු ව මිදුල දෙස බලා සිටින්නට විය. මම කුස්සියට ගොස් කේතලය ලිප තබා ආවෙමි. එවිට සිරිසේන යළිත් මා දෙස බැලුවේ ය.

"සාමා මොනවටවත් ඉල්ලුම් කෙළේ එහෙම නැද්ද?"

"අපෝ මොකෝ නැත්තෙ? සංස්ථා කීපෙකම ලිපිකරු ඇබෑර්තුවලට ඉල්ලුම් පත්‍ර දැම්මා"

"ඉතින්?"

"සම්මුඛ පරීක්ෂණේකටවත් කැඳෙව්වෙ නැහැ"

"ඒක ඉතින් අපි ලබා උපන් හැටි" සිරිසේන දුක්මුසුව සුසුමක් හෙළුවේය. "අපි කොච්චර උසස් විදියට විභාගේ පාස් උනත් අපට ඉංග්‍රීසි නැහැනෙ සාමා. ඉංග්‍රීසි නැතුව කිසිම තැනකට කිට්ටුවෙන්න බැහැ"

"ඒ උනාට මෙ රටේ රාජ්‍ය භාෂාව සිංහලලු නේ?" මම දුක්මුසුව සිනාසෙන්නට උත්සාහ කෙළෙමි.

"මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල කියල කැගහන උන්ගෙ කටවල්වල පිළිකා හැදෙන්න ඕන උන් කියන මුසාවට" යයි සිරිසේන ක්ෂන්තියෙන් පැවසුවේය.

"ඒක නම් සහතික ඇත්ත"

ඔහුට තේ කෝප්පයක් සාදාගෙන එන්නට මම කුස්සියට ගියෙමි. මම තේ එක වත්කර සීනි බෝතලය අතට ගතිමි. එහි ඇති සීනි කැට කීපය සූරාගත්විට යන්තමින් තේ එකකට සෑහෙයි. අම්මාත් මමත් කිසි විටක සීනි දමා තේ නො බොමු. ඒ වෙනුවට අප කරන්නේ සීනි කැට කීපයක් අත්ලට ගෙන දිව ගාමින් කහට වතුර බීමය. එහෙත් ගෙදරට ආ අමුත්තකුට එසේ සැලකිය හැකි ද?

සිරි තේ එක පානය කරන අයුරු මම දුක් මුසුව බලා සිටින්නට වීමි. ඔහු පිපාසයෙන් යුතුව මෙහි එන්නට ඇත. එසේම ඔහු කුස ගින්නෙන් ද දොළෙනු ඇත. එහෙත් ඔහුට කෑමට දීමට යමක් අපේ ගේ හරියේ නැත. කඩෙන් වත් යමක් ගෙනැවිත් දීමට මා ළඟ මුදල් නැත. ඔහු තේ එක පානය කර මා වෙත හිස් කෝප්පය දිගු කෙළේය.

"සිරි දැන් මොක ද කරන්නේ?"

එයට පිළිතුරක් වෙනුවට ඔහු ඉතාම දුක්මුසු අයුරින් සිනා සෙන්නට උත්සාහ කෙළේය.

"මොනවා කරන්ද සාමා? මම ලිපිකරු ඇබෑර්තු වලට විතරක් නෙවෙයි කම්කරු ඇබෑර්තුවලටත් ඉල්ලුම් පත්‍ර දැම්මා. මෙදා මම කසළ ශෝධක තනතුරකටත් ඉල්ලුම්පත්‍රයක් ඇරියා......."

"ඉතින්?"

"සම්මුඛ පරීක්ෂණයටවත් කැඳෙව්වෙ නැහැ"

මම මහත් ශෝකයෙක් ඔහුගේ මුහුණ දෙස බලා සිටින්නට වීමි. ඔහු අව්‍යක්ත ලෙස මිදුල දෙස බලා සිටියේය.

"මේක මහ පුදුම ප්‍රජාතන්ත්‍රවාදයක් තියෙන රටක් සාමා. මන්ත්‍රීකෙනෙක් හරි ඇමති කෙනෙක් හරි හොඳට අඳුනනවනම් රස්සාවකට කිසිම අධ්‍යාපන සුදුසුකමක් ඕන නැහැ. උන්ගෙ එවුන් සංස්ථාවල පිරිල. රුපියල් දහස් ගණනින් පඩි ගන්න ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු ඉන්නවා සංස්ථාවල - උන්ගෙන් සමහරුන්ට ඉතා අඩු වශයෙන් ජ්‍යෙෂ්ඨය තියා අටවත් නැහැ. සමහරුන්ට තියෙන ලොකුම සුදුසුකම් මන්ත්‍රී ආසනය තරඟ කරලා ඇපෙත් නැතුව පැරදුණ එක විතරයි. අපට අධ්‍යක්ෂකම් ඕන නැහැ. ඉතා අඩු වශයෙන් අපටත් එහෙම තැනක කම්කරු තනතුරක්වත්......"

මම කිසිවක් කතා නො කර බලා සිටින්නට වීමි. සිරි පසුවන්නේ කොතරම් කලකිරීමකින් ද? එයට තවත් පොහොර දැමීමට මම අකැමැත්තෙමි. මිදුල දෙස බලාගත්වනම සිරි නැවතත් කටහඬ අවදි කෙළේය.

"අපේ තාත්තා සනීප නැතුව වැලිසර ඉස්පිරිතාලෙ. තාත්තට කාසෙ. ඔය ලෙඩේ හැදුනෙ ඕනවට වැඩියෙ මහන්සිවෙලා.



ඉස්සෙල්ලම හැදුණෙ උණ හෙම්බිරිස්සාව. ඒක නො තකා මහන්සි උනා. අන්තිමට පපුව නරක් කළා. බේත් බිබිත් කුලී වැඩ කළා. හොඳටම බැරි ගැහුණට පස්සෙයි ඉස්පිරිතාලෙ නැවතුණේ. ඊට පස්සෙයි දැන ගත්තෙ කාසෙ විත්තිය........."

මට කතාකරගත නොහැකි විය. මගේ හදවත හඬා වැලපෙයි. දෙයියනේ කය වෙහෙසා වැඩ කරන මිනිස්සුන්ට මේ රටේ කිසිම ජීවන තත්ත්වයක් නැත්තේ ඇයි? සියලුම සැප සම්පත් විඳින්නේ ඇඟෙන් ඩාදිය බිංදුවක් හොල්ලන්නෙ නැති අය. මොකක්ද මේකෙ තියෙන සාධාරණය?

"තාත්තට දැන් කොහොමද සිරි?"

"තාත්තා ගැන මට හරි දුකයි සාමා. ඉස්පිරිතාලෙ හිටියට නියම ප්‍රතිකාරයක් නැහැ. බේත් නෑ. නිදා ගන්න ඇඳක් නෑ. කන්න බත් වේලක් ලැබෙන්නෙ නෑ........"

මම මහත් ශෝකයෙන් සිරි දෙස බලා සිටින්නට වීමි. පියා නැති මටත් වඩා ඔහු මොන තරම් දුක්බර ජීවිතයක් ගෙවනවා ඇද්ද? ඉස්කෝලෙ යද්දි අපි එක් උනාම හිටියෙ කොච්චර සතුටින් ද? ඒ කාලෙ අපට මොන කරදරයක් තිබුණත් අපි එක් උනාම තාවකාලිකව හරි ඒවා අමතක වෙනව. සමනලයො වාගෙ ගත කරපු ජීවිතය. දැන් අපට කාලෙකට පස්සේ මුණ ගැහුණ වෙලාවකවත් සතුටු වෙන්න බෑ. ජීවිතේ දුකින් අපේ හදවත් පිරිල. ජීවන බරින් මිරිකිලා. අපි ජීවිතේ දකින්නේ දැන්. ඉස්කෝලෙ යද්දි දැක්කෙ හීන විතරයි. අපි ඉගෙණ ගත් ප්‍රජාතන්ත්‍රවාදය සීමාවෙලා තියෙන්නෙ පාඩම් පොත් වලට විතරයි. සමාජයට බැහැපුවාම තියෙන්නෙ සම්පූර්ණෙම්ම ඒකෙ අනිත් පැත්ත. කෝ අපට උගන්නපු සමාන අවස්ථාවන්? සමාන අයිතිවාසිකම්?

දශරාජ ධර්මයෙන් පාලනය කරනවයි කියන රට. කිරියෙන් පැණියෙන් උතුරනවයි කියන රට. ලෝකෙන්ම උතුම් රට. රෙදිත් ඇඳගෙන මෙහෙම දේවල් තියෙනවය කියන පාලකයෝ ඉන්න රට. රක්ෂා නෑ. කන්න නෑ. ඉන්න තැනක් නෑ. අඳින්න වස්තරයක් නෑ. ලෙඩට බේත් උගුරක් නෑ. මේ සේරම දුප්පත් අපට. ඒත් තියෙන

For E-Pusthakalaya

එකාට ඒ සේරම තියෙනව. උන්ට මාසික පඩිය දහස් ගණනින්. මාසික ආදායම ලක්ෂ ගණනින්. මේකද දෙයියනේ අපට උගන්නපු ප්‍රජාතන්ත්‍රවාදයේ සමාන අවස්ථා? සමාන අයිතිවාසිකම්?

"මොක ද සිරි දැන් කරන්න කල්පනා කරන්නෙ?"

"කල්පනා කරල මොනව කරන්න ද සාමා?"

"ඒත්.....!"

"ඔව් සාමා - ඒත් අපිත් කොහොමහරි ජීවත් වෙන්න ඕන. ඒකනෙ ඔයා කියන්න හැදුවෙ. මට ඔයත් එක්ක කියන්න ලැජ්ජා නැහැ. මම දැන් පරදේසක්කාර බායියෙකුගෙ වත්තක දවස් කුලියට අගල් කපනවා..."

මගේ හදවත ඇවී යයි. පාසැල් යද්දී කථිකා තරඟ වලින් ජවනා තරඟවලින් තැගි පිට තැගි දිනාගත් සිරි. උසස් ලෙස විභාගය සමත් වුණ සිරි. දැන් බායියෙකුගෙ වත්තක කුලියට අගල් කපන සිරි. දිවි පෙවෙත උපයා ගන්නට ඔහු ඔරොත්තු නො දෙන අයුරින් මහන්සි වනු ඇත. ඔහුගේ ඒ මහන්සියෙන් බායියා තව තවත් සැප විඳිනු ඇත. සිරි කෙට්ටුවී ඇදී ගොස් සිටින්නේ ඔරොත්තු නොදෙන ලෙස වෙහෙස වන නිසා විය හැකිය. ඔහුගේ දුප්පත් තාත්තාට අත්වුණ ඉරණමම ඔහුටත් අත්වනු ඇද් ද?

"මොනව කරල හරි කමක් නෑ තාත්තව සනීප කර ගන්න මහන්සි ගන්න සිරි"

"මට දැන් ජීවිතේ එපා වෙලා තියෙන්නෙ සාමා. අපේ අම්මටත් දැන් කැස්ස"

"දෙයියනේ.........!"

"අපි මහ පුදුම කරුමක්කාරයො පිරිසක්"

"අම්මව ඉස්පිරිතාලෙ නැවැත්තුවෙ නැද්ද සිරි?"

"දොස්තරලා කියනවා නවත්වන්න තරම් තවම අමාරු නැතිලු පිට ඉඳගෙන බේත් ගන්නලු. ඉස්පිරිතාලෙ ඉඩ නැතිලු."

"අනේ දෙයියනේ අපේ ජීවිත ගෙවෙන හැටි!" මම හෙමින් කොඳුලෙමි.

සිරි ශෝකාකුලව මිදුල දෙස බලා සිටින්නට විය.



"මේ රටේ තියෙන පාලන වංචාව කවදා හරි දුක් විඳින මිනිසුන්ට අවබෝධ වන තුරු අපට මේ දුක විඳින්න වෙනවා. අපි දුක් විඳින්නෙ වැඩ කරන මිනිස්සුන්ගෙ ආණ්ඩුවක් නැති නිසා. පීඩිත පන්තියේ මිත්‍රයින් හැටියට ඒ පන්තියේ කර පිටින් කවුරු පාලන බලය ලබා ගත්තත් පාලන තන්ත්‍රයේ නායකත්වය ගන්නේ ධනපති කොටස. මොන වෙස් මූණක් බැඳ ගෙන ආවත් ඒ පන්තිය ආරක්ෂා කරන්නෙ තමුන්ගෙ පන්තියේ අයිතිවාසිකම්. අන්න ඒ ක්‍රමය නැති කරන්න ලැබුණොත් අපටත් කලක් යාවි"

"මොකක්ද ඒකට තියෙන මග?"

"විප්ලවය. සන්නද්ධ විප්ලවය. ලේ හලන විප්ලවය. ඉතිහාසය අපට ඒක පැහැදිළිව උගන්නලා තියෙනවා" ඔහුගේ කටහඬ හිටිහැටියේ උස් විය.

මම බියපත් දැස ඔහු වෙත යොමු කෙළෙමි. ඔහු කෝපයෙන් ඇවෙයි. වෛරයෙන් පිපිරෙයි. මුහුණ බියකරුය.

"මිනිස්සුන්ගේ ඡන්ද බලයෙන් ආණ්ඩුවක් වෙනස් කරන්න පුළුවන් රටක ලේ හලන විප්ලවයක් කරන්න ඕන ද සිරි?"

"ඔව් ඡන්ද-බලයෙන් ආණ්ඩු වෙනස් කරන්න පුළුවන්. අපි කීප වතාවක්ම ඒක කළා. ආණ්ඩු වෙනස් වුණා. පාලකයො වෙනස් වුණා. නමුත් පාලක පන්තිය වෙනස් වුණේ නැහැ. පාලන බලය එදත් අදත් කවදටත් එකම පන්තියක් අතේ. ඒකයි අපේ පන්තියට තැනක් නැත්තේ. ඡන්දයකින් පීඩිත පන්තියට බලය අල්ලා ගන්න බැරි විදියට ධනපති පන්තිය සංවිධානය වෙලා. පීඩිත පන්ති සංවිධානවල නායකත්වය අරගෙන ඉන්නෙ ධනපතියෝ......." ඔහු කෝපයෙන් පවසයි. මම නිරුත්තරව බලා සිටින්නට වීමි. ඉන්පසු සිරි තම ස්වරයෙහි වේගය මඳක් හීන කෙළේය.

"මේ තත්වය දැන් මේ රටේ තරුණයෝ අවබෝධ කරගෙන ඉන්නව. ඒ අවබෝධය අපි ගොවියන්ට කම්කරුවන්ටත් ලබා දෙන්න ඕන. සන්නද්ධ විප්ලවයකට අපි ඔවුන් සංවිධානය කරන්න ඕන....."

මම බියපත්ව බලා සිටින්නට වීමි. මෙබඳු ව්‍යාපාරයක් පිළිබඳ කුනු කුසුවක් ඒ දිනවල පාසැලේ ද තිබිණ. එහෙත් එය භයානක

මිහිමරු ව්‍යාපාරයක් වශයෙන් විදුහල්පති තුමා විසින් හඳුන්වනු ලැබූ නිසා පාසැලේ දී එළිපිට කිසිවෙක් ඒ ගැන කතා නො කළහ.

"දැන් සිරිත් ඔය ව්‍යාපාරයට බැඳිලද ඉන්නෙ?"

"ඔව්"

"අනේ මන්දන්නෑ සිරි"

"ඇයි?"

"ඒක මහ භයානක ව්‍යාපාරයක්ලු නේ ද?"

"ඔව්. නමුත් භයානක දේ නො කර කරන්න වෙන දෙයක් නැත්නම්? එක්කෝ විමුක්තිය. නැත්නම් මරණය. දණින් වැටී මෙහෙම ජීවත් වෙනවාට වඩා දෙපයින් සිට මිය යාම වැඩිය හොඳයි. සමහර විට අපට ජය අත්වෙයි. පැරදුණොත් මරණය හිමිවෙයි. දහසක් වේදනා විඳ විඳ කුසගින්නේ ටිකින් ටික මෙහෙම මැරෙණවාට වැඩිය හොඳයි වීරයෙක් වශයෙන් එකපාර මැරෙණ එක. ඒකයි මම මේ මග තෝරාගත්තේ........"

"දැන් ඔය ව්‍යාපාරෙ හුඟක් දියුණු ද?"

"අපි ඒක දියුණු කරගෙන යනව. ලංකාවෙ අස්සක් මුල්ලක් නැරම ඒක පතුරුවාගෙන යනව. අපට දැන් විශාල පිරිසක් ඉන්නව. සාමත් අපට එක් වෙන්න ඕන. ඔයාට දේශනයක් පවත්වන්න වෙලාවක මම ගෑනු ළමයෙක් එක්කරගෙන එන්නම්. එයා විශ්ව විද්‍යාලෙක ඉගෙණ ගන්න කෙනෙක්. ඔයා මම වාගෙ අය මූළු ගැන්නුණොත් කවදාවත් අපේ පන්තියට විමුක්තියක් නැහැ. ඒක නිසා අපේ යුතුකම් කොටස ඉටු කරන්න හිත දැඩි කර ගන්න......"

සිරිසේන නිසා මගේ සිත තුළ ද මේ ව්‍යාපාරය ගැන භක්තියක් ඇති වන්නට විය. ඒ සමගම තමුන්ගේ පන්තිය වෙනුවෙන් සටන් කොට මිය යාම දැන් ගෙවන මේ ජීවිතයට වඩා සැපතක් නො වේදැයි මට ද සිතිණ.

මම ඔහු සමග ගොස් මගේ එළවළු කොටුව ඔහුට පෙන්වීමි. වට පිට බැලූ ඔහුගේ මුහුණට සිනාවක් නැගිණ.

"සාමා ගෙදරටම වෙලා නිකම්ම ඉඳලා නැහැ"

මම සිනාසුණෙමි.



"සිරිට හිතුණෙ නැද්ද මෙහෙම දෙයක් කරන්න?"

"හිතිලා හුඟක් කල්. ඒත් අපට ඉඩම් අඟලක්වත් නැහැ. මටත් කොහෙන් හරි කැළෑ ඉඩමක්වත් සොයා ගන්න පුළුවන් නම් ඇත්තටම මට පුළුවනි හොඳට මහන්සිවෙලා වගා කරන්න. බායියෙකුගෙ වත්තේ මට කොටන්න පුළුවන් නම් මගෙම ඉඩමක කොටන්න මට බැරි ඇයි? ඒත් කෝ එහෙම තැනක් නැහැනෙ. ඉඩම් කච්චේරියකට ඉදිරිපත් උනොත් ඉඩම් දෙන්නෙ කසාද බැඳපු මිනිස්සුන්ට. ඒත් ඉඩම් අඟලක්වත් නැති මිනිහෙකුට කවුද ගෑනු දෙන්නෙ?"යි පවසමින් ඔහු සිනාසුණේය.

මම ද එයට සිනාසුණෙමි.

"අපට ආණ්ඩුවෙන් ඉඩම් කෑල්ලක් ගන්න බැරි උනාට මැති ඇමතිවරුයි උන්ගෙ හිතවත් පොහොසත්තුයි ආණ්ඩුවේ ඉඩම් බෙදා ගන්නේ අක්කර සිය ගණන් වලින " යයි ඔහු දුක් මුසුව පැවසුවේය.

"ඒක නම් ඇත්ත. මං අහලා තියෙනවා ඒ අය ඒ ඉඩම්වල වටිනා ගස් කපලා විකුණලා රුපියල් ලක්ෂ ගණන් හම්බ කර ගත්තා මිස කරපු වගාවක් නම් නැතිලු."

"ඒවා එහෙම තමයි"

ඔහු තවත් සෑහෙන වේලාවක් මා සමග ගත කෙළේය

"මම යන්න ඕන සාමා - මේ බයිසිකල් එක ඉල්ලාගෙන ආවෙ. ඒක ආපහු දෙන්න ඕන. ළඟදීම දවසක මම ආයිත් එන්නම්කො ඔයාව මුණ ගැහෙන්න"

ඔහු බයිසිකලයේ නැගී පිටත්ව ගිය පසු මම ඔහු නො පෙනී යන තෙක්ම කඩුල්ල ළඟට වී බලා සිටියෙමි. ඔහු පිළිබඳව මා තුළ ඇති වූයේ මහත් අනුකම්පාවක් සහ භක්තියකි.

For E-Pusthakalaya

# 13.

"**දු**වේ ගවුමත් දැන් වැරහැලි වෙලා නේද?"

මිදුල අතුගාමින් සිටි මම හිස හරවා බැලීමි. අම්මා පිල් කණ්ඩිය මත වාඩිවී කම්මුලේ අත තබාගෙන දුක් මුසුව මා දෙස බලා සිටියාය.

"නව එකක් තියෙනවනෙ" මම පැවසීමි.

"කෝකටත් ඉතින් තියෙන්නෙ එච්චරනෙ"

මට ඇත්තේ ගවුම් දෙකකි. ඉන් එකක් දැන් වැරහැලිවී ඇත. පන්සල් යන්නවත් අනෙක් ගවුම මම පරෙස්සම් කරගෙන සිටිමි.

කරාස් කරාස් හඬින් කුරු ඉදල බොරළු පොළව මත ඇතිල්ලෙයි. කිසිවකු විසින් මගේ හදවත ද එසේ සූරන්නාක් බඳු වේදනාවක් මට දැනෙයි. අම්මාට ද එසේම දැනෙනු ඇත.

"මං හිතාගෙන ඉන්නෙ කුපන් පොතක්වත් උකස් තියල උඹට ගවුමක් මස්සල දෙන්න"

"මේක ඇති. ඔහෙ කොහොම හරි අඳිනව"

"කොහොම අඳින්නද? හැම තැනම දැන් ඉරිල මහල ගොටුගැහිලනෙ"

"කමක් නෑ. මාව බලන්න මෙහෙ කවුරු එනවටද? හාල් පොත උකස් තිබ්බොත් අපට බඩගින්නෙ මැරෙන්නයි වෙන්නෙ"

"ඒක නම් එහෙම තමයි. ඒත් මම මේ කල්පනා කරන්නෙ අඳින්නෙ කොහොමද කියල"

අඳින්න නැත්තේ මට පමණක් නොවේ. අම්මාගේද චීත්ත රෙදි දැන් වැරහැලි වෙලාය. තරමක්වත් හොඳ එකකට ඇත්තේ එකම රෙද්දකි.

නාන්නට ගිය විට මම ඇඳගෙන සිටින ගවුම ඉතා පරිස්සමින් සෝදා ගනිමි. එය වේළෙන තුරු කබල් දිය රෙද්දක් හැඳගෙන නාන්නෙමි. ගවුම වේළුණු පසු නැවත හැඳගනිමි. තව කොච්චර



කාලයක් මෙහෙම කරන්නද? දවසින් දවසම අපේ ආදායම අන්තයට පිරිහුණත් රෙදි මිළ අහසට නගියි.

කෙසේ වෙතත් බඩගින්නේ සිටිය නොහැකි නිසා අපි හාල්පොත උකස් තැබීමේ අදහස අන්තිමේදී අත් හැරියෙමු.

දිනක් අඳුර වැටීගෙන එද්දී ගෙදර පැමිණි අම්මා ඇගේ මල්ලෙන් යම් කිසිවක් එළියට ගනිමින් මට කතා කළාය.

"දුවේ මෙන්න මේක උඹට ඇද්ද බලාපන්"

"මොකක්ද?"

"ගවුමක්"

මම වහා පැන එය දිග හැර බැලීමි. එය පරණ ගවුමකි.

"කොහෙන්ද මේක අම්මෙ?"

"මම අද වැඩට ගියේ ලේකම් රාලහාමිලාගෙ වලව්වට. අර නුවරද කොහෙද බෝඩිංවෙලා ඉගෙණ ගන්න ළමයා ගෙදර ඇවිත් උන්නා නිවාඩුවට. උඹ ගැනත් ඇහුවා"

"ඉතින්?"

"මම කිව්වා උඹ විඳින දුක"

මගේ හදවත ආත්මානුකම්පාවෙන් දැවී ගියේය. මට හැඬුම් යන්නට ආවේය.

"ඒ ළමයට දුක හිතිල උඹට දෙන්න කියල ඔය ගවුම දුන්නා. මහ ගෑනි දන්නව එහෙම නම් නහියි"

මට මගේ හැඬුම් යටපත්කර ගත නොහැකි විය. මම ගවුම මුහුණට ගුලි කරගෙන හඬන්නට වීමි. පරණ වුවත් ඒ ගවුමෙන් මිහිරි සුවඳක් වහනය වෙයි. එය සැවැන්දරා මුල්වලට වඩා බොහෝ මිහිරි සුවඳකි. මම එය සිඹගෙන හඬන්නට වීමි. මේ සුවඳ ගවුමේ සුවඳට වඩා අනෝමාගේ හදවතේ සුවඳද. මගේ වයසේ ඉන්න අනෝමා. කිසිම දුකක් නැති අනෝමා, මට අනුකම්පා කරපු අනෝමා. එයාට දෙයියන්ගෙම පිහිටයි. එයාවත් අනුකම්පා කරලා මේක නොඑව්වා නම් මට ඉන්න වෙන්නෙ අඩ නිරුවතින්.

"අඬන්න එපා දුවේ. උඹට අනුන්ගෙන් ඉල්ලාගෙන එන පරණ රෙදි අන්දවන්න හිතාගෙන නෙවෙයි අපි උඹ ගැන මහන්සි උනේ.

ඒත් මොනවා කරන්නද? මම දන්නව ඇත් තමයි උඹේ ජීවිතේ හොඳට අඳින්ඩ පළඳින්ඩ ඕන කාලෙ. ඒත් දුවේ මම මොනවා කරන්නද?"

"ගවුම පරණ හින්දා නෙවෙයි අම්මෙ මට ඇඬුනෙ. අනෝම මට පෙන්නපු අනුකම්පාවට. අම්මා හෙට ගියාම අනෝමාට කියන්න මං එයාට පිං දුන්නා කියල."

හැඩීම යටපත් කර ගත් මම ගවුම දිගහැර මගේ ඇඟට තබා බැලීමි.

"හරියට උඹට මහපු එකක් වාගෙ. ඒ ළමයත් ඇත් උඹ තරම්ම ඇති" යි මා දෙස බලා සිටි අම්මා පැවසුවාය.

පරණ වුවත් ඒ ගවුම වටිනා රෙද්දකින් හැඩට මැසූ එකකි. මගේ මුළු ජීවිතයටම මා මේ තරම් වටිනා රෙද්දකින් මැසූ ලස්සන ගවුමක් ඇඳ නැත.

"මම මේක ගමනක් යනකොට අඳින්න තියා ගන්නව අම්මේ. ගෙදරට අඳින්න හොඳ වැඩියි"

"එතකොට ගෙදරට අඳින්නෙ මොකක්ද?"

"ඉස්කෝලෙට ඇඳපු ගවුම් දෙකෙන් නව එකක් තියෙනවනෙ. ඒක මිට වැඩිය පරණ හින්දා ගෙදරට අඳිනවා"

අම්මා මා දෙස බලා සිට සුසුමක් හෙළුවාය

අනෝමා මාත් සමඟ සිංහල පාසැලේ පස්වැන්න දක්වා ඉගෙණ ගත්තාය. ඉන්පසු නුවර උසස් කන්‍යාරාමයක නේවාසික කරනු ලැබ ඉගෙනීම කරන්නට වූවාය. වෛද්‍යවරියකවීම ඇගේ බලාපොරොත්තුවයි. එදා රාත්‍රියේ මම ඇයට ලිපියක් ලිව්මි.

දයාබර අනෝමා;

මම මේ ලිපිය ලියන්නේ ඔයාට පින්දෙන්නයි. අම්මා අතේ ඔයා එවාපු ගවුම ලැබුණා. ඔයා ඒකවත් නොඑවන්නට මට සිදුවී තිබුණේ අඩ නිරුවතින් ගෙවෙලා ඉන්නයි. ඔයාගෙ අනුකම්පාව ගැන නැවත නැවතත් මම පින්දෙනවා.

මා දිනුණ පා සිටින්නේ පුදුම දුක්බර ජීවිතයකට. ඒක ලියලා වචනයෙන් ප්‍රකාශ කරන්න බෑ. කොටින්ම මට අනාගතයක් ඇත්තේ නැහැ. ජීවිතය සාර්ථක කරගන්න මා මෙතෙක් දැරුව ප්‍රයත්නයෙන්



මට ඉතිරිවී ඇත්තේ සම්මාන හතක් සමඟ ජ්‍යෙෂ්ඨය සමත්වූ බවට සඩදාසි කැල්ලක් විතරයි. ඒත් පරණ පත්තර එකතු කරන මිනිහටවත් ඒකෙන් පලක් නෑ.

මා ගැන ලියල ඔයාගෙ අහිංසක සිත දුකට පත්කරන්න මම කැමති නැහැ. ඔයා මට මේ කළ උපකාරය මා දිවිහිමියෙන් අමතක කරන්නෙ නැහැ. ත්‍රිවිධරත්නයේ සහ සියලුම දෙවියන්ගේ පිහිටෙන් ඔයාගේ ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි මම ඉතාම අවංකව හද පත්ලෙන් ම ප්‍රාර්ථනා කරනව.

මීට - හිතාදර

සාමා.

පසුවදා මම ඒ ලිපිය අම්මා අතේ අනෝමා වෙත යැව්මි. අම්මා එදා සවස ගෙදර ආවේ අනෝමාගෙන් ලිපියකුත් තවත් ගවුම් දෙකකුත් රැගෙනය.

"උඹේ ලියුම කියවලා ඒ ළමයට ඇඬුණා දෙයියනේ. දෙයියන් බුදුන් ඇති කාලෙ දරුවෙක්" යයි අම්මා පැවසුවාය.

අනෝමා පිළිබඳව මට දැනෙන්නට වූයේ අප්‍රමාණ ආදරයකි. එම ආදරයෙන් යුතුව මම ඇගේ ලිපිය කියවන්නට වීමි.

හිතාදර සාමා;

ඔයාගෙ ලිපිය කියවද්දි මට ඉබේටම ඇඬුණා. අනේ ඔයාට රක්ෂාවක් සොයා දෙන්න මට පුළුවන්නම්. ඔයා ගිහින් අපේ මන්ත්‍රීතුමා හමුවෙලා ඔයාගෙ තත්වය ගැන කියන්න. එයා මොකක් හරි පිළිවෙලක් කරලා දේවි. ඔයා වගේ අය ඔහොම අනාථ විය යුතු නම් ඡන්දය දීලා මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට යවන එකේ තේරුමක් නැහැ. ඒක නිසා බල කරලම කියන්න. මේ ප්‍රශ්නය විසඳිය යුත්තේ ඒ අය. මන්ත්‍රීකම දෙන්නෙ එයාගෙ විතරක් රක්ෂා ප්‍රශ්නෙ විසඳා ගන්න නෙවෙයිනෙ.

මේ සමඟ තවත් ගවුම් දෙකක් එවා ඇති. මම ඇඳපු ගවුම් එව්වා කියලා තරහ වෙන්න එපා. ඔයා දන්නවනෙ මාත් තවම යැපෙන්නෙ අනුන්ගෙන්. මෙයින් එක ගවුමක් මම ඇන්දෙ එකම වතාවයි.

අද ඔයා දුක් වින්දත් ඔයාට හොඳ අනාගතයක් හිමි බව මට

විශ්වාසයි. ඔයා කොච්චර දක්ෂ ළමයෙක් ද? පසුබට නොවී තවත් උත්සාහ ගන්න. හැමදාම පරදින්නෙ නැහැ - ඔයා ජය ගන්න දවසකුත් ඇති. සැම කළු වලාවකම රිදී රේඛාවකුත් ඇති බව සිතන්න. කල් යා නොදී ඔයාගේ ජීවිතය ජය මාවතකට යොමු වේවායි මම ඉත සිතින් පතමි.

මීට - හිතාදර

අනෝමා.

ඇගේ ලිපිය කියවා මම කඳුළු සහිත දෙනෙත මොහොතකට පියා ගතිමි. දුවගෙන ගොස් ඇය වැළඳ ගන්නට ඇත්නම් යයි මට සිතිණ. ඈ ලියා ඇත්තේ කෙතරම් ධෛර්ය ගෙන දෙන ලිපියක්ද? ඇයට මගේ දුක අවබෝධ වන හැටි. ඇයට වගේ හිතන්න හැම කෙනෙකුටම පුළුවන්නම්!

මන්ත්‍රීතුමා හමුවී පිහිටක් පැතිය යුතු යයි මට ද සිතිණ. ඔහුට උවමනා නම් මට මොකක් හෝ රක්ෂාවක් සොයා දීමට බැරිකමක් නැත. මම ඒ අදහස අම්මාට ද ඉදිරිපත් කෙළෙමි.

"අපි එයාට ඡන්දෙ දුන්නට එයා අපිව අඳුනන්නෙ නැහැනෙ"යි අම්මා කල්පනා කරමින් සිට පැවසුවාය.

"ඉතින් තමුන්ගෙ ඡන්දදායකයකුට වැඩක් කරලා දෙන්න අඳුනන්නම ඕනද?"

"ඒ මනුස්සයා හිතුවොත් අපි ඡන්දෙ දුන්නෙ අනිත් පැත්තට කියල?"

"එහෙම නම් අම්මෙ ඉතින් එළිපිට ඡන්දෙ විමසන්න එපායැ. රහස් ඡන්දයක් තියෙන්නෙ තමන්ට ඡන්දෙ දුන්න නුදුන්න හැමෝටම එකවාගෙ සලකන්න. අපට උගන්නලා තියෙන්නෙ නම් එහෙමයි."

"ඒ උනාට කවුරුත් කරන්නෙ තමුන්ගෙ අයට විතරයි"

"මන්ත්‍රීතුමාට ඡන්දෙ දෙන්න කියල අම්මට බල කෙරුවෙ රාලහාමිමායි හාමුදුරුවොයිනෙ. ඉතින් ඒ අයටවත් කියමුකො මන්ත්‍රීතුමාට කියන්න කියල"

"රාලහාමිට නම් කියල වැඩක් නෑ. එයා මන්ත්‍රීතුමාට කියයි කිසිම දෙයක් කරලා දෙන්න එපා කියල. එහෙම නෙවේ හාමුදුරුවන්ටවත් කියල බලමු."



පසුව දිනක් අම්මාත් මමත් උන්වහන්සේට කියන්නට පන්සල් ගියෙමු. මාලිගාවක් බඳු විශාල සංඝාවාසයට අප ගොඩවුණේ බයෙන් බයෙන් මෙනි. හාමුදුරුවෝ දවල් දානය වළඳා දැහැත් විටක් වළඳමින් උඩුකය නිරුවත් කරගෙන හාන්සි පුටුවේ දිගාවී සිටී සේක. රස්නය නිසා උඩුකය නිරුවත් කරගෙන දිගාවී සිටින උන්වහන්සේගේ විවේක සුවයට බාධා කිරීමේ පවට බියෙන් මෙන් අපි පසුබා අඩින්වී සිටියෙමු. පුටුව ආසන්නයේ වූ උස පිත්තල පඩික්කමට බුලත් කෙළ ගසන්නට කඳ කෙළින් කළ උන්වහන්සේ අපව දුටු සේක. ඉන්පසු නාඳුනන්නකු හඳුනාගන්නට බලන්නාක් මෙන් ඇස අඩවන් කරගෙන සැක සහිතව අප දෙස බලා සිටි හෙයින් අපි හෙමිහිට ආසන්න වීමු. උන්වහන්සේ පඩික්කමට නැඹුරුවී කටේ බුලත් කෙළ හිස්කළ සේක. අපි දොහොත් මුදුන්දී දණින් වැටී නළල බිම තබා වැඳ සිටගතිමු. ඉන්පසු උන්වහන්සේ මගේ හිසේ සිට දෙපය දක්වා විනිවිද බැල්මක් හෙළූ සේක. ඒ බැල්ම දරාගත නොහැකිව මම හැකිළුණෙමි.

"හීන්මැණිකෙ‍ා උඹටත් දැන් ගජ ළමිස්සියෙක් ඉන්නවනෙ ආ?" යි ඉක්බිති උන්වහන්සේ අම්මා දෙස බලමින් ඇසූ සේක.

අම්මා ද මා මෙන්ම හැකුළුණාය. උන්වහන්සේගේ කතාව මෙන් බැල්මද මගේ සිත් නොගත්තේය. බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක තුළ මීට වඩා සංවර විනීත බවක් මම අපේක්ෂා කෙළෙමි. අම්මා ද පිළිතුරක් නැතිව බලා සිටියාය.

"ඉතින් මොකද අද උඹලා මේ පැත්තෙ? දැන් උඹල ඉන්නෙ පන්සල එපා වෙච්ච ගාණට නෙ. පිරුවණේ විසි තිස් නමක් ඉගෙණ ගන්නව. උඹලගෙන් දැන් දානයක්වත් ලැබෙන්නෙ නැහැ"

"අපේ නැතිබැරිකම හින්දා හාමුදුරුවනේ" යි අම්මා බැගෑපත්ව පැවසුවාය.

"කවද්ද ඉතින් උඹලට තියෙන්නෙ - හැමදාම නැති බණේමනෙ? මේ ආත්මෙදි උඹලට කිසි දෙයක් නැත්තෙ ගිය ආත්මෙ උඹල කිසිම දෙයක් දන්දීලා නැති හින්දා. ලබන ආත්මෙ උඹල ඔයිටත් අන්ත හිඟන්නො නො වෙන්න නම් මේ ආත්මෙදි දැන්වත් නෑ බෑ නොකියා

For E-Pusthakalaya

මහා සංසරන්නයට දන් දීපල්ලා"

"එහෙමයි හාමුදුරුවනේ. ලෝබකමට හරි - නොසැලකීමට හරි ඉන්නවා නොවෙයි නැති බැරිකම හින්දාමයි හාමුදුරුවනේ. අපි එදා වේලවත්....."

"ඔය ඔය - ඔය කතාව විතරක් මට කියන්න එපා"යි කියමින් හාමුදුරුවෝ අම්මාගේ කතාවට බාධා කළහ. " හිත ඇත්නම් පත කුඩා නැහැ. මිනිස්සු දන් දෙන්නෙ තමුන්ට තිබිලම නෙමෙයි. උඹල දන්නවනේ අර මහා සංසරන්නයට දානයක් දෙන්න වෙන කිසිම දෙයක් අතේ නැතුව තමුන්ගෙ එකම දරුවගෙ මස් උයල දානෙ දෙන්න හිතාගෙන ඒ දරුවව මරන්න නාගයෙක් ඉන්න හුඹහක් ළඟට ඇරපු අම්මගෙයි තාත්තගෙයි කතාව? එහෙමයි හිත ඇති අය දන් දෙන්නෙ. ඒ දෙන්නට ඒ ආත්මයෙදිම හතර මහ නිධාන පහළ උනා......."

"එහෙමයි හාමුදුරුවනේ" අම්මා පැවසුවාය.

හාමුදුරුවන් ගැන මගේ හිතට පහළ වූයේ දැඩි කෝපයකි. දන් දෙන්නා තියා එදා වේල පිරිමසා ගන්න බැරුව බඩගින්නේ ඉන්න බව කියද්දීත් හාමුදුරුවෝ තවත් අම්මගෙන් ඉල්ලන්නෙ අර මිනිස්සු කළා වාගෙ මගේ ඊරි මාංශද?

"ඉතින් උඹල මොක ද අද මෙහෙ ආවෙ?"

"අනේ හාමුදුරුවනේ මේ ළමයට රස්සාවක් හොයා ගන්න තමුන්නාන්........."

අම්මා කතාව අවසන් කරන්නට පළමුව හාමුදුරුවෝ කොක්හඬලා සිනාසෙන්නට වූහ.

"කලියුග කාලෙට ඔව පුදුම නොවෙයි හීන් මැණිකො. නැත්නම් ගෑනු කවද්ද රස්සාවල් හොයන්න පන්සල් ආවෙ?" උන්වහන්සේ සිනාසෙමින් ඇසූහ.

"ඔබ වහන්සේගෙන් නොවෙයි - මන්ත්‍රීතුමාටවත් කියල......."

"ඒකට ඒ මනුස්සයා ළඟට යන්න එපායැ. මොකෝ මන්ත්‍රීකම කරන්නෙ මමයැ"

මගේ හිතට දැනෙන්නට වූයේ අසීමිත කෝපයකි. ඔබ වහන්සේ



ඡන්ද ව්‍යාපාරයට නොබැස්සා නම් අපි රක්ෂා සොයාගෙන පන්සල් එන්නෙනැහැයි කියන්නට මට සිතිණ. රක්ෂාවල් දෙන්නට - රට කිරියෙන් පැණියෙන් උතුරවන්නට - ඔබ වහන්සේ එදා දේශපාලන වේදිකා මත මොර දුන්නේ මෙහෙම අහන්නටදැයි ප්‍රශ්න කරන්නට මට සිතිණ. එහෙත් මෙය එයට තැන හෝ අවස්ථාව නොවේ.

"ඔබ වහන්සේ මන්ත්‍රීතුමාට කීවොත් එතුමා නො සලකා ඉන්නෙ නැති හින්දයි ඉස්සෙල්ලා ඔබ වහන්සේ බැහැදකින්න ආවෙ" යයි අම්මා බැගෑපත්ව පැවසුවාය.

"මන්ත්‍රීතුමා මගේ කීමට සලකන එක ඇත්ත. ඒත් උන්නැහේ කොහෙන්ද රස්සාවල් දෙන්නෙ? මේ ලක්ෂ ගාණක් ඉන්න අනාථයින්ට රස්සා දෙන්න මන්ත්‍රීන්ට පුළුවන් කියලද උඹල හිතන්නෙ?"

එවැනි දැවෙන ප්‍රශ්න විසඳන්නට බැරි නම් ඔවුන් ඒවා විසඳන්නට පොරොන්දු දී පාර්ලිමේන්තු ගියේ ඇයි දැයි මට සිතෙයි. එහෙත් මම එය ද සිතට තෙරපාගතිමි.

"අනිත් එක උඹලා මන්ත්‍රීතුමාට ඡන්දෙ දුන්නද - එහෙම නැතුව අර රට ජාතිය ආගම කාබාසිනියා කරන්න ආව කොමියුනිස්ට් කාරයට ඡන්දෙ දුන්නද කියන එක මම කොහොමද දන්නෙ?"

"අනේ හාමුදුරුවනේ ඒක ගැන නම් සැක හිතන්න එපා. මට ඕන තැනක දිවුරන්න පුළුවන්. ඔබ වහන්සෙගෙ කීමකට අපි කවදාවත් පිටුපාලා නැහැ"

ඉන්පසු මොහොතක් කල්පනා කරමින් සිටි හාමුදුරුවෝ මා දෙස උනන්දුවෙන් බැලූහ.

"මොනවද කෙල්ලෙ උඹ පාස් කරලා තියෙන්නෙ?"

සදා පූජනීය වූ බුදුන්ගේ උතුම් චීවරය කරේ දමාගෙන සිටියත් කතාකරන්නටවත් නොදන්නා මොහු ගෙන් පිහිට පතා එන්නට සිදුවූයේ මොන කරුමයක් නිසාදැයි මට සිතිණ.

"මට ජ්‍යෙෂ්ඨ සහතිකය තියෙනව සම්මාන හතකුත් එක්ක"

"එච්චරද?"

"එහෙමයි"

For E-Pusthakalaya



"ඒක තියෙන අය නම් කී ලක්ෂයක් ඉන්නවද?"

අම්මා බැගෑපත් දෑසින් බලා සිටින්නට වූවාය. හාමුදුරුවෝ කනප්පුව මතවූ තම දින පොත ගෙන පෙරළන්නට වූහ.

"මන්ත්‍රීතුමා කොළඹ ඉඳල ලබන ඉරිදට ගෙදර එනව. උඹලට පුළුවන්ද එදාට මාත් එක්ක යන්න?"

"පුළුවනි හාමුදුරුවනේ."

"හැබැයි ගොයියො මට නම් බෑ බස්වල තෙරපෙන්නයි රස්තියාදු වෙන්නයි. කාර් එකක් හොයාගෙන වරෙල්ලා"

අම්මා එවිට තුෂ්නිම්භූත වූවාය.

"අනේ හාමුදුරුවනේ මම කොහෙන් කාර් හොයන්නද?"

"ඇයි බොලං මේ රටේ කොච්චර කාර් තියෙනවද? උඹලට බෑ එකක් හොයා ගන්න? හොඳයි එහෙනම් ඔන්න මගේ කාර් එක තියෙනවා. උඹලා පැට්‍රෝල් ගහපල්ලා"

අම්මා කතා නැතිව බලා සිටින්නට වූවාය. ඇගේ ප්‍රශ්නය මම දනිමි. වැඩිහරියක් බඩගින්නේ ඉන්න අපි කොහොමද හාමුදුරුවන්ගේ කාර් එකට පැට්‍රෝල් ගහන්නෙ?

"අනේ හාමුදුරුවනේ මා සන්තකට තඹ දොයිතුවක් නෑ. මේ අසරණ කෙල්ලගෙ ජීවිතේ ගැන අනුකම්පා කරලා පින්තකා මේ වැඩේ කරලා ලැබුණොත්....!"

හාමුදුරුවෝ යළිත් කොක්හඬලා සිනාසුණහ. කිසිම වෙහෙස මහන්සියක් නොවී කා බී හොඳින් වැඩුණ ස්ථූල ශරීරය සොලවමින් සිනාසුණහ.

"වෙනදා සිරිත හාමුදුරුවරු ගිහියන්ට පින්දෙන එක. දැන් උඹල එනවද මට පින්දෙන්න? මට උඹලගෙ පින් නැතුවට කමක් නෑ......"

"අනේ හාමුදුරුවනේ මගේ කට වැරදුණා නම් සමාවෙලා....."

"මට බෑ හීන්මැණිකො බස්වල තෙරපෙන්න. උඹලා ගිහින් මන්ත්‍රීට කියාපල්ලා. ඕන නම් මාත් ලියුම් කෑල්ලක් දෙන්නම් උන්නැහෙට දෙන්න"

"එහෙමවත් ලැබුණොත්" අන් කළ යුතු යමක් නැති නිසා අම්මා පැවසුවාය.



උන්වහන්සේ දුන් ලිපියත් රැගෙන අම්මා සමග සමග මා පන්සල් වත්තෙන් පිටවූයේ දැඩි කලකිරීමකිනි.

"හාමුදුරුවොත් බලාගෙන ඉන්නෙ අපිව කන්න" මම කෝපයෙන් පැවසීමි.

"උඹට මම කීප වතාවෙ කියල තියෙනව කටින් පව් පුරවා ගන්න එපා කියල. මේක අපේ කරුමෙ" අම්මා නොමනාපයෙන් පැවසුවාය.

අම්මාගේ සිතට තවත් දුක් දීමට නුපුළුවන් හෙයින් මම ඒ ගැන නිහඬවීමි.

"හාමුදුරුවන්ට ඔය කාර් එක ලැබුණයි කියන්නෙ මහ ඡන්දකාලෙ ආණ්ඩු පක්ෂයට ඡන්දවැඩ කෙරුවටලු" යි මම පැවසීමි.

"පෙර පින් කරපු අයට ඒ විදියට යාන වාහන පහළ වෙනව. අපි ඒවට ඉරිසියා කරන්න හොඳ නැහැ පව් සිද්ධ වෙනවා"

අපමණ දුකකින් සිත බරවී පැවතුණත් අම්මාගේ දර්ශනය ගැන මට ඉබේම සිනා පහළ විය. එහෙත් ඇගේ සිත වෙහෙසන්නට අකැමති වූ මම නිහඬවීමි. මා කතා කළොත් පැවසිය යුත්තේ ඔය කාර් පහළ වූයේ ඒ පාසාණ්ඩයින්ගේ පෙර පින නිසා නොව අම්මලාගේ මෝඩකම් නිසා බවය.

For E-Pusthakalaya

# 14.

මන්ත්‍රීතුමා හමුවීමට යාම සඳහා අප මුදල් සොයා ගත්තේ තාල් පුවත් පොතක් උගස් තැබීමෙනි. ඊළඟ ඉරිදා අපි මන්ත්‍රීතුමා මුණ ගැසෙන්නට එතුමාගේ නිවසට ගියෙමු. එය මහ විශාල වලව්වකි. කළු ගේට්ටුවෙන් වලව්වේ විශාල වත්තට අප ඇතුළු වූයේ පවා බිය මුසු හැඟීමකින් යුතුවය.

විශාල නිවසට යාබදව පසෙකින් මන්ත්‍රී තුමාගේ කන්තෝරුව විය. එහි ඉස්තෝප්පුවේ අප බඳු දුප්පත් ගැමියෝ තව මහ රාශියක් වූහ. කන්තෝරුව ඉස්තෝප්පුවකින් සහ කාමරයකින් යුක්ත විය. ඉස්තෝප්පුවේ ලෑලි බංකු කීපයක් තබා තිබිණ. ඒ අප වැනි දුප්පතුන්ට වාඩිවීම සඳහාය. අනෙක් ගැමියන් අතරින් අපි ද වාඩි වීමු. වරින් වර කාමරය තුළට එකිනෙකා කැඳවනු පෙනිණ. සමහරු කාර්වලින් බැස කෙළින්ම එතුමාගේ කාමරයට ගියහ. ඔවුන් සැලකිය යුත්තන් විය යුතුය. හාමුදුරුවරු ද කෙළින්ම කාමරයට ගියහ.

පාසැල් ගුරුවර ගුරුවරියන් යයි සිතිය හැකි කිප දෙනෙක්ද අප අතර ඉස්තෝප්පුවේ වූහ. ඔවුන් ස්ථාන මාරුවීම් ලබා ගැනීම සඳහා මන්ත්‍රීතුමා හමුවීමට පැමිණ සිටින්නවුන් බව ඔවුන් අතර කෙරුණ දුක්මුසු කසුකුසු වලින් මට හැඟිණ. ගුරු මාරුවීම් දෙනු ලබන්නේත් මන්ත්‍රීතුමා විසින් ද? මාරුවීම් හා පත්වීම් ආදිය කරනු ලබන්නේත් දේශපාලකයින් මගින් වීම කෙතරම් අභාග්‍යයක් ද?

දුප්පත් ගැමියෝ ඇඹුම් හරිමින් ඉස්තෝප්පුවේ ගත කළහ. සැලකිය යුත්තෝ සහ හාමුදුරුවරු කාමරය තුළ හඬ නගා සිනාසෙමින් මන්ත්‍රීතුමා සමග ගත කළහ. කාමරයට ඇතුළුවන හාමුදුරු නමක් බොහෝ වේලාවකට ආපසු නො එන සේක. උන්වහන්සේලා කාමරයෙන් එළියට වැඩියේ දවල් දානය සඳහා වේලාව ආසන්න වූ



පසුය. දිවි පෙවෙත සඳහා යමක් නො කළ යුතු උන්වහන්සේලාට කාලය නිකරුණේ ගතවීමෙන් සිදුවන හානියක් නැත.

බොහෝ වේලාවක් ගතවීමෙන් පසු අම්මාත් මමත් කාමරය තුළට කැඳවනු ලැබීමු. අප එහි ඇතුළු වූයේ ගැහෙන හදවත්වලින් යුතුවය. රැස්වීම් සහ උත්සව වලදී ජාතික ඇඳුම අඳින මන්ත්‍රීතුමා කලිසමක් හැඳගෙන මහේශාක්‍ය අයුරින් වාඩිවී සිටියේය. ඔහු හිස ඔසවා මගේ හිසේ සිට දෙපතුල දක්වා විනිවිද බැල්මක් හෙළුවේය. ඒ බැල්ම දරාගත නො හැකිවූ මම හැකුළුණෙමි.

"මේ අය කොහෙ ඉඳල ද?" ඔහු ගැඹුරු හඬින් ඇසුවේය.

මම එතුමාට බුලත් හුරුල්ල දී වැඳ, හාමුදුරුවන්ගේ ලිපිය මේසය මත තැබීමි. ඔහු ලිපිය ගෙන කියවා බලා මා දෙස බැලුවේය.

"මොනව ද ඔය ළමය පාස්කරලා තියෙන්නෙ?"

"සම්මාන හතකුත් එක්ක පේස්වෙ තියෙනවා හාමුදුරුවනේ" යි අම්මා මට පළමුව යටහත් පහත් බවින් පැවසුවාය.

"ඉංග්‍රීසිත් තියෙනව ද?"

"නැහැ" යි මම හෙමිහිට කොඳුළෙමි.

"එහෙනම් ඉතින් කොහොමද මොකුත් කරන්නෙ?" යි ඔහු හිස ඔසවා කෙළින්ම මගේ මුහුණ දෙස බලමින් ඇසුවේය.

මගේ හදවත ඇවිගෙන යනු මට දැනිණ. මේ සිංහල රටේ සිංහලෙන් රක්ෂාව කරන්න සිංහල කෙල්ලෙකුට බැරි ද? ඉංග්‍රීසි ඇත්නම් මට රක්ෂාවක් ලැබෙයි ද? එහෙත් මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල කියල කෑ බෙරිහන් දෙන්නෙත් තමුන්නාන්සෙලාම නේදැයි අසන්නට මට සිතෙයි. නමුත් මා එය කෙසේ අසන්න ද?

"රැකීරක්ෂා කාර්යාලයේ එහෙම රෙජිස්ටර් වෙලා නැද් ද?" යි ඔහු හාමුදුරුවන්ගේ ලිපිය දෙස යළිත් බැල්ම හෙළාගෙන ඇසුවේය.

"තියෙනව. සීල් ගණනකුත් වැදිල තියෙනව"

"එහෙනම් එතනින් මොනවට හරි කැඳෙව්ව වෙලාවක මට ඇවිත් මතක් කරන්න. එතකොට මම සලකා බලන්නම්"

සියල්ල එතෙකින් අවසාන ද? මා රැකී රක්ෂා කාර්යාලයේ

For E-Pusthakalaya



ලියාපදිංචි වී දැන් කොපමණ කාලයක් ද? එහෙත් මෙතෙක් සම්මුඛ පරීක්ෂණයකටවත් මම කැඳවනු නො ලැබීමි. නවත් ඒ ගැන බලා සිටීම මුලාවකි. අම්මාත් මමත් අසරණව බලා සිටින්නට වීමු.

"එතනින් මාව මොනවටවත් කැඳවන එකක් නැහැ. ලියාපදිංචි වෙලා දැන් හුඟක් කල් වෙනවා" මම හෙමිහිට පැවසීමි.

"එහෙම තමයි - එක පාරටම රක්ෂා ලැබෙන්නෙ නැහැ"

"අනේ හාමුදුරුවනේ කොහොම හරි......." යයි අම්මා කන්නලව් කරන්නට වූවාය.

"සංස්ථා කීපෙකම ලිපිකරු ඇබෑර්තුවලටත් මම ඉල්ලුම්පත්‍ර දමලා තියෙනවා" යයි මම ද පැවසීමි.

"ඉතින්?"

"තාම කැඳවීමක්වත් නැහැ"

ඔහු නිහඬව මා දෙස බලා සිටින්නට විය.

"තමුන්නාන්සෙ බුදුන් දැක නිවන් දකිනව හාමුදුරුවනේ අපට අනුකම්පා කරලා මගෙ මේ අසරණ දරුවට මොකක් හරි...." අම්මා කන්නලව් කරමින් කඳුළු සලන්නට වූවාය.

"මොන සංස්ථාවලට ද ඉල්ලුම් කෙරුවෙ?" ඔහු මා දෙස බලමින් ඇසුවේය.

මම සංස්ථා කීපයකම නම් කීවෙමි.

ඔහු ඉන්පසු කල්පනාවෙන් බරව මෙන් මගේ මුහුණ දෙස බලා සිටින්නට විය. ඔහුගේ දෙනෙත කෙළින්ම මගේ දෙනෙත හා ගැටී තිබිණ. ඉන් ඇතිවූ අපහසුවෙන් වළකින්නට මම බිම බලා ගතිමි. සෑහෙන වේලාවකට පසු මා යළිත් හිස ඔසවා බලන විට ඔහු තවමත් පෙර සේම මා දෙස බලා සිටින අයුරු මට පෙනිණ. ඔහු කිසියම් හැඟීමකින් යුතුව අඩවන් ඇසින් බලාගෙන දෙතොලට මඳ සිනාවක් නගා ගත්තේය. මගේ හදවත තුළ ක්ෂණික ස්පන්දනයක් ඇති විය. එය කැඳවන බැල්මකි. මම යළිත් බිම බලා ගතිමි. ඔහු සිගරට්ටුවක් දල්වා ගත්තේය.

"හොඳයි එහෙනම් මාත් එක්ක කොළඹ යන්ඩ එන්න පුළුවන්



ද?" ඔහු ඇසුවේය.

"පුළුවනි හාමුදුරුවනේ" යි අම්මා නව පණක් ලද කලක මෙන් පැවසුවාය.

ඔහු තම දින පොත පෙරළා බැලුවේය.

"එහෙනම් ලබන දාසය වෙනිදාට එන්ඩ ඕන මාත් එක්ක කොළඹ යන්ඩ. අද දහ වෙනිදා. එදාට පුළුවනි ඒ සංස්ථාවලට ගිහින් බලලා මොකුත් කරන්න. මගේ කාර් එකේම යන්න පුළුවනි."

"තමුන්නාන්සේට බුදු බව අත්වෙයි හාමුදුරුවනේ" යි අම්මා කෘතඥතාව පළ කරමින් පැවසුවාය.

අම්මාගේ මුහුණෙහි වූයේ අපමණ සතුටකි. අපි ඔහුට ආචාර කොට ආපසු එන්නට හැරුණෙමු.

"එදාට අම්මා එන්න ඕන නැහැ. ඕය ළමයා විතරක් ආවාම ඇති. කාර් එකේ ඉඩත් නැහැ. එදාට මාත් එක්ක ඉස්කෝලෙ හාමිනේලා කට්ටියකුත් යනව ඒ ගොල්ලන්ගෙ වැඩ වගයකට අධ්‍යාපන කන්තෝරුවට" යයි අප දොරකඩ වෙත යද්දී ඔහු පැවසුවේය.

අපි ආපසු හැරී බැලීමු. ඔහු ආශාවෙන් මා දෙස බලා සිටියේය.

"හොඳයි හාමුදුරුවනේ"

අම්මා තුළ වූයේ නව පණක් ලද්දාක් බඳු සතුටකි. අපි ගේට්ටුව වෙත ආවෙමු.

"හොඳ ගුණ යහපත් උත්තමයෙක්. උන්නාන්සෙට ඡන්දෙ දුන්නට උඹ මට දොස් කීවා. ඒත් බලාපන් කොච්චර ගුණ යහපත් කෙනෙක්ද කියල. ලබන වතාවෙත් මගේ ඡන්දෙ දෙන්නේ උන්නාන්සේට."

මම කතා නො කෙළෙමි.

දාසය වැනිදා වන තෙක් මා ගත කෙළේ මහත් නොඉවසිල්ලෙනි. එදාට පාන්දරම අම්මාත් එක්ක මන්ත්‍රී තුමාගේ වලව්වට යා යුතුය. අනෝමට පින් සිද්ධ වෙන්න මට එයාගෙ ගවුමක් ඇඳගෙන යන්නට පුළුවනි. සපත්තු සෙරෙප්පු තමයි මොකුත් නැත්තෙ. ඒකට කමක් නැහැ. සෙරෙප්පු අරගෙන දෙන්න අම්මට කොහොම කරදර කරන්න ද? කරදර කළත් අම්මා කොහෙන් අරගෙන දෙන්න ද?

පුළුවන් උනොත් අනෝමගෙන්ම පරණ සෙරෙප්පු දෙකක් ඉල්ලා ගන්නව. එයා සති අන්තෙට ගෙදර ඒවි. තැනකට යන කොට ටිකක් පිළිවෙලකට යන්නත් ඕන. නැත්නම් ගණන් ගන්නෙ නැහැ.

ඇතැම් අවස්ථාවල මම සංස්ථාවක් ගැන සිතන්නට නිරායාසයෙන්ම පෙළඹෙමි. මන්ත්‍රීතුමාගෙ පිහිටෙන් එතන ලිපිකරුකමක් ලැබුණොත් කොච්චර වාසනාවක්ද? එහෙම උනොත් මට නවතින්න වෙන්නෙ කොළඹ. නුපුරුදු පරිසරයක. මම හොඳ අරපරිස්සමින් ජීවත් වෙන්න ඕන. පඩි ගත්තාම මම පඩිය සේරම ගෙනැවිත් දෙන්නෙ මගෙ දුප්පත් අම්මා අතට. අම්මා මං වෙනුවෙන් මොන දුකක් විඳිනව ද? දෙයියනේ මට රක්ෂාව ලැබුණොත් අම්මට මම සලකන්නෙ දෙව් දුවකට වගෙ. කොළඹට කිට්ටුවෙන් පුංචි ගේ කෑල්ලක් කුලියට හොයාගන්නවා. අම්මව එහේ එක්කරගෙන යනවා. මම රක්ෂාවට ගිහින් එනකල් අම්මට පුළුවනි ගෙදර ඉන්න. මම අම්මට මහන්සි වෙන්න ඉඩ දෙන්නෙ නැහැ. එතකොට අම්මගෙ ඇඟපත ආයිත් අර තාත්ත හිටිය කාලෙ වාගෙ මහත් වේවි. මගේ අම්මා. මම මුළු කොළඹම ඇවිදලා හරි මල්ලීවත් හොයා ගන්නව. එතකොට අපි තුන්දෙනා ආයිත් එකට. සීසීකඩ වෙච්ච අපේ පවුල ආයෙත් එක්වෙලා. මම මල්ලිව ය් ඉස්කෝලෙකට ඇරලා හරි උගන්නනව. මාත් තනියම පාඩම් කරලා විශ්ව විද්‍යාල ප්‍රවේශයට පෙනී හිටිනව. පාස් උනොත් බාහිර අයදුම් කරුවකු හැටියට උපාධියටත් පෙනී හිටිනව. දෙයියනේ මම පාස් උනොත්. එතකොට සංස්ථාවෙන් මට උසස් වීමක් ලැබේවි. කොළඹදී මට සේන අයියත් නිතර මුණ ගැහෙන්න පුළුවනි. මම කොළඹ ගියාම එයාටත් මොන තරම් සතුටක් හිතෙයි ද......

මම දෙමතත පියාගෙන ආශාවෙන් සුසුමක් හෙළීමි.

දෙයියනේ මේ සේරම මගෙ අහස් මාලිගා ද? තාම මට රස්සාව ලැබෙන්නා තියා ඒ ගැන බලන්නවත් ගියෙත් නෑ......

මන්ත්‍රීතුමාත් සමග කොළඹ ගිය විට එහිදී සේන අයියාත් මුණ ගැසෙන්නට ලැබුණොත් කොපමණ හොඳ දැයි මට සිතිණ. දැන් ඔහු



කොළඹ විශ්ව විද්‍යාලයේ ඉගෙණීම කරයි. ඔහුට කොළඹදී මා හමුවීම පිණිස නිශ්චිත තැනක් දන්වා යැවීමට මට නුපුළුවන. මන්ත්‍රීතුමා මා රැගෙන කොතැනකට යන්නේදැයි මම නො දනිමි. එහෙත් මම මන්ත්‍රීතුමාත් සමග දහසය වැනිදා කොළඹ පැමිණෙන බව දන්වා ඔහුට ලිපියක් ලිවීමි.

For E-Pusthakalaya

# 15.

දාසය වැනිදා පාන්දරම මම අනෝමාගේ ගවුමක් ද හැඳගෙන ගමනට සූදානම් වීමි. අනෝමා මට සෙරෙප්පු දෙකක් ද කලින් එවා තිබිණ. ඈ ආපසු කන්‍යාරාමයට යන බව ඇය එවා තිබූ කෙටි ලිපියේ සඳහන් විය. ඇගෙන් මට කිසියම් උවමනාවක් වුවොත් කන්‍යාරාමයට ලිපියක් එවීමට මැලි නො විය යුතු බව දන්වා ලිපිනය ද සඳහන් කර තිබිණ.

හාල් කූපන් පොත උගස් තබා ලබා ගත් රුපියල් දහයෙන් මේ ගමන සඳහා රුපියල් පහක් අම්මා ඉතිරිකර තබාගෙන තිබිණ. ඈ එය මා අත තැබුවාය.

පිටත් වන්නට සූදානම් වී මම අම්මාගේ දෙපතුල් අල්ලා වැන්දෙමි.

"ලෝක පාලක සියලුම දෙවි දේවතාවුන් වහන්සේලාගේ පිහිටෙන් මගෙ දූව යන මේ ගමන සාර්ථක වෙන්න ඕන. මගෙ දූව බය නැතුව යන්න. මගෙ දූවට ජය ඒකාන්තයි" අම්මා කඳුළු පිරුණ ඇසින් යුතුව පැවසුවාය.

මගේ දෙනෙතින් ද කඳුළු වැගිරිණ.

මා බස් රියෙන් මන්ත්‍රීතුමාගේ වලව්වට පැමිණෙන විට ගුරුවරියෝ දෙදෙනෙක් ද එහි පැමිණ සිටියහ. අප රැගත් කාර් එක පිටත් විය. ගුරුවරියෝ දෙදෙන මන්ත්‍රී තුමාත් සමග ඉතා කුළුපග ලෙස කතාබස් කළහ. මඟ දිගට ඔවුහු හඬ නගා සිනාසුණහ. මගේ බඳු චකිතයක් හෝ මන්ත්‍රීතුමා පිළිබඳව ගරුසරු බවක් හෝ ඔවුන් කෙරෙහි නොවීය. ඒ ගැන මම මහත් සේ පුදුම වීමි.

මන්ත්‍රීතුමා ද ඔවුන් සමග විහිළු තහළු කෙළේය. අන්‍යයන් හමුවේ ඔහු මවා පාන මහේශාක්‍යකම් මොවුන් හමුවේ කෙළිලොල් බවට පත්වූයේ ඇයි?



අප පළමුවෙන්ම පැමිණියේ අධ්‍යාපන කාර්යාලයටයි. මා කාර් එකේ තවතා ඔවුහු අධ්‍යාපන කාර්යාලය තුළට ගියහ. මඟ දිගට පැවති මහා වැස්ස මෙවේලේත් ඇද හැලෙමින් තිබිණ. මම කාර් එකට වී වීදුරුවල දුමාරය අතරින් පිටත බලා සිටියෙමි. අද මොනවා සිදුවෙයි ද? මා පැමිණි කාර්යය සාර්ථක වෙයි ද? ඒ සියල්ල මට නො පැහැදිලි දුමාරයකි.

මන්ත්‍රීතුමාත් ගුරුවරියන් දෙදෙනාත් ආපසු පැමිණියේ සතුටින් සිනාසෙමිනි. ඔවුන් ගිය කාරිය ඉටුවී ඇති බව මම සිතාගතිමි. ඔහු කාර් එකට නැගුණ පසු ගුරුවරියෝ දෙදෙන ඒ අසල සිටගෙන සිනා මුසුව බලා සිටින්නට වූහ.

"ඇන් ඉතින් ඔයගොල්ලන්ගෙ වැඩේ හරිනෙ" යි ඔහු ඔවුන් දෙස බලා සාවඥ සිනාවක් සමග පැවසුවේය.

"එහෙමයි සර්." ඔවුහු සිනාසුණහ.

"අපි එහෙනම් මෙතනින්ම බස් එකක් අල්ල ගන්න යන්නද සර්?" එකියක් ඇසුවාය.

ඔහු සිනාමුසුව බලා සිටියේය.

"අද අපි නැතුවට කමක් නැහැනෙ සර්" අනෙක් එකිය එවිට සිනාසෙමින් සාවඥ ලෙස පැවසුවාය.

ඔවුහු එසේම සාවඥ ලෙස මා දෙස ද බැලූහ. ඒ කිසිවක් මට අවබෝධ නො වීය. මන්ත්‍රීතුමා මා දෙස බලා ඔවුන්ට මඳ සිනාවක් පා කාර් එක පණ උපදවා ගත්තේය. රිය හෙමිහිට පෙරට ඇදෙද්දී මම හිස හරවා ගුරුවරියන් දෙස බැලීමි. එවිට ඔවුහු සිනාසුණහ. එකියක් සිනාව අතරින් ඇසක් වසා මට ඉඟිමැරුවාය. එය කොලොප්පමට කළ දෙයක් බඳුය. ඈ එසේ කෙළේ ඇයි?

වැස්සත් දුමාරයත් අතරින් කාර් එක වංකගිරි ගමනක යෙදිණ. අන්තිමේ අපි එක්තරා සංස්ථාවකට පැමිණියෙමු. ඔහු පසුපසින් මා කාර්යාලයට අඩිය තැබුවේ ගැහෙන හදවතින් යුතුවය. එහෙත් මා තුළ සතුටක් ද විය. ලිපිකරුවන් හා ලිපිකාරියන් වැඩ කරමින් සිටින කාර්යාලය දිගේ අපි ගමන් කෙළෙමු. ඇතැමෙක් හිස ඔසවා අප

For E-Pusthakalaya



දෙස බලා සිටියහ. ටක් - ටටක් - ටක් - ටටක් - ටයිප් රයිටර් හඬ නැගිණ. මට එය අමුතු ලෝකයකි. මටත් මොවුන් සමග වැඩ කරන්නට වාසනාවක් තිබේ ද?

එතැනින් අපි දොරක් හැරගෙන ලොකු කාමරයකට ඇතුළු වීමු. එයට අඩිය තබද්දී මට සීතලක් දැනිණ. එය වායු සමනය කළ කාමරයකි. එහි විශාල මේසයක් ළඟ වාඩිවී සිටි මහේශාක්‍ය පුද්ගලයා මන්ත්‍රීතුමා දකින්ම මුවගට සිනාවක් නගාගෙන අසුනක් වෙතට අත දිගු කෙළේය. මට ද පුටුවක් දැක් වූයේය. මා වාඩිවූයේ පුටුව කෙළවරට වන්නටය.

එතැන් සිට නිලධාරියාත් මන්ත්‍රීතුමාත් අතර කතා බහ සියල්ල සිදුවූයේ ඉංග්‍රීසියෙනි. මට එය ග්‍රීක් බඳු විය. වරින් වර නිලධාරියා මගෙන් ද යමක් ඉංග්‍රීසියෙන් ඇසුවේය. මම උඩ බිම බැලීමි. එවිට පිළිතුරු සපයනු ලැබුවේ මන්ත්‍රීතුමා විසිනි. විනාඩි කීපයකට පසු අපි එතනින් පිටත් වීමු.

කාර් එක නැවතත් වැස්ස සහ මීදුම අතරින් වංකගිරි ගමනෙහි යෙදුණේය. සිදුවූයේ කුමක් ද? මා රැකියාව සඳහා තෝරාගනු ලැබීද? මන්ත්‍රීතුමා කිසිවක් නොකියයි. මට අසන්නට ද බැරිය. මම බළලකුට බියෙන් මුළුගැන්වී සිටින මී පැටියෙකු මෙන් කාර් එකේ පසු අසුනේ ගුලි ගැසී සිටිමි!

තුවක්කු ගත් පොලිස් භටයන් දෙදෙනකු විසින් මුර කරනු ලබන ගේට්ටුවකින් ඇතුළට කාර් එක හරවනු ලැබිණ. මම බිය මුසුව වට පිට බැලීමි. ඉදිරියෙහි වූයේ මහා විශාල මාලිගාවක් බඳු නිවසකි. එතරම් විශාල නිවසකට මා කවදාවත් අඩිය තබා නැත. මන්ත්‍රීතුමා පසු පසින් මා ගමන් කෙළේ ගැහෙන හදවතින් යුතුවය.

එහි විශාල ශාලාවේ මා නැවැත්වූ ඔහු තරප්පුව නැග උඩුමහලට ගියේය. මම පුටුවක වාඩිවී බලා සිටින්නට වීමි. මා මෙන්ම තවත් බොහෝ දෙනා ශාලාවේ වාඩිවී සිටියහ. මෙතරම් අලංකාර විශාල නිවසක් හදන්න අවුරුදු කොච්චර යන්න ඇද්දැයි මගේ මෝඩ මොළයට කල්පනාවිය. බොහෝ වේලාවකට පසු සේවකයෙක් මා



වෙත පැමිණියේය.

"අන්න මන්ත්‍රීතුමා කතා කරනවා"

"කොහෙද ඉන්නෙ?"

"එන්න මාත් එක්ක යන්න"

මම ගැහෙන හදවතින් යුතුව සේවකයා පසු පසින් ගමන් කෙළෙමි. තරප්පිය නැංග අපි කාමර පේළියක් වෙත ආවෙමු. සේවකයා එක් කාමරයක දොරක් ළඟ නැවතුණේය.

"ඇතුළට යන්න" ඔහු මට පැවසුවේය.

මම කලබලවීමි.

"මන්ත්‍රීතුමා ඇතුළෙ ඉන්නව. බය නැතුව යන්න" ඔහු දොර මදක් තල්ලු කරමින් පැවසුවේය.

මම ගැහෙන හදවතින් යුතුව හෙමිහිට කාමරයට ඇතුළු වෙමින් එය සිසාරා බැලීමි.

"ආ - එන්න ඇතුළට"

තිගැස්සුණ මම ඒ කටහඬ පැමිණි දෙස එකවරම හිස හරවා බැලීමි. පිජාමා සරමක් හැඳගෙන තිරුවත් උඩුකයින් යුතුව මන්ත්‍රීතුමා සිගරැට්ටුවක්ද උරමින් ඇඳක හාන්සි වී සිටියේය. ඇඳ අසල මිටි ටීපෝවක් මත මත්පැන් බෝතලයක් වීදුරුවක් සහ සිගරැට් පැකට්ටුවක් විය. මත්පැන් වීදුරුව බාගෙට හිස්වී තිබිණ.

මට අප්‍රමාණ බයක් හා චකිතයක් දැනිණ. කිසිම දවසක මා පිරිමියකු සමග මෙසේ කාමරයක සිට නැත. ඔහු මා දෙස එක එල්ලේ බලා සිටින්නට විය. ඒ අතර ඔහු සිගරැට්ටුව එක දිගට උරන්නට ද විය. ඔහුගේ බැල්ම මට නො පැහැදිළිය. දොර ඇරගෙන හූ කියාගෙන දුවන්නට තරම් මහා බියක් මට දැනිණ. මම බියෙන් ගැහෙමින් බලා සිටින්නට වීමි.

"මොක ද නිකම් හොල්මනක් ඇකල බය වෙලා වගෙ? ඇවිත් වාඩි වෙන්න"

එහෙත් මම බයෙන් බලා සිටින්නට වීමි. ඔහු සිගරැට් දුම් වළලු අහසට තිකුත් කරමින් ඒවා සීලිම කරා ළගාවන අයුරු ඇදේ හාන්සිවී

For E-Pusthakalaya



බලා සිටින්නට විය.

ඔහු ඇඳෙන් නැගිට සූට්කේසයක් විවෘත කර වේට්ටියක් එළියට ගත්තේය.

"ම් - මෙන්න මේක ඇඳගෙන ඔය ගවුම ගලවලා ආලා අන්න අර නාන කාමරේට ගිහින් මූණ හෝදා ගන්නව. බඩගිනිත් ඇතිනෙ"

ඔහු මට නාන කාමරේ දොර පෙන්වා කාමරයෙන් එළියට ගියේය.

මම වේට්ටිය හැඳගන්නට බිය වීමි. එය ඔහු ජාතික ඇඳුමට අඳින වේට්ටියක් විය යුතුය. නැතත් මට මෙතැන ඇඳුම් මාරු කරන්නට අවශ්‍ය නැත.

මම බියෙන් වට පිට බලා නාන කාමරයට ඇතුළු වීමි. එය මා නාන කාමරයකට ඇතුළුවී ඇති පළමුවැනි වතාවය. එහි සවිකර ඇති බේසම් කරාම ආදිය දුටු මට මා පාසැලේදී දුටු චිත්‍රපටයක දර්ශනයක් මෙනෙහි විය. එය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පෙන්වූ චිත්‍රපටයකි. නර්ස් කෙනෙකු කරාමයක් කැරකූ සැටිත් එවිට බේසමට වතුර වැක්කෙරුණ සැටිත් ඇය බඳුන් වගයක් සේදූ සැටිත් මට මෙනෙහි විය. එය මතක තිබුණ නිසා මම ද කරාමය කැරකීමි. එවිට වතුර වැක්කෙරෙන්නට විය.

මේ සුඛෝපභෝගී නාන කාමරය සියල්ලෙන් සම්පූර්ණය. සබන්, තුවා, කණ්නාඩි, සුවඳ විලවුන්, පනා ආදී සියල්ලම පිරිසිදුව පිළිවෙලකට තබා ඇත. ඒවා පරිහරණය කරන්නට බියවූ මම යන්තමින් මූණ සෝදා ගෙන දෙකට නැමී මගේ යට සායෙන් මූණ පිසදා ගතිමි. ඉන්පසු යන්තමට පියර කුඩු ටිකක් අත්ලට හලාගෙන මූණේ තවරා ගතිමි. කණ්නාඩිය ළඟට ගොස් බැලීමි.

"කොහෙද සාමා අද උඹ මේ ඇවිත් ඉන්නෙ? තව උඹට අනාගතේ කොහෙ කොහෙ යන්න වෙයි ද? මොන මොනව කරන්න වෙයි ද? අද උඹ මේ ඇවිත් ඉන්නේ එන්නට හීනෙන්වත් හිතාපු ගේකට ද? කණ්නාඩියෙන් දිස්වුණු මගේ පිළිබිඹුවෙන් මගේ සිත අසන්නට විය.

මා ආපසු කාමරයට එනවිට මන්ත්‍රීතුමා තවමත් මත්පැන් බොමින් සිටියේය. මේසය මත කෑම සූදානම්කර තිබිණ. සේවකයකු පැමිණ



ඒවා තබා යන්නට ඇත.

සිගරට් දුම් නිකුත් කරමින් මන්ත්‍රීතුමා අඩවන් ඇසින් මා දෙස බලා සිනාසුණේය. බියෙන් තැති ගත් මම බිම බලා ගතිමි.

"සාමා හරි ලස්සනයිනෙ" ඔහු පැවසුවේය.

මගේ දෙපා ළඟින් ගිනි දැල්ලක් ඇවිලී හිස මුදුනින් මතුවුණාක් මෙන් මට දැනිණ. මොහු මගේ ලස්සන ගැන කතා කරන්නේ ඇයි? මම බියෙන් ගැහෙන්නට වීමි.

මම මුවැත්තියක මෙන් ගැහෙමින් බොහෝ වේලාවක් බිම බලා සිට නැවත හෙමිහිට හිස ඔසවා ඔහු දෙස බැලීමි. එවිට ද ඔහු පෙර සේම මා දෙස බලා සිටියේය. වීදුරුවේ ඉතිරිව තිබුණ මත් පැන් ටික එක උගුරට ගිල දැමූ ඔහු ඇඳෙන් නැගිට්ටේය.

"හ්ම් - එනවා බත් කන්න. දැන් බඩගිනිත් ඇතිනෙ" පවසමින් ඔහු මේසය වෙත ගොස් වාඩි වීය.

මට ඔහුත් සමග එකට වාඩිවී බත් කෑ හැකි ද? ඔහු පළාතේ ගරු මන්ත්‍රීවරයාය. මම පියා නැති අන්ත දුප්පත් හිගන කෙල්ලක්මි. මා පසුබා සිටිද්දී ඔහු නොරිස්සුමෙන් මා දෙස බැලුවේය.

"තමුන්නාන්සෙ කන්න. මම - පස්සෙ - කන්නම්" මම හෙමිහිට කොඳුළෙමි.

"පිස්සු නැතුව මෙහෙ එනව. මම තනියෙම කන්නෙ නැහැ"යි ඔහු පැවසුවේය.

මට මෙය මහත්ම අපහසුවකි. ඔහු සමග එකට වාඩිවී කෑමට වඩා මට බඩගින්නේ සිටිය හැකිය. එහෙත් ඔහුට අකීකරු වීමටද නුපුළුවන.

"පරක්කු වෙනව. මට තව ගමන් බිමන් වැඩ රාජකාරි තියෙනව" යි ඔහු නොරිස්සුමින් පැවසුවේය.

මම හෙමිහිට ගොස් කෑම මේසයට වාඩි වීමි. ඔහු මට කෑම බෙදන්නට ද විය. එය මස් මාළු බිත්තරවලින් සැදුණ අංග සම්පූර්ණ කෑම වේලකි. මෙබඳු කෑම වේලක් කන්නා තබා මින් පෙර මා දැකලාවත් නැත.

For E-Pusthakalaya

"ලැජ්ජා වෙන්නෙ නැතුව බඩ පුරාම කනව" යයි ඔහු ආදරයෙන් මෙන් පැවසුවේය.

එහෙත් මා කෙළේ කෑමට වඩා කෑම අතගෑමය. මගේ අත පමණක් නොව මුළු ඇඟම වෙව්ලන්නාක් මෙන් මට දැනිණ. ඔහු වරින් වර මා දෙස බලයි. එය ඉතාම කුළුපග බැල්මකි. මගේ අපහසුව දුරු කරන්නට ඔහු උත්සාහ කරන්නේ ද? ඔහුගේ මුහුණේ මහත් ප්‍රසන්න බවක් වෙයි.

ටික වේලාවකට පසු ඔහු මේසය යටින් මගේ කකුලක් හෙමිහිට පාගනු මට දැනිණ. මම වහාම කකුල ඉවතට ගනිමින් ඔහුගේ මුහුණ දෙස බැලිමි. ඔහු මුහුණට සිනාවක් නගා ගත්තේය. මගේ මුළු ඇඟම ගිනි ගත්තාක් මෙන් මට දැනිණ. කළ යුතු කිසිවක් මට නො හැඟෙයි. මට හඬන්නට සිතිණ.

"මොකෝ මාත් එක්ක තරහ ද?"

"න් - නැහැ" මම හෙමිහිට කොඳුළෙමි.

"එහෙනම් ඔය තරම් බයේ දඟලන්නෙ?"

මම කතා නො කෙළෙමි.

"ඔයාගෙ වැඩේ අද කරගන්න පුළුවන්වන පාටක් නැහැ" යි ඔහු පැවසුවේය.

මම ඔහුගේ මුහුණ දෙස බැලිමි. මගේ හදවත හඬා වැලපෙයි.

"අපි පමා උනා වැඩියි. ඒ ලිපිකරු ඇබෑර්තුවලට ඕන කරන අය තෝරාගෙන ඉවරයි. ඒත් තාම පත්වීම් දීලා නැහැ. මම සංස්ථාවෙ සභාපති එක්ක කතා කරන්නයි හිතාගෙන ඉන්නෙ. ඒත් අර ඩිරෙක්ටර් කිවා සභාපති කන්තෝරු එන්නෙ හෙටලු. සාමට අද කොළඹ නවතින්න වෙනව"

මගේ අවාසනාව යයි මට සිතිණ. සභාපති හමුවී හෙටවත් කරගන්න ලැබුණොත් වාසනාවකි. ඒත් අද මම නවතින්නෙ කොහෙ ද?

"එතකොට තමුන්නාන්සෙට හෙටත් මාව එක්ක ගෙන එන්න උනොත්"

"නෑ - අද ගිහින් හෙට ආයෙ එන්න මට ඉඩක් නැහැ. කොච්චර



ඈත ගිහින් ආපසු එන්න ඕනද? අනිත් එක අද හවස මට ආණ්ඩු පක්ෂේ හදිසි රැස්වීමකට යන්නත් තියෙනව"

"එතකොට අද මම නවතින්නෙ?"

"ඇයි මෙහෙ?"

මම කලබලවීමි. තැති ගතිමි.

"මට බැහැ"

එහෙත් ඔහු සිනාමුසුව මා දෙස බලා සිටී. දෙයියනේ මා අසුවී සිටින්නේ උගුලකද? ඔහු මාව මෙහි කැඳවාගෙන ආවේ මාත් එක්ක රැයක් ගත කරන්නද? දෙයියනේ මට කාගෙ පිහිටද? මට ඒක් වරම අම්මා මතක් විය.

"කොහොමහරි මම ඔයාට රස්සාව අරගෙන දෙන්නම්කො. එච්චරනෙ ඔයාට ඕන කරන්නෙ. ඊට පස්සෙ කාටවත් අත පාන්නෙ නැතුව ජීවත් වෙන්න මම ඉඩ සලස්සලා දෙන්නම්කො........"

මම කිසිවක් තේරුම්ගත නොහැකිව - කතා නැතිව ඔහුදෙස බලා සිටින්නට වීමි. රක්ෂාව නොලැබුණත් මට මොහු සමග මෙහි නිදා ගත හැකිද? මම බියෙන් තැති ගෙන බලා සිටින්නට වීමි.

"බය වෙන්න එපා කෙල්ලෙ. ඔය ඉස්කෝලෙ හාමිනේලා මාත් එක්ක කොළඹ ආවාමත් නවතින්නෙ මේ කාමරේ....."

ඒ ගුරුවරියන් මොහුත් සමග ලොකු කුළුපග කමක් දක්වමින් විහිළු තහළු කෙළේ ඔවුන් මොහුත් සමග මෙහි නිදාගත් නිසාද? ඔවුන් මාරුවීම් සාදා ගත්තේ මොහුගේ වනචර පහත් ආශාවන්ට ඔවුන්ගේ සිරුරු කැපකර දීමෙන් ද? අර ගුරුවරිය සිනාසෙමින් ඇසක් වසා මට ඉඟි කෙළේ මා මොහුට අලුත් ගොදුරක් වන බව දැනගෙනද?

"අනේ හාමුදුරුවනේ මට අද ගෙදර යන්න ඕන"

මම බැගෑපත් වීමි. ඒ සමගම මට හැඬිණ.

"පිස්සු වෙන්න එපා කෙල්ලෙ. අද ඉඳල හෙට වැඩේත් කරගෙනම යන්න පුළුවන්. තමුන්ගෙ අනාගතේ ගැන කල්පනා කරන්න"

මොහුත් සමග මෙහි රැයක් නිදාගත් පසු මට ඉතිරි වන අනාගතය කුමක්ද? අනිත් අතට රක්ෂාවක් නැතුව මට ඇති අනාගතය කුමක්ද? ඒත් මේ වාගේ කැත වැඩකට ඉඩදීලා රක්ෂාවක් ලබාගෙන බඩවියත රැක ගන්නවට වැඩිය හොඳයි බඩ කපාගෙන මැරෙන එක.

"අනේ හාමුදුරුවනේ මට බෑ මේ කාමරේ නවතින්න. තමුන්නාන්සේට බුදු බව අත්වෙයි මාව ගෙදර ගෙනහින් ඇරලන්න" මම බැගෑපත්ව හැඬුවෙමි.

ඔහු සිනාසෙන්නට විය. එය මා තුළ ඇති කෙළේ කෝපයකි.

"හොඳයි - සාමාට මේ කාමරේ හොඳ නැත්නම් අපි මීට වැඩියෙ හොඳ කාමරේකට යමු. එච්චරනෙ. මූද අද්දර තියෙන ලොකු හෝටලේක මුදුන් තට්ටුවෙ තියෙන කාමරේකට. හඳ පෑව්වාම මූද හරි ලස්සනට පෙනෙන හොඳ සුව පහසු සීත කරපු කාමරේකට......"ඔහු ප්‍රෙඩමලුව් පවසන්නට විය.

මොහු ප්‍රෙඩමලුව් සිටින්නේ මත්පැන් නිසාද? දැන් මොහු ආණ්ඩු පක්ෂේ විශේෂ රැස්වීමකට සහභාගි වන්නේත් මෙසේ වෙරිවීගෙනද? දෙයියනේ අද මම මොහුගෙන් ගැලවී යන්නේ කොහොමද? මගේ මුළු සර්වාංගයම අප්‍රමාණ භයකින් වෙළී ඇත. ඇයි දෙයියනේ මම මෙහෙම මර උගුලක අහුවුනේ? මා ක්ලාන්ත වන්නට එන්නාක් මෙන් මට දැනිණ. මම අත සෝදාගෙන නැගිට්ටෙමි.

"ඇයි? කෑම කාලා ඉවරද?"

මම කතා නොකර එතැනින් නැගිට ගොස් ඇඳ අසලට වී සිටගෙන බිම බලා ගතිමි. මේ හිරිගත් කාමරයෙන් මා පිටවී යන්නේ කෙසේද?

ඔහු ද කෑම කා අවසන්ව ඇඳට ආවේය. මම හෙමිහිට එතනින් ඉවත්ව පුටුව අසලට වීමි. මට මහා හඬින් හඬන්නට සිතෙයි. ඉබේම මට ඉකි බිඳෙයි. ඔහු සිගරැට්ටුවක් දල්වාගෙන ඇඳේ හාන්සිවී අඩවන් වූ ඇසින් මා දෙස බලා සිටියි.

"හරි මෝඩ ළමයෙක්නෙ. දැන් මහන්සිත් ඇතිනෙ. මේ ඇඳට ඇවිත් නිදාගන්න........"

මා කුමක් කියන්නද? කුමක් කරන්නද?



"කියන දේ අහන්නකො. ආඩිය ආතවා නේද? ඔය ගවුම ගලවලා දාන්න........"

ඔහුගේ මූණට කෙළ ගසන්නට මට සිතෙයි. වනචරයා.

"ඔච්චර ලැජ්ජා වෙන්න එපා. මම විතරනෙ ඉන්නෙ. ඉතින් කියන එක අහන්නකො. හොඳ ළමයනෙ......."

අනේ දෙයියනේ මා බේරා ගන්නේ කවුද? මම ඉකිබිඳිමින් හඬන්නට වීමි. මොහුගෙන් බේරෙන්නට බැරුව ගියොත් මම හයියෙන් කෑගහනව. එතකොට කවුරු හරි මගේ පිහිටට ඒවිද? ගේට්ටුව මුරකරන පොලිස්කාරයො මාව බේරා ගනියිද? ඒත් මන්ත්‍රිවරු මහ බලපුළුවන්කාර මිනිස්සු. පොලිස්කාරායො ගේට්ටුවේ ඉන්නේ මන්ත්‍රිවරුන්ගෙ ආරක්ෂාවට. ඒ දුප්පත්තු මේ බලපුළුවන්කාර වනචරයින් ඉස්සරහ පිට නිවට නියාළු වෙනව. අනේ දෙයියනේ......

"මොකද ඔය තරම් බය? ඇයි ඔච්චර ලැජ්ජා? මාත් මනුස්සයෙක්නෙ කෙල්ලෙ."

මම හිස ඔසවා බැලීමි. මන්ත්‍රීතුමා මා ඉදිරිපිට සිටගෙන සිටී. දැන් මා කුමක් කළ යුතු ද? එක්කෝ ඔහුට ඉඩදිය යුතුය. නැත්නම් ඔහු සමග පොර බැදිය යුතුය. මට ඒ දෙකම කරන්න බෑ. ඔහුට වැඳ වැටී කන්නලව් කරන එකයි තියෙන්නෙ.

ඔහු මාව වැළඳ ගන්නට සැරසුණේය. මම වහාම ඔහුගේ දෙපා ළඟ වැඳ වැටී හඬන්නට වීමි.

"අනේ හාමුදුරුවනේ මම අසරණ දුප්පත් කෙල්ලක්. මාව අනාථ කරන්න එපා" මම ඉකි බිඳිමින් පැවසීමි.

"අනාථ කරන්න නෙවෙයි - මම හදන්නෙ පිහිට වෙන්න. කෝ ඒකට මට ඉඩ දෙන්නෙ නැහැනෙ"

"අනේ හාමුදුරුවනේ මට ඒ පිහිට එපා. බුදු බව අත්වෙයි මට අම්මා ළඟට යන්න ඉඩ දෙන්න"

"ලැජ්ජා නැද්ද මෙහෙම අඬන්න? නැගිටින්න. මෝඩ කෙල්ල...."

"මට හිරිහැර කරන්න එපා හාමුදුරුවනේ"

මම වැඳවැටීගෙනම මුහුණ ඔසවා කඳුළු වැගිරෙන දෙනෙතින්

[illegible] ඔහුට කන්නලව් කෙළෙමි.

"හරි - ඔගෙන් කිසිම හිරිහැරයක් නැහැ. නැගිටින්න"

"තමුන්නාන්සෙ මාව ගෙදර එක්කරගෙන යනවද?"

"ඔව්. රක්ෂාව නැතුවට කමක් නැද්ද?"

"කමක් නෑ හාමුදුරුවනේ"

"හරි. එහෙනම් නැගිටපන්"

මම හෙමිහිට නැගිට සිටියෙමි. එහෙත් මා තුළ බිය පහ නොවෙයි. මට ඔහු විශ්වාස කළ නොහැක.

"හොඳයි - මම ඔයාව ගෙදර එක්කරගෙන යන්නම්. හැබැයි දැන්ම පිටත්වෙන්න බෑ. අරලියගහ වලව්වට ගිහින් ඇවිත් එක්කරගෙන යන්නම්. එතකොට රෑ වෙන්න පුළුවන්...."

"මම තනියම යන්නම් හාමුදුරුවනේ"

"තනියම ගිහින් අතරමං වෙලා මට ණය ගෙවන්නද කියන්නෙ?"

"මට යියැකි හාමුදුරුවනේ"

"වහගනින් කට. මෝඩ ගොන් තැම්බ. අතට අහුවෙච්ච රස්සාවවත් කරගන්න වාසනාව නැති එකී....." ඔහු මට සැරවුණේය.

මම නිහඬවීමි.

ඉන්පසු ඔහු මොහොතක් වේලා ඇඳේ වාඩිවී කල්පනා කරනු පෙනිණ. ඔහු කල්පනා කරන්නේ කුමක්ද? මට දැන් ඔහු කිසිසේත්ම විශ්වාස කළ නො හැක. මා ඔහුගේ උගුලට හසුකර ගත හැකි ආකාරයක් ගැන ඔහු සිතනු විය හැකිය. මොහුගෙන් ගැලවී මා ගෙදර යන්නේ කොහොමද?

ඔහු ඇඳෙන් නැගිට කෝපයෙන් ඇඳුම් අඳින්නට විය. ඔහු ඇඳුම් මාරු කරන්නට වූයේ කාමරය තුළ තරුණියක සිටින බවක් ගැන කිසිසේත්ම නොසලකමිනි. යට කලිසම අතට ගත් ඔහු සරම ගලවා ඇඳට විසි කෙළේය. ක්ෂණිකව තැතිගත් මම වහාම ඉවත බලාගතිමි. නිරුවතින් සිටින මිනිසකු මින් පෙර මා කිසිදාක දැක නැත. කුඩා පිරිමි දරුවකුගේ හැර වැඩුණු මිනිසකුගේ රහසඟ මා කිසිදාක දැක නැත. ලජ්ජාවෙන් හා බියෙන් තැතිගත් මම ඉවත බලාගෙන



ගැහෙන්නට වීමි. මොහු මහජනයා නියෝජනය කළ යුතු මන්ත්‍රීවරයෙක් නොවෙයි - අන්ත දූෂිත වනචරයෙක්.

"හ්ම් - යමු"

බියෙන් සැකෙන් ලජ්ජාවෙන් මම යන්තමින් හිස හරවා බැලීමි. එවිට ඔහු ඇඳුම් ඇඳගෙන සිටියේය. පූදුමයට මෙන් එවර ඇඳගෙන සිටියේ ජාතික ඇඳුමය. දැන් සුදු ඇඳුමෙන් සියලුම පව් වසාගත් උපාසකයෙක්. මා තුළ ඇතිවූයේ බලවත් කෝපයකි. මට ඔහුගේ මුහුණ දෙස කිසිසේත්ම බැලිය නොහැක. මින්පෙර කිසිදාක නොදැනුණු බියක් අර නිරුවත් දර්ශනය විසින් මා තුළ ඇතිකරනු ලැබ ඇත.

කාමරයේ දොර හැරගෙන අපි එළියට ආවෙමු. ඒ සමගම ඉදිරිපිට ඇති අනෙක් කාමරයේ ද දොර හැරගෙන කවුද එළියට ආවේය. මම ඒ අඩවන්ව ඇරුණු දොර දෙස නිකමට මෙන් බැලීමි. යට සායත් බොඩියත් පමණක් ඇඳගත් තරුණියක් කාමරයේ ඇඳ අසල සිට ගෙන ඇඳුම් අඳිමින් සිටිනු මට පෙනිණ. මගේ බිය දෙගුණ විය.

කාමරයෙන් එළියට පැමිණ දොර වැසූ තැනැත්තා මගේ හිස සිට දෙපතුල දක්වා විනිවිද බැල්මක් හෙළා මන්ත්‍රීතුමා දෙස බලා සිනාසුණේ 'තමුසෙට අද හොඳ දඩයමක් අහුවෙලා තියෙන්නේ' යි කියන්නාක් මෙනි.

ඔවුහු සිනාසෙමින් හිතවත් ලෙස ඉංග්‍රීසියෙන් වචන කිපයක් හුවමාරු කර ගත්හ. මේ තැනැත්තා කොහේදී හෝ දැක පුරුදු බවක් මට මෙනෙහි විය. මොහොතකට පසු මගේ මතකය අවදි විය. දෙයියනේ මොහු ඇමතිවරයෙක් නේද?

මින් පෙර මා කිසිදාක මොහු දැක නැත. එහෙත් පත්තරවල පළවන මොහුගේ ඡායාරූප මා කොතෙකුත් දැක ඇත. මොහු පිළිබඳ මා තුළ වූයේ මොන තරම් භක්තියක්ද? ඒ සියල්ල ක්ෂණිකව දෙදරා ගියේය. පත්තරවලින් මා හැඳිනගෙන සිටි දේශප්‍රේමී - ජාති හිතෛෂී - ආගම්මාමක - දේශපාලනඥයාත් මේ ස්ත්‍රී දූෂකයාත් එක් අයෙක්ම ද?

මට නොතේරෙන බසකින් කතා කරමින් හෙමිහිට ගමන් කළ ඔවුන් දෙදෙනා පිටුපසින් මමත් බියෙන් හා සැකයෙන් මිදුලට ආවෙමි.

For E-Pusthakalaya

ඇඹිලිපිටිය ගිය නවය බිඳුණු මා දෙස බලාගෙන සිටි මන්ත්‍රීතුමා සමග ඉංග්‍රීසියෙන් යමක් පවසා හඬ නගා සිනාසුණේය. මම හැකිළී සිටියෙමි.

දෙවියනේ මේ දේශපාලනඥයින් ගතකරන දෙබිඩි ජීවිතවල හැටි!

මේ රටේදීම පොදුන් ඇසිරෙන්නේ මෙහෙම නම් මහජන මුදලින් ගෙවන විදේශ සවාරිවලදී මොන තෙඩියාගම් නටනු ඇද්ද? එහෙත් ඒ සියලුම තෙඩියාගම් නටා ඔවුන් යළිත් ගුවන්යානයෙන් දිවයිනට ළඟාවනතුරු ගුවන් තොටුපලට යන අපේ සමහර හාමුදුරුවරු 'භවතු සබ්බ මංගලම් රක්ඛන්තු සබ්බ දේවතා' සජ්ඣායනා කරන සේක.

ඇමතිතුමා සුඛෝපභෝගී දැවැන්ත මෝටර් රියේ පසු අසුනට වී දුන් පසු රියැදුරා රියට පණ උපදවා ගත්තේය. මම ද මන්ත්‍රීතුමා සමග ඔහුගේ කාර් එකෙන් පිටත් වීමි.

මන්ත්‍රීතුමා මා ගෙන යන්නේ ඇත්ත වශයෙන්ම අරලියගහ වලව්වටද? නැත්නම් ඔහු අප මුලින් කී මුහුද අද්දර විශාල හෝටලයටද? එසේත් නැත්නම් වෙන කොහේටද්ද? මට මොහු කොහෙත්ම විශ්වාස කළ නොහැක. මගේ සිත අප්‍රමාණ බියකින් වෙළෙයි.

"මට ඔය ළමයව අරලියගහ වලව්වට එක්කරගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒක නිසා මම අඳුනන ගෙදරක නවත්තලා යන්නම්. රැස්වීම ඉවරවුණ හැටියේ මම ඇවිත් ඔයාව ගෙන එක්කරගෙන යන්නම්. එහෙම හොඳයි නේද?" මන්ත්‍රීතුමා ඉතාම කාරුණිකව ඇසුවේය.

"එහෙමයි" මම හෙමිහිට කොඳුළෙමි.

"එහෙම නැතුව රැයක් නවතින්න ඒ ගෙදර හොඳයි කියල ඔය ළමයට හිතෙනව නම් අද නැවතිලා හෙට උදේ සංස්ථාවට ගිහින් සේවය ලබාගන්න පුළුවනි."

මා කුමක් තීරණය කරන්නද? මා පැමිණියේ රක්ෂාව ලබා ගන්නය. එය ලබා ගන්නට හැකි වුණොත් ඊට වඩා දෙයක් මගේ ජීවිතේට ඕනේ නැත. නමුත් රක්ෂාව උදෙසා මගේ චරිත ශුද්ධිය බිලි දෙන්නට වුණොත් ඉන්පසු මට මගේ ජීවිතයෙන් පලක් නැත. මට මොහු විශ්වාස කළ හැකිද? ආරක්ෂා සහිත තැනක් නම් එතන රැයක්



නවතින්න වුණත් කමක් නැහැ.

"තමුන්නාන්සෙගෙ කැමැත්තක්" මම කොඳුළෙමි.

ලොකු නිවසක ආලින්දයේ කාර් එක නැවතිණ. අප පිළිගන්නට ආවේ වැදගත් පෙනුමක් ඇති මැදිවියේ කාන්තාවකි. ඈ මන්ත්‍රීතුමා සමග ඉතාම හිතවත් ලෙස සිනාසුණාය.

"මේ ළමයා අපේ ගම්පළාතේ එක්කෙනෙක්. උදේ මාත් එක්ක ආවා වැඩක් කරවා ගන්න. ඒත් ඒක කර ගන්න වෙන්නෙ හෙට. මම ආවෙ අද රෑට මෙයාව මෙහෙ නවත්තලා යන්න පුළුවන්ද කියල අහන්න" මන්ත්‍රීතුමා කාන්තාවට පැවසුවේය.

"අයියෝ කොච්චර සුළු දෙයක්ද? සුමානයක් උනත් නවත්තලා යන්නකෝ. මෙයාට බැරියැ මගේ දූලත් එක්ක ඉන්න" කාන්තාව සුහද ලෙස පැවසුවාය.

මගේ සිතට මහත් අස්වැසිල්ලක් දැනිණ. තවත් තරුණියෝ තිදෙනෙක් සාලයට පැමිණියහ. ඔවුහු ඇගේ දූවරුන් වශයෙන් මට හඳුන්වා දෙනු ලැබූහ.

"එහෙනම් හෙට උදේට මම එන්නම් මෙයාව එක්කගෙන යන්න." මන්ත්‍රීතුමා පැවසුවේය.

"කැමති වෙලාවක එන්න" කාන්තාව සිනහමුසුව පැවසුවාය.

ඉන්පසු මන්ත්‍රීතුමා පමා නොවී පිටත්ව ගියේය. තරුණියෝ මා වටකරගත්හ. කොණ්ඩය කපා කෙටි ගවුම් හැඳ සිටින ඔවුන් ලංසි තරුණියන් බඳුය. ඔවුහු මගෙන් නොයෙකුත් ප්‍රශ්න අසන්නට වූහ. මා දියෙන් ගොඩ දැමූ මාළුවකු මෙන් මට දැනිණ. ඔවුන් සමග සැසඳෙන්නට මට මොන තරම් අපහසුද? එහෙත් ඔවුහු මට හිතවත් බවක් පෙන්වූහ.

"මෙක මගේ කාමරේ. ඔයාට පුළුවන් මාත් එක්ක නිදාගන්න" එකියක් මා කාමරයකට එක්කරගෙන ගොස් පැවසුවාය.

මම ඇඳේ වාඩිවීමි. එය දෙදෙනකුට නිදාගත හැකි ලොකු ස්ප්‍රිං ඇඳකි. මොවුහු මොන තරම් සුවපහසු ජීවිත ගෙවත්ද? කාමරය ඉතාම ලස්සනය. හොඳටම පිරිසිදුය. කිසිවකින් අඩුවක් නැත. මා

අත්ත ඳුප්පත් හිගන කෙල්ලක බව් දනිනම් මොවුන් මට මෙතරම් හිතවත් ලෙස සලකනු ඇද්දැයි මට සිතිණ. ඈ මට ඇඳ ගන්නට ගවුමක් ද දුන්නාය. මගේ සිතට මහත් සහනයක් දැනිණ.

"මහන්සි ඇතිනෙ ඇඳුම් මාරුකරගෙන මූණ එහෙම හෝදාගෙන ටිකක් නිදාගන්න. මම එළියට යනවා. අර දොර ඇරියාම තියෙන්නෙ නාන කාමරේ......." ඈ එසේ පවසා කාමරයෙන් පිට වූවාය.

ඇය කෙතරම් කරුණාවන්තදැයි මට සිතිණ.

මම ඇඳුම් මාරුකර මූණ සෝදාගෙන ටිකක් හාන්සි වුණෙමි. නිතැතින්ම මට මතක්වූයේ අම්මාය. මා ගෙදර එන තුරු අම්මා තොයිඹසිල්ලෙන් මග බලා සිටිනු ඇත. අම්මාගෙන් වෙන්ව මා මෙතෙක් එක රැයක්වත් පිට තැනක නැවති නැත. එහෙත් එය අද සිදුවෙයි. ඒ වෙනකොට අම්මට මොනවා හිතෙයිද? මගේ දෑස කඳුළින් තෙත් විය.

ඇඳ කෙතරම් සුවපහස් වුවත් මට නින්ද නොගියේය. මම දහසක් සිතුවිලි අතර මංමුලාවෙමින් දෙනෙත පියා ගෙන සිටියෙමි.

අඳුර වැටෙන්නට ආසන්න වන විට තරුණියන් ලස්සන ඇඳුම් හැඳ හැඩවැඩ වන බව මට පෙනිණ.

"කොහේවත් ගමනක් යන්නද?" මම ඇසීමි.

"නැහැ. ඇයි ඔයා එහෙම ඇහුවෙ?"

මට ලජ්ජා සිතිණ. මෙය සැමදාම ඔවුන්ගේ සිරිත විය යුතුය.

"නෑ නිකම්" මම පැවසීමි.

තරුණිය කට කොනකින් සිනාසුණාය. අනෙක් දෙදෙනාද කාමරයට ආහ.

"අක්කේ පිපාසෙයි මොකුත් බොමුද? මෙයාටත් පිපාසෙ ඇති" එකියක් පැවසුවාය.

"මට නම් පිපාසයක් නැහැ" මම පැවසීමි.

"මටත් තිබහයි නංගි ගිහින් බොන්න මොකුත් හදා ගෙන එන්නකො"

ඉන් මොහොතකට පසු එකියක් බන්දේසියක් මත බීම වීදුරු හතරක් තබාගෙන ආවාය. පළමුවෙන් මා වෙත එය ඇල්ලූ නිසා මම



වීදුරුවක් ගතිමි. මගේ අත සීතල වීගෙන ගියේය. වීදුරුව එතරම්ම සීතලය.

ඔවුන් හෙමිහිට වීදුරු තොලගාන්නට වූ විට මම ද එය අනුකරණය කෙළෙමි. එහෙත් සීතල අතරින් මට කිසියම් සැර ගතියක් දැනිණ. මා මින් පෙර කවදාවත් මෙබඳු බීමක් පානය කර නැත. ඒවා කුමක්දැයි ඔවුන්ගෙන් අසන්නට ද මට බැරිය. එවිට ඔවුන් මා ගැන පහත් ලෙස සිතාගනු ඇත. නොබී සිටින්නටද බැරිය. එවිට මට මෙබඳු සිසිල් බීම නුපුරුදු යයි ඔවුන් සිතනු ඇත. මොවුන් සමග සිටින එක රැයට හෝ මා මගේ තත්ත්වය රැකගත යුතුය. ඒ නිසා වස වුවත් කමක් නැත. මාත් පානය කළ යුතුය. ඔවුන්ට වස ඔරොත්තු දෙන්නේ නම් මටත් ඔරොත්තු දෙනු ඇත.

ටිකින්ටික වීදුරුව භාගයක් පමණ හිස් කළ විට මේවා මත්පැන්දැයි මට සැක සිතිණ. මා කවදාවත් මත්පැන් පානය කර නැත. මේවා මත්පැන් නොවිය යුතුය. ගැහැනු මත්පැන් පානය නොකරති. ඒ නිසයි මොවුනුත් මේවා පානය කරන්නේ. මම එසේ සිතිමි. කෙසේ වෙතත් අහක දමන්නට බැරිනිසා අප්පිරියාවෙන් වුවද මම ඉතිරි හරියත් බීවෙමි.

ටික වේලාවකට පසු මගේ හිස කැරකෙන ගතියක් දැනිණ. වමනය යන්නට ආවත් මම එය ආයාසයෙන් මැඩපවත්වා ගතිමි. එහෙත් මගේ අපහසුව ඔවුන් තේරුම් ගන්නට ඇත.

"ඇයි සාමා?"

"න් - නෑ. මොකුත් නෑ........."

මට කතාකිරීමට අපහසු බව දැනිණ. දිව පැටලෙයි.

"නැත්තෙ නෑ. මොකද ඔයාට."

"මගේ ඔළුව ටිකක් බර ගතියයි"

"එහෙනම් ගමන් වෙහෙස හින්දා වෙන්න ඇති. ටිකක් හාන්සි වෙන්න"

මම ඇඳේ දිග ඇදුණෙමි. එහෙත් ඇඳ පෙරළෙන්නට එන්නාක් මෙන් මට දැනිණ. මොනවද මේ අය මට බොන්න දුන්නෙ? මට

ඇස් හැර බලා සිටිය නොහැක. කාමරයේ වහලයත් බිත්තිත් ඇලවීගෙනයයි. මම ඇස් පියා ගතිමි. එහෙත් එවිට මාත් සමග ඇඳ පෙරළෙන්නට යයි.

"නාම අඩු නැද්ද සාමා?" සෑහෙන වේලාවකට පසු එකියක් ඇසුවාය.

"ඇද් - ඇන් වැ - වැඩියි වාගෙ........"මගේ දිව ගොත ගැසෙයි.

"ඇත්තද? මහන්සි උනාම සමහරදාට මටත් ඔහොම තියෙනවා. එහෙම වෙලාවට බොන්න බේතක් මගේ ළඟ තියෙනවා. ඉන්න මම ඔයාට ටිකක් දෙන්න...."

ඈ දුවගොස් කුඩා වීදුරුවකට යමක් රැගෙන ආවාය. මට කට අරින්නට කීවාය. මම කට ඇරියෙමි. ඈ එය මගේ කටට වත්කළාය. මගේ බඩ පපුව දාගෙන ගියේය.

"නව චුට්ටකින් සේරම සනීපවෙයි" ඈ පැවසුවාය.

හිස කැරකෙන ගතියත් සමග මට නිදි මතක් දැනෙන්නට විය. මම කොට්ටය බදා ගතිමි.



# 16.

උදේ මා අවදි වූයේ මහත් කලබල ගතියෙනි. ඉකුත් රැයේ මහ විශාල කලබලයක් සිදු වූවාක් මෙන් මට මතක් විය. මොකක්ද කලබලය? එහෙත් මට එය මෙනෙහි නො වෙයි.

කිසිවකු මගේ බඳට උඩින් අත දමාගෙන මා තුරුළු කරගෙන නිදා සිටින බවක් මට දැනිණ. කවුද අර තරුණිය ද? මම වහා ඇස් හැර බැලීමි.

දෙයියනේ ගැනියෙක් නෙවෙයි පිරිමියෙක!

මම තැති ගැන්මෙන් උඩ විසිවී වාඩි වීමි. කවුද මේ? දෙයියනේ මන්ත්‍රීතුමා!

මම කෑගසාගෙන ඇඳෙන් බිමට පැන්නෙමි. එහෙත් ඒ සමගම මා නිරුවතින් සිටින බව මට පෙනිණ. මම විහාම නැමී ඇඳ පාමුල වැටී තිබූ පොරෝණයක් ගෙන සිරුර වසාගෙන ගැහෙමින් ඇඳ දෙස බැලීමි. ඇඳේ දිගාවී සිටින මන්ත්‍රීතුමා හිස ඔසවා මා දෙස බලා සිටියි.

මේක සිහිනයක් ද? දෙයියනේ මේක සිහිනයක් වෙනවා නම් කොච්චර හොඳ ද? ඒත් මේක හැබැහින්. දෙයියනේ ඇත්තටම සිද්ද වී ඇති දෙයක්.

කෝහොමද මූ මේ කාමරේට ආවෙ? කොයි වෙලාවෙ ද ආවෙ? දෙයියනේ මම අහුවෙච්ච උගුලක්. දැන් ඉතින් මූත් එක්ක නිදාගත්ත මගේ ගන්න දෙයක් තියෙනව ද?

මම දෝතින් මුහුණ වසාගෙන හැකි තරම් අඬන්නට වීමි. අනේ මගේ දුප්පත් අම්මා! හාල් පොත උගස් තියලා මගේ දුප්පත් අම්මා මාව එව්වේ මේකට ද? දැන් ඉතින් ආයිත් කොහොමද මම මගෙ අම්මගෙ මූණ බලන්නෙ? ඊට වැඩිය හොඳයි මැරෙණ එක. ඊයේ

For E-Pusthakalaya



උදේ පාන්දර අම්මාගේ දෙපතුල් අල්ලා වැඳල ආශිර්වාද ලබා ගෙන රස්සාවක් සොයාගෙන ආව අසරණ මම......! අනේ මං වගේ හිඟන කෙල්ලකට මෙච්චර උසස් කියන දේශපාලනඥයෙක් කරපු දෙයක! ඇයි මූට හෙණ වදින්නෙ නැත්තෙ? මම දෝතින් මුහුණ වසාගෙන තව තවත් හඬන්නට වීමි.

කාගේදෝ අතක් හෙමිහිට මගේ උරහිසක් මත රැඳෙනු දැනිණ.

"අඬන්න දෙයක් සිද්ද වෙලා නැහැ. ඒ සේරම මම බලා ගන්නවා. මම ඔයාව අනාත කරන්නෙ නැහැනෙ....." එය මන්ත්‍රීවරයාගේ කටහඬය.

අනාත කරන්නෙ නැහැ! යුවතියකගේ ජීවිතේ මීටත් වඩා අනාථ වීමක් තවත් තියෙනව ද? මොහුගේ මව සහ සහෝදරියන් පාවාදී බණින්නට මට සිතෙයි. මෙබඳු දෙයක් කළ හැක්කේ මවක සහෝදරියක ගැන කිසිම හැඟීමක් නැති එකෙකුටය. එහෙත් දැන් ඉතින් බැණීමෙන් සිදුවන යහපත කුමක්ද? සිදුවන්නට තිබුණ ලොකුම දේ සිදු වී හමාරය. නැති වන්නට මට තිබුණ ලොකුම හා එකම දේ නැතිවී අවසානය.

මම බොහෝ වේලාවකට පසු හෙමිහිට හිස ඔසවා බැලීමි. කාමරයේ මා හැර වෙන කවුරුවත් නැත. මම ඇඳ දෙස බැලීමි. ඇඳ මත පොර බැදූ කලක මෙන් ඇතිරිලි ආදිය පොඩිවී ඇත. මම ඇඳ වෙත ආසන්න වී එදෙස බලා සිටින්නට වීමි.

ඇතිරිල්ලේ වැගිරුණ රුධිර ධාරාවකි. කඳුළු අතරින් මම එදෙස බලා සිටින්නට වීමි. ධනේශ්වර දේශපාලනඥයකු උගේ විනෝදය තකා අහිංසක මගේ චරිත ශුද්ධිය කෙළෙසා මගේ සිරුරින් වැගිරවූ රුධිර ධාරාව! කොහොමද මම මූගෙන් මගේ ලේවල පලිය ගන්නෙ?

එක්වරම සිරිසේන මගේ හමුවේ සිටගෙන සිටින්නාක් මෙන් මට පෙනිණ. අපේ පන්තියේ විමුක්තිය තියෙන්නේ මුන්ගේ පන්තියේ රුධිර ගංගාව මත යයි ඔහු කෑ ගසන්නාක් මෙන් මට ඇසිණ.

ඔව් සිරිසේන ඔයා හරි. මමත් ජීවත් වෙන්න ඕන. මගේ ලේවල පලිය ගන්න ජීවත් වෙන්න ඕන. මම දත්මිටි කාගෙන එසේ තීරණය කෙළෙමි.



ගෙදර සිටින තරුණියන්ගෙන් එකියක් බියෙන් බියෙන් මෙන් කාමරයට ආවාය. ඈ කතා නැතිව මා දෙස බලා සිටියාය. මම කෝපයෙන් පුපුරන්නට වීමි. ඈ ඇඳ දෙස බැලුවාය. ඒ සමගම ඇගේ දෑස විමතියෙන් ලොකු විය. ඈ බියපත්ව මෙන් මා දෙස බැලුවාය.

"ඔයත් ගෑනියෙක් නේ ද? ඇයි මෙහෙම අපරාධයක් කරන්න අර වලත්තයට උදව් උනේ?" යි මම වේගයෙන් ඇසීමි.

එහෙත් ඒ සමගම යළිත් මට හැඬිණ. මම නැවතත් දෝතින් මුහුණ වසාගෙන ඉකි බිඳින්නට වීමි. ටික වේලාවකට පසු ඈ මා අතින් අල්ලාගෙන හෙමිහිට කතා කළාය.

"ඔව් සාමා මාත් ගෑනියක්. අපි දුප්පත් පවුල්වල ගෑනු වෙලා උපන්නෙ මේකට තමයි. මට ඔයා ගැන දුකයි. මම හිතාගෙන හිටියෙ ඔයා ආවෙ කැමැත්තෙන්මයි කියල. මෙතන සිද්ද වෙච්ච කුමන්ත්‍රණය මම දැන ගන්නකොට පමාවෙලා වැඩියි. නැත්නම් මට සිද්ද වෙච්ච දේ ඔයාටත් සිද්ද කරන්නෙ නැහැ.........."

මම හෙමිහිට ඇය දෙස බැලීමි. ඈ බලා සිටියේ ඇඳේ රුධිර පැල්ලම දෙසය. ඇගේ දෑස කඳුළින් තෙමී තිබිණ.

"මාත් මෙතෙන්ට ආවෙ ඔයා ආව විදියටමයි. මෙතන අපි අක්කලා නංගිලාවත් අම්මලා දූලාවත් නෙවෙයි...."

"එතකොට?" මම පුදුමයෙන් ඇසීමි.

එහෙත් ඈ කතා නැතිව මා දෙස ටික වේලාවක් බලා සිටියාය.

"මාත් මෙතෙන්ට ගෙනාවෙ ලොකු මිනිහෙක්. රක්ෂාවක් දෙන්න. මට අන්තිමට ලැබුණේ මේ රක්ෂාව..."

"මොකක් ද?"

"මේක ගණිකා මඩමක!"

මම උඩ විසිවී බිම වැටුණෙමි. ගණිකා මඩමක! දේශපාලනඥයින්ගෙ කය සතපන ගණිකා මඩමක!

"දුක් වෙන්න එපා සාමා. දුප්පත්වෙලා උපන් අපට උරුම මේක. පොහොසත් එවුන්ගෙ විනෝදයට අපේ සිරුර බිලිදෙන එක. කරන්න දෙයක් නෑ. මං හිතන්නෙ අද ඉඳලා ඔයාටත් හිමි මේක. කොහොමද

For E-Pusthakalaya

මෙහෙම දෙයක් කරගෙන ආයෙත් ගෙදර යන්නෙ? ඔයත් හිත හදාගන්න...."

ගණිකා වෘත්තිය! දේශපාලනඥයෙක් මට දෙන රක්ෂාව ඒක ද? නෑ. මම ගණිකාවක් වෙන්නෙ නෑ. එහෙම වෙලා මගේ පලිය ගන්න බෑ. ගණිකාවක් වෙලා ජීවත් වෙනවාට වැඩිය හොඳයි ජීවිතේ නැතිකර ගන්න එක. මම කොහොම හරි ගෙදර යනව. ඊත් මම මැරෙණ මොහොත දක්වාම මේ රහස රැක ගන්නව. වෙන කාටවත් තියා මගේ අම්මටවත් කියන්නෙ නෑ. අනිත් එක මගේ අම්මා මෙහෙම දෙයක් කොහොම අහන්නද? පපුව පැලිලා මැරෙයි. අම්මට තියෙන දුක මදිවට මම මේ දුකත් දෙන්නෙ නැහැ.

මාව ගෙදර එක්කරගෙන යාමට ඉක්මණින් එන බව කියා මන්ත්‍රීතුමා පිටත්ව ගියේය. ඔහු ආපසු එතැයි මම කොහෙත්ම විශ්වාස නොකෙළෙමි. හැඬූ කඳුළෙන් මගේ දවස ගෙවෙන්නට විය. කෙසේ හෝ මා මෙතැනින් පැන පාර සොයාගෙන ගෙදර යා යුතුය. එහෙත් මැදිවියේ කාන්තාව මට හෙල්ලෙන්න නොදී මා අවටම නිතර ගැවසුණාය.

සවස මන්ත්‍රීතුමාගේ කාර් එක පැමිණියේය. එහෙත් එහි සිටියේ මන්ත්‍රීතුමා නොව අර සංස්ථාවේ අධ්‍යක්ෂ වරයාය.

"අන්න මන්ත්‍රීතුමා කිව්වා ඔයාව එක්කරගෙන එන්න"

"කොහාට ද?"

"අපේ සංස්ථාවෙ සභාපතිතුමා මුණ ගැහෙන්න"

මම කල්පනා කරන්නට විමි. මේක තව උගුලක් ද? මොන උගුලක් වුණත් දැන් මට ආරක්ෂා කරගන්නට දෙයක් නැත. නැතිවෙන්නට දෙයක් නැති කෙනෙක් මොනවා නැතිවෙයි කියල බය වෙන්න ද? මම ඔහුත් සමග පිටත්වීමි.

කාර් එක නැවතුණේ මුහුදට ආසන්න විශාල හෝටලයක් ඉදිරිපිටය.

"මන්ත්‍රීතුමා දැන් සභාපතිතුමත් එක්ක මේ හෝටලේට එනව. අපි ගිහින් ඉඳිමු"

මම ඔහු පසු පසින් ඇදුණෙමි. හෝටලයේ සේවකයකු ද සමග



ඔහු කාමර පේළියක් අද්දරින් මා ද කැටුව ගමන් කෙළේය. සේවකයා එක් කාමරයක දොරක් හැර දුන්නේය.

"ඔයා මේ කාමරේට වෙලා ඉන්න. අර දෙන්නා ආව හැටියේ මම ඔයාට කතා කරන්නම් හෝල් එකට. ඒ දෙන්නා ඉක්මනට ඒවි. අද ඔයත් එක්ක මන්ත්‍රීතුමා රෑවෙන්න ඉස්සෙල්ලා ගමේ යන්නත් ඕන කිව්වා" යි ඔහු පැවසුවේය.

ඔහු ගිය පසු මම කාමරය සිසාරා බැලීමි. මොන තරම් සුඛෝප භෝගී කාමරයක් ද? මොනවද මේකට අඩු? අනේ ඇත්තට මන්ත්‍රීතුමාට ඡන්දෙ දීලා පාර්ලිමේන්තුවට එවාපු අපේ ගමේ කිසිම කෙනෙක් මෙහෙම කාමරේක ඉන්නා තියා දැකලාවත් තියෙනව ද? මන්ත්‍රීතුමා ඡන්ද කාලෙට දස දුක් විඳ විඳ මිනිස්සුන්ට බැගෑපත් වෙන්නෙ මේ වගේ සැප සම්පත් විඳින්න නේද?

සභාපති මාව දකින්න එන්නෙ මොනවට ද? ඌටත් ඕන වෙලා ඇත්තේ රස්සාව දෙන්න ඉස්සෙල්ලා මගෙන් සතුටු වෙන්න ද? නැත්නම් මාව දකින්න මෙච්චර හොඳ කාමරයක් මොනවට ද? අනේ දෙයියනේ මුන්ගෙ කල්පනාව මාව එක එකාගෙ අතින් අතට මාරු කරගනිමින් මගෙන් සතුටු වෙන්න ද? අනේ මගේ අම්මා අදත් මග බලාගෙන ඇති මම ගෙදර එනකන්. දෙයියනේ මම කොහොමද මොවුන්ගෙන් බේරිලා ගෙදර යන්නෙ?

මට ඉබේම හැඬිණ.

මහලු සේවකයා සිසිල් බීම බෝතලයක් සහ වීදුරුවක් බන්දේසියක තබාගෙන කාමරයට ඇතුළු විය. මම ඔහු දෙස බැලීමි. මා දෙස බැලූ ඔහු කතා නැතිව ගැඹුරු ඇසින් බලා සිටින්නට විය.

"ඇයි මේ නෝනා අඬන්නෙ?"

"කෝ මාව මෙතෙන්ට එක්කගෙන ආව මහත්තයා?"

"අරහෙ බාර් එකේ බොනවා"

මම ඔහු දෙස බලා සිටින්නට විමි. ඔහුද මා දෙස බලා සිටින්නට විය. මට මොහුගෙන් පිහිටක් බලා පොරොත්තු විය හැකි ද? මොහු විශ්වාස කළ හැකි ද? මම කතාව පටන්ගත යුත්තේ කොහොම ද?

"ඔහෙට නැද්ද මගේ වයසෙ දූවරු?" මම කඳුළු අතරින් ඇසීමි.

For E-Pusthakalaya

"ඉස්සර. ඇයි?"

"ඔයේ කැමති ද ඒ දුවරු ලොකු මහත්තයෙකුගෙ විනෝදෙට මේ වාගෙ තැනකට එවන්න?"

"එහෙම කරන්න සිද්ද උනොත් මම ඊට වැඩිය මගේ ළමයි කපල අන්න අර මූදට දමනව"

"මගේ තාත්තා හිටියා නම් මටත් අද ඒක කරාවි"

"ඔය ළමයගෙ තාත්තා නැද්ද?"

"නැහැ"

"මෙහෙ ආවෙත් ඔය ළමයගෙ කැමැත්තෙන් නෙවෙයි ද?"

"නැහැ. අපේ මන්ත්‍රීතුමා මාව එක්කරගෙන ආව මට රක්ෂාවක් දෙන්න"

"රක්ෂාවක! උගේ මේරගෙ......" ඔහු පහත් හඬින් කොඳුරමින් පුවද දත් කෑවේය.

"මූදු බව අක්වෙයි අනේ ඔහෙට බැරිද කොහොම හරි මට මෙතනින් පිටවෙන්න උදව් වෙන්න?"

ඔහු මොහොතක් වෙලා මා දෙස බලා සිටියේ ය.

"කොහෙ ද ඔය ළමයගෙ ගම?"

"නුවර ඉදලත් හුඟක් ඈත පිටිසර"

"පරිස්සම් වෙලා එච්චර ඈතක් තනියම යන්න. පුළුවන් ද?"

"පුළුවනි"

"අතේ සල්ලි තියෙනව ද?"

"ඔව්"

ඔහු මොහොතක් කල්පනා කෙළේය.

"එන්න මාත් එක්ක. මේක මගෙ රස්සාවත් නැතුව යන වැඩක්. ඒත් කමක් නෑ ඔය ළමය වාගෙ අසරණ කෙනෙකුට උදව්වෙලා. එතකොට මගේ ළමයකුටත් කවදාහරි කවුරුහරි උදව්වක් කරාවි. පොඩි රහස් පාරක් තියෙනවා. ඒකෙන් මම ඔය ළමය මහ පාරට ගෙනි යන්නම්. එතනින් පිටකොටුවට යන බස් එකක ගිහින් නුවර බස් එකකට නගින්න. එන්න මාත් එක්ක"

ඔහු මාත් සමග පවු දෙබොකු අතරින් ගොස් පුංචි ගේට්ටුවකින්



මහ පාරට මතු වුණේය.

"අර තියෙන්නෙ බස් හෝල්ට් එක. ඉක්මන් කරලා බස් එකකට නැගලා ඔතනින් පිටවෙලා යන්න. මම යනව"

"ලොකු උන්නැහේ මේ කරපු උදව්ව මගේ ජීවිතේ තියෙන තුරු මම අමතක කරන්නෙ නැහැ"

මගේ කතාව අවසන් කරන්නටත් පළමු ඔහු නොපෙනී ගොස් සිටියේය. මම බයෙන් වටපිට බලමින් බස් නැවතුම්ට දුවගෙන ආවෙමි. පෝලිමේ සිටගෙන සිටියදිද මා බියෙන් බලා සිටියේ මන්ත්‍රීතුමාගේ කාර් එක මා සොයා එනු ඇද්දැයි කියාය. 'පිටකොටුව' යන නාම පුවරුව සහිත බස් එකක් එනු දුටු මම මද සහනයක් ලදිමි. එයට නගින්නට පොර කෑ සෙනග සමග මා යන්නම් පා පුවරුවට නගිත්ම බස්රිය පිටත් විය.

ඇත්තම ඉතින් මන්ත්‍රීට හෝ අධ්‍යක්ෂකට මාව අල්ලන්න බැහැයි මට සිතිණ.

මම පිටකොටුවෙන් බැස බස් නැවතුම්පොලේ 'මහනුවර' බස් රථයක් ඇද්දැයි සොයන්නට වීමි. කිසිවකුගෙන් අසන්නට මම බියවීමි. පිරිමියකු තබා මහලු කාන්තාවක පවා විශ්වාස කරන්නට මම බියවෙමි. මගේ අසරණ බව අවබෝධ කර ගන්නා ඇය මට උගුලක් අටවා රවටාගෙන වහල් මෙහෙයට ධනවත් බංගලාවකට හෝ ගණිකා මඩමකට විකුණන්නට බැරි නැත.

බස් නැවතුම්පලේ නාම පුවරු පරීක්ෂාවෙන් බලා ගෙන යද්දී මට මහනුවර යන බස් නවත්වන තැන සොයාගත හැකි විය. මම එතැන සෙනග පෝලිමට එකතු වීමි.

For E-Pusthakalaya

# 17.

දහසක් සිතුවිලි අතර මා මංමුලාවී සිටියදී මා රැගත් බස්රිය වේගයෙන් පෙරට ඇදෙයි. එහි ගමන තවත් වේගවත් වන්නේ නම් යෙහෙකැයි මට සිතෙයි. නුවරින් අපේ ගම්බලා පිටත්වන අන්තිම බස්රිය එහි ළඟාවන්නේ සවස හයට පමණය. මට ඒ බස්රිය අල්ලාගත නොහැකි වනු ඇත.

අතරමඟදී අඳුර වැටිණ. දැන් මා අතරමංවී හමාරය. ගෙදර යාමට මට දැන් ඉතින් නුවරින් බස් එකක් අල්ලා ගත නොහැක. නුවරට යන විට තවත් බොහෝ රෑ වන්නේය. අද මම නවතින්නේ කොහෙද? මා එනතුරු අම්මා අදත් මග බලා සිටින්නිය. අදත් මා නො එන විට ඇ ඉවසන්නේ කෙසේද? ඇ මුළු රැයම හඬමින් ගත කරනු ඇත. මගේ හදවත හඬා වැලපෙයි.

මා හඳුනන කවුරුවත් නුවර සිටීද? එක් වරම මට අනෝමා මෙනෙහි විය. ඇ අද කන්‍යාරාමයේ සිටිනු ඇත. කොහොම හරි මට ඒ කන්‍යාරාමය සොයා ගත හැකි නම්! අනෝමා කිසිසේත් මා පිටු නොදකින්නිය. මා හැද සිටින්නේ ඇගේ ගවුමක්. ඇගේ සෙරෙප්පු.

අනෝමා මෙනෙහි වීමෙන් පසු මගේ සිතට සුළු වශයෙන් හෝ අස්වැසිල්ලක් දැනිණ. දයාබර අනෝමා. ඇයට සියලුම දෙවියන්ගෙ පිහිටය!

මා නුවරට ළඟා වන විට ඔරලෝසු කණුවේ රාත්‍රී අටද පසුවී තිබිණ. අපේ ගම පසුකරගෙන යන බස් රියක් නොවීය. දැන් ඉතින් අනෝමාගේ කන්‍යාරාමය සොයා ගන්නේ කෙසේද? මට ඇති පිහිට එය පමණයි. නමුත් කාගෙන් අහන්නද? කිසිම කෙනකු මට විශ්වාස කළ නොහැක. මාව රවටාගෙන වෙන කොහෙ හරි රැගෙන යනු



ඇත. හැරමිටි වාරුවෙන් යන මහල්ලකු තබා මැහැල්ලකවත් විශ්වාස කළ නොහැක. ඔවුන් මා රැගෙන ගොස් කාට හෝ විකුණනු ඇත. විශ්වාස කළ හැකි කෙනෙකු සොයා මම වටපිට බැලිමි.

අත දරුවකු වඩා ගත් තරුණ ජෝඩුවක් බස්රියක් එනතුරු බලා සිටිනු මට පෙනිණ. ඔවුන් මා මුළා නො කරනු ඇතැයි මට සිතිණ. කන්‍යාරාමය ගැන මම තරුණ මවගෙන් හෙමිහිට ඇසීමි.

"දැන් බස් එක එයි. අපි යන්නෙ කොන්වන්ට් එක පහුකරගෙන. අපට පුළුවනි ඔයාව එතනින් බස්සන්න" ඇ කාරුණික ලෙස පැවසුවාය.

මා කන්‍යාරාමය සොයා ගත්තේ ඔවුන්ගේ ආධාරයෙනි. මම බියෙන් බියෙන් කන්‍යාරාමයේ දොරටුවතුළින් ඇතුළුවිමි. මා දුටු කන්‍යා සොයුරියක් කුතුහලයෙන් මෙන් මා දෙස බලා සිටිනු පෙනිණ. මා අතරමංවූ බවත් රැය ගත කරන්නට අනෝමා සොයා මෙහි ආ බවත් මම ඇයට පැවසීමි. විජාතික කාන්තාවක්වූ ඇ මගේ කතාව උනන්දුවෙන් අසා සිටියාය.

"එන්න මාත් එක්ක" ඇ නුපුරුදු සිංහල ස්වරයෙන් වුවත් කාරුණිකව පැවසුවාය.

මම ඇය පසු පසින් ගමන් කෙළෙමි. අපි ලොකු ශාලාවකට පැමිණියෙමු. එහි සුවපහස් පුටු කීපයක් තබා තිබිණ. පත්තර සඟරා සහ මල් බඳුන් උසුලා ගත් ටීපෝ කීපයක් ද විය.

"ඔහොම වාඩිවෙලා ඉන්න. මම අනෝමාට එන්න කියන්නම්" යයි පවසා ඇ මගෙන් වෙන්ව තරප්පු පේලිය නගින්නට වූවාය.

ඇය නොපෙනී ගිය පසු මම තනිවීමි. ශබ්දයකට පවා එහි වූයේ බිත්තියේ සවිකළ ලොකු ඔරලෝසුවේ 'ටක් - ටොක් - ටක් - ටොක්' හඬ පමණකි. මගේ හදවත ද ඒ අනුව ස්පන්දනය වනු දැනෙයි. මම සැහෙන වේලාවක් බලා සිටියෙමි.

කිසිවකු තරප්පුව මුදුනට පැමිණ පහළ බලනු මට පෙනිණ. ඒ අනෝමාගේ මුහුණය.

"ආ - නේ - සාමා නේද.......?" පැවසූ ඇ තරප්පු පේලිය දිගේ වේගයෙන් පහළට දුව ආවාය.

For E-Pusthakalaya


මගේ සිත තුළ පහනක් දැල්වූවාක් මෙන් විය. මම වහාම පුටුවෙන් නැගිට්ටෙමි. දුවගෙන ආ අනෝමා මුළු හදවතින්ම මා වැළඳ ගන්නාක් මෙන් ප්‍රසන්න මුහුණින් යුතුව තරයේ මගේ අත අල්ලා ගත්තාය. ඉබේම මගේ ඇස කඳුළින් තෙත්විය.

"මොකද සාමා මේ? කොහෙද ඔයා මේ මහයි?"

"මං අතරමං උනා අනේ. ඔයාව හොයාගෙන ආවෙ...... ඔයාට කරදරයක් නැත්නම් මට අද රෑ නැවතිලා ඉඳලා හෙට උදේන්ම ගෙදර යන්න පුළුවන් උනොත්......"

"අපෝ පුළුවන්. ඒක සුළු දෙයක්. කොහෙද ඔයා ගියේ?"

මට එකවර කතාකර ගත නොහැකි විය. කොතනින් පටන්ගෙන කුමක් පැවසිය යුතුද? සිදුවූ දේ දිවිහිමියෙන් කිසිම කෙනකු සමග පැවසිය නොහැක. මොහොතක් වේලා මා දෙස බලා සිටි අනෝමා නැවත කතා කළාය.

"හා - විස්තර කතා කරන්න පස්සේ පුළුවනි. එන්න මාත් එක්ක"

මගේ අතින් අල්ලාගෙන සිටි ඈ එය අත නොහැරම මාත් සමග තරප්පුව නගින්නට වූවාය. බරාඳයක් පසු කළ අපි නිදන මැදිරියකට පැමිණියෙමු. එහි අනෝමාගේ වයසෙහිම තවත් යුවතියෝ රාශියක් වූහ. පිපීගෙන එන රෝසමල් බඳු ඔවුහු කුතුහලයෙන් මා දෙස බලා සිටින්නට වූහ.

"මෙයා සාමා සමරකෝන්. අපේ ගමේ මගේ යාළුවෙක්" අනෝමා ඔවුන්ට මාව අඳුන්වා දුන්නාය.

මා දුටු සෑම මුහුණක්ම මට සිනාවකින් සංග්‍රහ කෙළේය. ඔවුහු සියලු දෙනාම රාත්‍රී ඇඳුම්වලින් සැරසී සිටිති. කොතරම් සතුටින් පසුවන මොන තරම් වාසනාවන්ත තරුණියන් සමූහයක්දැයි මට සිතිණ. සෑම තරුණියකටම මේ වාසනාව ඇත්නම්!

"සාමා විනාඩියක් ඔහොම ඉන්න. මම මදර්ට කියල එන්නම්" යයි පවසමින් අනෝමා මගෙන් ඉවත්ව ගියාය. අනෙක් ශිෂ්‍යාවෝ ඔවුනොවුන්ගේ කාර්යයන්හි නිරත වූහ. මා අසල සිටි යුවතියක් කාරුණිකව කතා කළාය.

"ඔයා ඉන්නෙ අනෝමලගෙ ගෙවල් ළඟද?"



"ඔව්"

"ඉගෙණ ගන්නෙ කොහෙද?"

"දැන් ඉගෙණ ගන්නෙ නැහැ"

"අයියෝ ඇයි? ඔයා තාම ඉස්කෝලෙ යන වයසෙනෙ"

මම ඇය සමග සිනාසෙන්නට තැත්කළා මිස කතා නොකෙළෙමි. මා මුහුණ පා සිටින තත්වය ගැන ඒ අහිංසක යුවතිය දන්නේ කෙසේද? ඇයට එබඳු අත්දැකීමක් නැත. ධනවත් පවුලක ඉපිද සියලුම සැප සම්පත් මැද ඉගෙණීම කරගෙන යන ඇය - මා බඳු කොටසකුත් ජීවත් වන බවවත් නොදන්නවා ඇත. එය ඇගේ වරද නොවේ.

අනෝමාත් සමග සුදු කන්‍යා මාතාවක් පැමිණියාය. මා අසලට පැමිණි ඈ පරීක්ෂාකාරීව මා දෙස බැලුවාය. ඇයත් අනෝමාත් අතර කතාබහ කෙරුණේ ඉංග්‍රීසියෙනි. ඉන්පසු යන්නට හැරුණ ඈ මා දෙස බලා කාරුණික සිනාවක් පෑවාය. මම ද මුහුණට සිනාවක් නගාගෙන ඇයට හිස පහත් කෙළෙමි.

"එයා තමයි අපේ හොස්ටල් එක භාරව ඉන්න මදර්" යයි ඈ ගිය පසු අනෝමා පැවසුවාය.

ඉන්පසු අනෝමා මට ඇඳුම් මාරුකර ගන්නට සලස්වා දුන්නාය. මා ඇඳ ගත්තේ ඇගේ නයිටියකි. මාත් සමග නාන කාමරයට ගිය ඈ මට මුහුණ සෝදා ගන්නට සලස්වා දුන්නාය. එය ද සුඛෝපභෝගී නාන කාමරයකි. මුහුණ සෝදාගත් පසු මගේ ඇගේ තෙහෙට්ටුව බොහෝදුරට මගහැරිණ. සයනාගාරයට පැමිණි මම පවුඩර් ටිකක් ද මුහුණේ තවරා ගතිමි. අනෝමා ඕඩිකොලොන් ස්වල්පයක් ගෙන ඉතාම ආදරයෙන් මගේ හිසෙහි ගැල්වූවාය.

"සාමා නම් රෑට මොකුත් කන්න නැතුව ඇති නේද?"

"මට බඩගින්නක් නැහැ"

ඈ එවිට යන්තමින් සිනාසුණෝය. දයාවෙන් පිරුණ ඇගේ මුහුණ කෙතරම් පියකරුද? මාත් සමග ඇඳේ වාඩිවී සිටි ඇය නැගිට ගොස් ඇගේ කැබිනට්ටුව හැර බිස්කෝතු පැකට්ටුවක් එළියට ගත්තාය.

"අනේ අනෝමා කරදර වෙන්න එපා"

"මොකක්ද කරදරේ? මගේ හිතට දුක මේ වෙලාවෙ මීට වැඩියෙ

For E-Pusthakalaya


දෙයක් මෙහෙ නැති එකයි" පවසමින් ඈ විස්කෝතු පැකට්ටුව කැඩුවාය.

"ඔන්න ලැජ්ජා වෙන්නෙ නැතුව බඩ පිරෙන්න කන්න ඕන" යයි ඈ මගේ කතාකර පවසා විස්කෝතු පැකැට්ටුව මා අත තැබුවාය.

ඉන්පසු ඈ තවත් ටින් එකක්ද එළියට ගනු පෙනිණ.

"අනේ අනෝමා ඔයා මං හින්දා හරියට කරදර වෙනවා"

"පිස්ස! මහන්සිවෙන අයට හුඟක් හොඳයි කියල තාත්තා මෙදා මට මේ මයිලෝ ටින් එක ගෙනැවිත් දුන්නෙ. මං හරි ආසයි ඒක ඇල්වතුරෙන් හදලා බොන්න. ඔයාටත් එහෙම හදල දෙන්නද?"

"ඔයාට පහසු විදියක්"

"නෑ. ඔයාට රස්නෙට හදලා දෙන්නම්"

මා විස්කෝතු කන අතර ඈ උණුවතුර බෝතලයෙන් වතුර ගෙන මයිලෝ කෝප්ප දෙකක් පිළියෙළ කළාය. ඒ සියල්ල ඈ කරන්නේ කෙතරම් සතුටින්ද? මේ සියල්ල කරන්නේ කරදරයක් මෙන් සලකාගෙන බවට ඇගේ මුහුණේ ලකුණක්වත් නැත. ඒ වෙනුවට ඇත්තේ ළබැඳි මිතුරියකට සංග්‍රහ කරනවිට ඇතිවන ස්වභාවයකි.

අප දෙදෙනාම නිදාගත්තේ ඇගේ ඇඳේය. කොට්ටය මත හිස තබාගත් කෙණෙහිම මට අම්මා මෙනෙහිව හැඩුම් යන්නට ආවේය. හදවත ගිනි පත්තුවී ඈ මග බලාගෙන ඇති. මට ඉබේම සුසුමක් හෙළිණ.

මම ගියේ කොහෙද? සිද්ද උනේ මොනවද? දැන් ඉන්නේ කොහෙද? ජීවිතේක හැටි!

"ඔයාට නිදිමත ද?" අනෝමා හෙමිහිට ඇසුවාය.

"නැහැ"

"එහෙනම් අද ඔයාට උනේ මොකද කියල කියන්න"

මා ඒ සියල්ල කෙසේ කියන්නද? සිදුවූ දේ පිළිබඳ සත්‍යය අනෝමා තබා අම්මා සමග වත් කිව නොහැක්කකි. දිවි හිමියෙන් මම එය කිසිම කෙනකු සමග නොකියමි.

"මම රක්ෂාවක් හොයාගන්න කොළඹ ගියා. මන්ත්‍රීතුමාත් එක්ක සංස්ථාවකට ගිහින් බැලුවා. නුවර එනකොට හොඳටම රෑ උනා. ඊට පස්සෙයි ඔයාව හොයාගෙන ආවෙ" මම කෙටියෙන් පැවසීමි.



"මොකක්ද රක්ෂාව?"

"ලිපිකරුකමක්"

"මන්ත්‍රීතුමා කීවද ඒක හදලා දෙන්නම් කියල?"

"ඔව්"

"ඔයා රස්සාවට ගියාමත් තනියම හරි ඉගෙණ ගන්න. මම දන්නවනෙ ඔයා ඉගෙණ ගන්න කොච්චර දක්ෂද කියල" ඈ මාව උනන්දු කළාය.

ඇත්තටම මට රක්ෂාවක් ලැබෙයිද? ඒක විශ්වාස නැහැ. මන්ත්‍රී මගෙන් අයුතු ප්‍රයෝජනයක් ගත්තත් දැන් මාත් එක්ක තරහින් ඇති. ඒ මනුස්සයා මට මොනවා කරන්න හිතාගෙන ඉන්නවද කවුද දන්නෙ.

"ඔයාට සේන අයියා මුණගැහුනෙ නැද්ද කොළඹදි?" යි අනෝමා ඇසුවාය.

"නැහැ"

"ඇයි ඔයා යන වගක් දන්නලා ඇරියෙ නැද්ද?"

"දැන්නුවා. ඒත් මුණගැහෙන්න පුළුවන් තැනක් දන්නන්න මට පුළුවන්කමක් තිබුණෙ නැහැ"

"සේන අයියා ඔයා ගැන හරිම පැහැදීමකින් ඉන්නෙ. මට එවාපු ලියුමකත් ඔයා ගැන හොඳ කියල තිබුණ"

"ඇත්තද?"

"ඔව්. සේන අයියට ඔයා ගැන හරි දුකයි"

මම සුසුමක් හෙළීමි. සේන අයියාත් අනෝමාත් නෑනලා මස්සිනාලාය. ඔවුන් අතර පෙම් බැඳුමකුත් ඇද්ද? එවැන්නක් ඇත්නම් - ඒ සඳහා ඔවුන්ට මගෙන් උපකාරයක් අවශ්‍ය වුවහොත් එදාට මම ඔවුන්ට උපකාර කරන්නෙමි. ඒ දෙදෙනාම මට උපකාර කළ අයවෙති.

බොහෝ වේලාවක් යනතුරු මට නින්ද නොගියේය. එක් අවස්ථාවක යාන්තම් නින්ද යාගෙන එද්දී මන්ත්‍රී වරයා නිරුවතින් මා ඉදිරිපිට සිටගෙන මගේ බෙල්ල මිරිකන්නට තැත් කෙළේය. මම බියවී අවදිවීමි. මා සිටින්නේ කොහේදැයි එකවර මට නිච්චියක් නැති විය. ඉබේම මම ඇඳ මත වාඩිවීමි.

For E-Pusthakalaya


මා පසෙකින් අනෝමා නිදා සිටියාය. මා සිටින්නේ කන්‍යාරාමයේ බව මට මෙනෙහි විය. මම අනෝමා දෙස බලා සිටින්නට වීමි. ඇයට හොඳින් නින්ද ගොස් තිබේ. දයාබර අනෝමා...... වාසනාවන්ත අනෝමා...... ඔයා අඩිය තියන තියන තැන්වල නෙළුම්මල් පිපෙන්න ඕන...... ඔයා මට මොන තරම් අනුකම්පා කරලා තියෙනවද?

මම අපමණ ආදරයෙන් ඇය දෙස බලා සිටින්නට වීමි. රෝස මලක් බඳු ඇගේ පියකරු මුහුණ සිපගන්නට තරම් දැඩි ආදරයක් මා තුළ විය. එහෙත් එයින් ඇගේ නින්දට බාධාවක් වුවොත් මට පව්.

කොට්ටයෙන් ඇගේ හිස මඳක් පැත්තකට බරවී තිබිණ. මම ඇය අවදි නොවන සේ හෙමිහිට කොට්ටය සකස් කෙළෙමි.



# 18.

**මා** ගෙදර එන විට අම්මා කඳුළු පිරි ඇසින් මග බලා සිටියාය. ඇය දකිත්ම මගේ ද උගුර හිරවී දෙනෙතට කඳුළු නැගිණ. මා ගෙදරින් පිට වූයේ යුවතියක හැටියටය. එහෙත් දින දෙකකට පසු නැවත මට ගෙට ගොඩ වන්නට ලැබුණේත් පිරිසිදු යුවතියක හැටියට ද? මම ආයාසයෙන් හැඬුම යටපත් කරගෙන අම්මාගෙන් මුහුණ සඟවා ගතිමි.

"ඊයෙයි පෙරේදයි දෙකේම මම මන්ත්‍රීතුමාගෙ වලව්වට ගියා. මගෙ පපුව ගිනි පත්තු වෙලා හිටියෙ. ඇයි දුවේ මෙච්චර පරක්කු උනේ?"

"එක දවසෙන්ම ගිය වැඩේ කරගන්න බැරි උනා අම්මෙ"

"කොහෙ ද මේ දවස් දෙකේ නැවතුණේ?"

"මන්ත්‍රීතුමාගෙ අඳුනන ගෙදරක"

අම්මා සැනසුම් සුසුමක් හෙළනු පෙනිණ.

"කොහොම ද දුවේ ගිය වැඩේ ගැන?" මා ඇඳුම් මාරු කරද්දී අම්මා හෙමිහිට ඇසුවාය.

මා කුමක් කියන්න ද?

"අපි යන කොට ඕන කරන අය තෝරාගෙන ඉවරයි අම්මේ. ඒත් මන්ත්‍රීතුමා කිවා තවත් උත්සාහ කරලා බලන්නම් කියලා" අම්මා සනසනු පිණිස මම කීවෙමි.

"එහෙනම් ආයෙත් ගිහින් උන්නාන්සෙ හම්බවෙලා මතක් කරන්න වෙයි"

"ඔව් බලාගෙන බැරියැ"

සිදුවූ සියල්ල අම්මා දන්නවා නම් ඇයට කුමක් සිදු වෙයි ද? සංස්ථාවෙන් කිසියම් ලිපියක් හෝ මන්ත්‍රීතුමාගෙන් පණිවුඩයක්

For E-Pusthakalaya



ලැබෙතැයි මම සෑහෙන කාලයක් බලා සිටියෙමි. එහෙත් එය මෝඩ බලාපොරොත්තුවක් පමණකි. ඒ අතර නැවතත් මන්ත්‍රීතුමා හමුවීමට යා යුතු යයි අම්මා නොයෙක් විට පැවසුවාය. එහෙත් මම ඒ ගමනින් වැළකී සිටියෙමි.

අන්තිමට මම සංස්ථාවේ රක්ෂාව ගැන බලාපොරොත්තු අත හැරියෙමි.

සිරිසේන කිප වතාවක් ම මා සොයා පැමිණියේය. ඔහු පසුවූයේ දැවෙන කෝපයෙන් හා ධනපති ලේ පිපාසයෙනි. ඒ පිපාසය මා තුළ ද එසේම පැවතිණ. ඒ පිපාසය තුළින් මම ඔහුගේ ව්‍යාපාරයට සහයෝගය දැක්වීමට පොරොන්දු වීමි. ඔහු තව තවත් සාමාජිකයින් එක් රැස් කිරීමෙහි නිරතව සිටියේය.

"සාමාටත් පුළුවන් තරම් දුප්පත් ගෑනු ළමයි කට්ටියක් මෙහෙ සූදානම් කරලා තියන්න. හැබැයි අපට විශ්වාස කරන්න පුළුවන් අය විතරක් වෙන්න ඕන. කොයි වෙලාවක හරි මම ඒ අයට දේශපාලන පන්තියක් තියන්න උගත් ගෑනු ළමයෙක් මෙහෙ එක්කරගෙන එනවා..." යි සිරිසේන පැවසුවේය.

මේ කතා බහ අම්මාට කනින් කොනින් ඇසෙන්නට ඇත. සිරිසේන ගිය පසු අම්මා ඒ ගැන ඇසුවාය.

"මොනව ද ඒ ළමයා මෙහෙ ඇවිත් උඹත් එක්ක ඔය හැටි කටු කුටු ගාන්නෙ?"

"පැනලා යන්න කතා කරනවා" යි කියමින් මම සිනාසුණෙමි.

"උඹට විහිළු නේ ද?" අම්මා සැරවූවාය.

"මොකක්ද ඔය ආණ්ඩුවට විරුද්ධව මොනවද කරන්න කතා කෙරුවෙ? ඒවා කතා කරන්න මෙහෙ එන්න ඕන නැහැ. ආණ්ඩු කරන එක ලොකු ලොක්කන්ගෙ වැඩක්. අපි අපේ වැඩක් බලා ගන්න ඕන. දැන් මන්ත්‍රීතුමා රස්සාවක් හොයලා දෙන්න පොරොන්දු වෙලානෙ ඉන්නෙ. ඔය වැඩවලින් සිද්ද වෙන්නෙ ඒකත් නැතුව යන එක. අනිත් දවසෙ ඒ ළමය මෙහෙ ආවම මම කියනවා මෙහෙ එන්න එපා කියල......." අම්මා තරහින් පැවසුවාය.

ඇයට මේවා ගැන තේරුමක් නැත. ඒ නිසා මම නිහඬ වීමි.



ඇයට මන්ත්‍රීතුමා දෙවියෙකි. එහෙත් ඇගේ ඒ දෙවියා මට කළ හරිය ඇ දන්නී නම්?

අපේ ආර්ථික තත්වය දිනෙන් දිනම පිරිහෙන්නට විය. අනුන්ගේ ගෙවල්වල බැල මෙහෙවර කිරීමෙන් සුගතියක් නොවන බව අම්මා ට ද වැටහී තිබිණ. එයින් සුගතියක් තබා එදිනෙදා ජීවත් වීමටවත් නුපුළුවන් විය.

ඉන්පසු අම්මා කඩ කෑම සාදන්නට වූවාය. ඒ සඳහා ඇයට උදව් කිරීමට මට ද පුළුවන්වීම ගැන මම සතුටු වීමි.

අම්මා රැයින්ම නැගිට ආප්ප, පිට්ටු, ඉඳිආප්ප ආදි කෑම වර්ග සෑදුවාය. වටින් ගොඩින් එළිය වැටීගෙන එද්දී ඒවා කඩවලට ගෙන ගොස් විකුණුවාය. මෙය අපට ජීවත් වීමට තරම් ආදායමක් ලබා දෙන්නක් බව අපට පෙනෙන්නට විය. ඒ නිසා මම ද දිවා රෑ ඒ සඳහා වෙහෙසුණෙමි. එහෙත් අම්මා ඒ ගැන එතරම් පැහැදීමකින් නො සිටියාය.

"මොකක් හරි ආණ්ඩුවේ රස්සාවක් ගැන බලාපන් දුවේ. හැමදාම මෙහෙම කඩ කෑම හද හදා ඉඳල උඹට යන කලක් නැහැනෙ" යි ඇ නිතර පැවසුවාය.

දිනක් සේන අයියා අහම්බෙන් අපේ ගෙට ගොඩ වුණේය. එවලෙහි අම්මා කඩකෑමවල මුදල් එකතුකර ගෙන ඒම සඳහා කඩපලට ගොස් සිටියාය. ඔහු දකිත්ම මගේ ඇස කඳුළින් තෙත් විය. අනේ සේන අයියෙ මම විනාශ වුණා යයි මගේ හදවත හඬා වැලපිණ. ඒ සියල්ල යටපත් කරගෙන මම ඔහුට සිනාවකින් සංග්‍රහ කරන්නට උත්සාහ කෙළෙමි.

"මන්ත්‍රීතුමාගෙන් වැඩක් උනේ නැද්ද සාමා?"

මගේ හදවත ඇවී ගියේය. ඔහුගෙන් සිදුවූ හරිය කෙසේ කියන්න ද?

"ඔහෙ නෑ අයියෙ"

"මාත් දන්නා තරම් උත්සාහ කළා ඔයාට කොළඹ පැත්තෙන් රස්සාවක් හොයලා දෙන්න. නමුත්...."

"ඒක මගෙ කරුමෙ අයියෙ"

අපි නිහඬව බලා සිටියෙමු.

For E-Pusthakalaya

"මේ පැත්තටත් තාප්ප කල්ලිය බෝවෙලා වගෙ නේද සාමා?"

"ඒ කියන්නෙ?"

"අපේ ගෙදර තාප්පෙත් කවුද පොල්ගෙඩි අකුරෙන් සටන්පාඨ වගයක් ලියලා. තාත්තට මාරයා නැගලා" කියමින් ඔහු සිනාසුණේය.

"එහෙ වාසිට්යෙන් ඒ කල්ලිය ගිහි රාමෙට වැඩ"

"අයියා ඒවට සම්බන්ධ නැද්ද?"

"නැහැ"

මට ඔහු ගැන නොපැහැදීමක් ඇති විය. තරුණයින් ගේ සටනකදී ඔහු මග හැර සිටින්නේ ඇයි?

"ඇයි අයියා ඒකට සම්බන්ධ වෙන්නෙ නැත්තෙ?"

"මට ඒකට සම්බන්ධ වෙන්න බැහැ සාමා. ඒ අය ගැන මට හරිම දුකයි. ඒ අයට ප්‍රශ්න තියෙන එක ඇත්ත. නමුත් ඒ ප්‍රශ්නවලට තියෙන විසඳුම ඕක නෙවෙයි"

"ඇයි එහෙම කියන්නෙ?"

"පැන්සල් තුඩකින් ආණ්ඩු පෙරළන්න පුළුවන් නිදහසක් තියෙන රටක ඒකට තුවක්කු බයිනෙත්තු ඕන නැහැනෙ"

"පැන්සල් තුඩුවලින් පෙරළාපු වගේම පත්කර ගත්තු කිසිම ආණ්ඩුවකින් අපේ ප්‍රශ්න විසඳලා නැහැනෙ අයියෙ. හැමදාම නායකත්වයට එන්නෙ එකම පන්තියක්නෙ? ඒ අය වෙනස් වෙන්නෙ නැහැ"

"අන්න ඒක තමයි ප්‍රශ්නය. ඒකට තියෙන හේතුවම තමයි ඔය ප්‍රශ්නයට තියෙන උත්තරයත්"

"මොකක්ද හේතුව"

"සංවිධානය වෙලා ඉන්නෙ ධනේශ්වර පන්තිය විතරයි. වැඩකරන පන්තිය සංවිධානය වෙලා නැහැ. නගර බදව කම්කරුවන් කොටස් වශයෙන් හරි සංවිධානය වෙලා හිටියත් ගොවියන් කොහෙත්ම සංවිධානය වෙලා නැහැ. කම්කරු සංවිධානවල උනත් නායකත්වය අරගෙන ඉන්නෙ කම්කරුවො නෙවෙයි. ඒවා කම්කරුවන්ගේම කර පිටින් පාලන බලය ලබාගන්නට ධනේශ්වර පන්තියේම ඇතැම් කොටස් සාදාගෙන තියෙන සංවිධාන.



මැතිවරණයකදී මොන වෙස් මූණක් බැඳ ගෙන ආවත් සෑම ධනපතියෙක්ම ප්‍රතික්ෂේප කරන්නට අපි නිර්ධන පන්තියට උගන්වන්න ඕන. අපට අද අවශ්‍ය වෙලා තියෙන්නේ ඔවුන්ට ඒ අවබෝධය ලබාදීමේ සංවිධානයක්. නිර්ධන පන්තියේ අවබෝධයත් ශක්තියත් නරකරන සංවිධානයක් මිස ලේ හලන විප්ලවයක් නෙවෙයි"

ඔහු සමග වාද කරන්නට තරම් අවබෝධයක් මට නැත. සිරිසේන මෙතැන සිටියා නම් හොඳ යයි මට සිතිණ. වාද කරන්නට මට කරුණු නැතත් සේන අයියාගේ අදහස් සමග එකඟ වන්නට මට පුළුවන්කමක් නැත. මා තුළ ලේ පිපාසිත දැඩි වෛරයක් තිබේ. එය මගේ අත්දැකීම් විසින් ඇති කරනු ලැබූ වෛරයකි.

"අපේ ජීවිත ගැන ඔයාට අත්දැකීමක් නැහැ අයියෙ. මගේ ජීවිතය වගේ ජීවිත ගත කරන සෑම තරුණ තරුණියක්ම - අපව ඒ තත්වයට පත්කරපු ධනේශ්වර දේශපාලනඥයින්ට වෛර කරනවා."

"මම දන්නවා. නමුත් වෛරය විමුක්ති මාර්ගයක් නෙවෙයි"

"ඒ ආගමට අනුව. මම දැන් ඉන්නෙ ආගමත් එපා වෙලා."

"ඇයි?"

"අපේ ප්‍රශ්නවලට විසඳුමක් නැති ආගමකින් ඇති පලේ මොකක්ද?" මම වේගයෙන් ඇසීමි.

සේන අයියා ඉතාම ශෝකයෙන් මා දෙස බලා සිටින්නට විය.

"මට ඔයා ගැන හරිම දුකයි" ඔහු සැහෙන වේලාවක් බලා සිට ශෝකී ස්වරයෙන් පැවසුවේය.

"කවුරු හරි කෙනෙක් ඔයාගෙ හැඟීම් වැරදි මාර්ගයකට යොමු කරලා තියෙනවා. නමුත්ගෙ ආගමටත් පටහැනිව වෛරය විමුක්ති මාර්ගයක් හැටියට ඔයාට පහසුවෙන් අවබෝධ කරවන්නට කාට හරි පුළුවන් වෙලා තියෙන්නෙ ඔයා පසුවන තත්වය අනුව. මම තරුණ තරුණියන්ට දොස් කියන්නෙ නැහැ. ඒකට වගකිව යුත්තේ ඔවුන්ව මේ තත්වයට පත් කරපු අය. ඔවුන්ට ආගම ධර්මයත් එපා කෙරෙව්වෙ ඒ අය..."

මම කතා නැතිව ඔහු දෙස බලා සිටින්නට වීමි. ඔහු පසු වූයේ

For E-Pusthakalaya

මහත් කලකිරුණ ස්වභාවයෙනි.

"ආගමෙන් කරන්නෙ මිනිස්සුන්ගෙ ආර්ථික විමුක්තිය සලස්වන එක නෙවෙයි සාමා. ඒකෙන් කරන්නෙ අධ්‍යාත්මික විමුක්තිය සලස්වන එක. ඒ දෙකම කෙනෙකුගේ ජීවිතයට සම්බන්ධ උනාට එකක් නෙවෙයි දෙකක්"

"ඒක ඇත්ත. නමුත් ආගම් යටතේ සූරාකෑමේ නිදහස තහවුරු වෙලා නැද්ද?"

"ඇත්තෙන්ම නෑ. කිසිම ආගමක් සූරාකෑමේ නිදහසක් තියලා නැහැ. සූරාකන කිසිම කෙනකුට කිසිම ආගමක් යටතේ කිසිම විමුක්තියක් සලස්වලා නැහැ. සමහර අය ආගමේ මුවාවෙන් සූරාකෑමේ මාර්ග ඇතිකර ගෙන තියෙන එක ඇත්ත. නමුත් ඒක ආගමේ වරද ද?"

ඔහු පිළිතුරු අපේක්ෂාවෙන් මා දෙස බලා සිටින්නට විය. මම නිරුත්තරව බලා සිටින්නට වීමි.

"නමුත්ට ප්‍රශ්න තිබුණ පළියටම සියල්ලක්ම විනාශ කර දැමීම ඒ ප්‍රශ්නවලට විසඳුම් නො වෙයි සාමා. අපි බෞද්ධ සංස්කෘතියත් කෘෂිකර්මික අර්ථ ක්‍රමයත් ආත්ම කොට ගත් ජාතියක්. ඒ දෙකෙහි පිරිහීම තමයි අපේ පිරිහීම. ඒ දෙකෙන් පිරිහෙන්නට පිරිහෙන්නට අපේ ජාතිය තව තවත් පිරිහෙනවා. අපි ඒක අවබෝධ කර ගන්න ඕන. අපේ දේශපාලන දර්ශනය සකස් විය යුත්තේ වෛරය හා විනාශ කිරීම පදනම් කරගෙන නොවෙයි - බෞද්ධ සංස්කෘතියත් කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයත් පදනම් කරගෙන"

මට වඩා විශාල අවබෝධයකින් යුතුව ඔහු කතා කරන්නේ යයි මට හැඟෙන්නට විය. ඔහු එදා ආපසු ගියේ වෙනදා මෙන් සතුටින් නොව ඇඩි කළකිරීමකින් යුතුව යයි මට සිතිණ.

මම පසුතැවෙන්නට වීමි. සිතුවිලි සාගරයක මංමුලා වීමි. එක පැත්තකින් සේන අයියාය. අනිත් පැත්තෙන් සිරිසේනය. මේ දෙන්නාගෙන් වඩා හරි කොයි එක්කෙනාද? මා වඩා ආසන්න විය යුත්තේ කොයි එක්කෙනාටද? සිරිසේන මා අයත්වන පන්තියේම කෙනෙකි. මා විඳින දුක් වේදනා ඔහු ද විඳියි. සේන අයියාට අපට බඳු දුක් වේදනා නැත. එහෙත් ඒ දුක් වේදනාවලට උපත ලබාදුන්



යථාර්ථය පිළිබඳව අපට වඩා අවබෝධයක් ඔහුට නැද්ද? මා නැඹුරු විය යුත්තේ මේ දෙදෙනාගෙන් කවුරුන් වෙත ද? සිරිසේනගේ අරමුණ උතුම්ය. එහෙත් ඒ සඳහා තෝරාගෙන ඇති මාර්ගය ප්‍රචණ්ඩය. සේන අයියාගේ ද අරමුණ උතුම්ය. මාර්ගයද සාමකාමීය. මා නැඹුරු විය යුත්තේ කවුරුන් වෙත ද?

සිතුවිලි සාගරයේ මා ඔරුවකි. මගේ රුවලට සුළං බඳා මා එක් දෙසකට ඇදගෙන යයි. ඒ සුළඟ වූ කලී මගේම බඳු ජීවිතයක් ඇති සිරිසේනය. එහෙත් මම විරුද්ධ පැත්තට පදින්නට හබල් ගාමි. ඒ හබල වූ කලී සේන අයියාය.

For E-Pusthakalaya

# 19.

**සේ**න අයියා සරසවියේ සිට මට ලිපි ලීවේය. මා කිසියම් ව්‍යසනයක් කරගනිතියි ඔහු තුළ පැවැත්තේ බියකි. මට රක්ෂාවක් සොයා දීමට ඔහු කොතෙකුත් වෙහෙසුණේය. මා වෙනුවෙන් කොළඹදී මන්ත්‍රීතුමා ද මුණ ගැසෙන්නට ගිය බව එක් ලිපියක සඳහන් විය. ඒ ලිපියෙන් මම තැති ගතිමි. මන්ත්‍රී කුමක් කියන්න ඇද්ද? සිදුවූ කිසිම දෙයක් ඔහු නො කියන බව සහතිකය. එහෙත් මා ගැන ඔහු වෙනත් බොරුවක් ගොතා කියන්නට ඇද්ද? කෙසේ වෙතත් මට රක්ෂාවක් සොයා දෙන බවට ඔහු සේන අයියා සමගත් පොරොන්දු වන්නට ඇති. පොරොන්දු දීම මන්ත්‍රීවරුන්ට ඉතා ම සුළු දෙයකි. ඔවුන්ගේ දේශපාලන ජීවිතය එකම කඩවුණ පොරොන්දුවක් නොවේ ද?

දයාබර අනෝමාට ද මම නිතර ලිපි ලිව්මි. මා එක් රැයක් කන්‍යාරාමයේ ගත කළ බව රහසක් වශයෙන් තබා ගැනීමට මම කල්පනා නො කෙළෙමි. එය කවදා හෝ අම්මාටත් සේන අයියාටත් අනෝමාගෙන් හෙළි වන්නේය. එය ඔවුන් සමග නොකියන්නැයි මම අනෝමට නො කීවෙමි. මා කිසියම් රහස් ගමනක් ගියේ යයි අනෝමා සිතා ගන්නවාට මම අකැමැත්තෙමි. ඈ නිතර මට ලිපි ලීවාය. මට රැකියාවක් නැතිකම ගැන දුක් වූවාය.

මේ අතර අම්මා දිනෙන් දිනම කෘශ වන්නට වූවාය. එසේ වූයේ කොතෙකුත් ඇගේ ගත සිත පෙළූ දුක් වේදනාවන් හා අධික වෙහෙස මහන්සිය නිසා යයි මම කල්පනා කෙළෙමි. එහෙත් ඇය මේ දුකෙන් අත්මිදවීමට මට කිසිම පුළුවන්කමක් නැත. මම නොයෙක් වර අම්මාට



හොරෙන් කඳුළු සැළුවෙමි.

අම්මාට සිහින් කැස්සක් වැළඳිණ. එහෙත් ඈ ඒ ගැන නො සලකා දිගටම වෙහෙස මහන්සි වූවාය. ඒ සමගම කැස්ස වැඩි වන්නට විය. කහින විට ලේ බින්දු කීපයක් ද පිටවී තිබෙන බව දිනක් දක්නට ලැබිණ. මම මහත් සේ බියපත් විමි.

"අනේ අම්මේ අපි හොඳ දොස්තර කෙනෙකුගෙන් බේත් ටිකක් ගන්න යමුකො. ඕක බලාගෙන ඉන්න හොඳ කැස්සක් නෙවෙයි" මම කොතෙකුත් කන්නලව් කෙළෙමි.

"බලාගෙන බැරියැ" ඈ ගණන් නො ගෙන පැවසුවාය.

"හැමදාම කියන්නෙ ඔය කතාව. දැන් කොච්චර කල් බැලුව ද?"

එහෙත් අම්මා උනන්දුවක් නො පෙන්වා ගොඩ වෙද කම් කළාය. ඇයට වැළඳී ඇත්තේ ළය පීනස බව ඇගේත් ඇයට වෙදකම් කළ වෙද මහතාගේත් අදහස විය.

අම්මාගේ කැස්ස වැඩවීමත් සමගම කඩවල් කීපයක්ම අපෙන් කෑම ගැනීම නැවැත්වූ පසු අම්මා ඔවුන්ට දොස් කීවාය.

"උන්ගෙ හිතේ මට කාසෙ හැදිලා කියල. මේක මේ ළය පීනසේ. හොඳයි කමක් නෑ....."

ඉන්පසු ඒ කඩවලට කෑම ගෙනයාමට මම උත්සාහ කෙළෙමි. මේ වෙළඳාමත් නැතුව ගියොත් අපට ජීවත් වන්නට අන් මගක් ඇත්තේ ම නැත. එහෙත් මා කඩවලට කෑම ගෙනයාම ගැන අම්මා කොහෙත්ම සතුටු නුවූවාය. ඒ සඳහා ඈ මට කොහෙත් ම ඉඩ නුදුන්නාය.

"මගේ පණ තියෙද්දි ඒක නම් කෙරෙන්නෙ නෑ දූවේ. උඹව කඩවල් ගානේ වෙළඳාමේ යවන්න මට බෑ...."

"මට පුළුවන් අම්මෙ. ඒකෙන් කුලයක් වැටෙන්නෙ නෑ"

"එපා දූවේ. කොලු පැටියාවත් හිටියා නම් ඒක කරන්න තිබුණා. උඹ ආප්ප වට්ටිය ඔළුවේ තියාගෙන කඩවල් ගානේ යන්න උනාම නිකම්ම උඹව නෝංජල් වෙනව. කඩවල් ගානේ රස්තියාදුවෙන

එවුන් උඹට විහිළු කරන්නට පටන් ගනියි. මහ වනවර කටවල් තියෙන එවුන්. උඹට උන්ගෙන් බේරිලා එන්න බෑ"

"ඒක එච්චර දෙයක් නොවෙයි. මට පුළුවනි උන්ගෙන් බේරෙන්න"

"මම කියන එක අහපන්. උඹට බෑ. අවනම්බුවක් හදාගන්නවට වැඩියෙ හොඳයි නම්බුව තියාගෙන මැරිල යන එක"

අම්මා මට කෙසේවත් ඉඩ නුදුන්නාය. අපේ වෙළඳාම දිනෙන් දිනම අඩු වන්නට විය. ජීවත් වීම යළිත් අපට මහත් තර්ජනයක් වන්නට විය.

"අද කෑම ටික සේරම ඉතුරු උනා" යි එක් උදයක ආපසු පැමිණි අම්මා කෑම වට්ටිය හිසෙන් බිම තබමින් මහත් ශෝකයෙන් පැවසුවාය.

ඇගේ දෑසෙහි කඳුළු නැගී තිබිණ. කෘශ වී සිටි ඇ ගමන් වෙහෙසින් හති ලන්නට වූවාය. ඇගේ ඉල ඇට කූඩුව වහ වහා උස් පහත් විය. ඇයට දැන් සුළු වෙහෙසක් පවා ඔරොත්තු නො දෙයි.

"කිසිම කඩේක අද මොකුත් ගත්තෙ නැහැ. අපෙත් කෑම ගන්නකොට කිසිම මනුස්සයෙක් කඩවල් වලට තේ බොන්න ගොඩවෙන්නෙ නැතිලු. අපේම කරුමෙ තමයි. මේක කරුමෙට හැදුණු ලෙඩක්......"

මම කඳුළු පිරුණු ඇසින් එදෙස බලා සිටියෙමි.

"මම කොයිකාලෙ ඉඳලද අම්මට කියන්නෙ ඉස්පිරි තාලෙක නවතිමු කියල. කහින කොට ඉස්සෙල්ලම ලේ ගිය දවසෙ ඉඳලමනෙ මම කියන්නෙ. ඔය ගොඩ වෙද කම් කළා දැන් ඉතින් ඇති අම්මෙ......"

"උඹව කවුරු ළඟ ඇලද මම ඉස්පිරිතාලෙ යන්නෙ දූවේ"

"හොඳයි අම්මා මළොත් මාව කවුරු ළඟ ඇලද යන්නෙ?" මම තරහින් ඇසීමි.

"එතකොට මොනව උනත් මට පේන්නෙ නැහැනෙ. නමුත් මගෙ පණ කෙන්ද තියෙද්දි මට බැහැනෙ උඹව තනිකරලා ගිහින් හිත හදා ගෙන ඉන්න"

"අම්මා විකාර කතා කියන්නෙ නැතුව දැන්වත් ඉස්පිරිතාලෙක



නවතින්න යන්න. මම ඔය කොහේ හරි නවතින්නම්"

"කොහේ කියල නවතින්න ද?"

"මාමලගෙ දිහාවත් යනවා"

"ඒ ගෙදර හැටි උඹ දන්නවනෙ. ඒක අපායක්"

"මොනව කරන්න ද? මාත් ඒ අපායෙම වැටිල ඉන්නව"

"අනේ මන්දන්නෑ"

පසුව මම මාමාට ලිපියක් ලිවීම. රෝහලක සුළු සේවකයකු වන ඔහු පැමිණ අම්මා එක්කරගෙන ගොස් ඔහු හඳුනන දොස්තර මහතකු වෙත ඉදිරිපත් කෙළේය. දොස්තරගේ නිගමනය වූයේ අම්මාට ක්ෂය රෝගය වැළඳී ඇති බවත්, සුවය ලබන්නට නම් රෝගය තවත් උත්සන්න වීමට කලින් නො පමාව වැලිසර බඳු ළය රෝහලකට ඇතුළත් වී ප්‍රතිකාර ලැබිය යුතු බවත්ය.

එය ඇනගත් අම්මා කඳුළු පිරුණු බියපත් ඇසින් මා දෙස බලා සිටියාය. මම ඉකිබිඳ හැඬීමි. අම්මා ද මා වැළඳගෙන හැඬුවාය.

ඇය වැලිසර ළය රෝහලට ඇතුළත් කරනු ලැබූ දා අපි දෙදෙනාම හැඬීමු.

"දෙයියන්ගෙ පිහිටෙන් අම්මට ඉක්මණට සනීප වෙලා එන්න පුළුවනි"

"මැරෙන්න මම බය නෑ දූවේ. මට දුක උඹ ගැන. කොලුපැටියා ගැන මට එච්චර දුකක් නෑ. ඌ පිරිමියෙක්. ඌට වැටෙන කුලයක් නෑ. මගෙ දූව මාමත් එක්ක ගිහින් පරිස්සම් වෙලා ඉන්න...."

මගේ දැන් පරිස්සම් කරන්න දෙයක් ඉතුරුවී නැති බව අම්මා දනීනම්! ඇගේ ළය පැලී මිය යනු ඇත.

"අම්මා මං ගැන බය වෙන්න එපා."

මම මාමාත් සමග ඔහුගේ ගෙදර ආවෙමි. අම්මා මුලින් කීවාක් මෙන්ම එය නරපණුවන් ජීවත්වන නරකාදියකි.

ඔවුන්ට දරුවන් මහ කැලතකි. ඒ හැමෝම තාමත් කුඩාය. ඔවුහු දැලි කුණු තාවර පෙරාගෙන වැරහැලි එල්ලාගෙන හිඟන පැටවුන්

For E-Pusthakalaya

මෙන් සිටිති. නැන්දාට දරුවන් පිළිසිඳුවට හඹා ගන්නට නුපුළුවන. ඈ වහා කෝපයට පත්වෙයි. දරුවන්ට නිතරම මහ හඬින් කෑගසයි. හැරුණ අතේ පහර දෙයි. දරු කැලතට හැරෙන්නටවත් ඒ ගෙය ඉඩ මදිය.

අප මෙන්ම මාමා ද දරුණු ලෙස අගහිඟතාවයෙන් පෙළෙයි. අඩුපාඩුවලදී නැන්දා නිතර ඔහුට කෑගසයි. ඔවුන් අතර සණ්ඩු කෙලවරක් නැත. කන්නට නැත. අඳින්නට නැත. ඉන්නට හරියකට තැනක් නැත. ඔවුන් සාමයෙන් සතුටින් සමගියෙන් සිටින්නේ කෙසෙ ද?

මම දරුවන් නාවමි. ඔවුන්ගේ රෙදි සෝදමි. උයන්නට පිහන්නට නැන්දාට උදව් වෙමි. එහෙත් ඇය මා දෙස බලන්නේ ජන්ම වෛරක්කාරියක මෙනි. දරුවන් අපිරිසිදුව සිටිම ඇයට ප්‍රශ්නයක් නොවේ. යමක් ඇතොත් එය ඔවුන්ට උයා දෙන එකත් ඇයට ප්‍රශ්නයක් නොවේ. නමුත් ඔවුන්ගේ හිඟන පාත්‍රයේ මා සෙනසුරෙකු වී සිටීම ඇයට ප්‍රශ්නයක් නොවේ ද? අඩ සයින් පෙළෙන ඇගේ දරුවන්ගේ ආහාර වේලෙන් මටත් කොටසක් වෙන් කරන්නට සිදුවී තිබීම ඇයට ප්‍රශ්නයක් නොවේ ද? මම ඇය ගැන කෝප නො වීමි. එහෙත් මෙබඳු අසරණ තැනකින් මගේ කුසගිනි නිවා ගන්නට සිදුවීම මොන තරම් අවාසනාවක් ද?

මට ඉඳ හිට හෝ අම්මා බලන්නට වැලිසර යාමට සිදුවී ඇත්තේත් මාමාගේ මුදලිනි. අම්මාට දොඩම් ගෙඩි ටිකක්. බිත්තර ටිකක්. හෝර්ලික්ස් බෝතලයක් ගෙන යාමට මා අතේ තඹ සතයක් නැත. එවැන්නක් සඳහා මාමාට ද මුදල් නැත. ඔහු ගිරයට හසු වුණ පුවක් ගෙඩියක් බඳු පුද්ගලයෙකි.

මට සැනසීමකට ඇත්තේ මගෙන් කිසිම උපකාරයක් නො ලැබුණත් අම්මා ටිකින් ටික සුව අතට හැරී සිටීමය. ඇගේ ඇඟපත දැන් හොඳය. කැස්ස ද අඩුය. ඉක්මණින් සුවය ලබා ආපසු යාමට හැකිවන බවද වෛද්‍යවරයා කියා ඇත. ඉතා හොඳින් කෑම බීම සහ බෙහෙත් ලැබෙන බවද අම්මා කියයි. ඈ දුක් වන්නේ මා ගැනය.



"එහෙ හරි කරදරේ ඇති නේද? නංගිගෙන් බේරිලා ඉන්න එක හරි අමාරු ඇති. එයා හරි වසයි. මම ඉක්මනට ටිකට් කපාගෙන එන්න බලන්නම්කො...."

"මට එහෙ කිසිම කරදරයක් නෑ අම්මෙ. නැන්දා මාත් එක්ක හරි හොඳයි. අම්මා හොඳටම සනීපවෙලා මීස ටිකෙට් කපා ගන්න එපා"

"මට දැන් හොඳට සනීපයි දුවේ"

"ඒ උනත් දොස්තර මහත්තයා කියනකන් ටිකෙට් කපා ගන්න එපා"

අම්මා සුවය ලබා සිටීම මට මොනතරම් සතුටක් ද? එහෙත් මම රෝහලේ සිට ආපසු එන්නේ අපායට යන්නාක් මෙනි. නමුත් එහි නො ගොස් වෙන යන්නට තැනක් නැත.

බොහෝවිට මම නොකා නොබී සිටිමි. කන වේලද යන්තමින් කා සිටිමි. මට එය එතරම් ප්‍රශ්නයක් නොවේ. මට ප්‍රශ්නය වී ඇත්තේ නැන්දාගේ සැඩ පරුෂ කමය. මා නිසා මාමා ද බැණුම් අහන වාර අපමණය. එය මා පිළිබඳව ප්‍රශ්නයක් මුල්කරගෙන බව ඈ කෙළින්ම නො අඟවයි. එහෙත් ප්‍රශ්නය මා බව අවබෝධ කර ගැනීම මට අපහසු නැත.

මට මාමාගේ ගෙදර අන්තයටම එපා වූයේ මාමාත් මාත් අම්මා බලන්නට වැලිසර ගොස් පැමිණි දවසකය. අප එන විට නැන්දා වෙනදාටත් වඩා හොස්ස දික් කර ගෙන සිටියාය. ළමයි කීප දෙනෙක් තැන් තැන්වල ගුලි ගැසී නිදා සිටියහ. බාලම දරුවා නැන්දාගේ කිරි උරා බොමින් සිටියේය.

ගෙට ගොඩවූ මාමා වට පිට බැලුවේය. ළමයින් මළානික ලෙස ඇස් හැර බැලුවා මිස නැගිට්ටේ නැත. කුස්සියට ගිය මාමා නැවතත් නැන්දා සිටි තැනට ආවේය.

"ළමයින්ට මොකුත් උයලා දුන්නෙ නැද්ද?" මාමා හෙමිහිට ඇසුවේය.

"උයල දෙන්න? උයල දෙන්න තියෙන්නෙ මගෙ කැවුත්ත" ඈ

For E-Pusthakalaya


කොටි දෙනක මෙන් කඩා පැන්නාය.

මාමා නිහඬ විය.

"හරියට කන්න ගෙනල්ලා තියලා ගිය මිනිහෙක් වගේනෙ කතාව. මෙච්චා ගානේ නඩලං ගහනකොට ළමයි මතක් වෙන්න තැතුව ඇති" ඈ බැණ වදින්නට වූවාය.

මාමා ඇය දෙස හැරී බැලුවේය.

"නඩලං ගහන්න? මොන නඩලං ගැහිල්ලක් ද? මම ගියේ අක්කා බලන්න. ඒක නොගිහිල්ලම බැරි ගමනක්" ඔහු නොමනාපයෙන් පැවසුවේය.

"තො ගිහිල්ලම බැරිනම් එකෙක් ගියාම මදැයි. ජෝඩුඅල යන්නෙ"

"මොකව?" මාමා සැරවුණේය.

"හොඳ හිතින් උඹේ කට පරිස්සම් කරගනින්" මාමා ද කෝපවී සිටියේය.

"එච්චෙ එනවද මාව මට්ටු කරන්න? හිතුවා මදි. මට දැන් තේරෙනවා මාව පෙන්නන්න බැරි චිත්තිය. දැන් මම නැතුවට කමක් නැහැනෙ...."

"මොකක්ද බොල තෝ කීවෙ?"

මාමා කොටියෙකු මෙන් ඇය වෙත කඩා පැන්නේය. කම්මුලට වේගවත් පහරක් දුන්නේය.

"ඔව්. මාව මරාගෙන කාපිය. එතකොට මෙතන හිතේ හැටියට ඉන්න පුළුවන්නෙ" ඈ ගුටිකමින්ද කෑගසමින් බැණ වදින්නට වූවාය.

ළමයි මරහඬ තලන්නට වූහ. එකම කලබැගෑනියකි.

"නිකා ඉන්න මාමෙ. නිකා ඉන්නකො"

මම මාමා වෙත පැන ඔහුගේ අතේ එල්ලුණෙමි. මා ඔහු මැඩ පවත්වා ගත්තේ මහත් අමාරුවෙනි. එහෙත් නැන්දා නැගිට පොර කිකිළියක මෙන් සටනට ආවාය.

"තොපි හිතුව මදි. තොපිත් මරාගෙන මාත් මැරෙන්නෙ"

ඈ ආවේශ වූවක මෙන් මාමාගේ බොටුවට පැන්නාය. මාමාද



ඇය තල්ලුකර දැම්මේය. විසිවී වැටුණ ඈ රෙද්ද හදිමින් නැවතත් නැගිට සටනට ආවාය.

අසල් වැස්සෝ ද දුව ආහ. දෙදෙනා දෙපසට කළහ.

මට ඒ ගෙදර එපා වූයේ එදාය. මම බොහෝ වේලාවක් හැඬීමි. මේ ගෙදර මෙතරම්ම අසමගියකට මුල මා නො වේ ද? ඒ නිසා තව දුරටත් මා මෙහි නො සිටිය යුතුය. මගේ සිටීම ගැන නැන්දා කොහෙත් ම කැමති නැත. ඈ මා සැක කරන්නී ද? එහෙම සැකයක් තැතිව ඇති. එහෙත් ඇයට මාව පන්නා ගැනීමට අවශ්‍යව තිබේ. ඒ මේ ගෙදර පවත්නා අගහිගකම් නිසා විය හැකිය. මේ ගෙදරින් පිටවී යන්නැයි කෙලින්ම කීමට ඇයට නුපුළුවන. මේ අරියාදු ඒ නිසයි. මා ඉතා ඉක්මනින් මෙතැනින් පිටවී යා යුතුය.

නමුත් දෙයියනේ මා කොහේ යන්න ද? කාගේ පිහිට පතන්න ද?

මට සේන අයියා මෙනෙහි විය. අනෝමා මෙනෙහි විය. ඔවුහු මට උපකාර කරන්නට පුළුවන් තත්වයක සිටිත් ද? කෙසේ වෙතත් වෙන කරන්නටම දෙයක් නැති නිසා මම සේන අයියාට ලිපියක් ලීවෙමි.

දයාබර සේන අයියේ;

මෙවැනි ලිපියක් ලියා කරදර කිරීම ගැන මුලින්ම මට සමාවෙන්න. නමුත් මට මෙය කියන්න ඔබ හැර මේ ලෝකේ වෙන කිසිම කෙනෙක් නැහැ. අම්මා තාමත් රෝහලේ. මා තවමත් මාමලාගේ ගෙදර. නමුත් මට දැන් ඒ ගෙදර අපායක්. මට එතනින් දොට්ට බහින්නයි වෙලා තියෙන්නේ. නමුත් මම කොහේ යන්න ද?

සම්පූර්ණ විස්තර ලියතොත් පොතක් තරම් ලියන්න වේවි. ඒ සියල්ල ලියා ඔබට කරදර කරන්න මා කැමති නැහැ. එකම එක ඉල්ලීමක් කරන්න පමණයි මෙය ලියන්නේ. කරුණාකරලා මට නවතින්න තැනක් හොයලා දෙන්න. බෝඩ් වෙන්න නෙවෙයි. වැඩකාර කමට. කීයක්වත් මට නො ලැබුණත් කමක් නෑ. නොමැරී ජීවත් වෙන්න ලැබුණොත් ඇති.

For E-Pusthakalaya



මේ ඉල්ලීම ඉටු කරන්න ඔබටත් බැරි නම් මීට පස්සේ සාමා ගැන ඔබට එකම එක දෙයක් ආරංචි වෙයි. ඉන්පසු සියල්ල අවසානයි. ඒ තීරණය තො ගෙනයි මම මේ කොහොම හරි ජීවත් වෙන්න උත්සාහ කරන්නේ. මට ඒකට උපකාර කරන්න. මෙය මගේ අන්තිම ඉල්ලීමයි.

මට සමාවන්න.

මීට - හිතාදර නංගී,

සාමා.

(මෙහි ඉතිරි කොටස සඳහා කරුණාකර 'රිදීරේඛා' කියවන්න)

# කුමාර කරුණාරත්න
# අපේ කතාව

For E-Pusthakalaya

එදා සමන් [illegible] එරෙහි ව ඇති වූ
කැරැල්ලේ විශාල විපාකයන් සමාජයට ලබා දුනි. දිවි
ගලවා ගත් කුමාර අද ජය ගත් දූෂිත කෝටිපතියන්
බවට පත් ව සිටිති. එ පමණක් නොව එදා නමත්
නායකත්වය දුන් ඒ කැරැල්ලේ අද නායකයන් වී සිටින
කැරලිකරුවන්ගේ පරම සතුරන් බවට ද පත් ව සිටිති.
මෙරට [illegible] නායකයන් [illegible] [illegible] [illegible]
[illegible] [illegible] [illegible] [illegible] [illegible]
[illegible] [illegible] [illegible] [illegible] [illegible]
දුර්භාග්‍යයක් ද?

කුමාර කරුණාරත්න.

හංස ප්‍රකාශන

9789558504130